# විස්ස සහ 20 සම්මතවීමේ ගමන්මග

17, 18, 19 සහ 20 වනව්‍යවස්ථා සංශෝධන පිළිබඳ විවරණයක්

නීතිඥ ජගත් ලියන ආරච්චි

පැෆ්‍රල් ප්‍රකාශනයක්

# විස්ස සහ 20 සම්මතවීමේ ගමන්මග

17, 18, 19 සහ 20 වන ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ විවරණයක්

නීතිඥ ජගත් ලියන ආරච්චි

පැෆ්රල් ප්‍රකාශනයක්

# විස්ස සහ 20 සම්මතවීමේ ගමන්මග

17, 18, 19 සහ 20 වන ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ විවරණයක්


ප්‍රථම මුද්‍රණය - 2021 ජනවාරි

පැෆ්රල් ප්‍රකාශන වෙනුවෙන් සම්පාදනය

**නීතිඥ ජගත් ලියන ආරච්චි**

ISBN 978-624-5621-00-2

පිටකවර හා පිටු සැකැස්ම

**පැෆ්රල් මාධ්‍ය අංශය**

ප්‍රකාශනය

**පැෆ්රල්**

නො. 16, බර්ඩ් පෙදෙස, පාමංකඩ පාර, කොළඹ 06.

Tel: 011 2 558 570/1 Fax: 011 2 558 572

paffrel@sltnet.lk

www.paffrel.lk

මුද්‍රණය

**Neo Graphics(pvt)Ltd.**

44, උඩහමුල්ල ස්ටේෂන් පාර, ගංගොඩවිල

නුගේගොඩ.

# පැෆ්රල් සංවිධානයේ පණිවුඩය

1978 සිට ක්‍රියාත්මක වන වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වසර 42 ක කාලසීමාව තුළ 20 වතාවක් සංශෝධනයට ලක්විය. එලෙස සම්මත වූ සංශෝධන හැමවිටම ජනතාවාදී හෝ ප්‍රගතිශීලි නොවුණද මෑතකාලීන ලාංකික දේශපාලනය හදාරන්නෙකුට මගහැර යා නොහැකි සංශෝධන 04 ක් හමුවේ. සමාජයේ පුළුල් කථාබහට ලක් වූ එකී සංශෝධන වනුයේ 17, 18, 19 සහ 20 වන සංශෝධනයි. විටක රාජ්‍ය ආයතන ව්‍යුහ වඩා ස්වාධීන කරමින් ජනාධිපති බලතල විමධ්‍යගත වෙමින් ක්‍රියාත්මක වන ව්‍යවස්ථා සංශෝධන ඊළඟ අවස්ථාවේදී සපුරා වෙනත් ස්ථාවරයක් ගනිමින් සියලු බල ව්‍යුහයන් ජනාධිපතිවරයා වටා කේන්ද්‍රගතවීමේ දිශානතියකට යොමුවීම මේ පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරන්නෙකුට දැකිය හැකි සුවිශේෂි තත්ත්වයකි. සිදුකරනු ලබන ඕනෑම සංශෝධනයක් රාජ්‍ය ආයතන වල ස්වාධීනභාවය ජනාධිපතිවරයා සතු බලතල විමධ්‍යගතවීම, තොරතුරු දැනගැනීමේ අයිතිය සහ සංවරණ තුලන ක්‍රමයක් හරහා ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් ක්‍රියාකල යුතු වුවද අප නිරන්තරයෙන් අත්දකිමින් සිටින්නේ එය සිදුවනුයේ පාලකයින්ගේ කැමැත්තේ ප්‍රමාණයට අනුව පමණක් බවයි.

මෙම සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය, මේ පිළිබඳව පාර්ලිමේන්තු නියෝජිතයන් හා විද්වතුන් දැක්වූ අදහස්, මාධ්‍ය ආයතන ක්‍රියාකළ ආකාරය, පාර්ලිමේන්තුව තුළ එකී පනත් සම්මත වූ ආකාරය, එකක් ප්‍රතික්ෂේප කරමින් ඊට ප්‍රතිවිරුද්ධ ක්‍රමයක් සම්මත කිරීම, නැවත පෙර ක්‍රමයට සමාන සංශෝධනයක් ගෙන ඒමේ ක්‍රියාවලිය, විටින් විට තම මතයන් සාධාරණය කිරීමට මහජන නියෝජිතයන් කටයුතු කල ආකාරය ශ්‍රී ලංකා දේශපාලනයේ පසුගාමීත්වය පෙන්වන කැඩපත බඳුය.

අනෙක් අතට මෙය හුදු ලියවිල්ලක් පමණක්ම නොවේ. දේශපාලකයින්ගේ හෘද සාක්ෂිය මෙන්ම ප්‍රතිපත්තිගරුකභාවය ප්‍රශ්න කරන්නකි. රටේ මූලික නීතිය සංශෝධනය කිරීමේදී ජනතා අභිලාෂයන් සහ රටේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරනවා වෙනුවට කිසිදු වග විභාගයකින් තොරව ඒ මොහොතේ පවතින බල උවමනාව වෙනුවෙන් පෙනීසිටීමේ පටු උත්සාහය හෙළිදරව් කරන්නකි.

පැෆ්රල් සංවිධානයේ මෙම උත්සහය වන්නේ එවැනි තීරණාත්මක සංශෝධනයක් වූ 20 වන සංශෝධනය පිලිබඳව එහි පසුබිම, ඊට සමගාමී සෙසු සංශෝධන, ඒවා පිළිබඳව මහජන නියෝජිතයින්ගේ ක්‍රියාකාරීත්වය, මාධ්‍ය ආයතන, ආගමික නායකයින්, සිවිල් සමාජය ඒවාට දැක්වූ ප්‍රතිචාර ආදිය ජනතාවගේ දැනගැනීම සඳහා එක්කොට තැබීමයි. මෙම ග්‍රන්ථය අනාගතයේදී මේ පිළිබඳව උනන්දුවක් දක්වන පර්යේෂකයන්ට මහඟු ප්‍රයෝජනයක් වනු ඇතැයි අප විශ්වාස කරමු.

කෙසේ නමුත් කාලීන අවශ්‍යතාවයක් වූ මෙම ග්‍රන්ථයට අදාළ තොරතුරු ඒකරාශී කරමින් හා එය විධිමත්ව ලේඛනගත කරමින් ඔබ අතට පත් කිරීමට අවශ්‍ය දායකත්වය දැක්වීම හා එය වඩා සිත්ගන්නා අයුරින් සකස් කිරීම පිළිබඳව නීතිඥ ජගත් ලියන ආරච්චි මහතාට පැෆ්රල් සංවිධානයේ ස්තූතිය පිරිනමන අතර ප්‍රජාතන්ත්‍රවාදය අගයන මිලියන 22 ක් වූ පුරවැසියන්ට මෙය මහත් ඕනෑකමින් යුතුව පිළිගැන්වීමට කැමැත්තෙමු.

**රෝහණ හෙට්ටිආරච්චි**
විධායක අධ්‍යක්ෂ
2021 ජනවාරි මස 05 වන දින

# කතුවරයාගෙන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු රටක් කරවන මූලික ලියවිල්ලයි. එබැවින් එය රටක සියලුම ක්‍රියාදාමයන් සමග දැඩි බැදීමක් ඇති කරන ලියවිල්ලක් ද වේ. අප මේ ගතකරන්නේ නිදහසින් පසුව අප විසින් ම බිහිකරන ලද දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේය. එසේම එය නිදහසින් පසු වැඩිම කලක් රට කරවන ලද ලියවිල්ලද වේ.

එහි දැනට අවසානාත්මක සංශෝධනය සහ එය සම්මතවීමට අදාළ ගමන්මග පිළිබඳ මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ඉතිහාසය තුළ ප්‍රජාතන්ත්‍රවාදය දෙසට සහ ව්‍යවස්ථාදායක ඒකාධිකාරයක් දෙසට මාරුවෙන් මාරුවට යොමු වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සඳහා බලපෑ දේශපාලන සමාජීය කරුණු මෙන්ම ඒවායේ අන්තර්ගතයන් සහ බලපෑම පිළිබඳව කරුණු එක්තැන් කිරීමයි.

මෙය විචාරයකට වඩා තොරතුරු සහ කරුණු එක්රැස් කිරීමකි. සංශෝධනයන්හි ගුණදොස් විචාරයකට වඩා බලපෑම් පිළිබඳව නීතිමය විවරණයකට උත්සාහ කළෙමි.

මෙම ග්‍රන්ථය සම්පාදනය සඳහා ආරාධනා කළ පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටි ආරච්චි සහ පැෆ්රල් කාර්යය මණ්ඩලයට, මෙහි පිටු සැකැස්ම කළ නිලුක පෙරේරා සොහොයුරාට, ග්‍රන්ථය සකස් කිරීමේදී තොරතුරු ලබාදීම් සිදුකළ දේශපාලන පක්ෂවල නිලධාරීන් සහ ක්‍රියාකාරීන්ට සහ මාධ්‍යවේදී සොයුරු සොයුරියන්ටද, ග්‍රන්ථයේ ව්‍යාකරණ නිවැරදි කළ නාලක ජයසේන සොහොයුරාටද ස්තූතිය පිරිනමමි.

**නීතිඥ ජගත් ලියන ආරච්චි**

# විස්ස සහ 20 සම්මතවීමේ ගමන්මග

17,18,19 සහ 20 වන ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ විවරණයක්

## පෙළගැස්ම

### පළමු පරිච්ඡේදය


හැඳින්වීම 17


### දෙවන පරිච්ඡේදය


**1978 නව ජනරජ ව්‍යවස්ථාව සහ විවේචන 21**

2.1. නව ජනරජ ව්‍යවස්ථාවේ පසුබිම 21
2.2. 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ 24
2.3. නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එල්ලවූ විවේචන 25
2.4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් ජනාධිපති ධුරය තවදුරටත් ශක්තිමත් කිරීම 26
2.5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සඳහා කඩවුණ පොරොන්දු 28


### තුන්වන පරිච්ඡේදය


**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය 31**

3.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන 32
3.2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම 33
3.3. හදිසි පනත් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගෙන ආ නොහැකි බව 33
3.4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් සම්බන්ධ පාර්ලිමේන්තුවේ ක්‍රියාවලිය 34
3.5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයන් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල 37

3.6. පනත් කෙටුම්පත් සම්බන්ධව නීතිපතිගේ කාර්යභාරය 38
3.7. ජනමත විචාරණයකට ලක් කළ යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන 39
3.8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත් සඳහා ඡන්දය විමසීම 40
3.9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන 41

## හතරවන පරිච්ඡේදය

**ජනාධිපති බලතල අඩුකිරීම සහ රාජ්‍ය ආයතන නිර්දේශපාලනීකරණය සඳහා වූ උත්සාහය 45**

4.1. තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව -1990 46
4.2. පොදුජන පෙරමුණේ මැතිවරණ පොරොන්දු -1993/94 48
4.3. රජයේ බලය බෙදාහැරීමේ යෝජනාවලිය -1995 48
4.4. රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යෝජනාවලිය-1997 49
4.5. එක්සත් ජාතික පක්ෂයේ 43 වන වාර්ෂික සම්මේලනය-1997 50
4.6. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහ ප්‍රධාන ආයතන නිර්දේශපාලනීකරණය කිරීම සඳහා වූ පුරවැසි උපදේශන කමිටු වාර්තාව-1998 51
4.7. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත - 2000 53
4.8. විද්වත් වෘත්තිකයන්ගේ සංගමය සම්පාදිත 17 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත - 2001 ජනවාරි 55
4.9. පොදුජන එක්සත් පෙරමුණ සහ ජනතා විමුක්ති පෙරමුණ අතර අවබෝධතා ගිවිසුම - 2001 සැප්තැම්බර් 58

## පස්වන පරිච්ඡේදය

**17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 61**

5.1. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය 61
5.2. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම 62
5.3. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ මූලිකාංග 63
5.4. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ක්‍රියාකාරිත්වය 72
5.5. පළමු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අවසානය 73
5.6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අක්‍රිය වීමෙන් සිදුවූ බලපෑම 74

## හයවන පරිච්ඡේදය

**18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ එහි බලපෑම 77**

6.1. 18 වන ව්‍යවස්ථා සංශෝධනයට බලපෑ පසුබිම 78
6.2. 18 වන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම 79
6.3. 18 වන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ සම්මත වීම 80
6.4. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකළ ව්‍යවස්ථා වෙනස 82
6.5. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ බලපෑම 89

## හත්වන පරිච්ඡේදය

**19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම 91**

7.1. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට බලපෑ සමාජ දේශපාලන සිදුවීම් 92
7.2. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත 96
7.3. 19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ මූලිකාංග 96
7.4. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය 97
7.5. 19 සම්මත වූ පාර්ලිමේන්තුවේ සංයුතිය 98
7.6. කාරක සභා අවස්ථාවේදී සිදුකරන ලද ප්‍රධාන සංශෝධන 100
7.7. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම 101
7.8. 18 සහ 19 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන දෙකටම පක්ෂව ඡන්දය ලබාදුන් මන්ත්‍රීවරුන් 103

## අටවන පරිච්ඡේදය

**19 වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනය මගින් සිදුකළ ව්‍යවස්ථා වෙනස 105**

8.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්ථාපනය කිරිම 105
8.2. ජනාධිපතිගේ නිලකාලය අඩු කිරීම 107
8.3. පාර්ලිමේන්තුවේ නිල කාලය අඩු කිරීම 107
8.4. අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව සීමා කිරීම 107
8.5. ජනාධිපති මුක්තිය සීමා කිරීම 108

8.6. තොරතුරු දැනගැනීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් බවට පත් කිරීම 109
8.7. ජනාධිපතිට අමාත්‍ය ධුර දැරීමට නොහැකි බව 110
8.8. වර්තමාන ජනාධිපතිවරයා සම්බන්ධ අතුරු ප්‍රතිපාදන 110
8.9. අමාත්‍ය මණ්ඩලය සම්බන්ධ ජනාධිපති බලතල අඩු කිරීම 110
8.10. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ කාලය සංශෝධනය 110
8.11. විදේශ පුරවැසියන් සම්බන්ධ ප්‍රතිපාදන 111
8.12. ජනාධිපති අපේක්ෂකයන්ගේ අවම වයස වැඩි කිරීම 111
8.13. විගණන සේවා කොමිසම ස්ථාපනය කිරීම 111
8.14. ජාතික ප්‍රසම්පාදන කොමිසම ස්ථාපනය 112
8.15. විගණකාධිපති බලතල වැඩි කිරීම 113
8.16. අල්ලස් කොමිසමේ බලතල වැඩි කිරීම 114
8.17. මැතිවරණ කොමිසමේ බලතල වැඩි කිරීම 115
8.18. රාජ්‍ය සේවා කොමිසමේ බලතල වැඩි කිරීම 115
8.19. ජාතික පොලිස් කොමිසමේ බලතල වැඩි කිරීම 116
8.20. හදිසි පනත් පිළිබඳ ප්‍රතිපාදන අහෝසි කිරීම 117
8.21. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර පනත් කෙටුම්පත් ප්‍රසිද්ධ කිරීමේ කාලය වැඩි කිරීම 118


## නවවන පරිච්ඡේදය


**19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ක්‍රියාකාරීත්වය 119**

9.1. පාර්ලිමේන්තු මැතිවරණය සහ ජාතික ආණ්ඩුව පිහිටුවීම 119
9.2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවීම 120
9.3. කොමිෂන් සභා සඳහා පත් කිරීම් 123
9.4. නව කොමිෂන් සභා ස්ථාපනය 124
9.5. තොරතුරු අයිතිවාසිකම් පනත සම්මත කිරීම 125
9.6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට අතිරේක බලතල පැවරීම 125
9.7. ජනාධිපති ධුරකාලය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ මතය 127
9.8. ජනාධිපතිට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු පැවරීම් 128
9.9. සම්මත නොකළ 20 වන සංශෝධනය 131
9.10. 19 වන සංශෝධනයට එරෙහි චෝදනා 132
9.11. 19 වන සංශෝධනය සම්මතවීමේ සිට 2019 ජනාධිපතිවරණය දක්වා විශේෂ දේශපාලන තත්ත්වය 135

## දසවන පරිච්ඡේදය

**20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා පෙළගැස්ම 139**

10.1. 2019 ජනාධිපතිවරණය 139
10.2. 2020 පාර්ලිමේන්තු මැතිවරණය 140
10.3. නව රජයේ ප්‍රථම අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය 141
10.4. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව ඇමතීම - 2020 අගෝස්තු 20 141
10.5. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණ 141
10.6. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම 142

## එකොළොස්වන පරිච්ඡේදය

**20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකිරීමට අපේක්ෂා කළ වෙනස්කම් 143**

11.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කර පාර්ලිමේන්තු සභාව පිහිටුවීම 144
11.2. විගනන සේවා කොමිෂන් සභාව අහෝසි කිරීම 144
11.3. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කිරීම 144
11.4. ජනාධිපතිවරයාගේ වගකීම් ඉවත් කිරීම 144
11.5. ද්විත්ව පුරවැසියකුට පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට ඉඩදීම 145
11.6. ද්විත්ව පුරවැසියකුට ජනාධිපතිධූරය දැරීමේ අවස්ථා ලබාදීම 145
11.7. ජනාධිපති මුක්තිය පුළුල් කිරීම 146
11.8. ජනාධිපතිට අමාත්‍යධුර දැරීමට අවස්ථාව ලබාදීම 146
11.9. අමාත්‍ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව පිළිබඳ සීමාව ඉවත් කිරීම 146
11.10. අමාත්‍ය මණ්ඩලය පත් කිරීමේදී ජනාධිපතිවෙත පරම අභිමතයක් හිමිවීම 146
11.11. හදිසි පනත් පිළිබඳ ප්‍රතිපාදන යළි ඇති කිරීම 147
11.12. සාමාන්‍ය පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුව ඉදිරිපත් කිරීමට පෙර ගැසට් පත්‍රයේ පළකළ යුතු කාලය පිළිබඳ ප්‍රතිපාදන සංශෝධනය කිරීම 147

| | | |
|---|---|---|
| 11.13. | පොලිස්පතිවරයා පත් කිරීම පිළිබඳව බලතල ජනාධිපති යටතට ගැනීම | 147 |
| 11.14. | පාර්ලිමේන්තුව විසුරවීම පිළිබඳව ජනධිපතිට ඇති බලතල සංශෝධනය කිරීම | 147 |
| 11.15. | මැතිවරණ කොමිෂන් සභාවේ බලතල අඩු කිරිම | 147 |
| 11.16. | මැතිවරණ කොමිෂන් සභාවට පත්කිරීම් සම්බන්ධව ජනාධිපති අභිමතය පුළුල් කිරීම | 148 |
| 11.17. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම | 148 |
| 11.18. | ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම | 148 |
| 11.19. | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම | 149 |
| 11.20. | විගණකාධිපතිවරයාගේ බලතල අඩු කිරීම | 149 |
| 11.21. | විගණකාධිපති ලෙස සුදුසුකම් ලත් විගණක වරයකු වෙනුවට ඕනෑම අයෙක් පත් කිරීමට ජනාධිපතිට බලය ලැබීම | 149 |
| 11.22. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් ඉවත් කිරීමේ බලය ජනාධිපතිට පැවරීම | 149 |
| 11.23. | අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉවත් කිරීමේ බලය ජනාධිපතිට පැවරීම | 150 |
| 11.24. | ජනාධිපති අපේක්ෂකයකුගේ අවම වයස අවුරුදු 30 දක්වා අඩු කිරීම | 150 |
| 11.25. | පාර්ලිමේන්තුවේදී ප්‍රතික්ෂේප කරන ලද පනත් කෙටුම්පතක් ජනමත විචාරණයක් වෙත යොමුකර සම්මත කරවා ගැනීමේ බලය ජනාධිපතිට පැවරීම | 150 |
| 11.26. | කාරක සභා අවස්ථාවේදී පනත් කෙටුම්පතකට සිදුකරන සංශෝධන සඳහා සීමා පැනවීම | 150 |
| 11.27. | වැඩබලන අගවිනිසුරු සහ වැඩබලන අභියාචනාධිකරණ සභාපති පත් කිරීමේදී ජනාධිපති අභිමතය පුලුල් කිරීම | 151 |
| 11.28 | නිල දිවුරුම සංශෝධනය කිරීම | 151 |
| 11.29. | විසර්ජන පනත් කෙටුම්පත පරාජයට පත්වීමේදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳ විධිවිධාන සංශෝධනය | 152 |
| 11.30. | අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය සම්බන්ධයෙන් වූ සංශෝධනය | 152 |
| 11.31. | අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ ධුරය අවසන් වූ පසු ප්‍රතිපාදන සංශෝධය | 152 |
| 11.32. | විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදන සංක්ෂිප්තය | 153 |

## දොළොස්වන පරිච්ඡේදය

**විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතට එරෙහි විවේචන** **155**

12.1. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එරෙහි වූ කණ්ඩායම් 156
12.2. 20 වන ව්‍යවස්ථා සංශෝධනයට විරෝධය පළකළ ආණ්ඩුවේ දේශපාලන පක්ෂ 156
12.3. විරෝධතාවය පළකළ ආණ්ඩුවට සහයෝගය දැක්වූ කණ්ඩායම් 162
12.4. විරෝධතාවය පළකළ පූජ්‍ය/පූජක පක්ෂය 164
12.5. විරෝධතාවය පළකළ වෘත්තීය සමිති 167
12.6. විරෝධතාවය පළකළ සිවිල් සංවිධාන 169
12.7. 20 වන ව්‍යවස්ථා කෙටුම්පත විවේචනය කළ වෘත්තීය සංවිධාන 172
12.8. විරෝධය පළකළ විපක්ෂයේ දේශපාලන පක්ෂ 174
12.9. විවේචන එල්ල කළ ජාත්‍යන්තර සංවිධාන 175

## දහතුන්වන පරිච්ඡේදය

**විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය** **177**

13.1. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය 178
13.2. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පෙත්සම් විභාගය 178
13.3. ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය 180
13.4. පෙත්සම්කරුවන් සහ ඇතුළත් වූ පෙත්සම්කරුවන් 181

## දාහතරවන පරිච්ඡේදය

**විසිවන සංශෝධනයට එරෙහි විරෝධය හමුවේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ග** **185**

14.1. අගමැතිවරයාගේ කමිටුව 185
14.2. පනත් කෙටුම්පත සංශෝධනය පිළිබඳ කැබිනට් තීරණය 186

14.3. ජනාධිපතිවරයා විසින් සාකච්ඡා ලබාදීම 187
14.4. දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ 189
14.5. අගමැතිවරයාගේ මාධ්‍ය නිවේදනය 189
14.6. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීම 191

## පහළොස්වන පරිච්ඡේදය

**විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වීම 193**

15.1. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ පාර්ලිමේන්තු විවාදය 193
15.2. කෙටුම්පත සඳහා ඡන්ද විමසීම 195
15.3. කෙටුම්පතට පක්ෂව ඡන්දය ලබාදුන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් 197
15.4. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට එරෙහිවූ සහ පසුව පක්ෂව ඡන්දය දුන් මන්ත්‍රීවරුන්ගේ ස්ථාවරයන් 197
15.5. කාරක සභා අවස්ථාවේදී කෙටුම්පතට සිදුකරන ලද සංශෝධන 200
15.6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක්කළ 17/18/19/20 සංශෝධන සියල්ලටම පක්ෂව ඡන්දය දුන් මන්ත්‍රීවරුන් 202

## දහසයවන පරිච්ඡේදය

**20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනස 203**

16.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කර පාර්ලිමේන්තු සභාව ස්ථාපනය කිරීම 203
16.2. විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කිරීම 206
16.3. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කිරීම 206
16.4. ජනාධිපතිට අමාත්‍යධුර දැරීමට ප්‍රතිපාදන සැලසීම 206
16.5. හදිසි පනත් ගෙන ඒමේ ප්‍රතිපාදන යළි ඇතුලත් කිරීම 206
16.6. පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර ප්‍රසිද්ධ කිරීමේ අවම කාලය අඩු කිරීම 207
16.7. කාරක සභා අවස්ථාවේදී සංශෝධනයන් සම්බන්ධ සීමා 207
16.8. පාර්ලිමේන්තුව සම්මත නොකරන පනත් කෙටුම්පත් ජනමත විචාරණයට 208
16.9. ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම 208
16.10. අල්ලස් කොමිසමේ බලතල අඩු කිරීම 209

16.11. ජනාධිපති අපේක්ෂකුගේ අවම වයස සීමාව අඩුකිරීම 209
16.12. විදේශ පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකිකයකුට ජනාධිපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමට තිබූ බාධකය ඉවත් කිරීම 210
16.13. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සම්බන්ධයෙන් ජනාධිපතිගේ බලතල පුළුල් කිරීම 210
16.14. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් ඉවත් කිරීම බලය ජනාධිපතිට පැවරීම 211
16.15. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉවත් කිරීමේ අභිමතය ජනාධිපතිට පැවරීම 211
16.16. මැතිවරණ කොමිසමේ බලතල අඩු කිරීම 211
16.17. ජනාධිපතිගේ වගකීම් අඩු වීම 212
16.18. අමාත්‍යංශ ලේකම්වරුන්ගේ ධුරය අවසන් වූ පසු ප්‍රතිපාදන සංශෝධනය 213
16.19. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් වැඩි කිරීම 213
16.20. අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් වැඩි කිරීම 214
16.21. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පැරණි සහ නව සංශෝධන 214

## දාහත්වන පරිච්ඡේදය

**විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ බලපෑම 217**

17.1. රාජ්‍ය සේවයට සිදුවන බලපෑම 218
17.2. අධිකරණ ක්ෂේත්‍රයට සිදුවන බලපෑම 218
17.3. මානව හිමිකම් ක්ෂේත්‍රයට සිදුවන බලපෑම 219
17.4. රාජ්‍ය විගණනයට සිදුවන බලපෑම 220
17.5. පාර්ලිමේන්තුවේ බලතල සම්බන්ධයෙන් සිදුවන බලපෑම 220
17.6. තොරතුරු දැනගැනීමේ අයිතියට සිදුවන බලපෑම 221
17.7. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලයට සිදුවන බලපෑම 221
17.8. පාර්ලිමේන්තු පනත් මගින් ස්ථාපනය කරන ලද ඇතැම් ස්වාධීන ආයතනවලට සිදුවන බලපෑම 222

## උපග්‍රන්ථය

I. ශ්‍රී ලංකා අමරපුර - රාමඤ්ඤ සාමග්‍රී මහා සංඝ සභාව නිකුත්කළ නිවේදනය 235

II. බුද්ධශාසන කාර්ය සාධක මණ්ඩලය ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය 237

III. හෙළ බොදු සවිය ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය 249

IV. ඇල්ලේ ගුණවංශ හිමියන් ඇතුළු ස්වාමීන් වහන්සේලා ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය 242

V. කතෝලික රදගුරු සම්මේලනය නිකුත් කළ නිවේදනය 247

VI. ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ප්‍රකාශනය 248

VII. ජාතික සංවිධාන එකමුතුව ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය 251

VIII. යුතුකම සංවිධානය අගමැතිවරයා වෙත යොමුකළ ලිපිය 253

IX. ජාතික නිදහස් පෙරමුණ අගමැතිවරයා වෙත යොමුකළ ලිපිය 256

X. පිවිතුරු හෙළ උරුමය ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය 258

XI. ලංකා සම සමාජ පක්ෂය ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය 261

XII. පාර්ලිමේන්තු මන්ත්‍රී විජේදාස විසින් රාජපක්ෂ ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය 262

XIII. පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී දොලවත්ත විසින් ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය 271

XIV. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විශේෂඥ කමිටුවේ වාර්තාව 273

XV. වෘත්තීය සමිති එකතුව විසින් ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය 293

XVI. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මාර්ගගත පෙත්සම 297

XVII. මාධ්‍ය සංවිධාන එකමුතුවේ ඒකාබද්ධ නිවේදනය 299

XVIII. සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරයේ නිවේදනය 301

XIX. ජාත්‍යන්තර නිතීඥ සංවිධාන ඒකාබද්ධ නිවේදනය 303

# හැඳින්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක්කරන ලද 20 වන සංශෝධනය මේ වන විට පාර්ලිමේන්තුව විසින් සම්මත කර කථානායකවරයාගේ අත්සන තැබීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව තුල බලාත්මක වී තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු රටක කරවන මූලික ලියවිල්ලයි. එය සංශෝධනය වීම රටේ සමස්ත නීති පද්ධතියට බලපානු ලබයි.

1978 වසරේදී සම්මත කරන ලද වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන අතරින් වැඩිම කථාබහකට ලක්වූ සංශෝධන වන්නේ 13, 17, 18, 19 සහ 20 වන සංශෝධන වේ. මේ අතරින් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධ කථාබහ මෑත කාලයේ තරමක් යටපත් වූ අතර 17,18,19 සහ 20 පිළිබඳ සංශෝධන පිළිබඳ සාකච්ඡාව කරළියට පැමිණ තිබේ, මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන හතරම එකිනෙක හා සම්බන්ධය,

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වූ මූලික චෝදනාව වූයේ ජනාධිපතිධුරයක් ස්ථාපනය කිරීම මගින් අසීමිත බලයක් එම ජනාධිපතිධුරය වටා සංකේන්ද්‍රණය වන බවයි. එමගින් ව්‍යවස්ථානුකූල ඒකාධිපතියෙක් නිර්මාණය කරන ලද බවට චෝදනා එල්ලවිය. එබැවින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒම පිළිබඳ උත්සාහය සාර්ථක වූ විට 1978 ව්‍යවස්ථාවේ අහිතකර තත්ත්වය සමනය කිරීම සඳහා 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 2001 වසරේදී පාර්ලිමේන්තුවේ කිසිවකුගේ විරෝධතාවක් නොමැතිව සම්මත කරන ලදි. නමුත් 2009 යුද ජයග්‍රහණයත් සමග නැවතත් අධිබලැති ජනාධිපතිධුරයක්

පිළිබඳව බලයේ සිටි දේශපාලනඥයින් ජනතාව තුළ මතයක් ඇති කළ අතර එහි අවසානය වූයේ විපක්ෂයේ විරෝධය හමුවේ 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමයි. එමගින් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකළ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ ආපසු හරවා නැවත ව්‍යවස්ථාපිත ඒකාධිකාරයක් නිර්මාණය කරන ලදි. 2015 වසරේ ජනාධිපති මැතිවරණයේ විපක්ෂයේ ප්‍රමුඛ සටන් පාඨයක් වූයේද විධායක ජනාධිපතිධුරය අහෝසි කරන බවයි. කෙසේ නමුත් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එහා යමින් ජනාධිපතිගේ බලතල අඩුකරන ආකාරයේ සංශෝධනයන් රැසක් 2015 වසරේදී සම්මත වූ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලදි. එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සිදුකරන ලද සංශෝධන අතරින් වැඩිම ඡන්දයකින් සම්මත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය විය. එකී සංශෝධනය සඳහා විරුද්ධ වූයේ එක් මන්ත්‍රීවරයෙකු පමණි. 2019 පමණ වන විට 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව චෝදනා එල්ලවිය. මූලිකම චෝදනාව වූයේ ජනාධිපතිගේ බලතල උපක්‍රමශීලීව අගමැතිවරයා ලබාගෙන ඇති බවත් , ජනාධිපතිට සහ අගමැතිට අමතරව කථානායකද තුන්වන බලකේන්ද්‍රයක් ලෙස නිර්මාණය වී ඇති බවත් මෙම සියලු කරුණු මගින් රට අස්ථාවර වී ඇති බවත්ය, ඒ අනුව 2019 ජනාධිපතිවරණයේදීත් 2020 ජනාධිපතිවරණයේදීත් විපක්ෂයේ ප්‍රධාන සටන් පාඨයක් වූයේ 19 අහෝසි කරන බවයි, 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී 2/3 ක ජනවරමක් ඉල්ලා සිටියේ මෙම සංශෝධනයන් සිදු කිරීම සඳහාය. ඒ අනුව ඡන්ද 156 ක් ලබාගනිමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 2020 ඔක්තෝබර් මාසයේදී සම්මත වන අතර එමගින් නැවත ජනාධිපතිධුරය දැඩි ලෙස ශක්තිමත් විය. එමෙන්ම එමගින් 19 මගින් ස්ථාපනය කරන ලද කොමිෂන් සභා 2ක්ද අහෝසි විය.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද මෙම සංශෝධනයන් පිළිබඳව වඩාත් විමසිලිමත් විග්‍රහයක් සිදු කිරීම මෙම ග්‍රන්ථය මගින් සිදුකරන ලබයි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එල්ලවූ චෝදනා සහ විවේචනවල සිට ඒ සඳහා විවිධ දේශපාලන කණ්ඩායම් විසින් දක්වන ලද ප්‍රතිචාර ජනතාවට ලබාදුන් පොරොන්දු පිළිබඳවත් ඉහත කී සංශෝධනයන්ට මගපාදන ලද ආසන්නතම සමාජ දේශපාලනික සාධක පිළිබඳව මෙන්ම එකී සංශෝධන මගින් සිදුකරන ලද ව්‍යවස්ථාපිත වෙනස්කම් පිළිබඳවද මෙමගින් විග්‍රහයක් සිදුකරනු ලබයි.

මෙම ග්‍රන්ථය මගින් වැඩිම අවධාරණයක් යොමුකරනු ලබන්නේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳවය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකට වැඩිම සමාජ විරෝධයක් මතුවූයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

සංශෝධනය සම්මත කරන අවස්ථාවේදීය. ඒ හැරුණ විට වැඩිම සමාජ විරෝධයක් මතුවූයේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳවය. ඒ සඳහා විරෝධතාවය ආණ්ඩුවේ අමාත්‍යවරුන්ගෙන්ද එල්ල විය. එකී විරෝධතාවය 19 අහෝසි කිරීම පිළිබඳව නොව 20 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ ඇතැම් ප්‍රතිපාදන පිළිබඳවය. ඒ අනුව 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනට විරෝධය දැක්වූ කණ්ඩායම් ඔවුන්ගේ සටහන් පාඨ අනුව කොටස් දෙකකට බෙදිය හැකිය. එක් කණ්ඩායමක් වූයේ 19 වන සංශෝධනය මගින් ස්ථාපනය කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ ස්වාධීන කොමිෂන් සභා 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත්විමට එරෙහිවය. දෙවෙනි කණ්ඩායම 19 ඉවත් කිරීමට පක්ෂවුවත් එහි සඳහන් වූ විගණකාධිපතිගේ බලතල අඩුකිරීම, හදිසි පනත් ප්‍රතිපාදන සහ ද්විත්ව පුරවැසිභාවය පිළිබඳව වූ ප්‍රතිපාදනවලට එරෙහිව සිය විරෝධය දක්වන ලදි. මෙම විරෝධතා දැක්වූවන්ගේ සහ විවේචකයන් විසින් ප්‍රසිද්ධ කරන ලද ලිපි සහ මාධ්‍ය නිවේදන මෙම ග්‍රන්ථයේ උපග්‍රන්ථයක් ලෙස ඇතුළත් කරන්නේ එම විරෝධතා සහ විවේචන වඩාත් හොඳින් තේරුම් ගැනීම සඳහාය.

විශේෂයෙන්ම කොවිඩ්-19 ව්‍යවසන තත්ත්වය යටතේ රටේ ඇතැම් ප්‍රදේශවල සංචරණ සීමා පනවා තිබූ වාතාවරණයක් තුළ මෙන්ම මුළු දිවයිනම ආවරණය වන පරිදී දැඩි නිරෝධානය නියෝග මගින් මහජන එක්රැස්වීම් පාලනය කරන ලද වාතාවරණයක් තුළ මෙම විරෝධතාවය දැක්වීම් සිදුවූ බවද අමතක නොකළ යුතුය.

එසේම 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කිරීමේ ව්‍යවස්ථාපිත කාර්යය පටිපාටිය පිළිබඳව වෙනම පරිච්ඡේදයක් මෙම ග්‍රන්ථයට ඇතුළත් කරන ලද්දේ පාඨකයාගේ අවබෝධය තීව්‍ර කිරීම සඳහාමය.

# දෙවන පරිච්ඡේදය

## 1978 නව ජනරජ ව්‍යවස්ථාව සහ විවේචන

1948 වසරේදී අප නිදහස ලබන විට ක්‍රියාත්මක වූයේ බ්‍රිතාන්‍යයේ බකිංහැම් මාළිගයේ රාජ්‍ය සභා ශාලාවේදී 1946 මැයි 15 දින සම්මත කරන ලද සෝල්බරි ව්‍යවස්ථාව ලෙසින් ප්‍රකට වූ 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජාඥාවය. 1972 ජුනි 22 දින ලාංකික ව්‍යවස්ථාදායකය විසින් සම්පාදනය කරන ලද පළමු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරන ලද අතර එය ජනරජ ව්‍යවස්ථාව ලෙසත් 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලෙසත් ප්‍රකට විය. පසුව 1978 වසරේදී නව ජනරජ ව්‍යවස්ථාව නමින් හදුන්වනු ලබන 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරන ලදි. අද දක්වාම ක්‍රියාත්මක වන්නේ විවිධ සංශෝධනවලට ලක්වූ මෙම නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය පිළිබඳ දේශපාලන පසුබිම සහ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන පිළිබඳව වූ මූලික විවේචන පිළිබඳව හැඳින්වීමක් සිදුකිරීම මෙම පරිච්ඡේදය මගින් සිදු කරනු ලැබේ.

## 2.1. නව ජනරජ ව්‍යවස්ථාවේ පසුබිම

1977 පැවති මැතිවරණයෙන් පාර්ලිමේන්තුවේ 5/6 ක බලයක් (කොට්ඨාශ ක්‍රමයට පැවති මැතිවරණයෙන් ) බලයක් එක්සත් ජාතික පක්ෂයට ලැබිණි. මැතිවරණයෙන් අගමැති ලෙස පත්වූ ජේ.ආර්.ජයවර්ධනගේ අභිලාෂය වූයේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය සමාප්ත කරමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් ජනාධිපති ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කිරීමයි.

1977 ජූලි පාර්ලිමේන්තු මැතිවරණය සඳහා එක්සත් ජාතික පක්ෂය විසින් ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රකාශනයේ 11 වන පිටුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනුවෙන් පරිච්ඡේදයක් ඇතුළත් කර තිබූ අතර එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි අන්තර්ගත කිරීමට අපේක්ෂිත මූලික ලක්ෂණ මෙසේ සඳහන් කර තිබුණි.

"ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයක පරමාර්ථ ඉඳුරා සපුරාලන ජනරජ පනතක්, ආණ්ඩුක්‍රම පනතක් සම්පාදනය කරන්නටත්, සම්මත කරන්නනටත් ක්‍රියාත්මක කරන්නටත් අපි ජනතාවගේ වරම පතමු. ආගම, භාෂාව, ජනතාවගේ මූලික මානුෂික අයිතිවාසිකම් වරප්‍රසාද හා නිදහස තහවුරු කිරීම. අධිකරණයේ හා පුවත්පත් ස්වාධිනත්වය යළි ඇතිවන පරිද්දෙන් දේශපාලන බලපෑම් හා ඇඟිලි ගැසීම් පිටුදැකීම ආදී වශයෙන් 1975 හේ පක්ෂ මහා සම්මේලනයේදී සම්මත කරගන්නා ලද ප්‍රතිපත්ති නව ආණ්ඩුක්‍රම පනතට ඇතුළු කරන්නෙමු. මහා ජාතියේ වේවා සුළු ජාතියක වේවා, ජාතිය, ආගම, කුලය ආදී කිසිම බාධකයක් නොමැතිව සෑම රටවැසියකුටම සමාන හා මූලික මිනිස් අයිතිවාසිකම් හා අවස්ථා සලසා සපුරා දෙන බව නව ජනරජ පනතින් සහතික කරමු. සිංහල භාෂාව භාවිත නොකරන්නවුන් පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කිරීම අරමුණු කොට කැඳවනු ලබන සර්වපාක්ෂික මහා සම්මේලනයක තීරණ නව ආණ්ඩුක්‍රම පනතට ඇතුළු කරන්නෙමු.

විධායක බලය කලින් කල ජනතා ඡන්දයෙන් තෝරාපත් කරනු ලබන ජනාධිපතිවරයකු වෙත පවරනු ලැබේ. මැතිවරණ අතරතුර ඇතිවන කාල පරිච්ඡේදවලදී මනා ස්ථාවරභාවයක් මෙයින් සහතික කෙරේ. අපට හුරු පුරුදු වූ පාර්ලිමේන්තු සම්ප්‍රදාය මේ නව ජනරජ පනතින්ද ආරක්ෂා කෙරෙන අතර පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් ලබන පක්ෂයෙන් අගමැතිවරයා ජනාධිපති විසින් තෝරා ගනු ලබයි. අමාත්‍ය මණ්ඩලයේ අමතිවරුද පාර්ලිමේන්තුවට තේරු පත්වූ මන්ත්‍රීන් අතුරින්ම තෝරා ගනු ලබති".

මේ අනුව එක්සත් ජාතික පක්ෂය ජනතාවගෙන් බලය ඉල්ලා සිටියේ ජනාධිපති ආණ්ඩුක්‍රමයක් බිහිකිරීම සඳහා බව පෙනී යයි.
මැතිවරණයෙන් මාස 2කට පමණ පසුව ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සහ කම්ටුව වෙනස්කළ යුතුයැයි සලකන වෙනත් ලිඛිත නීති සංශෝධන සලකා බැලීම සඳහා, තේරීම් කාරක සභාවක් පත් කරන ලදි. 1977 නොවැම්බර් 3 වන දින කථානායකවරයා විසින් පත් කළ එකී කාරක සභාවේ සාමාජිකයින් වූයේ

- ජේ.ආර්.ජයවර්ධන(එජාප)-සභාපති
- ආර්.ප්‍රේමදාස(එජාප)

- ලලිත් ඇතුලත්මුදලි(එජාප)
- ගාමිණි දිසානායක(එජාප)
- රොනී ද මැල්(එජාප)
- කේ.ඩබ්ලිව්.දේවනායගම්(එජාප)
- එම්.එච්.එම්.නයිනමරික්කාර්(එජාප)
- සිරිමාවෝ බණ්ඩාරණායක(ශ්‍රීලනිප)
- මෛත්‍රීපාල සේනානායක(ශ්‍රීලනිප)
- එස්.තොණ්ඩමාන් (ලංකා කම්කරු කොංග්‍රසය) යන මන්ත්‍රීවරුන්ය

( පිටුව 98- ජේ ආර් ජයර්ධන චරිතප්‍රදානය-සිව්වෙනි වෙළුම)

ජේ.ආර්.ජයවර්ධන 1978 පෙබරවාරි 04 වන දින විධායක ජනාධිපති ලෙස දිවුරුම් දීමෙන් අනතුරුව මෙම තේරීම් කාරක සභාවෙන් ඉවත් වූ අතර ආර්.ප්‍රේමදාස කාරක සභාවේ සභාපති ලෙස පත්විය. (ජේ. ආර්. ජයවර්ධන පළමු වරට විධායක ජනාධිපති වන්නේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද දෙවන සංශෝධනය මගිනි)

ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ මෙම කමිටුවේ සේවය කිරීම ප්‍රතික්ෂේප කළේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම අහෝසි කර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට විරෝධය පා සිය මන්ත්‍රිවරුන් දෙදෙනා පසුව ඉවත් කරගත්තේය. ඒ අනුව එම පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ප්‍රධානම පක්ෂ දෙක වූ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක කමිටුවෙන් ඉවත් වූ අතර විපක්ෂ මන්ත්‍රිවරයකු වූ එස්.තොණඩමාන් පමණක් ව්‍යවස්ථා සම්පාදක සභාව නියෝජනය කරන ලදි. පසුව ඔහුටද අමාත්‍යධුරයක් ලබාදීම නිසා ව්‍යවස්ථා සම්පාදක කමිටුව සම්පූර්ණයෙන්ම ආණ්ඩුවේ සාමාජිකයින්ගෙන් පමණක් සමන්විත කමිටුවක් බවට පත්විය. මේ නිසා 1978 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එය කෙටුම්පත් කරන අවස්ථාවේ සිට විරෝධය එල්ලවිය.

මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ විවාදයේදී 1978 අගෝස්තු 3 වන දින එවකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව වූ සිරිමාවෝ බණ්ඩාරණායක විසින් සිදුකරන ලද පහත සඳහන් ප්‍රකාශය මගින් මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විපක්ෂයේ වූ විරෝධය තේරුම්ගත හැකිය.

"මා විසින් එදා විස්තර කළ ඒකාධිපති මාර්ගයේ අවසානය කරා පැමිණීමට මේ රජයට සහ මේ සභාවට ගතවූයේ යම්තම් දස මාසයකි. තව දින කීපයකින් හෝ

සමහර විට තව පැය කීපයකින් වුවත් නිදහසේ අන්තිම පහන් සිළුව නිවී යෑමට ඉඩ ඇත. ගතවූ මාස කිහිපය තුළ සිදුවීම් හිට්ලර් බලයට පැමිණීමට කලින් තිබුණු ජර්මන් ජනරජයේ අවසාන කාලය සිහිකරවනසුළු ය. හිට්ලර් කළේ වයිමා ජනරජ ව්‍යවස්ථාව උපයෝගී කර ගනිමින් මුළු ව්‍යවස්ථානුකූල රාජ්‍ය ක්‍රමය විනාශ කර දැමීමයි. ප්‍රථමයෙන් හිට්ලර්ද කළේ ජනාධිපති ගේ සහ කැබිනට් මණ්ඩලයේ නායකයා වූ චාන්සලර්ගේ සියලුම විධායක බලතල තමාටම පවරා ගැනීමයි. අනතුරුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනයක් මගින් එතෙක් ජනසම්මතවාදී සමූහ ආණ්ඩුවක් වශයෙන් පැවැති රජය ඒකාධිපති රජයක් බවට පරිවර්තනය කර තමාම එහි ආඥාදායකයා බවට පත්වීමයි. හිට්ලර් ඊට කලින් පැවැති මහජන මතය විමසීමේදී තමා ලත් අතිවිශාල මහජන වරම පාවිච්චි කළේ වයිමා ජනරජ ව්‍යවස්ථාවේ ප්‍රජාතාන්ත්‍රික අංශ සියල්ල අනුක්‍රමයෙන් අහෝසි කිරීම සඳහාය. අන්තිමේ දී ජර්මනියේ ඉතිරි වූ එකම දේශපාලන තන්ත්‍රය ඒක පුද්ගල ආඥාදායකත්වයක් පමණකි. එම තත්ත්වය හමුවේ උදාසීනව සිටීමේ අති භයානක ප්‍රතිඵලය ජර්මනිය පමණක් නොව මුළු මහත් ලෝකයම වින්දා.” (ලියන ආරච්චි, 2017:90)

## 2.2. 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්‍ෂණ

මෙම ව්‍යවස්ථාවේ දක්නට ලැබුණ මූලිකම ලක්‍ෂණය වූයේ පැවති පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය වෙනුවට ජනාධිපති ආණ්ඩුක්‍රමයක් හඳුන්වාදීමය. ඒ අනුව රාජ්‍යයේ ප්‍රධානියාද කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියාද සන්නද්ධ සේවාවල ප්‍රධානියාද වන්නේ ජනාධිපතිය. ජනාධිපති මැතිවරණයක් මගින් වසර 6ක කාලයක් සඳහා ජනතාව විසින් ඍජු ඡන්දයෙන් ජනාධිපතිව තෝරාගපත් කරගනු ලබයි.

අගමැතිවරයා පත් කිරීම කැබිනට් මණ්ඩලය පත් කිරීම අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරු පත් කිරීම. නීතිපති, විගණකාධිපති, ඔම්බුඩ්ස්මන්, පාර්ලිමේන්තුවේ මහලේකම් පත් කිරීම, විදේශ දූතමණ්ඩල පත් කිරීම යනාදියට ජනාධිපතිට බලතල ඇත. එසේම අධිකරණ සේවා කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා සාමාජිකයින් පත් කිරීමටද ජනාධිපතිට බලතල පැවරිණි. එසේම සියලුම අමාත්‍යංශ සඳහා ලේකම්වරු පත් කිරීමේ බලය සතු වන්නේද ජනාධිපතිටය. දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීමේ බලය පැවරුණු කැබිනට් මණ්ඩලයේ ප්‍රධානයා වන්නේද ජනාධිපතිවරයාය. ජනාධිපතිවරයාට ඔහු සිදුකරන කාර්ය සම්බන්ධයෙන් සිවිල් හෝ අපරාධ නඩු පැවරීමේ හැකියාවක්ද නොවීය. අධිකරණයෙන් වැරදිකරුවන් වූ පුද්ගලයන්ට සමාව දීමේ බලයද ජනාධිපතිවරයා සතුවිය. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලයද ජනාධිපති

සතුවිය. හදිසි නීතිය පැනවීමේ බලයද ජනාධිපති සතුවිය. මේ නිසා ජනාධිපතිවරයා අධිකරණය සහ ව්‍යවස්ථාදායකය අබිබවා නැගී සිටියේය.

මේ හැරුණ විට සොල්බරි ව්‍යවස්ථාව ( 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජාඥාව ) මගින් ස්ථාපනය කරන ලද සහ 1972 ව්‍යවස්ථාව මගින් අහෝසි කරන ලද අධිකරණ සේවා කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව නැවත පිහිටුවීමද නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අංගයක් විය.
එතෙක් පැවති කොට්ඨාශ මැතිවරණ ක්‍රමය වෙනුවට සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීමද මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සිදුවිය.

එසේම බලගැන්විය හැකි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් හඳුන්වා දීමද මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂ ලක්ෂණයක් විය.

ජාතික භාෂාව ලෙස (රාජ්‍ය භාෂාව ලෙස නොවේ) සිංහල සහ දෙමළ භාෂා දෙකම පිළිගැනීමද මෙම ව්‍යවස්ථාව මගින් සිදුවිය.

පසුව සිදුකරන ලද සංශෝධන මගින් විවිධ වෙනස්කම්වලට ලක්වුවද 1978 වසරේදී සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉහත සදහන් අංග අන්තර්ගත විය.

## 2.3. නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එල්ලවූ විවේචන

මෙම ව්‍යවස්ථාවට එල්ල වූ මූලිකම විරෝධතාව වන්නේ සියලු බලතල ජනාධිපතිවරයා වටා කේන්ද්‍රගත වීමයි. පාර්ලිමේන්තුව අඩු බලයක් සහිත ආයතනයක් බවට පත්විය. ව්‍යවස්ථාවේ ජනාධිපති ධුරය පිළිබඳව අදහස් දක්වන ආචාර්ය එන්. එම්. පෙරේරා පවසන්නේ " ජනාධිපති ක්‍රමය නිසා රාජ්‍ය බලයයේ උත්තරීතර ආයතනය ද්වීකරණය වීමේ හේතුවෙන් නව ව්‍යවස්ථාව අවුල් සහගත තත්ත්වයකට පත්වී තිබේ. ජාතික රාජ්‍ය සභාව තවදුරටත් රාජ්‍ය බලයේ උත්තරීතර ආයතනය නොවන්නේය. එම බලය ද්වීත්වකරණය වී ඇත. ජනතාව විසින් කෙළින්ම තෝරාපත් කරගනු ලබන ජනාධිපතිවරයකු වන බැවින්, ඔහු ජනතාවගේ පරමාධිපත්‍යයේ ආයතනයක්ද වන්නේය. එම නිසා උත්තරීතර ආයතනය වන ව්‍යවස්ථාදායක මණ්ඩලය තුළ හකුළුවා ඇති බලතල සමාන්තර වශයෙන් හෝ පංගුකාර වශයෙන් ජනාධිපතිවරයාද භුක්ති විදියි (පෙරේරා,1996:26).

අමාත්‍යවරුන් සහ රාජ්‍ය නිලධාරීන් කොමිෂන් සභා සාමාජිකයින් පත් කිරීමට තිබූ බලතල නිසාම රාජ්‍ය සේවය අධිකරණය සහ පොලිසිය දැඩි ලෙස දේශපාලනීකරණය වූ බවටද චෝදනා එල්ලවිය.

එසේම රාජ්‍ය භාෂාවක් ලෙස සිංහල භාෂාව පමණක් ඇතුලත් කිරීමද මෙම ව්‍යවස්ථාවට එරෙහිව එල්ල වූ තවත් චෝදනාවකි.

එසේම පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක්කරන ඇතැම් සංශෝධන මගින් ජනාධිපතිගේ බලතල තවත් වැඩිකර ගන්නා ලදි.

## 2.4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් ජනාධිපති ධුරය තවදුරටත් ශක්තිමත් කිරීම

විධායක බලතල සම්බන්ධයෙන් සිදුකරන ලද මුල්ම සංශෝධනය වූයේ 1982 අගෝස්තු 27 වන දින කථානායකගේ සහතිකය සටහන් කරන ලද, තුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි. එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාව සංශෝධනය කළේය. මුල් ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරණයක් පැවැත්වෙන්නේ බලයේ සිටින ජනාධිපතිවරයාගේ සය අවුරුදු ධුරකාලය ඉකුත්වීමට මාස දෙකත් මාසයත් අතර කාලයකදීය. නමුත් මෙම සංශෝධනය මගින් බලයේ ජනාධිපතිවරයාට තමාව දෙවනවර පත්කර ගැනීම සඳහා ජනාධිපතිවරණයක් පැවැත්වීම සඳහා වසර 4කට පසුව ප්‍රකාශයක් කළ හැකි ලෙස සංශෝධනය විය. ඒ අනුව බලයේ සිටින ජනාධිපතිවරයාට සිය දෙවන ධුරකාලය පිළිබඳ මැතිවරණය තමන්ට වාසිදායක වන අවස්ථාවක පැවැත්වීමට ඉඩකඩ හිමිකර ගත හැකිය. ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිවරයා පමණක් නොව චන්ද්‍රිකා බණ්ඩාරණායක ජනාධිපතිවරිය සහ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාද මෙම ප්‍රතිපාදනයෙන් ප්‍රයෝජන ගත්බව මැතිවරණ ඉතිහාසයෙන් පැහැදිලි වෙයි.

ආණ්ඩක්‍රම ව්‍යවස්ථාවට අනුව එතෙක් පැවති පාර්ලිමේන්තුව කලින් විසුරුවා නොහරින්නේ නම් 1977 පෙබරවාරි 04 වනදා සිට වසර 6ක් පමණක් පවතියි. ඉන්පසුව පාර්ලිමේන්තු මහ මැතිවරණයක් පැවැත්විය යුතුය.( සංශෝධන රහිත 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 161 ව්‍යවස්ථාව ) 1982 දෙසැම්බර් 23 වන දින කථානායකගේ සහතිකය සටහන් කරන ලද හතරවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම තත්ත්වය වෙනස්කරමින් 1982 ඔක්තෝබර් 20 වනදින පවත්වන ලද ජනමත විචාරණයේ ප්‍රතිඵල මත 1989 අගෝස්තු මස 4 වන දිනතෙක් තවත් වසර 6ක් සඳහා පාර්ලිමේන්තු දීර්ඝ කිරීම සිදු කරන ලදි. එමගින්

1977 වසරේදී කොට්ඨාශ ක්‍රමය ඔස්සේ ලබාගත් 3/5ක බලය 1989 වසර දක්වා පවත්වා ගැනීමට ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිවරයා සමත් විය.

එමෙන්ම 1984 මාර්තු 6 වන දින කථානායකගේ සහතිකය සටහන් කරන ලද අටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ බලතල හා කාර්ය දැක්වෙන 33 වන ව්‍යවස්ථාව සංශෝධනය කරමින් "නීතිඥ වෘත්තියේ විශිෂ්ඨත්වයට පත්ව ඇත්තාවූද අවංකභාවයෙහි උත්කෘෂ්ඨ තත්ත්වයක් පවත්වාගෙන ඇත්තාවූද නීතිඥවරයන්" ජනාධිපති නීතිඥවරුන් ලෙස පත්කිරීමේ බලතලද ජනාධිපතිවරයාට අලුතින් ලබාදී ඇත.

එමෙන්ම 1986 අගෝස්තු 6 වන දිනකථානායකගේ සහතිකය සටහන් කරන ලද දහවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විධායක ජනාධිපතිවරයාට වඩාත් තීරණාත්මක බලතල ලබාදීමක් සිදුකරන ලදි. එතෙක් පැවති ප්‍රතිපාදන අනුව මහජන ආරක්ෂක පනත යටතේ ජනාධිපතිතුමන් විසින් හදිසි අවස්ථාව පැනවීම පිළිබඳ ප්‍රකාශයක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුතු අතර මුල් ව්‍යවස්ථාවේ 155(8) ව්‍යවස්ථාවට අනුව මාස 6කට වඩා වැඩි කාලයක් හදිසි නීතිය රටතුළ පැනවෙමින් පැවතිය හොත් නැවතත් හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීමේ ජනාධිපතිවරයාගේ ප්‍රකාශය පාර්ලිමේන්තුවේ 2/3 බහුතරයකින් සම්මත විය යුතුය. එසේම 155(9) ව්‍යවස්ථාවෙන් දක්වා තිබුණේ එවැනි ආකාරයට සම්මත නොවූ ප්‍රකාශයක් නැවත දින 90ක් ඇතුළත පාර්ලිමේන්තුවට ගෙන එන්නේ නම් එම යෝජනාවද පාර්ලිමේන්තුවේ 2/3 ක බහුතරයකින් සම්මත කර ගත යුතු බවයි. ඒ අනුව ජනාධිපතිවරයාගේ ප්‍රකාශ මගින් මාස හයකට වඩා අඛණ්ඩව හදිසි අවස්ථාව පවත්වාගෙන යන්නේ නම් ඒ සඳහා පාර්ලිමේන්තුවේ සරල බහුතරයක් නොව විශේෂ බහුතරයක් අවශ්‍ය වන බවයි. එසේ විශේෂ බහුතරයක් නොමැති අවස්ථාවකදී හදිසි අවස්ථාව දින 90කින් ඉවත්වන බව මෙම ව්‍යවස්ථා දෙක එක්ව කියවන කල පැහැදිලි වේ. දහවන සංශෝධනය මගින් මෙම 155(8) හා 155(9) යන ව්‍යවස්ථා ඉවත් කිරීමක් සිදු විය. එහි ප්‍රතිඵලය වන්නේ හදිසි නීතිය ප්‍රකාශයට පත්කිරීමේ ප්‍රකාශන කැමති ගණනක් මාසිකව දිගින් දිගටම පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත කරවාගැනීමට ජනාධිපතිවරයා ඉඩකඩ ලැබීමයි. 1977 වසරෙන් පසුව පවත්වන ලද කිසිදු මැතිවරණයකදී කිසිදු තනි පක්ෂයකට 2/3ක බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් ලබාගත නොහැකි විය. ඒ අනුව 1978 ව්‍යවස්ථාව යටතේ එක් පක්ෂයකට 2/3 ක මන්ත්‍රී සංඛ්‍යවක් ලැබී තිබුණේ 1989 මැතිවරණය දක්වා පමණි. එනමුත් 1983 වසරේ සිට 2010 වසර දක්වා වැඩි කලක් පුරවැසියන් ජීවත් වූයේ හදිසි නීති තත්ත්වයක් තුළය. පාර්ලිමේන්තුව 2/3ක සහයක් නොමැතිව ජනාධිපතිට එසේ අඛණ්ඩව හදිසි නීති පවත්වාගෙන යාමට හැකියාව ලැබුණේ මෙම දහවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සහයෙනි.

## 2.5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සදහා කඩුවුණ පොරොන්දු

මේ අනුව 1990 පමණ වන විට ජනාධිපති ධුරය 1978 වසරේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපනය කරන ලද ජනාධිපතිට වඩා වැඩි බලතල සහිත ජනාධිපති ධූරයක් නිර්මාණය වී තිබිණි. එසේම එම කාලයේ ජනාධිපතිවරුන් විධායක බලතල භාවිතා කිරීම අනුවද, දේශපාලන පක්ෂ තුළ මෙන්ම ජනතාව තුළද විධායක ජනාධිපති ධුරය සම්බන්ධයෙන් විරෝධයක් ගොඩනැගෙමින් පැවතිණ.

1978 වසරෙන් පසුව පැවති පළමු පාර්ලිමේන්තු මැතිවරණය වු 1989 පාර්ලිමේන්තු මැතිවරණයෙන්ද ජයග්‍රහණය කරන ලද්දේ 1978 ව්‍යවස්ථාව සම්පාදනය කරන ලද එක්සත් ජාතික පක්ෂයම වීම නිසා මෙම සංශෝධන පිළිබඳව ආණ්ඩුව කිසිදු පියවරක් ගත්තේ නැත.

නමත් 1978 ව්‍යවස්ථාව යටතේ පැවැත් වූ දෙවන පාර්ලිමේන්තු මැතිවරණය පැවැති 1993 වර්ෂය වන විට මේ පිළිබඳව සමාජය තුළ පුළුල් සාකච්ඡා සහ බලපෑම් ඇතිව තිබූ අතර ප්‍රධාන විපක්ෂ කණ්ඩායම වූ පොදු පෙරමුණු කණ්ඩායමේ ප්‍රධාන සටන් පාඨයක් වූයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන එන බවය.

විධායක ජනාධිපතිධුරය අවසන් කිරීමේ පොරොන්දුව වඩා ආකර්ෂණීය ඡන්ද පොරොන්දුවක් විය. එම ආකර්ෂණීය මැතිවරණ පොරොන්දුව මත ජනාධිපතිධුරය ලබාගත් චන්ද්‍රිකා බණ්ඩාරණායක ජනාධිපති ධුරයට පත්වීමෙන් පසුවද ඇය විසින් දිගින් දිගටම ජනාධිපතිධුරයේ බලතල දැඩිව ක්‍රියාත්මක කරන ලදි.

මේ වන විට ජනාධිපති ධුරයේ දැඩි විධායක බලය පිළිබඳව මෙන්ම මැතිවරණ, රාජ්‍ය සේවය, අධිකරණය සහ පොලිසිය දැඩි ලෙස දේශපාලනීකරණය වීම පිළිබඳව සමාජය තුළ දැඩි මතයක් ස්ථාපනය වී තිබිනි.

ඒ අනුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හෝ අඩුම තරමින් ජනාධිපතිගේ විධායක බලතල අඩු කිරීම. රාජ්‍ය සේවය ස්වාධීන කිරීම, අධිකරණය ස්වාධීන කිරීම, පොලිසිය ස්වාධීන කිරීම සහ පොලිසිය ස්වාධීන කිරීම සදහා වන ප්‍රතිපාදන ඇතුළත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් පිළිබඳව සාකච්ඡා ආරම්භ වී තිබිණි.

වර්ෂ 2000 පමණ වන විට මැතිවරණ ක්‍රමය සහ විශේෂයෙන් මනාප ක්‍රමය පිළිබඳව සමාජය තුළ දැඩි පිළිකුලක් නිර්මාණය වී තිබිණ. 1999 වර්ෂයේ වයඹ පළාත් සභා මැතිවරණයේදී සිදු වූ මැතිවරණ දූෂණ සහ ප්‍රචණ්ඩ ක්‍රියාද මේ සඳහා උත්තේජක සපයන ලදි.

මීළඟට ජනාධිපතිධුරයට පත්වන මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාද බලයට පැමිණෙන්නේ විධායක ජනාධිපතිධුරය අහෝසි කරන පොරොන්දුව මතය. විශේෂයෙන්ම 2005 වසරේදී මහින්ද රාජපක්ෂ ජනාධිපති අපේක්ෂකයාට සක්‍රිය සහයක් ලබාදුන් ජනතා විමුක්ති පෙරමුණ සමග ඇති කරගන්නා ලද ගිවිසුමේ 07 ජේදයේ දැක්වූයේ 6වන ජනාධිපතිධුර කාලය තුළ විධායක ජනාධිපතිධුරය අහෝසිකරන බවය.
(https://www.bbc.com/sinhala/news/story/2005/09/printable/050905_jvp_points 2020/11/29 )

ඉහත විස්තර අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය මුළුමනින්ම පාහේ එක්සත් ජාතික පක්ෂයේ අවශ්‍යතාව මත සිදුවූ අතර ප්‍රධාන විපක්ෂ කණ්ඩායම් දෙකම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියෙන් බැහැර වන ලදි. ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වූ මූලික විවේචනය වූයේ පාර්ලිමේන්තුව හැල්ලුවට ලක්වන පරිදි ස්ථාපනය කරන ලද ජනාධිපතිධුරය වටා එක්රැස්වී තිබූ අධික බලයයි. 1978ට පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කරන ලද ඇතැම් සංශෝධන මගින් මෙම තත්ත්වය තවදුරටත් තීව්‍ර කරන ලදි. එසේම එය ක්‍රියාවට නැගීමේදී රාජ්‍ය සේවය අධිකරණය සහ පොලිසිය දේශපාලනීකරණය වීම මෙන්ම මැතිවරණ නිදහස් සහ සාධාරණ නොවීම පිළිබඳව මහජනතාව තුළ අසතුටක් වර්ධනය විය.

# තුන්වන පරිච්ඡේදය

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කරනු ලබන්නේ පාර්ලිමේන්තුව විසිනි. ඒ අනුව පනත් සම්මත කිරීම සහ සංශෝධනය මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයද පාර්ලිමේන්තුවේ ප්‍රමුඛ කාර්යයකි. ඒ සඳහා වන පනත් කෙටුම්පත් රජයට මෙන්ම පෞද්ගලික මන්ත්‍රිවරුන්ටද ගෙන ආ හැකිය. ස්ථාවර නියෝගවලට අනුව පෞද්ගලික මන්ත්‍රීවරුන් ලෙස සලකනු ලබන්නේ කථානායක, නියෝජ්‍ය කථානායක, නියෝජ්‍ය කාරක සභා සභාපති, අග්‍රාමාත්‍ය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍ය, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍ය, නියෝජ්‍ය අමාත්‍ය, පාර්ලිමේන්තුවේ සභානායක, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායක, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක සහ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක යනාදී ධුර දරන මන්ත්‍රීවරයකු නොවන මන්ත්‍රිවරයකු වේ (ස්ථාවර නියෝග 24(3) රජයේ පනත් කෙටුම්පත් වර්ග 3කට ලක් කල හැකිය. එනම් සාමාන්‍ය පනත් කෙටුම්පත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත් සහ විසර්ජන පනත් කෙටුම්පත් වශයෙනි.

පෞද්ගලික මන්ත්‍රීවරුන්ටද සාමාන්‍ය පනත් කෙටුම්පත් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ හැකියාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ස්ථාවර නියෝග අනුව ඇත. පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත් ගෙන ආ අවස්ථා ලෙස කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රි විජයදාස රාජපක්ෂ විසින් 2012 ජුනි මස 08 වන දින ගැසට් පත්‍රයේ අතිරේකයක් ලෙස පළකරන ලද 19 වන ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත(ආගමික පූජකවරයකු වීම මැතිවරණයකට ඉදිරිපත්වීමට නුසුදුසුකමක් බවට පත් කිරීම),ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමි විසින් 2013 මැයි මස 31 වන දින ගැසට් පත්‍රයේ අතිරේකයක් ලෙස පළකරන ලද 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත (පළාත් සභා පිළිබඳ ප්‍රතිපාදන අහෝසි කිරීම සඳහා වූ සංශෝධන), සහ 2018 සැප්තැම්බර් මස 05 වන දින ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත (විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීම පිළිබඳ ප්‍රතිපාදන ඇතුළත්) දැක්විය හැකිය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල පවතින ප්‍රතිපාදන පිළිබඳව විස්තරයක් කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සම්බන්ධව පාර්ලිමේන්තුවට පවතින සීමා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් සම්මත කිරීම සහ සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය, එහිදී ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ නීතිපතිගේ කාර්යභාරය. පිළිබඳව විශේෂයෙන්ම සාකච්ඡා කරනු ලබයි.

## 3.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම පිළිබඳ මූලික නීතිමය ප්‍රතිපාදන ඇතුළත් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIIවැනි පරිච්ඡේදය තුළය. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරිම හෝ පරිච්ඡින්න කිරීම පිළිබඳව ප්‍රතිපාදන මෙම පරිච්ඡේදයේ ඇතුළත් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේදී එම කෙටුම්පත මගින් සංශෝධනය කිරීමට අපේක්ෂා කරන ආනුශංගික සංශෝධන එම කෙටුම්පතේ පැහැදිලිව සඳහන් විය යුතුය. එසේම එම කෙටුම්පතේ දීර්ඝ නාමයෙන් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ කෙටුම්පතක් බවට සඳහන් කළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82වන ව්‍යවස්ථාවේ සඳහන් වේ.

එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කර වෙනත් (නව) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රතියෝජනය කරන විධිවිධාන ඇතුළත් වන පනත් කෙටුම්පතක් නම් ඒ බව එහි දීර්ඝ නාමයෙන් සඳහන් කළ යුතුය.

එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කර වෙනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ එහි යම් කොටසක හෝ ක්‍රියාකාරිත්වය අත්හිටුවන්නා වූ නීතියක් පැනවීමට පාර්ලිමේන්තුවට බලයක් නොමැති බවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කරන්නා වූ නීතියෙන්ම ඒ වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පනවනු

ලබන්නේ නම් මිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුළුමනින්ම පරිච්ඡින්න කරන්නා වූ නීතියක් පැනවීම පාර්ලිමේන්තුව විසින් නොකළ යුතු බවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන ව්‍යවස්ථාව දක්වා සිටියි.

## 3.2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

සෑම පනත් කෙටුම්පතක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව එකී පනත් කෙටුම්පතෙහි අන්තර්ගත කරුණු අනුව එය විශේෂ බහුතරයකින් සම්මත විය යුතුද, යන්න පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා නීතිපතිවරයා වෙත යොමුකළ යුතුය.

රජය පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය. කැබිනට් මණ්ඩලය එකී පනත් කෙටුම්පත සඳහා අනුමැතිය ලබාදීමෙන් පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවම වශයෙන් දින හතකට පෙර ගැසට් පත්‍රයේ පළකළ යුතුය. පෞද්ගලික පනත් කෙටුම්පත්ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සතියකට පෙර ගැසට් පත්‍රයේ පළකළ යුතුය(විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78(1) ව්‍යවස්ථාව).

එසේම එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පළාත් සභා ලැයිස්තුවට අදාළ කරුණක් සම්බන්ධයෙන් සංශෝධනයක් ඇතුළත් වන්නේ නම් එම කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට පෙර ජනාධිපති විසින් පළාත් සභාවල අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. ( ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ(3) වන ව්‍යවස්ථාව)

## 3.3. හදිසි පනත් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගෙන ආ නොහැකි බව

2001 වර්ෂයේදී 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ 2010 වර්ෂයේදී 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද්දේ හදිසි පනත් ගෙන ඒම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 වන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන භාවිත කරමිනි.

එකී හදිසි පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රතිපාදන 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අහෝසි කරන ලද අතර පසුව විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හදිසි පනත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රතිපාදන සංශෝධවලට ලක්කරමින් නැවත හඳුන්වා දෙන ලදි. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122(3) ව්‍යවස්ථාවට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳව පනත් කෙටුම්පත් මෙම හදිසි ක්‍රමවේදය භාවිත කරමින් පාර්ලිමේන්තුවට ගෙන ආ නොහැකි බව විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122(3) ව්‍යවස්ථාවේ මෙසේ දැක්වේ. "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් විධිවිධානයක් සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම සහ ප්‍රතියෝජනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම පිණිස වූ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම සහ ප්‍රතියෝජනය කිරීම පිණිස වූ යම් පනත්කෙටුම්පතකට මේ ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවිය යුත්තේය".

## 3.4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් සම්බන්ධ පාර්ලිමේන්තුවේ ක්‍රියාවලිය

### පළමුවර කියවීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුට ඉදිරිපත් කරන අවස්ථාව පළමුවර කියවීම ලෙස හඳුන්වනු ලැබේ. සාමාන්‍යයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන්නේ අගමැති විසිනි. නමුත් එය නීතියක් නොව සම්ප්‍රදායකි. 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත ඉදිරිපත් කරන ලද්දේ අධිකරණ අමාත්‍යවරයා විසිනි. එදින අදාළ ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව මූලික හැඳින්වීමක් පමණක් සිදුකරයි. ඉන් පසුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 50(2) අනුව එය මුද්‍රණය කළ යුතු යැයි කථානායක විසින් නියෝග කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ දින සිට දින 7ක් තුළ එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලතාව පිළිබඳ අභියෝග කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීමට ඕනෑම පුරවැසියකුට ඇත. එවන් අවස්ථාවකදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සති තුනක් තුළ සිය තීරණය කථානායක වෙත දන්වා යැවිය යුතුය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායක විසින් පාර්ලිමේන්තුවට දැනුම්දෙනු ලබන අතර එය එදින හැන්සාඩ් වාර්තාවට ඇතුළු කරනු ලැබේ.

## දෙවන වර කියවීම

පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට පළමුවරට ඉදිරිපත් කිරීමෙන් අවම වශයෙන් සතියකට පසුව එකී පනත් කෙටුම්පත දෙවනවර කියවීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ. නමුත් පනත් කෙටුම්පත පළමුවර කියවීමෙන් පසුව ඒ පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කරමින් යම් පුරවැසියකු ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කර තිබේ නම් ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායක වෙත ලැබෙන තුරු දෙවනවර කියවීම සිදුකළ නොහැකිය.

## දෙවෙනි වර කියවීම පිළිබඳ විවාදය

පනත් කෙටුම්පතක් දෙවැනි වර කියවීමේදී එම පනත් කෙටුම්පතේ සාමාන්‍ය යෝග්‍යතාව හා ප්‍රතිපත්ති ආවරණය කරමින් විවාදයක් පවත්වනු ලැබිය හැකි බව ස්ථාවර නියෝග 56 හි සඳහන් වේ. පනත් කෙටුම්පත පිළිබඳ විවාදය ලෙස සාමාන්‍ය ජනතාවට ජනමාධ්‍යය මගින් දැක ගැනීමට ලැබෙන්නේ මෙම පනත් කෙටුම්පත සම්බන්ධ දෙවෙනිවර කියවීම පිළිබඳ විවාදයයි.

විවාදය අවසානයේදී පනත් කෙටුම්පත ස්ථාවර නියෝග 47 ප්‍රකාරව ඡන්දයකින් (කටහඬ අනුව; බෙදීම - පේළි අනුව/නම් අනුව - විද්‍යුත් ඡන්ද සටහන් කිරීම මගින්) සම්මත කරනු ලැබේ.

විවාදයෙන් පසුව පනත් කෙටුම්පත දෙවෙනි වර කියවා සම්මත කරගත යුතුය. ඒ සඳහා සභාවේ ඡන්දයක් අවශ්‍ය යැයි මන්ත්‍රීවරයකු ඉල්ලා සිටින අවස්ථාවකදී ඡන්දයක් පවත්වනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතක් සඳහා පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ගේ 2/3ක බහුතරයකගේ ඡන්දයෙන් එය සම්මත විය යුතුය.(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82වන ව්‍යවස්ථාව)

දෙවැනිවර කියවීමෙන් පසුව පනත් කෙටුම්පත (විසර්ජන පනත් කෙටුම්පතක් හැර) ස්ථාවර නියෝග 57 ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන අමාත්‍යවරයෙකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ යෝජනාවක් මත එය පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට හෝ විශේෂ කාරක සභාවකට හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවකට හෝ යෝග්‍ය ආංශික අධීක්ෂණ කාරක සභාවකට යොමු කරනු ලැබේ.

පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් කාරක සභා අවස්ථාවේ කාර්ය පටිපාටිය ස්ථාවර නියෝග 59 සිට 70 දක්වා වගන්තිවල සඳහන් වේ.

ඒ අනුව කාරක සභා අවස්ථාවේදී පනත් කෙටුම්පතේ වගන්තියෙන් වගන්තිය කියවමින් සංශෝධන සහිතව හෝ රහිතව සම්මත කරනු ලැබේ. එහිදි යම් වගන්තියකට හෝ යම් මන්ත්‍රීවරයකු ඉදිරිපත් කරන සංශෝධනයකට විරුද්ධතාවයක් මතු වුවහොත් එකී වගන්තිය හෝ සංශෝධනය සඳහා ඡන්ද විමසීමක් පවත්වනු ලැබේ.

ස්ථාවර නියෝග 71 සහ 72 අනුව තුන්වැනිවර කියවීමේදී මන්ත්‍රීවරයකුගේ යෝජනාවක් මත පනත් කෙටුම්පත ඡන්දයෙන් සම්මත කරනු ලබයි. ස්ථාවර නියෝග 47 ප්‍රකාරව තුන්වැනි වර කියවීමේදීද ඡන්දය විමසනු ලැබේ. එහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ 2/3ක බහුතර ඡන්දයෙන් සම්මත විය යුතුය. එකී ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ යම් වගන්තියක් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාව යටතේ දැක්වෙන ජනමත විචාරණයකට තුඩු දෙන සංශෝධනයක් ඇතුළත්ව තිබේනම් (ඒ බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිය තීරණය මගින් දනුම්දී තිබේ නම්) එවිට එම පනත් කෙටුම්පත 2/3ක බහුතර ඡන්දයක් ලබාගැනීමෙන් අමතරව ජනාධිපති විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85 ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන භාවිත කරමින් ජනමත විචාරණයක් වෙත යොමුකළ යුතුය. ඒ අනුව එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ජනමත විචාරණයකින් සම්මත විය යුතුය.

## කථානායකවරයාගේ සහතිකය

පාර්ලිමේන්තුවේ 2/3ක බහුතර ඡන්දයෙන් සම්මත වීමට ප්‍රමාණවත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් එය නිසි පරිදි සම්මත වූ පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව පරිදි එයට කථානායකවරයාගේ සහතිකය සටහන් කළ යුතුය. එකී සහතිකය වන්නේ "(පනත් කෙටුම්පතේ ලුහුඬු නාමය මෙහි සඳහන් කරන්න) නමැති මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද බව මෙයින් සහතික කරමි." යන්නයි.පනත් කෙටුම්පත සම්මත කරන ලද්දේ යම් බහුතර ඡන්දයකින්ද ඒ බහුතර ඡන්දයද ඒ සහතිකයෙහි සඳහන් කරනු ලැබිය හැකිය.

එම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 වැනි ව්‍යවස්ථාව අනුව පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කිරීම අවශ්‍ය වන අවස්ථාවක, ඒ පනත් කෙටුම්පත හෝ ඒ විධිවිධානය ජනතාව විසින් ජනමත විචාරණයකදී අනුමත කරනු ලබන තෙක් නීතිය බවට පත් නොවිය යුතු බවද ඒ සහතිකයේ සඳහන් විය යුතුය.

## 3.5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයන් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල

ශ්‍රේෂ්ඨාධිකරණයට පමණක් ඇති සුවිශේෂී බලයක් වන්නේ පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලත්වය සම්බන්ධයෙන් වූ අධිකරණ බලයයි;(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 118 (අ) ව්‍යවස්ථාව). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ පනත් කෙටුම්පතක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව වූ පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමුකළ යුත්තේ එකී කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමෙන් සතියක් තුළ බවයි. එසේ ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරන අවස්ථාවේදීම කථානායක වෙතද භාරදිය යුතුය.

පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් යොමුවූ විට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් උපරිම වශයෙන් සති තුනක කාලයක් තුළ එහි තීරණය ජනාධිපති සහ කථානායක වෙත පමණක් දැනුම්දිය යුතුය. පනත් කෙටුම්පත පිළිබඳව සිය තීරණය ලබාදෙන තෙක් පාර්ලිමේන්තුව විසින් අදාළ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගත යුතුය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය සමග ඒ තීරණයට එළඹීමට හේතුද දැක්විය යුතු අතර, පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූලද යන වගත් එසේ නම් ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කවර විධිවිධානයකටද නැතහොත් විධිවිධානවලටද යන වගත් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයෙහි ප්‍රකාශ විය යුතුය.

එසේම පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල යයි ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළ අවස්ථාවක
(අ) එම පනත් කෙටුම්පත 82 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි සහ (2) වැනි අනුව්‍යවස්ථාවල විධිවිධාන අනුව පිළියෙළ වීම අවශ්‍ය ද යන වග ; හෝ
(ආ) එම පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් හෝ 84 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ නියමිත විශේෂ බහුතර ඡන්දයෙන් පමණක් සම්මත කළ හැකි ද යන වග ; හෝ (ඇ) එම පනත් කෙටුම්පත හෝ එහි විධිවිධානයක් හෝ 84 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ නියමිත විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කොට 83 වැනි ව්‍යවස්ථාවේ නියමිත ප්‍රකාර ජනතාව විසින් ජනමත විචාරණයක දී අනුමත කළ යුතු ද යන වග, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ තීරණයෙහි ප්‍රකාශ කළ යුත්තේය. තවද ඒ පනත් කෙටුම්පතෙහි හෝ ඒ විධිවිධානයෙහි හෝ

අනනුකූලතාව ඉවත් වන්නේ කවර ස්වභාවයක සංශෝධන මගින්ද යන වග නිශ්චිතව සඳහන් කළ හැකිය.

යම් පනත් කෙටුම්පතක් හෝ පනත් කෙටුම්පතක විධිවිධාන හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල යයි තීරණය කරනු ලැබ ඇත්තා වූ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල යයි තීරණය කරන ලද සේ සැලකෙන්නා වූ අවස්ථාවක ඒ පනත් කෙටුම්පත හෝ ඒ විධිවිධාන හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයේ ප්‍රකාශ කර ඇති ආකාරයට හැර සම්මත නොකළ යුතුය.

එසේ වුවද, ඒ පනත් කෙටුම්පතෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇති අනනුකූලතාව ඉවත් වන සේ සංශෝධනය කරනු ලැබීමෙන් පසුව ඒ පනත් කෙටුම්පත සම්මත කිරීම නීත්‍යානුකූල වේ. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123 ව්‍යවස්ථාව)

## 3.6. පනත් කෙටුම්පත් සම්බන්ධව නීතිපතිගේ කාර්යභාරය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වන කෙටුම්පතක දීර්ඝ නාමය පිළිබඳ අවශ්‍යතා) සහ (2) වැනි අනුව්‍යවස්ථාවේ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට වෙනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රතියෝජනය කරන පනත් කෙටුම්පතක ඒ බව දීර්ඝ නාමයේ සඳහන් කිරීම පිළිබඳ ප්‍රතිපාදන) දැක්වෙන නියම කඩවී ඇත්තේද යන වගද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියම කොට ඇති විශේෂ බහුතර ඡන්දයෙන් විනා නීත්‍යානුකූලව සම්මත කළ නොහැකි විධිවිධාන ඇතුළත් වී ඇත්තේද යන වගද දැනගැනීම පිණිස සෑම පනත් කෙටුම්පතක්ම පරීක්ෂා කර බැලීම නීතිපතිවරයාගේ කාර්යය වන්නේය. මේ ව්‍යවස්ථාව යටතේ තම කාර්ය ඉටු කිරීමේදී නීතිපතිවරයාට හෝ නීතිපතිවරයාට සහය වන්නා වූ යම්කිසි නිලධරයෙක් වේ නම් ඔහුට හෝ ඒ කාර්ය ඉටු කිරීමට අවශ්‍ය සියලු පහසුකම් සැලසිය යුත්තේය.

එසේම යම්කිසි පනත් කෙටුම්පතකින් ඉහත කී ව්‍යවස්ථාවල යම්කිසි නියමයක් කඩ වී ඇති බව නීතිපතිවරයාගේ මතය වේ නම්, එසේ නැතහොත් යම්කිසි පනත් කෙටුම්පතක යම්කිසි විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියම කොට ඇති විශේෂ බහුතර ඡන්දයෙන් විනා නීත්‍යානුකූලව සම්මත කොට ගත නොහැකි බව නීතිපතිවරයාගේ මතය වේ නම්, එකී මතය නීතිපතිවරයා ජනාධිපතිවරයාට දන්වා යැවිය යුත්තේය.

සංශෝධනයක් සම්බන්ධයෙන් ස්වකීය මතය ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ අවසාන සම්මතය ලබා ගැනීම සඳහා පිළියෙළ වී ඇති

අවස්ථාවේදී නීතිපතිවරයා විසින් කථානායකවරයා වෙත දන්වා යැවිය යුතුය. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77 වන ව්‍යවස්ථාව)

## 3.7. ජනමත විචාරණයකට ලක් කළ යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන

සෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක්ම පාර්ලිමේන්තුවේ මන්ත්‍රිවරුන්ගේ 2/3ක බහුතරයකින් සම්මත විය යුතු වුවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

- 1 වැනි ව්‍යවස්ථාව ( රජය),
- 2 වන ව්‍යවස්ථාව (ඒකීය රාජ්‍යයක් බව),
- 3 වන ව්‍යවස්ථාව (ජනතාවගේ පරමාධිපත්‍යය)
- 6 වැනි ව්‍යවස්ථාව (ජාතික කොඩිය)
- 7 වැනි ව්‍යවස්ථාව (ජාතික ගීය)
- 8 වැනි ව්‍යවස්ථාව (ජාතික දිනය)
- 9 වැනි ව්‍යවස්ථාව (බුද්ධාගම)
- 10 වන ව්‍යවස්ථාව (සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස)
- 11 වන ව්‍යවස්ථාව (වධ හිංසාවලින් නිදහස)
- 30 (2) (ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරාපත් කරගත යුතු බව, ජනාධිපති ධුරකාලය වසර 6කට වඩා දීර්ඝ කිරීම)

යන ව්‍යවස්ථාවල හෝ 62(2) අනු ව්‍යවස්ථාව ( පාර්ලිමේන්තුවේ කාලය වසර 6කට වඩා දීර්ග කිරීම) හෝ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා වූ හෝ පරිච්ඡින්න කොට ප්‍රතියෝජනය කිරීම සඳහා වූ හෝ ඒ ව්‍යවස්ථාවල යම් විධිවිධානයකට අනනුකූල වන්නා වූ හෝ පනත් කෙටුම්පතකට හෝ ජනාධිපතිගේ ධුරකාලය හෝ පාර්ලිමේන්තුවේ කාලය වසර 6ක වඩා වැඩි කිරීම සඳහා වන කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ 2/3ක බහුතර ඡන්දයකින් සම්මත වීමට අමතරව ජනමත විචාරණයක් මගින්ද සම්මත විය යුතුය. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාව) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් සම්බන්ධව ජනමත විචාරණයක් සඳහා යොමුකළ හැක්කේ ජනාධිපති විසිනි. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85(1) ව්‍යවස්ථාව) 85(3) ව්‍යවස්ථාව දක්වන්නේ ජනමත විචාරණයකදී ලබාදෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් බහුතරයක් පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය ලබාදී ඇත්නම් එම කෙටුම්පත ජනමත විචාරණය මගින් සම්මත වී ඇති බව සලකනු ලැබේ.

එසේම ජනමත විචාරණයකින් පනත් කෙටුම්පතක් සම්මත වීමට නම් ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාවෙන් 2/3කට අඩු ඡන්ද දායකයන් පිරිසක් ඡන්දය භාවිත කර ඇති අවස්ථාවකදී මුළු ඡන්ද සංඛ්‍යාවෙන් 1/3කට වැඩි ප්‍රමාණයක් පනත්

කෙටුම්පතට පක්ෂව ඡන්දය ලබාදී තිබේ නම් එම කෙටුම්පත සම්මත වූවා සේ සලකනු ලැබේ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85(3) ව්‍යවස්ථාව) ජනමත විචාරණයකින් නිසි පරිදි සම්මත වූ පසුව ඒ බව ජනාධිපති විසින් එහි සහතිකය සටහන් කළ යුතුය (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82(2) ව්‍යවස්ථාව) එසේ සහතිකය සටහන් කිරීමෙන් පසුව එය බලාත්මක වේ.

පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරන ලද පනත් කෙටුම්පත් ජනමත විචාරණයට ලක් කිරීම පිළිබඳ ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85(2) ව්‍යවස්ථාවේ පවතින නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතකට මෙම ප්‍රතිපාදන අදාළ නොවන බවද එම ව්‍යවස්ථාවේම සඳහන් වේ.

## 3.8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත් සඳහා ඡන්දය විමසීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ 2/3ක ඡන්දයෙන් සම්මත විය යුතුය (ඇතැම් විට එයට අමතරව ජනමත විචාරණයක්ද අවශ්‍ය වේ) පාර්ලිමේන්තුවේ ඡන්දය විමසීම පිළිබඳව විධිවිධාන සඳහන් වන්නේ ස්ථාවර නියෝග 47ට අනුව ඡන්දය විමසීම ආකාර කිහිපයකට කළ හැකිය.

- කටහඬ අනුව
- පේළියෙන් පේළියට සංඛ්‍යා ලබාගැනීමෙන්
- ස්ථාවර නියෝගවලට අනුකූලව මන්ත්‍රීන්ගේ නම් කියවීමෙන්
- විද්‍යුත් ඡන්දය දීමේ යන්ත්‍රණය අනුව ඡන්දය විමසීමෙන්

මේ අනුවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් යනු පහසු කාර්යයක් නොවන බව පැහැදිලිය. ඒ සඳහා පාර්ලිමේන්තුවේ බහුතර බලය පමණක් නොව 2/3ක බහුතරයද ඇතැම්විට ජනමත විචාරණයකදී එය ජයග්‍රහනය කිරීම සඳහා ජනමතයක්ද අවශ්‍ය වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධන 16(15)ක් එකතුවූයේ 1989 පාර්ලිමේන්තු මැතිවරණයට පෙරය. ඒ සඳහා භාවිත වූයේ 1977 කොට්ඨාශ ක්‍රමය යටතේ පවත්වන ලද මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය ලබාගත් 5/6ක සුවිශේෂි බලයයි. ජනමත විචාරණයක් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සම්මත කරගෙන ඇත්තේ එක් වරක් පමණි. ඒ 1982 වසරේදී පාර්ලිමේන්තුවට එක් කරන ලද හතරවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි.

# 3.9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන

| සංශෝධනය හා සහතිකය සටහන් කළ දිනය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද වෙනස්කම් |
|---|---|
| **පළමුවන සංශෝධනය** 1978 නොවැම්බර් 20 | අභියාචනාධිකරණයට පැවරී තිබූ සමහර කරුණු සම්බන්ධ අධිකරණ බලතල ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරීම සඳහා 140 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. |
| **දෙවන සංශෝධනය** 1979 පෙබරවාරි 26 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු අයත් වූ දේශපාලන පක්ෂය අහිමි වන අවස්ථාවක(ඉල්ලා අස්වීම,පහකිරීම වැනි හේතුවක් නිසා) ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කටයුතු කිරීමට අදාළ 161 ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. |
| **තුන්වන සංශෝධනය** 1982 අගෝස්තු 27 | බලයේ ජනාධිපතිවරයාට තමාව දෙවන වර පත්කර ගැනීම සඳහා ජනාධිපතිවරණයක් පැවැත්වීම සඳහා වසර 4කට පසුව ප්‍රකාශයක් කළ හැකිවන පරිදි 31 වන ව්‍යවස්ථාව සංශෝධනය |
| **හතරවන සංශෝධනය** 1982 දෙසැම්බර් 23 | පැවති පාර්ලිමේන්තුවේ කාලය තවත් වසර 6කින් දීර්ඝ කිරීම සඳහා 161 ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. |
| **පස්වන සංශෝධනය** 1983 පෙබරවාරි 25 | මන්ත්‍රී පුරප්පාඩුවක් පිරවීමට(පළමු පාර්ලිමේන්තුවේ) අදාළ දේශපාලන පක්ෂයේ ලේකම්වරයා කටයුතු නොකරන්නේ නම් පමණක් අතුරු මැතිවරණයක් පැවැත්වීම සඳහා 161 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. |
| **හයවන සංශෝධනය** 1983 අගෝස්තු 08 | ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව උල්ලංඝනය කිරීමට කටයුතු කිරීම තහනම් කිරීම සඳහා 157 හා 101 ව්‍යවස්ථා සංශෝධනය කිරීම සහ භෞමික අඛණ්ඩතාවය උල්ලංඝනය නොකිරීමේ ප්‍රතිඥාව ලෙස හත්වන උපලේඛනය ඇතුළත් කිරීම. |
| **හත්වන සංශෝධනය** 1983 ඔක්තෝබර් 04 | පරිපාලන දිස්ත්‍රික්ක 25 දක්වා වැඩිකිරීම සඳහා 5වන ව්‍යවස්ථාව හා 96 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම,මහාධිකරණ කොමසාරිස්වරුන් පත්කිරීම සඳහා 111ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. කිලිනොච්චිය පරිපාලන දිස්ත්‍රික්කයක් ලෙස එක් කිරීම සඳහා පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම. |
| **අටවන සංශෝධනය** 1984 මාර්තු 06 | ජනාධිපති නිතිඥවරුන් පත්කිරීම පිළිබඳ ජනාධිපතිවරයා සතු බලතල පුළුල් කිරීම සඳහා 33වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම හා ඒ අනුව 136 ව්‍යවස්ථාව හා 169 ව්‍යවස්ථාව සංශෝධනය කිරීම |
| **නමවන සංශෝධනය** 1984 අගෝසතු 24 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස තෝරාපත්කර ගැනීමට සුදුසු නොවන රජයේ සේවකයින්ගේ වැටුප් පරිමාණ සකස් කිරීම සඳහා 91 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම |

| | |
|---|---|
| **දහවන සංශෝධනය**<br><br>1986 අගෝස්තු 06 | මහජන ආරක්ෂක පනත යටතේ ජනාධිපතිවරයා සිදුකරන ප්‍රකාශයක් අනුමත කිරීම සඳහා තුනෙන් දෙකක බහුතරයක අවශ්‍යතාව ඉවත් කිරීම සඳහා 55 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම |
| **එකොළොස්වන** සංශෝධනය-1987 මැයි 06 | මුල් අවස්ථා අපරාධ අධිකරණ බලතල මහාධිකරණයෙන් ඉවත් කිරීම සඳහා 111 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. උපලේඛනගත රජයේ නිලධාරීන් සම්බන්ධව අධිකරණ සේවා කොමිෂන් සභාවට ඇති බලතල පුළුල් කිරීම සඳහා 112, 113, 114 ව්‍යවස්ථා සංශෝධනය කිරීම |
| **දොළොස්වන සංශෝධනය** (ක්‍රියාත්මක නොවීය පාර්ලිමේන්තුව විසින් සම්මත නොකරන ලදි) | දිනේෂ් ගුණවර්ධන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් 1987 සැප්තැම්බර් 25 වනදින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ නමුත් ඉදිරි කටයුතු සිදු නොකරන ලදි |
| **දහතුන්වන සංශෝධනය**<br><br>1987 නොවැම්බර් 14 | දෙමළ භාෂාව රාජ්‍ය භාෂාවක් කිරීම සඳහා 18වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. අභියාචනාධිකරණයේ සමහර බලතල පළාත්බද මහාධිකරණයට පැවරීම සඳහා 138 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. පළාත් සභා පිහිටුවීම සඳහා XVII A පරිච්ඡේදය ඇතුළත් කිරීම. මහජන ආරක්ෂක පනත යටතේ නියෝග පැනවීම සංශෝධනය කිරීම සඳහා 155 ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. පළාත් සභා ප්‍රඥප්ති ලිඛිත නීති ලෙස අර්ථ ගැන්වීම පිණිස 170 ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. පළාත් සභා නම් කිරීම සඳහා අටවන උපලේඛනයද ,පළාත් සභා ලැයිස්තුව,සමගාමී ලැයිස්තුව සහ සංවෘත ලැයිස්තුව විස්තර කිරීම සඳහා නවවන උපලේඛනය ඇතුළත් කිරීම. |
| **දහහතරවන සංශෝධනය**<br><br>1988 මැයි 24 | ඇතැම් අවස්ථාවලදී ජනාධිපති මුක්තිය ක්‍රියාත්මක නොකිරීම පිණිස 35 වන ව්‍යවස්ථාව සංශෝධනය. පාර්ලිමේන්තු මංත්‍රිවරුන් සංඛ්‍යාව 225 දක්වා වැඩිකිරීම පිණිස 62වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. ජනමත විචාරණයක් පිළිබඳ පෙත්සමක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ බලතල සීමාවන පරිදි 80 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. සීමා නිර්ණය කොමිෂන් සභාව පිහිටුවීම සඳහා 96වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. සමානුපාතික නියෝජන ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 98 හා 99 ව්‍යවස්ථා සංශෝධනය. ජාතික ලැයිස්තුව පිළිබඳ ප්‍රතිපාදන සංශෝධනය කිරීම.මැතිවරණ පෙත්සම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ බලතල පුළුල් කිරීම සඳහා 130 ව්‍යවස්ථාව සංශෝධනය. |
| **පහළොස්වන සංශෝධනය**<br><br>1988 දෙසැම්බර් 17 | මැතිවරණ දිස්ත්‍රික්ක කලාපවලට බෙදීම අවලංගු කිරීම සඳහා 96 ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. දිස්ත්‍රික්කයකට අදාළ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් සංඛ්‍යාව තීරණය කිරීමට මැතිවරණ කොමසාරිස්වරයාට ඇති බලතල සංශෝධනය සඳහා 98 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. සමානුපාතික නියෝජන ක්‍රමයේ සීමාව අටෙන් එකේ සිට විස්සෙන් එක දක්වා අඩු කිරීමට 99 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. |

| | |
|---|---|
| **දහසයවන සංශෝධනය**<br><br>1988 දෙසැම්බර් 17 | පළාත් සභා මන්ත්‍රිවරුන්ට තමන්ගේ කාර්යය ඉටුකිරීම කැමති ජාතික භාෂාවකින් කටයුතු කිරීමට හැකිවනු පිණිස 20වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.සිංහල හා දෙමළ පරිපාලන භාෂා සහ ව්‍යවස්ථාදායක භාෂා බවට පත් කිරීම සඳහා 22 හා 23 ව්‍යවස්ථා සංශෝධනය කිරීම. සිංහල මෙන්ම දෙමළ භාෂාවද අධිකරණ භාෂා බවට පත් කිරීම පිණිස 24 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. |
| **දහහත්වන සංශෝධනය**<br><br>2001 ඔක්තෝබර් 03 | ජනාධිපතිවරයාගේ බලතල සීමා කිරීම පිණිස ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීම සඳහා VII A පරිච්ඡේදය ඇතුළත් කිරීම. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාළ කටයුතු සංශෝධනය කිරීම සඳහා IX පරිච්ඡේදය ඇතුළත් කිරීම.<br>ජනාධිපතිතුමාගේ පත් කිරීම් සම්බන්ධ බලතල සීමා කිරීම සඳහා 65 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. මැතිවරණ කොමිසම පිහිටුවීම පිණිස XIVA පරිච්ඡේදය ඇතුළත් කිරීම. අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු සංශෝධනය කිරීම පිණිස XVA පරිච්ඡේදය ඇතුළත් කිරීම. ජාතික පොලිස් කොමිෂන් සභාව පිහිටුවීම සඳහා XVIIIA පරිච්ඡේදය ඇතුළත් කිරීම. |
| **දහඅටවන සංශෝධනය**<br>2010 සැප්තැම්බර් 09 | ජනාධිපතිවරයාගේ ධූරවාර ගණන පිළිබඳ සීමාව ඉවත් කිරීම. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඉවත් කිරීම. කොමිෂන් සභාවල හා සමහර පත් කිරීම් පිළිබඳ ජනාධිපති සතු බලතල පුළුල් කිරීම.පොලිස් හා මැතිවරණ කොමසමේ බලතල සීමා කිරීම. |
| **දහනවවන සංශෝධනය**<br><br>2015 මැයි 15 | ජනාධිපතිවරයාගේ ධූරකාලය වසර 5 දක්වා අඩු කිරීම. ජනාධිපතිධූර වාර ගණන 2 දක්වා සීමා කිරීම.ව්‍යවස්ථාදායක සභාව නැවත හඳුන්වාදීම. නව කොමිෂන් සභා 2ක් හඳුන්වා දීම. |
| **දහනවවන සංශෝධනය**<br><br>2015 මැයි 15 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඉවත් කිරීම, විගණන සේවා කොමිසම සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කිරීම, ජනාධිපතිගේ බලතල වැඩි කිරීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සහ මැතිවරණ කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම, හදිසි පනත් යළි හඳුන්වාදීම |
| **විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය**<br><br>2020 ඔක්තෝබර් 29 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කර පාර්ලිමේන්තු සභාව ස්ථාපනය කිරීම, විගණන සේවා කොමිෂන් සභාව සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කිරීම, හදිසි පනත් ක්‍රමවේදය යළි හඳුන්වාදීම, ද්විත්ව පුරවැසිභාවය සහිත පුරවැසියන්ට පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ජනාධිපතිවීමට අවස්ථා ලබාදීම, අධිකරණ සේවා කොමිෂන් සභාවට පොලිස් කොමිෂන් සභාවට මැතිවරණ කොමිෂන් සභාවට සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ සංශෝධනයන් සිදු කිරීම |

"යාවත්කාලීන කිරීම - 2021 ජනවාරි දක්වා"

# හතරවන පරිච්ඡේදය

## ජනාධිපති බලතල අඩුකිරීම සහ රාජ්‍ය ආයතන නිර්දේශපාලනීකරණය සඳහා වූ උත්සාහය

1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පැවති මූලික විරෝධය වූයේ රාජ්‍යයේ සියලු බලතල ජනාධිපතිධුරය වටා සංකේන්ද්‍රණය වී පැවතීමයි. එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් තුළින් ජනාධිපතිවරයාගේ බලතල අඩු කිරීම පිළිබඳව මෙන්ම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කරමින් නැවත පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් දක්වා යාම පිළිබඳවද සාකච්ඡා පැවැත්විණ. එසේම මූලික රාජ්‍ය ආයතන දැඩි ලෙස දේශපාලනීකරණය වීම හේතුවෙන් අධිකරණය ස්වාධීන කිරීම, මැතිවරණ පැවැත්වීම සඳහා ස්වාධීන යන්ත්‍රණ බිහිකිරීම සහ රාජ්‍ය සේවය දේශපාලන මැදිහත්වීමෙන් ඈත් කිරීම පිළිබඳව සමාජය තුළ විවිධ මට්ටමින් සාකච්ඡා පැන නැගිණ. නමුත් 1978 සිට 2000 වසරේ ඔක්තෝබර් මාසයේදී 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වන තෙක්ම එම කිසිදු උත්සාහයක් සාර්ථක වූයේ නැත. සමාජයේ විවිධ මට්ටමින් පැනනැගුණ ජනාධිපතිවරයාගේ බලතල සීමා කිරීම සහ මැතිවරණ, රාජ්‍ය සේවය සහ අධිකරණ ස්වාධීන කිරීම සඳහා ගන්නා ලද උත්සාහය පිළිබඳව හැඳින්වීමක් සිදුකිරීම මෙම පරිච්ඡේදයේ අරමුණයි.

## 4.1. තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව-1990

1988-89 කාලයේදී සන්නද්ධ ගැටුම් හේතුවෙන් ඒ පිළිබඳව විමර්ශනය කිරීම සඳහා 393 වන අධිකාරය වන පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ ආර්.ප්‍රේමදාස ජනාධිපතිවරයා විසින් පිහිටුවන ලද තරුණයන් පිළිබඳ කොමිෂන් සභාවේ වාර්තාව තුළ රාජ්‍ය ආයතන නිර්දේශපාලනීකරණය සම්බන්ධ නිර්දේශ ඇතුළත් විය.

තරුණ පිරිසේ කොටසක් හෝ කොටස් අතරේ පවතින අදාන්ත බව, අසහනය හා සමාජ අතෘප්තිකරභාවයද එබදු අතෘප්තිකරභාව පැවතීමට සහ වර්ධනය වීමට තුඩුදී ඇති සාධකද ඇතුළු කරුණු පිළිබඳව පරීක්ෂා කර ජනාධිපති වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස 1989 ඔක්තෝබර් මාසයේදී මෙම කොමිෂන් සභාව පත් කරන ලදි.

කොමිෂන් සභාවේ සභාපති වූයේ මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලකය. මහාචාර්ය ජී.එල්.පීරිස්, ආචාර්ය රාධිකා කුමාරස්වාමි,ඒ.එස්.මුහමඩ් අලි, ආර්.අයි.ටී.අලස්, මොනිකා රුවන්පතිරණ, ෂවීන්ද්‍ර ප්‍රනාන්දු, සහ ලාල් කුරුකුලසූරිය යන අය සාමාජිකයෝ වූහ. 1990 මාර්තු මාසයේදී කොමිෂන් සභාව විසින් සිය වාර්තාව ජනාධිපති වෙත පිළිගන්වන ලදි.

මෙම වාර්තාවේ පළමු පරිච්ඡේදය වෙන්වී තිබුණේ පොදු සමාජය දේශපාලනකරණයෙන් ඈත් කිරීම පිළිබඳය. එහි සදහන් වන පරිදි දේශපාලනකරණය පමණ ඉක්මවා යාම පිළිබද අදහස් ප්‍රධාන කොටස් හතරකට බෙදිය හැකිය.

- (අ). රාජ්‍ය සේවාවන්ට පුද්ගලයන් බඳවා ගැනීමේදී දේශපාලන බලය අනිසි ලෙස පාවිච්චි කිරීම.
- (ආ). පාලක පක්ෂයේ ආධාරකරුවන්ට රජයේ කොන්ත්‍රාත්තු හා බලපත්‍ර දීමේදී දේශපාලන බලය අයුතු ලෙස යොදා ගැනීම.
- (ඇ). පවත්නා ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන් අපකීර්තියට ලක් කිරීමෙහිලා දේශපාලන බලය අනිසි ලෙස පාවිච්චි කිරීම.
- (ඈ). රාජ්‍ය ආයතනයන්හි එදිනෙදා පරිපාලනයහි දේශපාලන ඇඟිලි ගැසීම්. (තරුණයින් පිළිබද ජනාධිපති කොමිෂන් සභා වාර්තාව,1990:1)

කොමිෂන් සභා වාර්තාවේ තවදුරටත් සඳහන් වූයේ දේශපාලනික හා රජයේ ආයතන අතර සංයුක්ත අන්තර්ක්‍රියාකාරීත්වයක් තිබිය යුතු බවද මහජන

සුබසිද්ධිය පිණිස දේශපාලනඥයන් වැදගත් අධීක්ෂණ කාර්යභාරයක් ඉටු කළයුතු බවද, එසේ වුවත් දේශපාලනයේ බලපෑම්වලින් තොරව රාජකාර්යයන්හි නියුක්තව සිටීමට රාජ්‍ය සේවය ඉඩදිය යුතු බවද කොමිෂන් සභාව දකියි. (එම,1990:3) යනුවෙන් සඳහන් විය. ඒ අනුව රාජ්‍ය සේවයේ බඳවා ගැනීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම සහ සේවයෙන් පහ කිරීම දේශපාලනයේ ඈත් කිරීම සදහා කොමිෂන් සභාව පහත මූලික නිර්දේශ කරන ලද්දේ නාමයෝජනා කොමිෂන් සභාව නැමති ආයතනය ස්ථාපනය කිරීමයි. එහි මූලික කාර්ය වූයෙ පහත පහත සඳහන් කොමිෂන් සභාවල සාමාජිකත්වය දරන පුද්ගලයන් පිළිබඳව ජනාධිපති වෙත නිර්දේශ කිරීමයි.

(අ) ඇතැම් වැදගත් ක්ෂේත්‍රවල බඳවා ගැනීම්, උසස් කිරීම්, ස්ථානමාරු හා සේවයෙන් පහකිරීම් පිළිබඳව වගකිව යුතු වැදගත් කොමිෂන් සභා.

(ආ) අතිශය සංවේදී තෝරාගත් ක්‍ෂෙත්‍රවල කෙටිකාලීන හෝ පක්‍ෂ අවශතාවන් ඉක්මවා යන ක්‍ෂෙත්‍ර තුළ ප්‍රතිපත්ති සම්පාදනය පිළිබදව වගකිව යුතු වැදගත් කොමිෂන් සභා. (එම,1990:5)

මේ අනුව කොමිෂන් සභාව විසින් පහත සඳහන් නිශ්චිත කොමිෂන් සභාවල සාමාජිකයින් පත් කිරීමේදී ජනාධිපති විසින් නාමයෝජනා කොමිෂන් සභාවේ නිර්දේශ මත සිදුකළ යුතු යැයි කොමිසම විසින් නිර්දේශ කරන ලදි. එනම්

1. රාජ්‍ය සේවා කොමිසන් සභාව,
2. අධ්‍යාපන සේවා කොමිසන් සභාව,
3. මානව අයිතිවාසිකම් පිළිබඳ කොමිසන් සභාව,
4. ජාතික තරුණ සේවා සභා මණ්ඩලය,
5. රාජ්‍ය සංස්ථා සේවා සභාව (මධ්‍යම සහ පහළ ශ්‍රේණිවල බඳවාගැනීම් හා උසස් කිරීම් සඳහා ඇති කරනු ලැබේ)
6. රාජ්‍ය භාෂා කොමිසන් සභාව (දැනට සැලකිල්ලට භාජනය වෙමින් පවති)
7. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව,
8. ආරක්ෂක හමුදාවල පත්කිරීම් සඳහා වගකිව යුතු කොමිසන් සභාවක්
9. වැටුප් ප්‍රමිති කිරීම සඳහා වු කොමිසන් සභාව, (එම,1990:5)

මෙයට අමතරව, ප්‍රතිපත්ති සම්පාදනය සඟහා බලය පවරන ලද නව කොමිසන් සභා හතරක් ඇති කරන ලෙසද කොමිසම නිර්දේශ කර තිබිණි.

නාමයෝජනා කොමිෂන් සභාවේ සාමාජිකයන් පාර්ලිමේන්තුවේ නියෝජනය

වන දේශපාලන පක්ෂවල අනුපාතය අනුව නියෝජිතයින්ගෙන් සමන්විත යුතු බවද, එයට අමතරව, අග්‍රවිනිශ්චයකාරයා හා විගණකාධිපති යන දෙදෙනා ඡන්දය පාවිච්චි නොකරන නියෝජිතයෙකු බැගින් සහභාගී කරගත යුතු බවද කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදි.

ඒ අතරින් ඇතැම් ඇතැම් කොමිෂන් සභා ඒ වන විට පැවති අතර, ඇතැම් කොමිෂන් සභා පසුව ස්ථාපනය වී ඇත. ඇතැම් කොමිෂන් සභා මේ වන තෙක් ස්ථාපනය වී නැත.

## 4.2. පොදුජන පෙරමුණේ මැතිවරණ පොරොන්දු -1993/94

1993 වසරේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී පොදු පෙරමුණේ ප්‍රමුඛ මැතිවරණ පොරොන්දුවක් වූයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන එන බවයි, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඒකාධිකාරී බලතල සහිත ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවටද ප්‍රකාශ විය ආණ්ඩුවේ බලය හිතුවක්කාරව පාවිච්චි කිරීම වැළැක්වීමේ ශක්තිමත් සංවරණ සහ තුලන ක්‍රමයකින් තොරව පෞද්ගලික නිදහස ආරක්ෂා කළ නොහැකි බව 1993 පොදුජන එක්සත් පෙරමුණ මැතිවරණ ප්‍රකාශයේද සඳහන් විය. ( පිටු අංක 142 පිටුව හැන්සාර්ඩ් වාර්තාව - 2000 සැප්තැම්බර් 24). පාර්ලිමේන්තු මැතිවරණයෙන් පොදු පෙරමුණ ජයග්‍රහණය කරන ලදි. 1994 වසරේදී පැවති ජනාධිපතිවරණයේදීද විධායක ජනාධිපති ධූරය අහෝසි කරන බවට පොදු පෙරමුණු අපේක්ෂිකාව වූ චන්ද්‍රිකා බණ්ඩාරණායක ප්‍රකාශ කළ අතර එයට ප්‍රතිචාර දක්වූ ජාතික ප්‍රගතිශීලී පෙරමුණේ ජනාධිපති අපේක්ෂක නිහාල් ගලප්පත්ති අභියෝග කරන ලද්දේ ජනාධිපතිවරණයෙන් ජයග්‍රහනය කළහොත් විධායක ජනාධිපතිධූරය අහෝසි කරන බවට ලිඛිත පොරොන්දුවක් ලබාදෙන්නේ නම් තමන් ජනාධිපති අපේක්ෂකත්වයෙන් ඉල්ලා අස්වී ඇයට ඡන්දය ලබාදෙන ලෙස තම ආධාරකරුවන්ගෙන් ඉල්ලා සිටින බවයි. ඒ අනුව චන්ද්‍රිකා බණ්ඩාරණායක ලිඛිත පොරොන්දුවක් ලබාදුන් අතර නිහාල් ගලප්පත්ති ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරමින් ජනාධිපතිවරණ සටනින් ඉවත් විය.

## 4.3. රජයේ බලය බෙදාහැරීමේ යෝජනාවලිය -1995

රාජ්‍ය ආයතන නිර්දේශපාලනීකරණය පිළිබඳ මීළඟ නිල ලේඛනය අපට හමුවන්නේ 1995 වසරේ අගෝස්තු මාසයේදී රජය විසින් එළිදක්වන ලද "රජයේ බලය බෙදාහැරීමේ යෝජනාවලිය" තුළය. පොදුපෙරමුණ රජය විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමේ ක්‍රියාවලියේ ප්‍රථම පියවර වූයේ මෙම බලය බෙදාහැරීමේ යෝජනාවලියයි. මෙම යෝජනාවලිය එක "පැකේජය" ලෙස ප්‍රකට

විය. එහි VIIවන කොටස වන රාජ්‍ය සේවය යටතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවන් පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සමග සාකච්ඡා කර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කළ යුතු බවයි. ( පිටුව 489 - රොහාන් එදිරිසිංහ, මාරියෝ ගෝමස්, වී.ටී. තමිල්මාරන්., අසංක වැලිකල - Power - Sharing In Sri Lanka Constitutional and Political Documents 1926 - 2008, Centre For Policy Alternatives - 2008 Colombo) 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් හඳුන්වාදුන් සහ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් යළි හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳව පළමුවරට හමුවන නිල ලේඛනය වන්නේ 1995 වසරේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු අමාත්‍යංශය විසින් ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම රජයේ බලය බෙදාහැරීමේ යෝජනාවලිය හෙවත් පැකේජයයි.

## 4.4. රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යෝජනාවලිය -1997

1995 බලය බෙදාහැරීමේ යෝජනාවලිය තවදුරටත් සංවර්ධනය කරමින් 1997 ඔක්තෝබර් මාසයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු අමාත්‍යංශය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යෝජනාවලියක් ගෙන එන ලදි. රාජ්‍ය ආයතන නිර්දේශපාලනකරණ සහ ජනාධිපතිවරයාගේ බලතල තවදුරටත් අඩු කරන ආකාරයේ ව්‍යවස්ථා සභාවක් පිළිබඳව විධිමත් ප්‍රතිපාදන මෙම යෝජනාවලිය තුළ අන්තර්ගත විය.එකී යෝජනාවලියේ VIX වන පරිච්ඡේදය වෙන්වී තිබුණේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳ ප්‍රතිපාදන වෙනුවෙනි. යෝජනා කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් වූයේ කථානායක. අගමැති, විපක්ෂනායක, ප්‍රධාන අමාත්‍ය සම්මේලනයේ සභාපති, සෑම ජනවර්ගයක්ම නියෝජනය වන පරිදි තෝරාගත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 7 දෙනෙක්, කථානායකවරයා විසින් නාම යෝජනා කරනු ලබන විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ හෝ අභියාචනාධිකරණ විනිසුරුවරුන් දෙදෙනෙකුය.

- ජාතික රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන පිළිබද ස්ථිර කොමිෂන් සභාව,
- මැතිවරණ කොමිෂන් සභාව,
- මුදල් කොමිෂන් සභාව, යන කොමිෂන් සභාව සදහා සුදුසු සාමාජිකයින් ජනාධිපති වෙත නිර්දේශ කිරීම මෙම කොමිෂන් සභාවේ එක් කාර්යයකි.

එසේම

- නීතිපති,
- යුද හමුදා නාවික හමුදා ගුවන් හමුදා සහ පොලිස් ප්‍රධානයා,
- මැතිවරණ කොමසාරිස්.

- ඔම්බුඩ්ස්මන්,
- විගණකාධිපති යන ධුර සඳහා ජනාධිපති විසින් නිර්දේශ කරන පුද්ගලයන්ට අනුමැතිය ලබාදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ දෙවන කාර්යයයි. එයට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහ නීතියෙන් නියම කරනු ලබන වෙනත් කාර්යය සිදු කිරීම මෙම කොමිෂන් සභාවේ කාර්යයක් බව එකී යෝජනාවලියේ සඳහන් විය.

මෙම යෝජනාවලියේ VII වන පරිච්ඡේදයේ මධ්‍යම විධායකය - ජනරජයේ ජනාධිපති පිළිබඳව ප්‍රතිපාදන වෙනුවෙන්ය. මෙම යෝජනාවලිය මගින් යෝජනා කළ ජනාධිපතිවරයා පත් කරනු ලබන්නේ නොපැමිණි මන්ත්‍රිවරුන්ද ඇතුළුව පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ බහුතර ඡන්දයෙනි. ඒ අනුව එම ජනාධිපති, අගමැතිගේ උපදෙස් අනුව ක්‍රියාකරන ජනරජයේ ප්‍රධානියා මෙන්ම සන්නද්ධ සේවාවලද ප්‍රධානියාය. මෙම යෝජනාවලියේ ප්‍රතිපාදන අනුව ජනාධිපතිවරයා විධායකය ලෙස හැඳින්වුවද අගමැතිගේ උපදෙස් මත ක්‍රියාකළ යුතු ජනාධිපතිවරයෙකි.

## 4.5. එක්සත් ජාතික පක්ෂයේ 43 වන වාර්ෂික සම්මේලනය -1997

1997 දෙසැම්බර් 21 වන දින පවත්වන ලද එක්සත් ජාතික පක්ෂයේ 43 වන වාර්ෂික මහා සම්මේලනයේදී සම්මත කරගත් යෝජනාවක් අංක 1 දරන යෝජනාවද ජනාධිපතිවරයාගේ බලතල අඩු කිරීම සහ රාජ්‍ය ආයතන නිර්දේශපාලකරණය පිළිබඳව ඉතා වැදගත් සන්ධිස්ථානයකි. එහි අංක 1 දරන යෝජනාව වූයේ දූෂිත, ප්‍රෝඩාකාරී, බලලෝභී දේශපාලන සංස්කෘතියක් අත්විඳීමට සිදුවීමෙන් බලාපොරොත්තු සුන් වී කර කියාගත නොහැකිව සිටින මහජනතාව තුළ දේශපාලනය පිළිබඳ නව පිබිදීමක් හා අපේක්ෂාවක් ඇති කරනු පිණිස නව දේශපාලන සංස්කෘතියක් බිහි කළ යුතු යැයි යෝජනා කරන්නීය.
නව දේශපාලන සංස්කෘතියක් උදෙසා,

01. ස්වාධීන මැතිවරණ කොමිසමක් පිහිටුවීම,
02. ස්වාධීන පොලිස් කොමිසමක් පිහිටුවීම,
03. ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් පිහිටුවීම,
04. ශ්‍රේෂ්ඨාධිකරණය ස්වාධීනත්වය තහවුරු කෙරෙන බලතල තවදුරටත් ශක්තිමත් කිරීම, තුළින් මූලික පියවර තැබිය යුතුය. ( 24 වන පිටුව - 2001 සැප්තැම්බර් 24 වන දින හැන්සාර්ඩ් වාර්තාව) යනුවෙනි.

## 4.6. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහ ප්‍රධාන ආයතන නිර්දේශපාලනකරණය කිරීම සඳහා වූ පුරවැසි උපදේශන කමිටු වාර්තාව 1998

1998 සැප්තැම්බර් 14 වනදින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී විද්වතුන් 18 දෙනෙකුගෙන් සමත්විත නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහ ප්‍රධාන ආයතන නිර්දේශපාලනකරණය කිරීම සඳහා වූ පුරවැසි උපදේශන කමිටුව නම් කමිටුව මගින් වාර්තාවක් එළිදැක්වූ විය. එකී වාර්තාවේ 8 වන ඡේදය වෙන්ව පැවතියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සම්බන්ධ නිර්දේශ වෙනුවෙනි. එහි 8.5. නිර්දේශය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් නිර්දේශ කර තිබිණි. එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංයුතිය වූයේ

- කථානායක,
- අගමැති,
- විපක්ෂ නායක,
- පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරුන් විසින් නාමයෝජනා කරන ලද ප්‍රධාන අමාත්‍යවරයෙකු,
- පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් විසින් නම් කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 5 දෙනෙකු
- අගමැති සහ විපක්ෂ නායක විසින් ඒකාබද්ධව නාම යෝජනා

කරනු ලබන සාමාජිකයින් 7 දෙනෙකු. මෙම හත්දෙනා අතරින් දෙදෙනෙකු විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ හෝ අභියාචනාධිකරණ විනිසුරුවරුන් විය යුතු අතර, ඉතිරි පස්දෙනා රාජ්‍ය සේවයේ විශිෂ්ට සේවාවක් සිදුකළ හෝ වෘත්තීය, වාණිජ, කර්මාන්ත ක්ෂේත්‍රයේ හෝ කෘෂිකර්මාන්තයේ විශිෂ්ටත්වයට පත් දේශපාලන තනතුරු නොදරන පුද්ගලයන් විය යුතුය.

මේ අනුව මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් 16 දෙනෙකු සිටින අතර 8 දෙනෙක් පාර්ලිමේන්තුව නියෝජනය කරන අතර එක් අයෙකු පළාත් සභාව නියෝජනය කරයි. සාමාජිකයින් 7 දෙනෙකු දේශපාලන සබඳතා නොමැති පුද්ගලයන්ය.

පහත සඳහන් කොමිෂන් සභා සඳහා කොමසාරිස්වරුන් පත් කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපති වරයා විසින් එම පත් කිරීම සිදුකළ යුතු බව මෙම වාර්තාවේ දැක්වේ. එනම්

I. ජාතික මැතිවරණ කොමිසම
II. ජාතික රාජ්‍ය සේවා කොමිසම
III. ජාතික පොලිස් කොමිසම
IV. අල්ලස් සහ දූෂණ කොමිසම

V. සීමා නිර්ණය කොමිසම
VI. රාජ්‍ය භාෂා කොමිසම
VII. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම
VIII. මුදල් කොමිසම
IX. ජාතික අධ්‍යාපන කොමිසම

එසේම පහත සඳහන් රජයේ උසස් තනතුරු සදහා ජනාධිපති විසින් නිර්දේශ කරනු ලබන පුද්ලගයන් පත් කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ලබාගත යුතු බව වාර්තාවේ දක්වේ

I. අගවිනිසුරු
II. නීතිපති
III. යුද, නාවික, ගුවන් හමුදාවන්ගේ ප්‍රධානීන්
IV. ඔම්බුඩ්ස්මන්
V. විගණකාධිපති
VI. ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම්, කැබිනට් ලේකම් සහ වෙනත් අමාත්‍යංශ ලේකම්වරු.

( පිටුව 53, Report of the Citizens Consultation on Free and Fair Elections and Depoliticization of Key Institutions -1998 November)

නිදහස් සහ සාධාරණ මැතිවරණ පැවැත්වීම සහතික කිරීම සදහා ස්වාධීන මැතිවරණ කොමිසන් සභාවක් පිහිටුවීම, පොලිසිය නිර්දේශපාලනීකරණය කිරීම පිණිස ජාතික පොලිස් සේවා කොමිෂන් සභාවක් පිහිටුවීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලතල ලබාදීම සහ එය ස්වාධීන කිරීම, අධිකරණය ස්වාධීන කිරීම සදහා අධිකරණ සේවා කොමිෂන් සභාවට අතිරේකව අධිකරණ පත්කිරීම් කොමිෂන් සභාවක් පත් කිරීමටද, ජනාධිපති විසින් මහාධිකරණ විනිසුරුවරු පත් කිරීමේදී අධිකරණ පත්කිරීම් කොමිෂන් සභාවේ නිර්දේශ මත එය සිදුකළ යුතු බවටද නිර්දේශ කර තිබිණ.

මෙම පුරවැසි උපදේශන කමිටුවේ වාර්තාව කෙටුම්පත් කරන ලද්දේ කේ.එච්.ජේ.විජේදාස, බ්‍රැඩ්මන් වීරකෝන්, ඩී.එම්.ස්වාමිනාදන්, ස්වර්ණා ඔබේසේකර, ආනා සෙනවිරත්න, සිබිලි අසීස්, ඩබ්ලිව්.ඩී.අයිලප්පෙරුම, ඔස්වල් ෆර්ත් පියතුමා, ඒ.සී.එම්.හෂීම්, වෙල්වින් විජේසේකර, හෙන්රි ගුණතිලක, ඔස්ටින් ප්‍රනාන්දු, මොනිකා රුවන්පතිරණ, කිංග්ස්ලි රොඩ්‍රිගො, ඒ.එල්.එම්.තන්ගවේල්, එල්මෝ පෙරේරා, ජානකී ගුණවර්ධන, ඩී.එස්.එස්. මායාදුන්න යන විද්වතුන්ය. මෙම උපදේශන කමිටුවේ කැදවුම්කරු වූයේ එවකට කොළඹ පුරපති කරු ජයසූරියයි.

## 4.7. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත 2000

1993 වසරේ බලයට පැමිණි පොදු පෙරමුණු රජයේ අණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් ආරම්භ කරන ලද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමේ ක්‍රියාවලියේ අවසන් පියවර වූයේ 2000 අගෝස්තු 3 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතයි. ව්‍යවස්ථා කෙටුම්පත සකස් කරන ලද්දේ අධිකරණ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු ජනවාර්ගික ඒකාබද්ධතා අමාත්‍ය මහාචාර්ය ජී.එල් .පීරිස්ගේ සභාපතිත්වයෙන් යුතු පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් විසිනි. මෙම තේරීම් කාරක සභාව විසින් 1994 වසරේ සිට 1999 වසර දක්වා රැස්වීම් වාර 77 ක් පවත්වා ඇති බව මහාචාර්ය ජී.එල් . පීරිස් අමාත්‍යවරයා ප්‍රකාශකර ඇත.( අහමඩ්, 2000:ix)

මෙම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි VII වන පරිච්ඡේදය වෙන්වී ඇත්තේ මධ්‍යම විධායකය-ජනරජයේ ජනාධිපතිවරයා පිළිබඳ ප්‍රතිපාදන වෙනුවෙනි. 55 වන වගන්තියට අනුව ජනාධිපතිවරයා රජයේ නායකයා සහ සන්නද්ධ හමුදාවල සේනාවිධායකයා වන අතර අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයා ක්‍රියාකළ යුතුය.කෙටුම්පතේ 56 වන වගන්තියට අනුව ජනාධිපතිවරයා තෝරාපත් කරගනු ලබන්නේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙනි. මේ අනුව මෙම කෙටුම්පත මගින් යෝජනා කරනු ලබන ජනාධිපතිවරයා විධායක බලතල නොමැති ජනාධිපතිධුරයකි.

මෙම කෙටුම්පතේ XIV පරිච්ඡේදය වෙන්වී තිබුණේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳ ප්‍රතිපාදන වෙනුවෙනි. එහි 122 වගන්තිය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් වූයේ

- උප ජනාධිපතිවරුන් දෙදෙනා,
- අග්‍රාමාත්‍යවරයා,
- පාර්ලිමේන්තුවේ විපක්ෂනායකවරයා,
- පාර්ලිමේන්තුවේ කථානායකවරයා,
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විෂය භාර අමාත්‍යවරයා,
- ප්‍රධාන අමාත්‍යවරුන්ගේ සම්මේලනයේ සභාපතිවරයා
- අගවිනිසුරුගේ අදහස අනුව ජනාධිපති විසින් පත් කරනු ලබන

අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් ලෙස සේවය කළ විශ්‍රාමික විනිසුරුවරුන් තිදෙනෙකුගෙන්ය.

මේ අනුව දසදෙනෙකුගෙන් යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිධුරය උප ජනාධිපතිවරුන් විසින් මාස හය බැගින් මාරුවෙන් මාරුවට දැරිය යුතු බව 122(2) වගන්තියේ සඳහන් වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ප්‍රධාන කාර්යයක් වන්නේ පහත සඳහන් කොමිෂන් සභා සඳහා කොමසාරිස්වරුන් ලෙස සුදුසු පුද්ගලයන්ගේ නම් ජනාධිපති වෙත නිර්දේශ කිරීමයි. එනම්

- ජාතික රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කිරීමේ නිත්‍ය කොමිෂන් සභාව,
- රාජ්‍ය භාෂා කොමිෂන් සභාව,
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
- මැතිවරණ කොමිෂන් සභාව,
- මුදල් කොමිෂන් සභාව,
- ජාතික පොලිස් කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පහත සඳහන් රජයේ උසස් තනතුරු සඳහා ජනාධිපති විසින් සිදුකරන නිර්දේශිත නම් සඳහා අනුමැතිය ලබාදීමද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යයකි. එනම්

- නීතිපතිවරයා
- පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා
- ඔම්බුඩ්ස්මන්වරයා
- විගණකාධිපතිවරයා

මෙම කෙටුම්පතේ 156 වගන්තියට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවක් පවතින අතර එහි සභාපති නිලබලයෙන් අගවිසුරු වේ. අනෙකුත් සාමාජිකයින් දෙදෙනා ජනාධිපති විසින් අගවිනිසුරුගෙන් අදහස් විමසා පත්කළ යුතුය. එසේම ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් පත් කිරීමේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ අනෙක් විනිසුරුවරුන්ගේ අදහස් විමසා ජනාධිපති විසින් පත් කළ යුතු බව කෙටුම්පතේ 15(2) වගන්තිය දක්වයි. එසේම පළාත්බද මහාධිකරණවල විනිසුරුවරුන් පත් කිරීමේදීද අගවිනිසුරුගේ අදහස් විමසා දැනගැනීමෙන් පසුව ජනාධිපති විසින් පත් කිරීම් සිදුකළ යුතු බව පනත් කෙටුම්පතේ 155 වගන්තිය දක්වයි.

එසේම ජාතික පොලිස් කොමිෂන් සභාවක් සහ පළාත් පොලිස් කොමිෂන් සභා

පිහිටුවීම පිළිබඳ ප්‍රතිපාදනද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල වැඩි කිරීම පිළිබඳ ප්‍රතිපාදනද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වඩාත් ස්වාධීන කිරීම පිළිබඳ ප්‍රතිපාදනද, ජාතික මැතිවරණ කොමිෂන් සභාවක් පිහිටුවීම පිළිබඳ ප්‍රතිපාදනද මෙම කෙටුම්පතේ ඇතුළත්ව තිබිණ.

මේ අනුව විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීම පාර්ලිමේන්තුවේ බලතල ශක්තිමත් කිරීම, මැතිවරණ පැවැත්වීම ස්වාධීනව සිදුකිරීම, රාජ්‍ය සේවය අධිකරණය සහ පොලිසිය ස්වාධීන කිරීම පිළිබඳ ප්‍රතිපාදන මෙම ව්‍යවස්ථා කෙටුම්පත තුළ ඇතුළත්ව තිබිණි.කෙටුම්පත් පිළිබඳ විවාදය 2000 අගෝස්තු 3, 7 හා 8 දිනවල පැවති අතර එක්සත් ජාතික පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් විසින් මෙම කෙටුම්පත පාර්ලිමේන්තුව තුළදී ගිනිතබා විනාශ කරන ලදි.

## 4.8. විද්වත් වෘත්තිකයන්ගේ සංගමය සම්පාදිත 17 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත-2001 ජනවාරි

2000 ව්‍යවස්ථා කෙටුම්පත ඉදිරියට නොයන  බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවවස්ථා සංශෝධනයක් එනම් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සාකච්ඡාව සිවිල් සමාජය තුළ පැන නැගිණ. විද්වතුන් හා සිවිල් ක්‍රියාකාරීන් අතර මෙම සාකච්ඡා ආරම්භ කිරීමට මූලික වූයේ එවකට කොළඹ පුරපති ලෙස කටයුතු කළ කරූ ජයසූරිය මහතාය. නගරාධිපති නිල නිවසේදී ආනන්ද සංගරී, වික්ටර් අයිවන්, වරණ කරුණාතිලක, එල්මෝ පෙරේරා වැනි කණ්ඩායමක් මේ සඳහා සහභාගි විය. සාකච්ඡා වාර දෙකකට පසුව කණ්ඩායමේ අදහස වූයේ මෙම සාකච්ඡා නගරාධිපති නිල නිවසේ පැවැත්වීම නිසා එයට එක්සත් ජාතික පක්ෂ මුහුණුවරක් ගන්නා බැවින් එය වෙනත් ස්වාධීන ස්ථානයක පැවැත්විය යුතු බවයි. එල්මෝ පෙරේරා එවකට විද්වත් වෘත්තිකයින්ගේ සංගමයේ (OPA) ලේකම්වරයා ලෙස කටයුතු කළ බැවින් මෙම සාකච්ඡා මින් ඉදිරියට එහි පැවැත්වීමට කණ්ඩායම එකඟ විය. (ලියන ආරච්චි, 2016: 19).

ඒ අනුව විද්වත් වෘත්තිකයින්ගේ සංගමය විසින් ව්‍යවස්ථා සංශෝධන කාර්යය සඳහා සියලුම දේශපාලන පක්ෂවලට ආරාධනා කරනු ලැබිණ. ජනතා විමුක්ති පෙරමුණ, එක්සත් ජාතික පක්ෂය ඇතුළු බොහෝ පක්ෂ ඊට සහභාගී විය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහභාගි නොවිණ.

2001 ජනවාරි මාසයේදී විද්වත් වෘත්තිකයින්ගේ සංගමය විසින් අනුමත කළ මෙම 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ප්‍රසිද්ධියට පත්කළ අතර එය සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත යොමුකරන ලදි. (ලියන ආරච්චි, 2017:20)

මෙම කෙටුම්පත මගින් එතෙක් පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI පරිච්ඡේදයට පසුව VIඅ ලෙස නව පරිච්ඡේදයක් එකතු කිරීමට යෝජනා කරන ලදි. ඒ අනුව 29අ ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ස්ථාපනය කළ යුතුය. එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් වන්නේ

- කථානායක
- අගමැති
- විපක්ෂ නායක
- කථානායක විසින් පත්කරන ඉහත තිදෙනා නියෝජනය නොකරන දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු
- කථානායක විසින් පත් කරන වයස අවුරුදු 70 වට නොඅඩු විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුවරයෙක්
- පහත සඳහන් ආයතනවලින් තෝරාගන්නා වයස අවුරුදු 70ට අඩු සහ මනා සේවා වාර්තා සහිත, දේශපාලන සබඳතාවලින් තොර පුරවැසියන්
- විද්වත් වෘත්තිකයන්ගේ සංවිධානයෙන් එක් අයෙක්
- වාණිජ මණ්ඩලයෙන් සහ උපලේඛනයේ සඳහන් කර්මාන්ත අංශය නියෝජනය කරමින් එක් අයෙක්
- උපලේඛනයේ සඳහන් කර ඇති වෘත්තීය සමිති නියෝජනය කරමින් එක් අයෙකු
- උපලේඛනයේ සඳහන් ජනමාධ්‍ය සංවිධාන නියෝජනය කරමින් එක් අයෙකු
- උපලේඛනගත රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරමින් එක් අයෙකු

(ලැයිස්තුගත කර්මාන්ත, වෘත්තීය සමිති ලැයිස්තුව, ජනමාධ්‍ය සංවිධාන ලැයිස්තුව, සහ රාජ්‍ය නොවන සංවිධාන ලැයිස්තුව උපලේඛන ලෙස කෙටුම්පතට ඇතුළත් කර තිබිණි)

මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මූලිකම කාර්යය වූයේ පහත සඳහන් කොමිෂන් සභා සඳහා සුදුසු කොමසාරිස්වරුන් ජනාධිපති වෙත නිර්දේශ කිරීමයි. එනම්

- අධිකරණ සේවා කොමිෂන් සභාව
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව
- මැතිවරණ කොමිෂන් සභාව
- පොලිස් කොමිෂන් සභාව
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
- සීමා නිර්ණය කොමිෂන් සභාව
- අධ්‍යාපන කොමිෂන් සභාව
- මානව හිමිකම් කොමිෂන් සභාව
- මුදල් කොමිෂන් සභාව

එසේම පහත සඳහන් රජයේ උසස් තනතුරු සඳහා ජනාධිපති විසින් නිර්දේශ කරනු ලබන පුද්ගලයන් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය නොමැතිව ජනාධිපතිට එම පුද්ගලයන්ව අදාළ තනතුරු සඳහා පත්කළ නොහැකිය.

- අගවිනිසුරු සහ සෙසු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්
- අභියාචානාධිකරණයේ සභාපති සහ සෙසු අභියාචනාධිකරණ විනිසුරුවරුන්
- නීතිපති
- විගණකාධිපති
- ඔම්බුඩ්ස්මන්
- පාර්ලිමේන්තුවේ මහලේකම්
- යුද, නාවික සහ ගුවන් හමුදාවල ප්‍රධානීන්
- මහබැංකුවේ අධිපති
- අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජෙනරාල්
- පොලිස්පති

එසේම රාජ්‍ය සේවය වඩාත් ස්වාධීන කිරීම සඳහා ජාතික රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල වැඩි කිරීම, මැතිවරණ කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම, පොලිස් සේවා කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම ආදී ප්‍රතිපාදන මෙම කෙටුම්පත් ලියවිල්ල තුළ ඇතුළත් විය.

## 4.9. පොදු ජන එක්සත් පෙරමුණ සහ ජනතා විමුක්ති පෙරමුණ අතර අවබෝධතා ගිවිසුම-2001 සැප්තැම්බර්

2000 පාර්ලිමේන්තු මැතිවරණයෙන් ආණ්ඩු බලය පිහිටුවාගත් පොදුජන එක්සත් පෙරමුණු රජය 2001 ජූනි මාසයේදී අර්බුදයකට මුහුණ දුන්නා."අර්බුදය හටගන්නේ රජයට සහය දුන් මුස්ලිම් කොන්ග්‍රසයේ හා ජාතික සමගි පෙරමුණේ මන්ත්‍රීවරුන් හත් දෙනෙකු 2001 වසරේ ජූනි 21 දින විපක්ෂයට එක් වීමත් සමගයි. ඒ අනුව විපක්ෂයට මන්ත්‍රී ධුරය 115ක් හිමිවූ අතර ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීධුර සංඛ්‍යාව 109 දක්වා පහළ යන ලදි. 2001 ජූලි 10 වන දින විපක්ෂ මන්ත්‍රීවරුන් 115 ක් අත්සන් කරන ලද විශ්වාසභංග යෝජනාවක් කථානායක අනුර බණ්ඩාරණායක මහතාට (අනුර බණ්ඩාරණායක මහතා එක්සත් ජාතික පක්ෂයෙන් පාර්ලිමේන්තුවට පත්වූ මන්ත්‍රීවරයෙකි) භාරදෙන ලදි".( ලියන ආරච්චි, 2017:20)

මේ අවස්ථාවේදී ජනාධිපතිනිය විසින් පාර්ලිමේන්තු සභාවාරය කල් දමූ අතර 2001 ජූලි මස 10 වන දින අංක 1192/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2001 අගෝස්තු මස 10 වන දින ජනමත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳව ජනමත විචාරණයක්ද කැඳවන ලදි.

මෙම තත්ත්වය හමුවේ ආණ්ඩුවට සහය සඳහා ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් වූ අතර ඒ සඳහා 2001 සැප්තැම්බර් මස 05 වනදින පොදුජන එක්සත් පෙරමුණේ මහලේකම් දිමු ජයරත්න සහ ජනතා විමුක්ති පෙරමුණේ මහලේකම් ටිල්වින් සිල්වා අතර අවබෝධතා ගිවිසුමක් ඇති කරගන්නා ලදි. එහි 5වන වගන්තියේ මෙසේ සදහන් විය.

මෙම ගිවිසුමේ උපලේඛනයෙහි සදහන් විපක්ෂයේ සියලුම පක්ෂවල පූර්ණ එකඟතාව යටතේ කෙටුම්පත් කොට ඇති යෝජිත 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි,

(අ) ව්‍යවස්ථාදායක මණ්ඩලය
(ආ) ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාව
(ඇ) ස්වාධීන අධිකරණ සේවා කොමිෂන් සභාව
(ඈ) ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාව
(ඉ) ස්වාධීන පොලිස් කොමිෂන් සභාව දෙපාර්ශ්වයම එකඟවන අත්‍යවශ්‍ය සංශෝධවලට යටත්ව ආණ්ඩක්‍රම ව්‍යවස්ථාවට ගෙන එනු ලබන සංශෝධනවලට යටත්ව 2001 ක්වූ සැප්තැම්බර් මස 24 වන දින හෝ ඊට පෙර දිනකදී පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමටත්, පොදුජන එක්සත් පෙරමුණ එකඟ වේ. "ව්‍යවස්ථා මණ්ඩලය 2001 ඔක්තෝබර් 05 දිනට පෙර ස්ථාපනය කළ

යුතුය" මෙහිදී ගිවිසුමේ උපලේඛනයට එක් කරන ලද්දේ විද්වත් වෘත්තිකයන්ගේ සංගමය විසින් කෙටුම්පත් කරන ලද 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතය.( ලියන ආරච්චි, 2016:21)

අවබෝධතා ගිවිසුමේ 7 වන වගන්තියේ සඳහන් වූයේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසිකර පාර්ලිමේන්තුවට විධායක බලය පැවරීම සඳහාවූත්, සියලු ජනකොටස්වල කැමැත්ත පාර්ලිමේන්තුව තුළ සාධාරණ ලෙස නියෝජනය වන පරිදි සකස් වූ මැතිවරණ ක්‍රමයක් සඳහා අවශ්‍ය ව්‍යවස්ථා සංශෝධන හා භාරකාර ආණ්ඩුවක් යටතේ එම මැතිවරණය පැවැත්වීම සඳහා වූත්, අවශ්‍ය ව්‍යවස්ථා සංශෝධන මෙම දිනයේ සිට මාස 6ක් ඇතුළත කාලයක් තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට දෙපාර්ශ්වය එකඟවේ. එය ක්‍රියාත්මක වන්නේ මෙම ව්‍යවස්ථා සංශෝධනයෙන් එළඹෙන පළමුවන පාර්ලිමේන්තු මැතිවරණයේදීය.

මේ අනුව මෙම එකඟතා ගිවිසුම මගින් ජනාධිපතිවරයාගේ බලතල මූලික වශයෙන් අඩු කිරීමත් රාජ්‍ය සේවය මැතිවරණ පොලිසිය සහ අධිකරණ වඩාත් ස්වාධීන කිරීම සඳහා වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සඳහාත් අවසානයේදී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා දෙපාර්ශ්වයම එකඟතාව පළකිරීමත් සිදුවිය.

මේ අනුව 2001 වසරේදී 17 වන සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ බලතල අඩු කිරීම සහ මූලික ආයතන ස්වාධීන කිරීම පිළිබඳ ප්‍රතිපාදන ඇතුළත් වන අවස්ථාව දක්වා 1993 වසරේ සිටම විවිධ දේශපාලන පක්ෂ සිවිල් ක්‍රියාකාරීන් මෙන්ම වෘත්තිකයන්ගේ සංවිධානයද විවිධ උත්සාහ දරා ඇති බව පැහැදිලිය.

# පස්වන පරිච්ඡේදය

# 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

ජනාධිපති ධුරයේ විධායක බලතල අඩුකිරීම රාජ්‍ය ආයතන නිර්දේශපාලනය කිරීම පිළිබදව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සංශෝධනයක් පිළිබඳව 1993 වසරේ සිට ආරම්භ වූ සාකච්ඡා සහ ක්‍රියාමාර්ග එක්තරා දුරකට යථාර්ථයක් බවට පත් වූ අවස්ථාවක් ලෙස 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වා දිය හැකිය. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සදහා භාවිත කරන ලද්දේ විද්වත් වෘත්තිකයන්ගේ සංවිධානය විසින් සම්පාදනය කරන ලද කෙටුම්පත වුවද එය පාර්ලිමේන්තුවේ සම්මත වූ පසුව මුල් ලියවිල්ල සහ එම සංශෝධනය අතර විශාල වෙනස්කම් තිබුණ බව එම කමිටුවේ සමාජිකයකුවූ එල්මෝ පෙරේරා 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම ගැන සිවිල් සමාජයේ වගකීමක් නැමති ලිපියේ දක්වා ඇත ( ජාතික සාම මණ්ඩලය, 2008:3) කෙසේ නමුත් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දක්වා වූ ගමන් මග පිළිබඳව පසුගිය පරිච්ඡේදයෙන් සාකච්ඡා කළ අතර 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම එහි මූලික ලක්‍ෂණ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අවසානය හා එහි බලපෑම පිළිබඳව මෙම පරිච්ඡේදයෙන් සාකච්ඡා කිරීමට අපේක්‍ෂා කරයි.

## 5.1. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන ආවේ හදිසි පනත් කෙටුම්පතක් ලෙසය. එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122

ව්‍යවස්ථාව  අනුව පළමුව ජනාධිපතිතුමිය විසින් එය ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීම සඳහා ඉදිරිපත් කරන ලදි. ශ්‍රේෂ්ඨාධිකරණය මෙම පනත් කෙටුම්පත සලකා බලන අවස්ථාව වන විට  ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සම් 3ක් ඉදිරිපත්ව තිබූ අතර එම පෙත්සම් ඉදිරිපත් කර තිබුනේ විජය ප්‍රකාශන සමාගම සහ උපාලි පුවත්පත් සමාගම, මාධ්‍යවේදී වික්ටර් අයිවන්, මාධ්‍යවේදී වරුණ කරුණාතිලක යන පුද්ගලයන් සහ ආයතන විසිනි. මෙම පෙත්සම් තුන මගින් ප්‍රශ්නකර තිබුණේ ව්‍යවස්ථා කෙටුම්පතේ 9 වන වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104අ(6) අනු ව්‍යවස්ථාව ලෙස ඇතුළත් කිරීමට යෝජනා කරන ලද ප්‍රතිපාදන සම්බන්ධයෙනි. එහි සඳහන්  වූයේ යම් ඡන්ද විමසීමක් සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමෙන් දින 7ක් ඇතුළත මාධ්‍ය ආයතනයක් විසින් තමන් යම් දේශපාලන පක්ෂයකට හෝ කණ්ඩායමකට සහය ලබාදෙන බව මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දෙන්නේ නම් ඒ පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුතු බවත් එවැනි මාධ්‍ය ආයතනවලට  මැතිවරණ කොමිෂන් සභාව විසින් පනවනු ලබන විධාන අදාළ නොවන බවයි. මෙම ප්‍රතිපාදනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කරනද බවට පෙත්සම්කරුවන් විසින් ගෙන එන ලද තර්කය ශ්‍රේෂ්ඨාධිකරණයද පිළිගන්නා ලදි. එහිදී  නීතිපතිවරයා විසින් මෙම ප්‍රතිපාදනය ඉවත් කිරීමට එකඟ විය. ශ්‍රේෂ්ඨාධිකරණ තීරණ අංක 6/2001 යටතේ (SC SD 6/2001) යටතේ අංකනය කර තිබූ මෙම පෙත්සම් විභාග කරන ලද්දේ අගවිනිසුරු සරත් නන්ද සිල්වා, සහ  පී එදිසූරිය සහ එච්.එස්.යාපා යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි.ශ්‍රේෂ්ඨාධිකරණය සිය මතය 2001 සැප්තැම්බර් 21 වන දින කථානායක සහ ජනාධිපති වෙත යොමුකර තිබිණි. (පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය, 2001:249) ඒ අනුව මෙම කෙටුම්පත පාර්ලිමේන්තුවේ 2/3ක විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල බව අධිකරණය තීරණය කර තිබිණ.

## 5.2. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම

පසුව 2001 සැප්තැම්බර් 24 වන දින 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද්දේ අග්‍රාමාත්‍ය රත්නසිරි වික්‍රමනායක විසිනි.

ඉහත පරිච්ඡේදය අනුව 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා පාදක කරගත් ලියවිල්ල විපක්ෂයේ දේශපාලන පක්ෂයක් (ජවිපෙ) විසින් ඉදිරිපත් කළ ලියවිල්ලකි. එය පාර්ලිමේන්තු ඉතිහාසයේ අලුත් අත්දැකීමක් විය. ජනතා විමුක්ති පෙරමුණ මෙම අවස්ථා මේ මුහුණදුන් දුෂ්කරතාව ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී

විමල් වීරවංශ මෙම විවාදයේදී මෙසේ ප්‍රකාශ කරන ලදි "පළමුවෙන්ම මා අවධාරණය කරන්න කැමතියි විපක්ෂය සකස් කළ කෙටුම්පතට පදනම්ව ආණ්ඩු පක්ෂය සමග දීර්ඝ ලෙස  සාකච්ඡා කළා. ආණ්ඩුපක්ෂයේ ඇතැම් සංශෝධන අවසානාත්මක සංශෝධන හැටියට නොවෙයි තිබෙන්නේ . නමුත් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අමාත්‍ය මණ්ඩලයෙන් අනුමත කර ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් අද 24 වැනි දා වන විට මේ අවස්ථාවට පැමිණිය යුතු නිසා අවසානාත්මක එකඟතා හැටියට නොව යම්කිසි එකඟතා හැටියට එකඟ වෙන්නට අපට සිදුවුණා. අවසානාත්මක එකඟතාවලට පැමිණීම සඳහා කාරක සභා අවස්ථාවට පෙර තවදුරටත් සාකච්ඡා කර නිරවුල් කර ගැනීමේ එකඟතාවයන් ඇතිව අපි කටයුතු කළා. ඒ අනුව කැබිනට් මණ්ඩලයෙන් අනුමත කර යැවූ කෙටුම්පතේ තිබෙන ගැටලු ගැන අප විපක්ෂයත් සමග සාකච්ඡා කළා". (පිටු අංක 47 2001 සැප්තැම්බර් 24 හැන්සාර්ඩ් වාර්තාව) මේ අනුව ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත සම්බන්ධයෙන් ජවිපෙ ආණ්ඩුපක්ෂය සහ එජාපය අතර එකඟතාවල ගැටලු තිබූ බව පෙනී යයි.

කෙටුම්පත සම්මත කිරීම සඳහා විවාදය සැප්තැම්බර් 24 වන දින පැවති අතර විවාදය අවසානයේ ඡන්ද විමසීමේදී පක්ෂව ඡන්ද 210ක් ලැබුණු අතර කිසිවෙකු විරුද්ධව ඡන්දය ප්‍රකාශ නොකරන ලදි. සිහළ උරුමය පක්ෂයේ ජාතික ලැයිස්තුවෙන් තේරී පත්වූ පාඨලී චම්පික මන්ත්‍රීවරයා ඡන්දය දීමෙන් වැළකී සිටින ලදි. ඔහුගේ ස්ථාවරය වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සර්වපාක්ෂික වුවත් එය ස්වාධීන ආයතනයක් නොවන බවයි. දේශපාලන පක්ෂවලට ලබාදෙන කෝටා මගින් ස්වාධීන ආයතන බිහිකළ නොහැකි බව ඔහු ප්‍රකාශ කරන ලදි (පිටු අංක 64 - හැන්සාර්ඩ් වාර්තාව 2001 සැප්තැම්බර් 24 ) මන්ත්‍රීවරුන් 13 දෙනෙකු නොපැමිණි මන්ත්‍රීවරුන් ලෙස සලකුණුවිය. (පිටු අංක 167- 2001 සැප්තැම්බර් 24 හැන්සාර්ඩ් වාර්තාව) ඒ අනුව කෙටුම්පත සම්මත වූ අතර 2001 සැප්තැම්බර් මස ඔක්තෝබර් 03 වන දින කථානායක සහතිකය සටහන් කිරීමෙන් පසුව බලාත්මක විය.

## 5.3. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ මූලිකාංග

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 17 වන සංශෝධනය ගෙන එනු ලබන්නේ මූලික වශයෙන්ම විධායක ජනාධිපති ධුරයේ බලතල අඩු කිරීම සඳහාය. ඒ අනුව එතෙක් පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 17 වන සංශෝධනය මගින් සිදුකරන ලද මූලික වෙනස්කම් වූයේ

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හඳුන්වාදීම
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල වැඩි කිරීම
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්වාධීන කිරීම

- අධිකරණ සේවා කොමිෂන් සභාවේ බලතල වැඩි කිරීම
- අධිකරණ සේවා කොමිෂන් සභාව ස්වාධීන කිරීම
- පරිපාලන අභියාචන විනිශ්චය සභාව හඳුන්වාදීම
- මැතිවරණ කොමිෂන් සභාව හඳුන්වාදීම
- ජාතික පොලිස් කොමිෂන් සභාව හඳුන්වාදීම

## 5.3.1.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්ථාපනය කිරීම

ඉහත පරිච්ඡේදයේ සදහන් කළ පරිදි 1995 රජයේ දේශපාලන යෝජනාවලිය තුළ සදහන් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳ ප්‍රතිපාදන මුල්වරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළු වන්නේ මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගිනි. මෙම සශෝධනයේ කේන්ද්‍රීය ආයතනය වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය වන්නේ

- අග්‍රාමාත්‍යවරයා
- කථානායකවරයා (සභාපති)
- විරුද්ධ පක්ෂ නායකයා
- ජනාධිපතිවරයාගේ නියෝජිතයෙකු
- අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂ නායකයා විසින් නාමයෝජනා කරන ජනාධිපතිවරයා විසින් පත්කරන 5 දෙනෙක්
- පාර්ලිමේන්තුවේ සුළු පක්ෂවල නියෝජිතයෙක්

මේ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සමස්ත සාමාජික සංඛ්‍යාව 10ක් වන අතර සුවිශේෂීම සිදු වීම වනුයේ එකී සාමාජිකයින්ගෙන් 7 දෙනෙකුම පාර්ලිමේන්තුව නියෝජනය නොකරන අය වීමයි. ඒ අනුව ජනාධිපතිවරයාගේ නියෝජිතයා අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂ නායකයා විසින් නාමයෝජනා කරන ජනාධිපතිවරයා විසින් පත්කරන 5 දෙනා හා පාර්ලිමේන්තුව නියෝනය කරන සුළු පක්ෂවල නියෝජිතයා යන 7 දෙනාම විශිෂ්ටත්වයෙන් හා අවංකභාවයෙන් යුත් පොදු ජනජීවිතයේදී කීර්තියට පත් කිසිදු දේශපාලන පක්ෂයක් නියෝජනය නොකරන පුද්ගලයන් විය යුතු බව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව දක්වා සිටියි. එසේම මෙම සාමාජිකයින් සුළු ජනවර්ග නියෝජනයක්ද ඇතුළත්වන ලෙස පත්විය යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන කොමිෂන් සභා සහ පාර්ලිමේන්තු පනත් මගින් ස්ථාපනය කරන ලද කොමිෂන් සභා දෙකක් සඳහා කොමසාරිස්වරුන් පත් කිරීමට එතෙක් ජනාධිපතිට තිබූ අභිමත බලය මෙම ව්‍යවස්ථා සභාව පිළිබඳ ප්‍රතිපාදන මගින් සීමා කරන ලදි. ඒ අනුව පහත කොමිෂන් සභා සඳහා

කොමසාරිස්වරුන් පත් කිරීමේදී ජනාධිපතිවරයා එම කොමසාරිස්වරුන් පත් කළ යුත්තේ ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත පමණි. එම කොමිෂන් සභා වන්නේ

- මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයින්,
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්,
- ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයින් ,
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයින්,
- අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ සාමාජිකයින්,
- මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින් ,
- සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයින්,

එයට අමතරව රජයේ ඇතැම් උසස් නිලතලවලට පුද්ගලයන් පත් කිරීමේදී එතෙක් ජනාධිපති වෙත තිබූ අභිමත බලයද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳ ප්‍රතිපාදන මගින් සීමා කරන ලදි. ඒ අනුව පහත තනතුරු සඳහා ජනාධිපති විසින් නිර්දේශ කරනු ලබන පුද්ගලයන් ජනාධිපතිට පත් කළ හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ලැබෙන්නේ නම් පමණි. එම තනතුරු වන්නේ

- අගවිනිසුරු හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්,
- අභියාචනාධිකරණ විනිසුරුවරුන්,
- අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්,
- නීතිපති,
- විගණකාධිපති,
- පොලිස්පති,
- ඔම්බුඩ්ස්මන්,
- පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මේ අනුව රජයේ ප්‍රධානම කොමිෂන් සභා සහ ප්‍රධාන නිලතල සම්බන්ධව ජනාධිපතිට තිබූ අභිමතානුසාරී බලතල මෙම ප්‍රතිපාදන මගින් සීමා කරන ලදි. ඒ අනුව එම කොමිෂන් සභා සහ තනතුරු දේශපාලනයෙන් ස්වාධීන කිරීම අපේක්ෂා කරන ලදි.

### 5.3.2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබාදුන් අතිරේක බලතල

1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(1) ව්‍යවස්ථාවට අනුව රජයේ නිලධාරීන් පත්කිරීම, මාරුකිරීම, සේවයෙන් පහ කිරීම සහ රජයේ නිලධරයන්ගේ විනය පාලනය අමාත්‍ය මණ්ඩල වෙත පවරා තිබිණි. එසේම 55(3) ව්‍යවස්ථා දක්වා සිටියේ අමාත්‍ය මණ්ඩලය සතු මෙම බලතල අමාත්‍ය මණ්ඩලය විසින් කලින් කල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා දිය හැකි බවයි.

මුල් කාලයේ කොමිෂන් සභාවට මෙම බලතල පවරාදී නොතිබුණ බැවින් කොමිෂන් සභාව අභියාචනා සලකා බලන මණ්ඩලයක් ලෙස පමණක් ක්‍රියාත්මක විය.

පසුව, වර්ෂ 1992දී, එතෙක් අමාත්‍යංශ ලේකම්වරුන් වෙත පවරා තිබූ මාණ්ඩලික ශ්‍රේණිවල රජයේ නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථානමාරු, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම පිළිබඳ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අමාත්‍ය මණ්ඩලය විසින් පවරා දෙනු ලැබිණ. කොමිෂන් සභාව හෝ එමගින් බලය අභිනියෝජිත කමිටුවක් විසින් ගනු ලබන තීරණ වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ අවලංගු කිරීමට බලතල අමාත්‍ය මණ්ඩලය වෙත රඳවා ගනු ලැබිණ.
(http://www.psc.gov.lk/index.php?option=com_content&view=article&id=14&Itemid=136&lang=si 2020/11/06)

නමුත් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල වඩාත් පුළුල් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව රාජ්‍ය සේවයේ පත් කිරීම් උසස් කිරීම් ස්ථාන මාරු කිරීම් හා විනය පාලනය කිරීම පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී තිබූ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරිණි. කෙසේ නමුත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සම්බන්ධ බලතල අමාත්‍ය මණ්ඩලය විසින්ම දරන ලදි.

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(1) ව්‍යවස්ථාව සංශෝධනය කරමින් රජයේ නිලධරයන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහිලා විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබීය.

එසේම 55(3) ව්‍යවස්ථාව සංශෝධනය කරමින් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහිලා විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා අමාත්‍ය මණ්ඩලය විසින් සිදුකළ යුතු බවටද ප්‍රතිපාදන ඇතුළත් කරන ලදි.
මේ අනුව කොමිසමට රාජ්‍ය සේවකයන් සම්බන්ධව විශාලය බලයක් ලැබුණ අතර එම හේතුවෙන් එතෙක් අමාත්‍ය මණ්ඩලයේ අභිමතය මත සිදුවූ රාජ්‍ය සේවයේ පත්කිරීම් මාරුකිරීම් සහ විනය පාලන සහ ඉවත්කිරීම් රාජ්‍ය සේවා කොමිසමට පැවරීම නිසා රාජ්‍ය නිලධාරීන්ට ස්වාධීනව කටයුතු කළ හැකි වාතාවරණයක් ස්ථාපනය කරන ලදි.

### 5.3.3. රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්වාධීන කිරීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත් කිරීම පිළිබඳව 1978 ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයාට අභිමත බලයක් පැවති අතර 17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීමේදී ජනාධිපතිවරයා වෙත අදාළ නම් නිර්දේශ කිරීමේ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පවරන ලදි. ඒ අනුව ඔවුන් දේශපාලනයෙන් යම්තාක් දුරකට ස්වාධීන කරන ලදි.

එසේම පැවති ආණ්ඩක්‍රම ව්‍යවස්ථාවී 56(4) ව්‍යවස්ථාවට අනුව කොමිෂන් සභාවේ සාමාජිකයකු හේතු දක්වා ඉවත් කිරීමේ බලය ජනාධිපතිට පැවතිණ. 17 වන ව්‍යවස්ථා සංශෝධනයේ 54(4) ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිට කොමිෂන් සභා සාමාජිකයකු ඉවත් කළ හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත පමණි. එසේම 17 වන ව්‍යවස්ථාවේ 55(5) ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුවට වගකීමට හා පිළිතුරු දීමට බැඳී සිටින ආයතනයක් බවට පත් කෙරිණි. මේ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත් කිරීමේදී කටයුතු කිරීමේදී සහ ඉවත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිගේ ග්‍රහණයෙන් ඉවත් කර ස්වාධීන ආයතනයක් බවට පත් කරන ලදි.

### 5.3.4. අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත අතිරේක බලතල ලබාදීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ව්‍යවස්ථාවට අනුව මහාධිකරණ විනිසුරුවරුන් පත් කිරීම පිළිබඳ පූර්ණ බලය ජනාධිපතිට පැවරී තිබිණි. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 111අ ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන සලසා ඇත්තේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත මෙම පත් කිරීම් සිදුකළ යුතු බවයි.එසේම 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත 111උෟ ව්‍යවස්ථාවේ දක්වන්නේ මහාධිකරණ විනිසුරුවරුන් පුහුණු කිරීමට අදාළ රීති සකස් කිරීමේ බලතල අධිකරණ සේවා කොමිෂන් සභාව සතු බවයි. ඒ අනුව මහාධිකරණ විනිසුරුවරුන් සම්බන්ධව මෙතෙක් නොතිබුණ බලයක් අධිකරණ සේවා කොමිෂන් සභාවට ලබා දී තිබිණි. එසේම 17 වන සංශෝධනය මගින් ස්ථාපනය කරන ලද පරිපාලන අභියාචනා විනිශ්චයාධිකරණය සඳහා විනිසුරුවරුන් පත් කිරීමේ බලයද අධිකරණ සේවා කොමිෂන් සභාවට පැවරිණි. ඒ අනුව 17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ බලතල වර්ධනය කිරීමක් සිදුකරන ලදි.

## 5.3.5. අධිකරණ සේවා කොමිෂන් සභාව ස්වාධීන කිරීම

1978 ව්‍යවස්ථාවේ 112(1) ව්‍යවස්ථාවට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙක් සාමාජිකයින් වන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් දෙදෙනා පත් කිරීමේ පරම බලය ජනාධිපති සතුව පැවතිණ. නමුත් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කොමිෂන් සභාවේ සාමාජිකයින් දෙදෙනා පත් කිරීමේදී ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ලබාගත යුතුය.

1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 112(5) ව්‍යවස්ථාවට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් (සභාපතිවරයා හැර) ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයා වෙත පැවතිණ.නමුත් 17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ(6) ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන සලසා ඇත්තේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ජනාධිපති විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉවත් කරන්නේ නම් ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය ලබාගත යුතු බවයි.

මේ අනුව අධිකරණ සේවා කොමිෂන් සභාව ජනාධිපතිගේ බලපෑමෙන් සෑහෙන දුරට ඉවත් කර ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය උත්සාහ දරා ඇත.

## 5.3.6. පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය ස්ථාපනය කිරීම

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අලුතින් ස්ථාපනය කරන ලද ආයතනයකි. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59(1) ව්‍යවස්ථාව මගින් මෙම අධිකාරිය පිහිටුවා ඇත.රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ පොලිස් කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ තීරණයක් වෙනස් කිරීමට, සුළු වශයෙන් වෙනස් කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට බලය ඇත්තේය. මෙයට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයකට වෙනස් කිරීම හෝ අවලංගු කිරීම සඳහා බලතල හිමිවූයේ අමාත්‍ය මණ්ඩලය වෙතය.(1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 59(අ) ව්‍යවස්ථාව). ඒ අනුව මෙම ව්‍යවස්ථා සංශෝධනයට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තිමත් වූ පුද්ගලයකුට සිදුවූයේ අමාත්‍ය මණ්ඩලය වෙත අභියාචනා කිරීමටය. එය රාජ්‍ය සේවකයා දැඩි ලෙස දේශපාලනීකරණය කළ කටයුත්තක් විය. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් හදුන්වා දුන් මෙම විනිශ්චය අධිකාරිය නිසා රාජ්‍ය සේවකයාට සිය අභියාචනය වඩාත් ස්වාධීන ආයතනයක් ලෙස සිදුකළ හැකිවිය.

එහි 59(2) ව්‍යවස්ථාව දක්වන්නේ විනිශ්චය අධිකාරියට අදාළ කාර්ය පටිපාටිය සහ බලතල නීතියෙන් නියම කළ හැකි බවයි. ඒ අනුව ඒ සඳහා පසුකාලීනව පාර්ලිමේන්තුව විසින් 2001 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරී පනත පනවා ඇත.එකී පනත අනුව විනිශ්චය අධිකාරිය සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර එකී සාමාජිකයික් වසර තුනක කාලයක් සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

## 5.3.7. ජාතික පොලිස් කොමිෂන් සභාව

පොලිස් සේවය දේශපාලනයෙන් ස්වාධීන කිරීමේ අරමුණින් 17 වන ආණ්ඩුක්‍ර ව්‍යවස්ථාව මගින් අලුතින් ස්ථාපනය කරන ලද ආයතනයකි. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIII අ පරිච්ඡේදයේ 155අ සිට 155ක දක්වා ව්‍යවස්ථාවන් වෙන්වී ඇත්තේ ජාතික පොලිස් කොමිෂන් සභාව පිළිබඳ ප්‍රතිපාදන වෙනුවෙනි.

ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත වසර 3ක නිල කාලයක් සඳහා ජනාධිපති විසින් පත් කරනු ලබන සාමාජිකයින් 7 දෙනෙකුගෙන් මෙම කොමිෂන් සභාව සමන්විත වේ. එසේම පාර්ලිමේන්තු පළාත් සභා හෝ පළාත් පාලන ආයතන නියෝජිතයකු මෙම කොමිසමේ සාමාජිකයකු ලෙස පත් කිරීමට නුසුදුසු බවත් රාජ්‍ය සේවයකයකු කොමිසමේ සාමාජිකයකු ලෙස පත් කළහොත් ඔහුගේ/ඇයගේ අදාළ ධූරය අත්හැරියා සේ සලකන බවත් කොමිසමේ සාමාජිකයකු වූ පුද්ගලයකු නැවත රාජ්‍ය සේවයට හෝ අධිකරණ සේවයේ ධූරයකට පත් කිරීමට නුසුදුසු වන බවත් දක්වේ.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල පිළිබඳව 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ ව්‍යවස්ථාවේ දක්වේ. ඒ අනුව

- පොලිස්පතිවරයා හැර අනෙකුත් පොලිස් නිලධාරීන් පත් කිරීම උසස් කිරීම ස්ථාන මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය හා ඉවත් කිරීම්. මෙහිදී උසස් කිරීම් මාරු කිරීම් විනය කටයුතු හා සේවයෙන් ඉවත් කිරීම් පොලිස්පතිවරයා විමසා සිදුකළ යුතු බව දක්වයි.
- පොලිස් නිලධාරීන්ට එරෙහිව හෝ පොලිස් සේවයට එරෙහිව මහජනතාව විසින් සිදුකරන පැමිණිලි විමර්ශනය කිරීම සහ පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියකට අනුව සහන සලස්වා දීම.

- පොලිස් නිලධාරීන් බඳවා ගැනීම, පුහුණු කිරීම, පිළිබඳව පටිපාටි සකස් කිරීම
- පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම, ජාතික අංශයේ සහ පළාත් අංශවල භාවිතය සඳහා අවශ්‍ය අවි ආයුධ, වෙඩි ද්‍රව්‍ය සහ වෙනත් උපකරණවල ස්වභාවය සහ වර්ගය, චර්යා සංග්‍රහ සහ උසස් කිරීමේදී සහ ස්ථාන මාරු කිරීමේදී අනුගමනය කළ යුතු ප්‍රමිතිය තීරණය කිරීම
- පොලිස් නිලධරයන් සඳහා සුදුසු යැයි හෝ අවශ්‍ය යැයි කොමිෂන් සභාව සලකනු ලබන විවිධාන සැලැස්වීම.

කොමිෂන් සභාවේ මෙම බලතල අතරින් පොලිස් නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, ස්ථානමාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය සහ ඉවත් කිරීම් බලතල පොලිස්පතිවරයාට හෝ පොලිස්පතිවරයා විමසා වෙනත් නිලධාරියකුට පැවරිය හැකිය.

මෙවැනි බලය පැවරූ නිලධාරියකුගේ තීරණයකින් අතෘප්තිමත් වන පොලිස් නිලධාරියකුට පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනයක් සිදු කළ හැකි බව 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දක්වා සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඒ ව්‍යවස්ථාවේ දක්වයි. පොලිස් කොමිෂන් සභාවේ තීරණයකට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය සභාව වෙත අභියාචනා කළ හැකිය.

මේ අනුව 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපනය කරන ලද පොලිස් කොමිෂන් සභාව පොලිස් සේවය දේශපාලන බලපෑම්වලින් ඉවත් කිරීම රාජ්‍ය සේවයේ අනෙකුත් සේවාවලින් ස්වාධීනව පවත්වාගෙන යාමද, පොලිස් සේවයට එරෙහිව පුරවැසියන්ගේ අභියාචනා විමසීම සඳහා පහසු සහ ස්වාධීන යන්ත්‍රණයක් සැකසීමද අපේක්ෂා කර ඇති බව පැහැදිලිය.

### 5.3.8. මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය කිරීම

ජනාධිපතිගේ බලතල අඩු කිරීම, රාජ්‍ය සේවය ස්වාධීන කිරීම, පොලිසිය ස්වාධීන කිරීම මෙන්ම නිදහස් සහ සාධාරණ මැතිවරණ පැවැත්වීමට සුදුසු නීතිමය වාතාවරණයක් සැකසීමද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ සාකච්ඡාවේ ප්‍රමුඛ අංගයක් බවට පත්වී තිබිණි. ඒ අනුව එතෙක් පැවති රාජ්‍ය දෙපාර්තමේන්තුවක් වූ මැතිවරණ දෙපාර්තමේන්තුව වෙනුවට ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස මැතිවරණ කොමිෂන් සභාව පළමුවරට 17 වන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වාදෙන ලදි.

17 වන සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIVඅ පරිච්ඡේදයේ 103 සිට 104ඒ දක්වා ව්‍යවස්ථාවලින් වෙන්වී ඇත්තේ මැතිවරණ කොමිෂන් සභාවට අයත් ව්‍යවස්ථාමය ප්‍රතිපාදන වෙනුවෙනි.

103(1) ව්‍යවස්ථාව අනුව වෘත්තීය පරිපාලන හෝ අධ්‍යාපන ක්ෂේත්‍රවල විශිෂ්ටතා හිමිකරගෙන සිටින පුද්ගයන් පස්දෙනෙකුගෙන් මැතිවරණ කොමිෂන් සභාව සමන්විත වේ. මෙම සාමාජිකයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපති විසින් සිදු කරනු ලැබේ. මෙම සාමාජිකයින් වසර පහක කාලයක් ධුරය දරනු ඇත.

කොමිෂන් සභාවේ පරමාර්ථය වන්නේ නිදහස් සහ සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම බව 103(2) ව්‍යවස්ථාව දක්වයි.
104ආ ව්‍යවස්ථාවට අනුව මැතිවරණ කොමිෂන් සභාවේ බලතල සහ කාර්ය ලෙස පහත කටයුතු දක්වා ඇත.

- ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු මැතිවරණ, පළාත් සභා ඡන්ද විමසීම්, පළාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම.
- ඡන්ද නාමලේඛන පිළියෙළ කිරීම.

එසේම කොමිෂන් සභාවේ බලතල සහ කාර්ය මෙම කටයුතු සඳහා පමණක් සීමා නොවන බවද එකී ව්‍යවස්ථාවේ දක්වා තිබේ.

නිදහස් සහ සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා අවශ්‍ය සම තරග බිමක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන වැදගත් බලතල දෙකක් මැතිවරණ කොමිෂන් සභාවට ලබාදී ඇත.

මැතිවරණ කාලපරිච්ඡේදය තුළදී රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක් ඡන්ද විමසීමට ඉදිරිපත් වන යම් අපේක්ෂකයකු හෝ දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් ප්‍රවර්ධනය කිරීමට හෝ වළක්වාලීමේ කාර්ය සඳහා භාවිත කිරීම වැළැක්වීම සඳහා ලිඛිත විධානයක් කිරීමේ හැකියාව මින් පළමු බලයයි.

එසේම මැතිවරණයක් පැවැත්වෙන කාලසීමාව තුළ එම මැතිවරණය නිදහස්ව සහ සාධාරණව පැවැත්වීම සඳහා කොමිසම අවශ්‍ය යැයි සලකනු ලබන උපමාන නිකුත් කිරීමේ බලයද කොමිසමට ලබාදී ඇත.

එයට අමතරව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වෙත නිකුත් කරනු ලබන උපමාන සඳහා එකී ආයතන අනුගත නොවන්නේ නම් මැතිවරණ කාල පරිච්ඡේදය සඳහා එකී ආයතනවලට අදාළව නිසි බලධරයකු පත් කිරීමේ බලයද මැතිවරණ කොමිෂන් සභාවට ලබාදී තිබිණ.

මෙම නියෝග සහ උපමාන නිකුත් කිරීමේදී ඡන්ද විමසීමක් පවතින කාලය යනුවෙන් අර්ථ නිරූපණය කර ඇත්තේ ඡන්ද විමසීම හෝ ජනමත විචාරණය පැවැත්වෙන බවට නියමයක් හෝ ප්‍රකාශයක් සිදුකරනු ලබන දින සිට එහි ප්‍රතිඵල නිකුත් කරනු ලබන දිනය දක්වා කාලය  බව ව්‍යවස්ථාවේ දක්වා ඇත.

## 5.4. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ක්‍රියාකාරීත්වය

2001 සැප්තැම්බර් 24 වන දින 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුව විසින් සම්මත කළ  අතර ඒ සඳහා කථානායකගේ සහතිකය 2000 ඔක්තෝබර් 03  දින සටහන් කරන ලද බැවින් එය එදින සිට බලාත්මක විය.

නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ ඒ යටතේ කොමිෂන් සභා පත් කිරීම තවදුටත් ප්‍රමාද වූයේ ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසාය.

2001 දෙසැම්බර් 05 වන දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් ජයග්‍රහණය කරන ලද්දේ රනිල් වික්‍රමසිංහ නායකත්වය දුන් එක්සත් ජාතික පෙරමුණයි. ඒ අනුව ජනාධිපති හා අගමැති පක්ෂ දෙකක් නියෝජනය කරන වාතාවරණයක් තුළ 17 වන ව්‍යවස්ථා සංශෝධනයේ වැදගත්කම තවත් ඉස්මතු විය.

ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිලබලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනාට අමතරව පත් කළ යුතු සාමාජිකයින් 07 දෙනා පත් කිරීමෙන් අනතුරුව ප්‍රථම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කටයුතු 2002 මාර්තු 25 දින සිට සිය කාර්ය ආරම්භ කරන ලදි.(ලියන ආරච්චි, 2017:30)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත පත් කරන ලද පළමු පොලිස් කොමිෂන් සභාව 2002 නොවැම්බර් 25 දින සිය කාර්ය ආරම්භ කරන ලදි. (https://www.npc.gov.lk/about/timeline/ - 2020/11/18) ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව සිය බලතල ක්‍රියාවට නගන ලද අතර මහජන

පැමිණිලි විමසීමේ පටිපාටියද ගැසට් පත්‍රයේ පළකිරීම සිදුකරන ලදි. නමුත් මැතිවරණ කොමිෂන් සභාව සදහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සාමාජිකයන් නිර්දේශ කරනු ලැබුවද ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරණායක විසින් එම කොමිසම පිහිටවූයේ නැත. ඒ අනුව 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරන අවස්ථාවේ මැතිවරණ කොමසාරිස් ලෙස කටයුතු කළ දයානන්ද දිශානායක 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වනතෙක්ම මැතිවරණ කොමිෂන් සභාවේ බලතල සහ කාර්ය ඉටුකරමින් මැතිවරණ කොමසාරිස් ලෙස කටයුතු කරන ලදි.

17 වන සංශෝධනයේ පරිදි අනෙකුත් කොමිෂන් සභා සඳහා කොමසාරිස්වරුන් පත් කිරීම සහ උසස් නිලතල සඳහා පුද්ගලයන් පත් කිරීම ව්‍යවස්ථාවට අනුකූලව සිදුවන ලදි.

එයට අමතරව 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත, 2002 අංක 32 දරන මූල්‍ය නීති (සංශෝධන ) පනත, 2002 අංක 35 දරන මහජන උපයෝගිතා පනත යන පනත් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත අතිරේක වගකීම් සහ කාර්යයභාරයක් පවරන ලදි.(ලියන ආරච්චි, 2016:32)

## 5.5. පළමු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අවසානය

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් 6 දෙනෙකුගේ වසර 3ක ධුර කාලය 2005 මාර්තු 25 වන විට අවසන් විය. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දක්වා සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(ඉ)(3) ව්‍යවස්ථාවට අනුව සභාවේ සන පූර්ණය 6 දෙනෙකි. නමුත් එවකට සිටි ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක අදාළ පත් කිරීම් සිදුකිරීමට කටයුතු කළේ නැත. 2005 නොවැම්බර් 17 වන දින පැවති ජනාධිපතිවරණයෙන් මහින්ද රාජපක්ෂ ජනාධිපති ලෙස තේරී පත්විය. ඔහුද අදාළ පත් කිරීම් සම්බන්ධව ක්‍රියාත්මක නොවීය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පත් කිරීමට බාධාවක් වූයේ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂ නායකවරයාගේ පක්ෂය නියෝජනය නොකරන විපක්ෂයේ සුලු පක්ෂ නියෝජිතයා පිලිබඳව විපක්ෂයේ සුළු පක්ෂ අතර එකඟතාවක් නොවීම බව අගමැති රත්නසිරි වික්‍රමනායක පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන ලදි. මෙම හේතුව නිසා වර්ෂ දෙකකටත් අධික කාලයක් ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සභාව පිහිටුවීමට නොහැකිව පවතින බවද ඔහු ප්‍රකාශ කරන ලදි (පිටු අංක 2779 හැන්සාර්ඩ් වාර්තාව-2008 මාර්තු 18) එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ඩියු ගුණසේකර පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නැවත පත් කිරීමේදී සාමාජිකයන් 10දෙනාම සිටිය යුතු බවට නීතිපති උපදෙස් දී ඇති බවයි

(පිටු අංක 2791 හැන්සාර්ඩ් වාර්තාව -2008 මාර්තු 18) එයට පිළිතුරු දෙමින් අනුර දිසානායක මන්ත්‍රීවරයා ප්‍රකාශ කරන ලද්දේ ඒ වන විටත් 10 දෙනෙකුගේ නම් ජනාධිපති වෙත යවා ඇති බවයි.(පිටු අංක 2791 හැන්සාර්ඩ් වාර්තාව -2008 මාර්තු 18)

කෙසේ නමුත් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය දක්වන්නේ 2008 පෙබරවාරි මාසය වන විට දේශපාලන පක්ෂ විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත්කළ යුතු 6 දෙනෙකුගේ නාම ලේඛනයක් කථානායක වෙත ඉදිරිපත් කළ බවත් එය ජනාධිපති වෙත යැවූ බවත්ය. (ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය, 2008:78) එසේම අගමැති රත්නසිරි වික්‍රමනායක ප්‍රකාශ කරන ලද්දේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව සොයා බැලීමට පාර්ලිමේන්තු කාරක සභාවක් පත් කර ඇති බවත් එහි වාර්තාව ලැබෙන තෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සාමාජිකයින් පත් නොකරන බව ජනාධිපතිතුමාගේ ස්ථාවරය බවයි ( පිටු අංක 2779- හැන්සාර්ඩ් වාර්තාව -2008 මාර්තු 18)

ඒ අනුව 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි වන තෙක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යළිත් ක්‍රියාත්මක නොවීය,

## 5.6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අක්‍රිය වීමෙන් සිදුවූ බලපෑම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ක්‍රියාකාරී නොවීම නිසා ස්වාධීන කොමිෂන් සභා සදහා කොමසාරිස්වරුන් නිර්දේශ කිරීම සදහා යාන්ත්‍රණයක් නොමැති වීම මෙන්ම උසස් ධුර සඳහා වන අනුමැතිය ලබාගැනීමටද යන්ත්‍රණයක් නොමැති විය. මේ වන විට 2002 වර්ෂයේ පත් කරන ලද ඇතැම් ස්වාධීන කොමිෂන් සභාවල නිල කාලය අවසන්ව තිබිණි.

ඒ අනුව ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සභාවේ නිර්දේශකින් තොරව පත් කරන ලදි. එසේම විවිධ උසස් නිලධාරීන්ද ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සභාවේ අනුමැතියෙන් තොරව ජනාධිපති විසින් පත් කරන ලදි.

2005 මාර්තු 24 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අක්‍රිව වූ අවස්ථාවේ සිට 2010 වසරේ 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභව අහෝසි වන තෙක් එහි නිර්දේශ හෝ අනුමැතිය නොමැතිව ජනාධිපති විසින් සිදුකරන ලද පත් කිරීම් මෙසේය

- අගවිනිසුරුවරුන් - 1ක්
- නීතිපතිවරු - 2ක්
- ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් - 7ක්
- අභියාචනාධිකරණ විනිසුරුවරුන් - 8 ක්
- ස්වාධීන කොමිෂන් සභාවල කොමසාරිස්වරුන් - 22ක්
- පොලිස්පතිවරුන්-3
- විගණකාධිපතිවරුන් - 2ක්
- පාර්ලිමේන්තු මහලේකම් (තාවකාලික) -1 ක් (දිසානායක සහ ලියන ආරච්චි. 2020 :71)

කෙසේ නමුත් එසේ පත්කළ ජාතික පොලිස් කොමිෂන් සභාවේ නිල කාලයද 2009 අප්‍රේල් 19 වන දින අවසන් විය. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල කාලය 2009 අප්‍රේල් 03 වන දිනෙන් අවසන් විය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලකාලය 2009 සැප්තැම්බර් මාසයේදී අවසන් විය. මෙම කොමිෂන් සභා සඳහා 18 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන තෙක් නැවත සාමාජිකයන් පත් කිරීමක් සිදු කළේ නැත,

ජාතික පොලිස් කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක නොවීම නිසා එම පොලිසියේ සහ රජයේ නිලධාරීන් බඳවා ගැනීම් උසස් කිරීම් සහ ස්ථානමාරු විනය කටයුතු සඳහා අමාත්‍යංශ ලේකම්වරුන්ට සහ පරිපාලන බලධාරීන්ට පැවරීමට 2006 ජූනි 17 වන දින පැවති අමාත්‍ය මණ්ඩලය තීරණය කළ අතර එය අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ චක්‍රලේඛයක් මගින් සියලුම අමාත්‍යංශ ලේකම්වරුන් වෙත දැනුම්දී තිබිණ. ( 2009 ජූනි 25 දින හා අංක 09/1041/360/034 දරන චක්‍රලේඛය)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසරිස්වරුන් නොමැති නිසා කොමිසමේ නිලධාරීන්ට කොමිසමේ බලතල ක්‍රියාවට නැගිය නොහැකි බව 2010 මාර්තු 30 වන දින සීඒ/1/1/10 4 දරන චක්‍රලේඛය මගින් ජනාධිපති ලේකම් දැනුම් දෙන ලදි.

මේ අනුව 17 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් මූලිකව අපේක්ෂා කළ අරමුණක් වන නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා වූ මැතිවරණ කොමිෂන් සභාව පත් නොකිරීම මෙන්ම 2005 වසරේ මාර්තු මාසයෙන් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අක්‍රිය වීම නිසා ජනාධිපති විසින් කොමිෂන් සභා සඳහා කොමසාරිස්වරුන් පත්කිරීම සහ උසස් ධුර සඳහා පුද්ගලයන් පත් කිරීම සිය

අභිමතය පරිදි සිදු කිරීම මෙන්ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. ජාතික පොලිස් කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත් නොකර සිටීම නිසා රාජ්‍ය සේවය අධිකරණය මැතිවරණ ක්‍රියාවලිය සහ පොලිසියේ ස්වාධීනත්වය පිළිබඳව බරපතල ගැටලු මතුවිය.

# හයවන පරිච්ඡේදය

## 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ එහි බලපෑම

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපනය කරන ලද ප්‍රධානම ආයතනය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත්කළ යුතු සාමාජිකයන් පත් නොකිරීම මගින් එය අක්‍රියභාවයට පත් වීම මෙන්ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ ජාතික පොලිස් කොමිෂන් සභාවද අක්‍රිය තත්ත්වයට  පත්වීම (වඩාත් නිවැරදිව කිවහොත් ජනාධිපති විසින් ස්වකැමැත්තෙන්ම අක්‍රිය තත්ත්වයට පත් වීමට ඉඩහැරීම) මගින් නැවත වරක් ජනාධිපති වටා එම බලතල ඒකරාශි වීම සිදුවිය. ක්‍රියාත්මක වන 17 වන සංශෝධනය අවුල් සහගත බැවින් එහි සංශෝධනයක් සිදුකිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු කාරක සභාවක්ද 2009 වන විට පත් කර තිබිණි( පිටු අංක 2779- හැන්සාර්ඩ් වාර්තාව -2008 මාර්තු 18)  කෙසේ නමුත් 2010 වසරේ ඔක්තෝබර් මාසයේදී හදිසි පනත් කෙටුම්පතක් ලෙස 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලදි.

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමේ සමාජ දේශපාලනික පසුබිමද, 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන වෙත සිදුකරන ලද මූලික වෙනස්කම් පිළිබඳවද, එකී සංශෝධනය නිසා සිදුවූ බලපෑම පිළිබඳවද මෙම පරිච්ඡේදය මගින් සාකච්ඡා කරනු ලබයි.

## 6.1. 18 වන ව්‍යවස්ථා සංශෝධනයට බලපෑ පසුබිම

2009 මැයි 19 වන දින එල්ටීටීඊය යුදමය වශයෙන් පරාජයට පත් වීමත් සමග මහින්ද රාජපක්ෂ ජනාධිතිවරයාගේ ජනප්‍රියතාව වේගයෙන් ඉහළ නගින්නට විය. එම හේතුවෙන්ම තම සහෝදරයා වන බැසිල් රාජපක්ෂ රජයේ කටයුතුවලට සම්බන්ධ කරගනිමින් උතුරු හා නැගෙනහිර සංවර්ධන කටයුතු පවරන ලදි. 2011 සැප්තැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිතව තිබූ ජනාධිපතිවරණය වසර දෙකක් ඉදිරියට ගෙන එමින් 2010 ජනවාරි මාසයේදී පැවැත්වීමට ජනාධිපතිවරයා තීරණය කළේය. මෙම ජනාධිපතිවරණයෙන් මහින්ද රාජපක්ෂ 57.88 % ක ඡන්ද ප්‍රතිශතයක් (ttp://www.infolanka.com/news/election2010.htm 2020/11/28) ලබාගනිමින් විශිෂ්ට ජයග්‍රහණයක් ලබාගත්තේය. එම ජයග්‍රහණය දෙවෙනි වූයේ 1994 වසරේදී චන්ද්‍රිකා බණ්ඩාරණායක ජනාධිපතිවරියගේ ජයග්‍රහණයට පමණි. 2010 අප්‍රේල් මාසයේ පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් මන්ත්‍රීධුර 144ක් ලබාගෙන ජයග්‍රහණය කරන්නටද ඔහු සමත්විය. එම මැතිවරණයෙන් ජනාධිපතිවරයාගේ පුත් නාමල් රාජපක්ෂ සහ බාල සොහොයුරු බැසිල් රාජපක්ෂ පිළිවෙලින් හම්බන්තොට සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් වැඩිම මනාප ලබාගනිමින් පාර්ලිමේන්තුවට පිවිසීමද සිදු විය.

මහින්ද රාජපක්ෂ පවුල පිළිබඳ විශ්වාසයක් රට තුළ ගොඩනැගෙමින් (හෝ ගොඩනගමින්) පැවති අතර යුද්ධය ජයග්‍රහණය කරන ලද්දේ ජනාධිපති වෙත තිබූ බලතල හේතුවෙන් බවත් ඉදිරි සංවර්ධන කටයුතු සඳහා ජනාධිපතිට වැඩි බලයක් ලබාදිය යුතු බවටත් සංවාද මතු වෙමින් පැවතිණි.

මෙම සංවාදය ජනාධිපති මහින්ද රාජපක්ෂගේ මැතිවරණ ප්‍රකාශයන්ට සපුරාම පටහැණිය. 2005 වසරේදී පැවති ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වෙමින් ඔහු ජනතා විමුක්ති පෙරමුණ සමග 12 වැදගැම් ගිවිසුමකට එළඹුණ අතර එහි 7 වන වගන්තියේ සඳහන් වූයේ විධායක ජනාධිපති ක්‍රමය ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට වඩාත්ම විනාශකාරී හා හානිකර වන අතර එය අහෝසි කිරීම අත්‍යවශ්‍ය ප්‍රමුඛ කාර්යයක් ලෙස පිළිගෙන ඇති අතර, 6 වන විධායක ජනාධිපති ධුර කාලය අවසන් වීමට පෙර විධායක ජනාධිපති ක්‍රමය අවසන් කිරීමට එකග වී ඇත. යනුවෙනි (https://www.bbc.com/sinhala/news/story/2005/09/printable/050905_jvp_points2020/11/29 ) ඔහු 2005 ජනාධිපතිවරණයට ඉදිරිපත් වන විට ඉදිරිපත් කළ මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ජන මතයට මුල් තැන නැමති පරිච්ඡේදයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය යටතේ දක්වා ඇත්තේ "විධායක ජනාධිපති ධුරය අහෝසි කෙරෙන්නා වූ හා රටේ සෙසු ප්‍රශ්නවලටද විසඳුම් ලබා දෙන්නා වු නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සියල්ලන්ගේ

සම්මුතියෙන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි. එතෙක් ජනාධිපතිවරයා නිල මට්ටමින් පාර්ලිමේන්තුවට වගකියන ලෙසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ඉදිරිපත් කරන්නෙමි" (84 පිටුව මහින්ද චින්තන -2005 ) යනුවෙනි. එසේම 2010 මැතිවරණය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මැතිවරණ ප්‍රකාශයේ සඳහන් වන්නේ පාර්ලිමේන්තුවට ලබා දී තිබෙන ජනවරමට ගරු කරමින්, පාර්ලිමේන්තුවට සහ අධිකරණයට වගකියන භාරකරුවෙක් (Trusteeship) බවට විධායක ජනපති ධුරය පත්කරන්නෙමි. ( පිටුව 56 මහින්ද චින්තන-2010 ඉංග්‍රිසි පරිවර්තනය) නමුත් විධායක බලතල අඩු කරනු වෙනුවට විධායක බලය තවදුරටත් වැඩිකරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසක් සඳහා ජනාධිපති ප්‍රමුඛ ආණ්ඩුව තල්ලු වෙමින් පැවතිණි.

## 6.2. 18 වන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

18 වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනය ගෙන එන්නේ හදිසි පනත් කෙටුම්පතක් ලෙසය. ඒ අනුව කැබිනට් මණ්ඩලය විසින් එය ජාතියේ යහපත සඳහා වහා අවශ්‍යයි යන ශිර්ෂය යටතේ නිකුත් කරන ලදි.

ඒ අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමට පෙර ගැසට් පත්‍රයේ පළ නොකළ අතර ජනාධිපති විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව යමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීම සඳහා යොමු කරන ලදි. අගෝස්තු මස අග පැවැත්වීමට නියමිතව තිබූ පක්ෂනායක රැස්වීම සැප්තැම්බර් මස 2 වන දින පවත්වා 18 වන සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවත් විවාදය සැප්තැම්බර් 8වන දින පවත්වන බවත් දැනුම් දෙන ලදි. පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායක වෙත යොමුකරන ලද අතර කථානායක විසින් 2010 සැප්තැම්බර් 07 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. එදිනම අග්‍රාමාත්‍ය දි. මු. ජයරත්න විසින් පළමුවර කියවීම සඳහා එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. ඊට පසු දිනම එකී පනත් කෙටුම්පත පිළිබඳව විවාදය පවත්වන කථානායකවරයා දැනුම්දෙන ලදි ( පිටු අංක 04 - හැන්සාර්ඩ් වාර්තාව 2010 සැප්තැම්බර් 07 දින) අමාත්‍ය මණ්ඩලය විසින් 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන ලද්දේ 2010 අගෝස්තු 30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදීය. එය සාමාන්‍යයෙන් පැවැත්වෙන අමාත්‍ය මණ්ඩල රැස්වීමක් නොවන විශේෂ අමාත්‍ය මණ්ඩල රැස්වීමක්ය. එසේම සැප්තැම්බර් මුල් සතියේ පාර්ලිමේන්තුවේ කටයුතු සාකච්ඡා කිරීම සඳහා පැවැත්වීමට නියමිතව තිබූ පක්ෂනායක රැස්වීම අවලංගු කරන බව කථානායක විසින් ප්‍රකාශ කරන ලදි. ( පිටු අංක 249 2018 සැප්තැම්බර් 8 දින හැන්සාර්ඩ් වාර්ථාව), මෙම කෙටුම්පත පිළිබදව ශ්‍රේෂ්ඨාධිකරණ විභාගය සඳහාද නියමිත

පිටපත් තමන්ට නොලැබුණ බව ජනතා විමුක්ති පෙරමුණු පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක මෙසේ පාර්ලිමේන්තුවේදී මෙසේ සදහන් කරන ලදි. "ඒක ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරනකොට මහජන මන්ත්‍රීවරු හැටියට කිසි කෙනෙක් දන්නේ නැහැ මොකක්ද ඒකේ තිබෙන්නේ කියලා, කැබිනට් මණ්ලයෙන් එක කොපියක් හම්බ වුණා. ඒක අරගෙන ගිහිල්ලා නීතීඥවරු කිව්වා, මේක තමයි සංශෝධනය" කියලා. රජයේ නීතීඥයා ඇවිත් කිව්වා, "ඕක නොවෙයි" කියලා. ඉතින් අපි දන්නේත් නැහැනේ, ඒකද, කෝකද කියලා. දැන් ඉදිරිපත් කරනතුරු අපි දන්නෙත් නැහැ" ( පිටු අංක 250 2018 සැප්තැම්බර් 8 දින හැන්සාර්ඩ් වාර්තාව), 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සහ විවාදය දක්වා වූ ක්‍රියාවලිය ඉතා හදිසි සහ විනිවිදභාවයෙන් තොර ක්‍රියාවලියක් බව පැහැදිලිය. එය මහජන සංවාදයෙන් හැකිතාක් දුරට ඈත් කිරීමේ උත්සාහයක ආණ්ඩුව නිරත වූ බව අගෝස්තු මාසයේ අගභාගයේ සිට ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වය අනුවද පැහැදිලි වේ. මෙම සංශෝධින කෙටුම්පත මගින් සිදුකිරීමට අපේක්ෂා කළ ප්‍රධාන වෙනස්කම් වූයේ

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරිම
- ජනාධිපතිට තරග කළ හැකි වාර දෙකේ සීමාව අහෝසි කිරීම
- ස්වාධීන කොමිෂන් සභා සතු බලතල අඩු කිරීම වේ.

## 6.3. 18 වන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ සම්මත වීම

2010 අප්‍රේල් පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් බලය පිහිට වූ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුවට මන්ත්‍රීධුර 144ක් හිමිව තිබිණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත 2/3ක විශේෂ බහුතරයකින් සම්මත වීම නිසා මන්ත්‍රීධුර 6ක් විපක්ෂයෙන් ලබාගත යුතුව තිබිණි. වාමාංශික පක්ෂ විසින්ද පනත් කෙටුම්පතට විරුද්ධ බවට අදහස් පළ කරන ලදි. විවාදයට ආසන්න දිනයකදී ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය ප්‍රකාශ කරන ලද්දේ තමන් පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන බවයි.

2010 අප්‍රේල් මැතිවරණයේ ප්‍රතිඵල අනුව පාර්ලිමේන්තුවවේ සංයුතිය වූයේ

- එක්සත් ජනතා නිදහස් සංධානයේ මන්ත්‍රීවරුන් -144
- එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් - 60
- ඉලංකෙයි තමිල් අරසු කච්චි -14
- ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සංන්ධානය - 7

( මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය - https://elections.gov.lk/web/wp-content/uploads/election-results/parliamentary-elections/general-election-2010.pdf - 2020/11/09)

ජනතා විමුක්ති පෙරමුණ මෙම පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වී තිබුණේ ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සංධානය මගිනි. මුස්ලිම් කොංග්‍රසය තරග කර තිබුණේ එක්සත් ජාතික පක්ෂ ලැයිස්තුව තුළිනි.

මේ අනුව 2/3ක ඡන්දය ලබාගැනීම සඳහා විපක්ෂයේ ඡන්ද 6ක් ලබාගත යුතුව තිබිණි. 2010 සැප්තැම්බර් 08 දින පනත් කෙටුම්පත පිලිබඳ විවාදය පැවැත්විණ. ප්‍රධාන විපක්ෂය වූ එක්සත් ජාතික පක්ෂය මෙම විවාදය වර්ජනය කරන ලදි. අගමැතිවරයා පනත් කෙටුම්පත ඉදිරිපත් කරමින් ප්‍රකාශ කරන යෝජිත සංශෝධනවලින් අපේක්ෂා කරන්නේ කිසියම් පුද්ගලයෙකුට ජනාධිපති ධූරය දැරිය හැකි වාරගණන දෙකකට සීමා කිරීම ඉවත් කිරීමත්, ජනාධිපතිවරයා මාස තුනකට වරක් පාර්ලිමේන්තුවට පැමිණීමට විධිවිධාන සැලසීමත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නැවත නිර්වචනය කර එහි සංයුතිය සරල කර පාර්ලිමේන්තු සභාවක් පිහිටුවීම මගින් ප්‍රායෝගික ආයතනයක රාමුවක් සැකසීමත්, අමාත්‍ය මණ්ඩලයේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල හා කාර්යභාරය නැවත පැහැදිලි කිරීමත් මගින් පවත්නා බාධක සහ ගැටලු ඉවත් කිරීමත්, පොලිස්පති ඇතුළු පොලිස් නිලධාරින් රාජ්‍ය සේවක ගණයට ඇතුළත් කිරීම සහ ජාතික පොලිස් කොමිසමේ බලතල නැවත විග්‍රහ කිරීමත් සහ මැතිවරණ කොමිසමේ බලතල හා සංයුතිය නැවත විග්‍රහ කිරීමත් යන කරුණු බවය ( පිටු අංක 186 හැන්සාර්ඩ් වාර්තාව 2020/09/08).

විවාදය අවසානයේ ඡන්ද විමසීමේදී ආණ්ඩුව නියෝජනය කළ බන්ධනාගාර පුනරුත්තාපන අමාත්‍ය ඩියු ගුණසේකර ප්‍රකාශ කළේ තමන් ඇතුළු සමාජවාදී ජනතා පෙරමුණේ මන්ත්‍රිරුන් පස්දෙනා (එක්සත් ජනතා සන්ධානයෙන් තේරීපත්වූ) මෙම පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය භාවිත කරන බවයි. එහිදී ඔහු 18 වන සංශෝධනය අප ඡන්දය දෙන්නේ ඇයි යනුවෙන් ආණ්ඩුවේ වමේ පක්ෂවල ස්ථාවරය සහිත ලේඛනයක් හැන්සාර්ඩ් ගත කරන ලදි (පිටු අංක 298 2010 සැප්තැම්බර් 08 දින හැන්සාර්ඩ් වාර්තාව)එයට ඩියු ගුණසේකර, වාසුදේව නානායක්කාර, තිස්ස විතාරණ, චන්ද්‍රසිරි ගජධීර සහ වයි.පී.පද්මසිරි යන මන්ත්‍රිවරුන් අත්සන් තබා තිබිණි.

විවාදය අවසානයේදී කෙටුම්පතට පක්ෂව ඡන්ද 161ක් ලැබුණ අතර විරුද්ධව 17 ක් ලැබිණි මන්ත්‍රිවරුන් 46 ක් නොපැමිණි මන්ත්‍රීවරුන් ලෙස සටහන් විය. එහිදී එක්සත් ජාතික පක්ෂයෙන් තරග කර තේරී පත්වූ මන්ත්‍රිවරුන් වන අර්ල් ගුණසේකර, අබ්දුල් කාදර්, නිමල් විජේසිංහ, මනුෂ නානායක්කාර, ප්‍රභා ගනේෂන් (ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පක්ෂය), පලනි දිගම්බරන් (ජාතික කම්කරු සංගමය), ජේ.ශ්‍රී. රංගා. ලක්ෂ්මන් සෙනවිරත්න යන මන්ත්‍රිවරුන් සහ

උපේක්ෂා ස්වර්ණමාලි මන්ත්‍රීවරියද, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පිවිසි ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ රවුෆ් හකීම්, එච්,එම්,එම් හාරිස්, හුනෙයිස් ෆාරුක්, මොහොමඩ් අස්ලම්, නූර්දීන් මෂූර්, බෂීල් සේගු ඩාවුඩ්, ෆයිසාල් කාසිම්, එම්.එස්.තව්ෆික් යන මන්ත්‍රිවරුද, ඉලංගයි තමිල් අරසු කච්චි නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පිවිසි එච්.පී. පියසේන මන්ත්‍රිවරයාද පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි.

## 6.4. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකළ ව්‍යවස්ථා වෙනස

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධයෙන් සංශෝධනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රධාන වෙනස්කම් කිහිපයක් සිදුකරන ලදි. එනම්

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීම- පාර්ලිමේන්තු සභාව හඳුන්වාදීම
- බලයේ සිටින ජනාධිපතිවරයකුට දෙවරක් පමණක් තරග කිරීමට තිබූ සීමාව ඉවත් කිරීම
- ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ ඡන්දය ප්‍රකාශ කිරීම හැර අනෙකුත් සියලු කටයුතු කිරීමට බලතල ලබාදීම
- අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉවත් කිරීමේ බලතල ජනාධිපතිට ලබාදීම
- මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් අඩු කිරීම සහ බලතල අඩු කිරීම
- මැතිවරණ කොමිෂන් සභාව සදහා අන්තර්කාලීන ප්‍රතිපාදන හඳුන්වාදීම
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම
- ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම

## 6.4.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීම- පාර්ලිමේන්තු සභාව හඳුන්වාදීම

ජනාධිපතිවරයාට කොමිෂන් සභා සාමාජිකයින් සහ අගවිනිසුරු ඇතුළු උසස් නිලතල සඳහා පුද්ගයන් පත් කිරීමට පැවති අභිමතානුසාරී බලතල සීමා කිරීමට 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් යන්ත්‍රණය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කරන ලදි. ඒ වෙනුවට පාර්ලිමේන්තු සභාව නැමති ආයතනය හඳුන්වාදෙන ලදි. මෙම ආයතනයේ සාමාජිකයින් වූයේ

- අග්‍රාමාත්‍යවරයා ;
- කථානායකවරයා;
- විරුද්ධ පක්ෂෙය් නායකවරයා;
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු, අග්‍රාමාත්‍යවරයාගේ නාමිකයකු;
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු, විරුද්ධ පක්ෂයේ

නායකවරයාගේ නාමිකයකු, ( 18 වන සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාව) අගමැති සහ විපක්ෂනායක සිය නියෝජිතයන් නම් නොකරන්නේ නම් එකී නියෝජිතයින් නම් කිරීමේ කාර්යය කථානායක වෙත පැවරිණි.

### පාර්ලිමේන්තු සභාවේ කාර්යයභාරය

ජනාධිපති විසින් පහත සඳහන් කොමිෂන් සභා සහ ධුරවලට තැනැත්තන් පත් කිරීමේදී ඒ සඳහා සිය නිරීක්ෂණ ජනාධිපති වෙත ලබාදීම පාර්ලිමේන්තු සභාවේ කාර්යයයි. එම කොමිෂන් සභා වන්නේ

- මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයින්
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්
- ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයින්
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයින්
- අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ සාමාජිකයින්
- මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින්
- සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයින්

  අදාළ පාර්ලිමේන්තු සභාව වෙතින් නිරීක්ෂණ ලබාගත යුතු තනතුරු වන්නේ

- අගවිනිසුරු සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්
- සභාපති සහ අභියාචනාධිකරණ විනිසුරුවරුන්

- අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හැර අනෙක් සාමාජිකයින්
- නීතිපති
- පොලිස්පති
- විගණකාධිපති
- ඔම්බුඩ්ස්මන්
- පාර්ලිමේන්තුවේ මහලේකම්

ඉහත කී කොමිෂන් සභාවන් සහ තනතුරු සඳහා සාමාජිකයින් පත් කිරීමේදී ජනාධිපති විසින් පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ලබාගත යුතු වුවද, ජනාධිපති එම නිරීක්ෂණ අනුව කටයුතු කළයුතු බවට ප්‍රතිපාදනයක් නොමැත. එම නිසා ඉහත කී කොමිෂන් සභා සහ තනතුරු සඳහා පුද්ගලයන් පත් කිරීමේදී 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපති වෙත පරම අභිමතයක් ලබාදී තිබේ. එය මෙම කොමිෂන් සභා සහ තනතුරුවල ස්වාධීනත්වයට බලවත් බාධාවක් සිදුකර තිබේ. ඒ අනුව එම කොමිෂන් සභා සහ තනතුරු විධායකයට අවශ්‍ය පරිදි පත් කරන තනතුරු බවට පත් වී තිබේ.

## 6.4.2. බලයේ සිටින ජනාධිපතිවරයකුට දෙවරක් පමණක් තරග කිරීමට තිබූ සීමාව ඉවත් කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31(2) ව්‍යවස්ථාව දක්වන්නේ “ජනතාව විසින් දෙවරක් ජනාධිපති ලෙස තෝරාගත් තැනැත්තෙකු ඉන් පසුව එම ධුරයට ජනතාව විසින් තෝරා පත් කර ගනු ලැබීමට සුදුස්සෙකු නොවන්නේය” යනුවෙනි. මේ අනුව පුද්ගලයකුට ජනාධිපති ලෙස පත්විය හැක්කේ වාර දෙකක් සඳහා පමණි.

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධය මගින් 32(2) අනුව ව්‍යවස්ථා ඉවත් කරන ලදි. ඒ අනුව යම් තැනැත්තෙකුට කැමති වාර ගණනක් ජනාධිපති ලෙස පත්විය හැකිය. මෙම ප්‍රතිපාදන මගින් ඡන්දයෙන් පත්වන ජනාධිපති ඒකාධිපතියෙක් බවට පත් කිරීම සිදුවේ. පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා ඡන්ද විමසීම් සහ පළාත් පාලන ඡන්ද විමසීම් පවත්වන්නේ එකී ආයතන විසුරුවා හැරීමෙන් පසුවය. ඒ අනුව අපේක්ෂකයන්ට මැතිවරණය පවත්වන අවස්ථාව වන විට නිලබලයක් නොමැති බැවින් මැතිවරණ නිලධාරීන්ට පොලිස් නිලධාරීන්ට සහ රාජ්‍ය නිලධාරීන්ට ස්වාධීනව කටයුතුකළ හැකි අතර මැතිවරණයේ අපේක්ෂකයන්ට එකී නිලධාරීන්ට සිදුකළ හැකි බලපෑම අවම වේ. නමුත් ජනාධිපති ධුරයේ සිටින ජනාධිපති ඊළඟ ජනාධිපතිවරණයට තරග වදින අවස්ථාවේදී මැතිවරණය පැවැත්විය යුතු බවට ගැසට් නිවේදනය නිකුත් කරන්නේද ජනාධිපති අපේක්ෂකයකු වන බලයේ සිටින ජනාධිපතිය. එසේම

ඔහු/ඇය ජනාධිපති අපේක්ෂකයා මෙන්ම බලයේ සිටින ජනාධිපතිවරයාද වේ. එබැවින් සියලු බලතල සහ රාජකාරි සිදුකරන අතරම සියලු වරප්‍රසාද සහ රාජ්‍ය සම්පත්ද භාවිත කරනු ලබයි. එබැවින් එවැනි ජනාධිපතිවරණයකදී ප්‍රතිවාදී අපේක්ෂකයන්ට කිසිසේත්ම සම තරගබිමක් නිර්මාණය නොවේ. දෙවරකට වඩා එක් පුද්ගලයකුට ජනාධිපතිධුරය දැරීමට අවස්ථාව ලබාදීම තුළින් මෙම තත්වය වඩාත් භයංකර වේ. එය ප්‍රජාතන්ත්‍රවාදි ජනරජයකට කිසිසේත්ම සුබදායක ව්‍යවස්ථා ප්‍රතිපාදනයක් නොවේ.

### 6.4.3. ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ ඡන්දය ප්‍රකාශ කිරීම හැර අනෙකුත් සියලු කටයුතු කිරීමට බලතල ලබාදීම

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් 32 වන ව්‍යවස්ථාව සංශෝධනය කරමින් පහත ප්‍රතිපාදන ඇතුළත් කර තිබේ.

ජනාධිපතිවරයා ස්වකීය ධුරෙයහි බලය ප්‍රකාරව මාස තුනකට එක් වරක් පාර්ලිමේන්තුවට සහභාගි විය යුත්තේ ය. මේ කර්තව්‍යය ඉටුකිරීමේ දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති හිමිකම හැර පාර්ලිමේන්තු මන්තීවරයකු සතු සියලු වරප්‍රසාද, පරිහාර සහ බලතලවලට ජනාධිපතිවරයා හිමිකම් ලබන අතර, පාර්ලිමේන්තුව හෝ එහි මන්තීවරුන් හෝ සතු යම් වරප්‍රසාද කඩකිරීමක් සම්බන්ධයෙන් වගකිව යුතු නොවන්නේ ය, යනුවෙනි.

18 වන සංශෝධනය මගින් එක් කළ මෙම ප්‍රතිපාදනය ආණ්ඩුපක්ෂයේ ඇතැම් මන්ත්‍රිවරුන් පෙන්වාදුන්නේ ජනාධිපති පාර්ලිමේන්තුව කෙරෙහි වගකීමක් ඇති වන ආකාරයේ ප්‍රතිපාදනයක් බවයි. නමුත් එකී සංශෝධනය කියවා බලන විට ජනාධිපති වෙත පාර්ලිමේන්තුවට බලපෑමක් කිරීමට අවස්ථාවක් ලබාදීම විනා ජනාධිපති වෙත අමුතු වගකීමක් ආරෝපණය කිරිමක් සිදු නොවන බව පැහැදිලිය.

### 6.4.4. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉවත් කිරීමේ බලතල ජනාධිපතිට ලබාදීම

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරිම සදහා සිදුකළ වැදගත් සංශෝධනයක් වූයේ ජනාධිපති විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරීමේදී ඒ සදහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය ලබගත යුතු බවයි. (17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ(6) ව්‍යවස්ථාව). 18 වන ව්‍යවස්ථා සංශෝධනයේ එම ව්‍යවස්ථාව (111ඉ(6)) සංශෝධනය කරමින් කොමිෂන් සභාවේ ඕනෑම සාමාජිකයකු හේතු දක්වා ඉවත් කිරීමේ බලතල ජනාධිපති වෙත පවරන ලදි.

### 6.4.5. මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් අඩු කිරීම සහ බලතල අඩු කිරීම

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් හඳුන්වා දුන් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයින් සංඛ්‍යාව පස් දෙනෙකි. 18 වන සංශෝධනය මගින් මෙම සාමාජික සංඛ්‍යාව තිදෙනෙකු දක්වා අඩු කරන ලදි. කොමිෂන් සභාවේ රැස්වීම් සඳහා සනපූර්ණයද තිදෙනෙකු වන බැවින් සාමාජිකයින් සියලු දෙනාම නොමැතිව කොමිෂන් සභාවේ රැස්වීම් පැවැත්විය නොහැකි තත්ත්වයක් මේ නිසා උද්ගත විය. නමුත් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරන තෙක්ම මැතිවරණ කොමිෂන් සභාව පත් නොකළ බැවින් 2015 නොවැම්බර් මාසය දක්වාම මෙහි බලපෑම පිළිබඳව අත්දැකීමක් නොවීය. නමුත් 19 වන සංශෝධනය මගින්ද මෙම ප්‍රතිපාදනය වෙනස් නොකළ බැවින් මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසු මෙම ව්‍යවස්ථා ප්‍රතිපාදනයේ ආදීනව අත්දැකීමට අවස්ථාව ලැබිණි.

### 6.4.6. මැතිවරණ කොමිෂන් සභාව සඳහා අන්තර්කාලීන ප්‍රතිපාදන සශෝධනය කිරීම

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වාදුන් මැතිවරණ කොමිෂන් සභාව පිළිබඳ ප්‍රතිපාදන අනුව මැතිවරණ කොමිෂන් සභාව පත් කරන තෙක් කොමිෂන් සභාවේ බලතල සහ කාර්ය ඉටුකිරීමේ වගකීම දැනට තනතුරේ සිටින මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදුකළ යුතුය.

දහහත්වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අනෙකුත් ආනුෂංගික සංශෝධන යන කොටසේ 25(2) ව්‍යවස්ථාවේ දක්වා ඇත්තේ "103 වන ව්‍යවස්ථාවට අනුකූලව මැතිවරණ කොමිෂන් සභාව සංස්ථාපනය කරන තෙක් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී මැතිවරණ කොමසාරිස්වරයා ලෙස ධුරය දරන තැනැත්තා විසින් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුම වූ දිනයේදී ඔහු වෙත පැවරී තිබුණු මැතිවරණ කොමසාරිස් ධුරයේ බලතල හා කර්තව්‍ය තවදුරටත් ක්‍රියාවේ යෙදීම හා ඉටු කිරීම සහ මැතිවරණ කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය ක්‍රියාවේ යෙදීම හා ඉටු කිරීම කරනු ලැබිය යුත්තේය, මැතිවරණ කොමිෂන් සභාව එසේ සංස්ථාපනය කරනු ලබන දින සිට හා ඉන්පසුව ඔහු විසින් මැතිවරණ කොමසාරිස් ලෙස ධුරය දැරීම නතර වන්නේය" යනුවෙනි. ඒ අනුව ඒ වන විටත් ධුරයේ සිටින මැතිවරණ කොමසාරිස්වරයා මැතිවරණ කොමිෂන් සභාවේ බලතල සහ කාර්යයභාරය ක්‍රියාත්මක කළ යුතුය.

18 වන සංශෝධනය මගින් මෙම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය කරන අවස්ථාව දක්වා ජනාධිපතිට යෝග්‍ය යැයි හැඟී යන්නේ නම් මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය ඉටුකිරිම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුවේ අතිරේක මැතිවරණ කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයකුව පත් කළ හැකි බවට ප්‍රතිපාදන සලසන ලදි. ඒ අනුව 2011මාර්තු 26 දි එතෙක් මැතිවරණ කොමසාරිස් ලෙස කටයුතු කළ දයානන්ද දිශානායක ඉල්ලා අස්වූ අතර ඒ වන විට අතිරේක මැතිවරණ කොමසාරිස් ලෙස කටයුතු කළ මහින්ද දේශප්‍රිය මැතිවරණ කොමසාරිස් ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් පත් කරන ලදි.

## 6.4.7. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එතෙක් අමාත්‍ය මණ්ඩලය වෙත පැවරුණ රාජ්‍ය නිලධාරින් බඳවාගැනීම, ස්ථානමාරු කිරීම, උසස් කිරීම සහ විනය පාලනය පිලිබඳ බලතල අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත පවරණ ලදි. නමුත් 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් 55 ව්‍යවස්ථාව සංශෝධනය කරමින් එම බලතල නැවත අමාත්‍ය මණ්ඩලයට පවරන ලදි.

අමාත්‍ය මණ්ඩලය විසින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අදහස් විමසා දැනගැනීම කළ යුතු බවට වූ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ වූ ප්‍රතිපාදනය( 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(3) ව්‍යවස්ථාව) 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අහෝසි කරන ලදි. ඒ අනුව අමාත්‍ය මණ්ඩලයට දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීමේදී පරම අභිමතය හිමිවිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවට එතෙක් පැවරී තිබූ රාජ්‍ය නිලධාරින් බඳවාගැනීමේ, ස්ථානමාරු කිරීමේ, උසස් කිරීමේ, විනය පාලනය කිරිමේ බලතල සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරිමේදී අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ ලබාදීමේ බලතලද 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කරන ලදි.

ඒ අනුව 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව යනු රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය විසින් පවරනු ලබන කාර්යයක් ඉටුකරන සහ රාජ්‍ය නිලධාරීන්ගේ අභියාචනා විභාග කරනු ලබන ආයතනයක් පමණක් බවට පත්විය.

### 6.4.8. ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපනය කරන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවට කාර්යයභාර රැසක් පවරා තිබිණි.

- පොලිස්පතිවරයා හැර අනෙකුත් පොලිස් නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය හා ඉවත් කිරීම. මෙහිදී උසස් කිරීම, මාරු කිරීම, විනය කටයුතු හා සේවයෙන් ඉවත් කිරීම පොලිස්පතිවරයා විමසා සිදුකළ යුතු බව දක්වයි.
- පොලිස් නිලධාරීන්ට එරෙහිව හෝ පොලිස් සේවයට එරෙහිව මහජනතාව විසින් සිදු කරන පැමිණිලි විමර්ශනය කිරීම සහ පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියකට අනුව සහන සලස්වා දීම.
- පොලිස් නිලධාරීන් බඳවාගැනීම, පුහුණු කිරීම, පිළිබඳව පටිපාටි සකස් කිරීම
- පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම, ජාතික අංශයේ සහ පළාත් අංශවල භාවිතය සඳහා අවශ්‍ය අවි ආයුධ, වෙඩිද්‍රව්‍ය සහ වෙනත් උපකරණවල ස්වභාවය සහ වර්ගය, චර්යා සංග්‍රහ සහ උසස් කිරීමේදී සහ ස්ථාන මාරු කිරීමේදී අනුගමනය කල යුතු ප්‍රමිතිය තීරණය කිරීම
- පොලිස් නිලධරයන් සඳහා සුදුසු යැයි හෝ අවශ්‍ය යැයි කොමිෂන් සභාව සලකනු ලබන විධිවිධාන සැලැස්වීම. (17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ ව්‍යවස්ථාව)

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මේ අතරින් පොලිස් නිලධාරීන්ට එරෙහිව හෝ පොලිස් සේවයට එරෙහිව මහජනතාව විසින් සිදුකරන පැමිණිලි විමර්ශනය කිරීම සහ පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියකට අනුව සහන සලස්වා දීම යන බලතල හැර අනෙක් සියලු බලතල සියල්ල ඉවත් කරන ලදි. ඒ අනුව 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාව මහජන පැමිණිලි විභාග කරන ආයතනයක් පමණක් බවට පත්විය.

## 6.5. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ බලපෑම

හදිසි පනත් කෙටුම්පතක් ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් සම්මත කරන ලද 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදන දෙස බලන විට ඒවායේ කිසිදු හදිසි ප්‍රතිපාදනයක් ඇතුළත් නොවන බව පැහැදිලිය. විශේෂයෙන්ම එහි ජනාධිපතිධුරය දැරීමේ වාරගණන ඉවත් කිරීම පිළිබඳ වූ ප්‍රතිපාදනය අවශ්‍ය වන්නේ වසර පහකටත් වැඩි කාලයකින්ය (2010 වසරේ පත්වූ ජනාධිපතිගේ ධුරකාලය 2016 තෙක් පවතී). එසේම එය මහජන සංවාදයෙන් හැකිතාක් දුරට ඈත්කිරීමට උත්සාහ කළ බව ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වයෙන් පැහැදිලි විය. මේ අනුව 18 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන ලද්දේ එය නිසි මහජන සංවාදයකද ලක් නොවීය. එසේම විවාදය සඳහා ලබාදී තිබුණේද එක් දිනක් පමණි. ඒ අනුව 18 වන ආණ්ඩුක්‍රම සම්මත කිරීමේ ක්‍රියාවලියද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සම්මත කිරීම පිළිබඳව නරක පූර්වාදර්ශයක් සපයන ක්‍රියාවලියකි.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ජනාධිපතිට පැවරී තිබූ අධික බලතල හේතුවෙන් විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ බලතල අතර සංවරණ සහ තුලන ක්‍රමය දැඩි ලෙස බිඳවැටී තිබුණි. ඒ හේතුවෙන්ම රාජ්‍ය සේවය, පොලිසිය, අධිකරණ ක්‍රියාවලිය සහ මැතිවරණ දැඩි ලෙස දේශපාලනීකරණය වී තිබිණි. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම තත්ත්වය වෙනස් කිරීමට සකසන ලද ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ආපසු හැරවීමක් 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකරන ලදි. මේ අනුව නැවත වරක් රාජ්‍ය සේවය තුළට අත පෙවීමට දේශපාලනඥයන්ට අවස්ථාව සැලසිණ.

ජනාධිපති වෙත අධික බලයක් පැවරීම සහ ජනාධිපතිගේ කාර්ය අධිකරණ විමර්ශනයට ලක් නොවීම සහ ජනාධිපති පාර්ලිමේන්තුවට වග නොකියන තත්ත්වයක් නිර්මාණය කිරීම මගින් එක් පුද්ගලයකු වෙත කිසිදු ආයතනයකට වගවීමක් නොමැති අධික බලයක් ලබාදීම බල බෙදීමේ සිද්ධාන්තයට පටහැණි තත්ත්වයක් නිර්මාණය කරන ලදි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල සීමා කිරීම සහ එම බලතල අමාත්‍ය මණ්ඩලය වෙත පවරා ගැනීම සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල කප්පාදු කිරිම මගින් රාජ්‍ය සේවය සහ පොලිසිය ස්වාධීන නොවන තත්ත්වයකට පත් කරන ලදි.

එසේම 18 වන ව්‍යවස්ථා සංශෝධනය නිදහස් හා සාධාරණ මැතිවරණයක් කෙරෙහි අහිතකර ලෙස බලපායි. විශේෂයෙන්ම, රාජ්‍ය සම්පත් සහ රාජ්‍ය

නිලධාරීන් අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීම සඳහා රජයේ දේශපාලන අධිකාරිය වෙත 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පනවා තිබූ අත්‍යවශ්‍ය සහ සීමිත ආරක්ෂණ කිහිපයක්ම මෙම සංශෝධනය මගින් ඉවත් කර තිබේ.

මැතිවරණ කොමිෂන් සභාව සම්බන්ධයෙන් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ වූ ප්‍රතිපාදන සංශෝධනය කිරීම මගින් මැතිවරණ කොමිෂන් සභාවක් පත් කරනවා වෙනුවට ධුරයේ සිටින මැතිවරණ කොමසාරිස් වෙනුවට වෙනත් මැතිවරණ කොමසාරිස්වරයකු පත් කිරීමේ බලය ජනාධිපති වෙත පැවරීමෙන්ම පැහැදිලි වූයේ මැතිවරණ කොමිෂන් සභාවක් පත් කිරීමේ කිසිදු සූදානමක් නොමැති බවයි. එය එසේම සිදු වූ අතර මැතිවරණ කොමිෂන් සභාවක් මුල්වරට පත් කරන්නේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත වීමෙන්ද පසුව 2015 සැප්තැම්බර් මාසයේදීය.

17 වන ව්‍යවස්ථා සංශෝධනයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට අදාළ ප්‍රතිපාදන 2005 සිට ක්‍රියාත්මක නොවූ අතර කොමිෂන් සභා සහ උසස් තනතුරු සැලකිය යුතු ප්‍රමාණයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නොසලකා හරිමින් ජනාධිපතිවරයා විසින් පත් කිරීම් සිදු කරන ලදි. එම පසුබිම තුළ 18 වන ව්‍යවස්ථා සංශෝධනය, විධායකය විසින් දේශපාලන අවශ්‍යතා සඳහා බලය තහවුරු කිරීමේ උච්චතම අවස්ථාව ලෙස දැකිය හැකිය.

# හත්වන පරිච්ඡේදය

## 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දැඩි බලතල සහිත විධායක ජනාධිපතිධුරයක් නිර්මාණය කරන ලදි. ඉන්පසුව එම ව්‍යවස්ථාවට සිදුකරන ලද ඇතැම් සංශෝධන මගින් මෙම විධායක ජනාධිපති ධුර්යේ බලතල තවදුරටත් වැඩි කරන ලදි. 2001 වසරේදී සිදුකරන ලද 17 වන අණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විධායක ජනාධිපති ධුරයේ බලතල තරමක් දුරට අඩුකර එය පාර්ලිමේන්තුවේ සහ ස්වාධීන කොමිෂන් සභා වෙත පවරන ලදි. නමුත් 2010 වසරේදී සිදුකරන ලද 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් යළිත් වරක් ජනාධිපති ධුරය දැඩි විධායක බලතල සහිත ධුරයක් බවට පත් කරන ලදි. මෙම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත කරන ලද විධායක බලතල වැඩි කළත් ක්‍රියාත්මක නොවීය. 2015 වසරේදී සම්මත කරන ලද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිගේ විධායක බලතල දැඩි වෙනසකට භාජනය කරන ලදි. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට බලපාන ලද දේශපාලන සහ සමාජ පසුබිම, 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමේ ක්‍රියාවලිය, කෙටුම්පතේ අන්තර්ගතය පිළිබඳව මෙම පරිච්ඡේදය මගින් විමර්ශනය කරනු ලබයි.

## 7.1. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට බලපෑ සමාජ දේශපාලන සිදුවීම්

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභා සහ ප්‍රධාන තනතුරු සඳහා තම අභිමතය පරිදි පුද්ගලයන් පත් කරන ලදි. ඇතැම් පත් කිරිම් පිළිබඳව එතරම් ප්‍රසාදයක් නොපැවතිණි. ජනාධිපති වටා රුස්වූ විධායක බලතල අවභාවිත කරමින් ඇතැම් අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ ආධාරකරුවන් පවා පහළ අධිකරණවල විනිසුරුවරුන්ට බලපෑම් සිදුකරන්නනට විය. 2010 ජනාධිපතිවරණයේ ජනාධිපති අපේක්ෂක සහ හිටපු හමුදාපති සරත් ෆොන්සේකාගේ තනතුරු පහළ දැමීම සහ කඩිනමින් සිදුකරන ලද නඩු විභාග අවසානයේ ඔහු සිරගත කිරීම මෙන්ම අගවිනිසුරු ශිරාණි බණ්ඩානායක පාර්ලිමේන්තු කමිටුවක් මගින් ධුරයෙන් පහකිරීම පිළිබඳවද සමාජයේ තැතිගැන්මක් ඇති විය. විධායක බලතල සහිත ජනාධිපතිගේ බලතල අඩුකිරීම හෝ විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීම පිළිබඳ කථාබහ නැවත සමාජය තුළ මතුවන්නට විය.

ජනප්‍රිය සමාජ ක්‍රියාකාරි හිමිනමක් වූ මාදුළුවාවේ සෝභිත හිමියන්ගේගේ නායකත්වයෙන් බිහිවූ සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරය මූලික කරුණු තුනක් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසක් සඳහා සියලු දේශපාන පක්ෂවලට ඉල්ලීම් සිදුකරන ලදි. එනම් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, 18 වන සංශෝධනයෙන් වෙනස් කළ ස්වාධීන කොමිෂන් සභා යළි ඇති කිරීම සහ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම වේ. (විජේසූරිය, 2016:34) වෘත්තීය සමිති සිවිල් සංවිධාන සහ නීතිඥ සංවිධානය රජයේ දැඩි පිළිවෙතට එරෙහිව සමාජය තුළ විධායක ජනාධිපති ක්‍රමයේ සහ රාජ්‍ය ආයතන දේශපලනීකරණය වීමේ ආදීනව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ විරෝධතා ආරම්භ කර තිබිණි.

මේ අතර 2014 නොවැම්බර් 20 දින අංක 1889/31දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ජනාධිපති මහින්ද රාජපක්ෂ නිවේදනය කර සිටියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31(3)(අ) ව්‍යවස්ථාව පරිදි තමන් වැඩිදුර කාලයක් සඳහා ජනාධිපතිවරණයක් සඳහා තමන් ඉදිරිපත් වන බවයි. මහින්ද රාජපක්ෂ 2010 වසරේ ජනවාරි මාසයේදී බලයට පත්වූයේ වසර 6ක නිල කාලයක් සඳහාය. ඒ අනුව 2016 ජනවාරි දක්වා ජනාධිපති නිල කාලය තිබිණි. නමුත් මෙම නිවේදනයෙන් සිදුවූයේ නියමිත කාලයට වසරකට පෙර ජනාධිපතිවරණයක් පැවැත්වීමයි.

එයට පසු දිනම එනම් 2014 නොවැම්බර් 21 වන දින කොළඹ නව නගර ශාලාවේ විශේෂ රැස්වීමක් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. සෞඛ්‍ය අමාත්‍යවරයා ලෙස සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් ලෙස කටයුතු කළ මෛත්‍රීපාල සිරිසේන මෙවර ජනාධිපතිවරණයේ විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් කරන බව එම රැස්වීමේදී එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ ප්‍රකාශ කරන ලදි. ආණ්ඩුව නියෝජනය කළ ඇමතිවරුන් කිහිප දෙනෙක්ද හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායකද මෙම අවස්ථාවට සම්බන්ධ විය. ඉන් පසුව ආණ්ඩුවට එරෙහි බොහෝ බලවේග විපක්ෂය වටා ඒකරාශී විය. ඔවුන්ගේ ප්‍රධාන සටහන් පාඨයක් වූයේ විධායක ජනාධිපතිට තිබූ අධික බලය සහ පවුල්වාදය පිටුදකින නීති සම්මත කළයුතු බවයි.

මාදුළුවාවේ සෝභිත හිමිගේ ප්‍රධානත්වයෙන් යුතු සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරය විපක්ෂයේ අපේක්ෂකයා දිනවීමේ සටනේ විශාල කාර්යභාරයක් සිදුකරන ලදි. එම සංවිධානයේ මෙහෙයවීමෙන් දෙසැම්බර් මස 1 වන දින මෛත්‍රිපාල සිරිසේන ජනාධිපති අපේක්ෂකගේ ජයග්‍රහණය වෙනුවෙන් රැලියක් පැවැත්වූ අතර එහිදී මෛත්‍රීපාල සිරිසේන සහ දේශපාලන පක්ෂ සහ සිවිල් කණ්ඩායම් 43ක් අතර ගිවිසුමක් ඇති කරගන්නා ලදි. එය "සාධාරණ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයක් සඳහා පොදු මහජන න්‍යාය පත්‍රයක්" නමින් හඳුන්වන ලදි. එකී ගිවිසුමට අනුව මෛත්‍රිපාල සිරිසේන ජනාධිපති ධූරය ලබාගත් පසුව ක්ෂණිකව සිදුකළ යුතු කාර්ය ලෙස සඳහන් වූයේ

1) දැනට පවත්නා විධායක ජනාධිපති ක්‍රමය මාස හයක් ඇතුළත සම්පූර්ණයෙන් ම අහෝසි කර ජනතාවට වගකියන පාර්ලිමේන්තු ක්‍රමයක් ස්ථාපිත කිරීම, අලුතින් ඇති කෙරෙන පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය තුළ ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා වන අතර, ජනාධිපති ධූරයට ඊට උචිත වගකීම් සහ බලතල පැවරීමට ද, ජනාධිපති ධූරය රටේ ජාතික සමගියේ ප්‍රතිමූර්තියක් ලෙස ස්ථාපිත කිරීමට ද කටයුතු කරනු ඇත.

2) අධිකරණය, පොලිසිය,රාජ්‍ය සේවය, මැතිවරණ බලධාරීන්, නීතිපති, විගණකාධිපති, වැනි ස්වාධීනව කටයුතු කළ යුතු ආයතනවල සහ කොමිෂන් සභාවල ස්වාධීනත්වය නැවත ඇති කිරීම සඳහා 17 වන ව්‍යවස්ථා සංශෝධනය නැවත බලගන්වා වඩාත් ශක්තිමත් කිරීම.

3) මනාප ඡන්ද ක්‍රමය මුළුමනින්ම අහෝසි කර, සෑම මැතිවරණ ආසන කොට්ඨාසයකටම තමන්ගේම මන්ත්‍රීවරයකු ලැබෙන සහ විවිධ ජන කොටස් සහ දේශපාලන මතවලට නිසි නියෝජනයක් ලැබෙන, පැරණි මන්ත්‍රී ආසන ක්‍රමයේ සහ සමානුපාතික ක්‍රමයේ සම්මිශ්‍රණයෙන් නව මැතිවරණ ක්‍රමයක් ඇති කිරීම. ( විජේසූරිය, 2016: 64 )

මේ අනුව විපක්ෂයේ පොදු අපේක්ෂකයා ජයග්‍රහණය කළහොත් ප්‍රබල ආණ්ඩුක්‍රම සංශෝධනයක් සිදුකරන බවට පොරොන්දුවක් ජනතාවට ලබාදෙන ලදි.

එසේම විපක්ෂයේ පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේනගේ ජනාධිපතිවරණ මැතිවරණ ප්‍රකාශය සකස් කිරිමේදී මෙම ගිවිසුම පාදක කරගන්නා ලද අතර ඒ අනුව "මෛත්‍රී පාලනයක් ස්ථාවර රටක්" නැමති ප්‍රතිපත්ති ප්‍රකාශය එළිදක්වන ලදි. එහි පළමු අංකය ලෙස සඳහන් වූයේ "ප්‍රජාතන්ත්‍රවාදය සහතික කරන ව්‍යවස්ථා සංශෝධනයක්" යන්නයි.

- විධායක ජනාධිපති ක්‍රමය වෙනසකට ලක්කිරීම,
- අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව, සංයුතිය හා ස්වභාවය විද්‍යාත්මක පදනමක සිට සිදු කිරීම.
- අමාත්‍යාංශ සඳහා පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය ශක්තිමත් කිරීම.
- සියලු අමාත්‍යාංශ සඳහා කුසලතා ඇගයීමක් ස්වාධීනව සිදු කර එය පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ අධික්ෂණයට යටත් කිරීම
- කේවල ආසන ක්‍රමය හා පරාජිත අපේක්ෂකයන්ගේ සමානුපාත ඡන්දයේ සංකලනයක් භාවිතා කරමින් මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම.
- 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසි කිරීම
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව බලවත් කිරිම
- අමාත්‍යමණ්ඩලය සීමා කිරිම, මැතිවරණ ක්‍රමය සංශෝධනය කරමින් මනාප ක්‍රමය වෙනස් කිරීම,
- අධිකරණ, පොලීසිය, මැතිවරණ, විගණන හා නීතිපති වැනි ආයතනවල අපක්ෂපාතිත්වය ආරක්ෂා කිරීම පිණිස ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කිරීම වැනි කරුණු ප්‍රධාන වේ.

මෙම ජනාධිපතිවරණයේදී ජනතාව අතර ගිය වඩා ආකර්ශනීය ලේඛනය වූයේ මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය ඇසුරෙන් සකස් කරන ලද "වෙනසකට එක්වෙමු

මෛත්‍රී පාලනයක් දින 100 කින් අලුත් රටක්" නැමති දින 100 වැඩසටහන තුළ මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා දින වෙන් කර තිබීමයි.ඒ අනුව

- ජනවාරි 12 සඳුදා-ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපනය කිරීම සඳහා යෝජිත ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සඳහා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂ හා අනෙකුත් පුරවැසි කණ්ඩායම්වලින් නියෝජනත්වයෙන් යුත් ජාතික උපදේශක සභාව පත් කිරීම.
- ජනවාරි 21 බදාදා- දැනට පවතින අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුව හා සම්බන්ධ වූ විධායකයක් සහිත ආණ්ඩුක්‍රම ව්‍යුහයක් ස්ථාපනය කිරීම සහ 18 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආහෝසි කරමින් ස්වාධීන අධිකරණ කොමිසම, ස්වාධීන පොලිස් කොමිසම,ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම,ස්වාධීන මැතිවරණ කොමිසම,ස්වාධීන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම හා මානව හිමිකම් කොමිසම බලාත්මක කිරීම ඇතුළත් 19 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කෙටුම්පතක් හැටියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය ආරම්භ කර හැකි ඉක්මනින් සම්මත කරගැනීමට කටයුතු කිරීම.
- ජනවාරි 28 බදාදා-මනාප ඡන්ද ක්‍රමය සහමුලින්ම අහෝසි කොට සෑම මැතිවරණ කොට්ඨාශයටකටම මන්ත්‍රීවරයකු ලැබෙන පරිදි මන්ත්‍රී ආසන ක්‍රමය හා සමානුපාතික ක්‍රමයේ මිශ්‍රණයක් සහිත නව මැතිවරණ ක්‍රමය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා සර්ව පාක්ෂික කමිටුවක් පත් කිරීම.
- පෙබරවාරි 2 සඳුදා-සියලුම මහජන නියෝජිතයින් විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම පද්ධතියක් නීතිගත කිරීම.
- පෙබරවාරි 18 බදාදා-ස්වාධීන කොමිෂන් සභා ස්ථාපනය කිරීම හා එයට අදාළ පත් කිරීම් සිදු කිරීම.
- පෙබරවාරි 23 බදාදා-ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවා ස්වාධීන කොමිෂන් සභා ඇතුළු වෙනත් පත්කිරීම් සිදුකිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම
- අප්‍රේල් 20 සදුදා-අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුවට සම්බන්ධ වූ විධායකයක් සහිත ආණ්ඩුක්‍රම ව්‍යුහයක් ක්‍රියාත්මක කිරීම.

2015 ජනවාරි 08 දින පැවති ජනාධිපතිවරණයෙන් 51.28% ඡන්ද ප්‍රතිශතයන් ලබාගනිමින් මෛත්‍රීපාල සිරිසේන ජයග්‍රහණය කරන ලදි. ජනවාරි 09 දින අගමැති ලෙස රනිල් වික්‍රමසිංහ දිවුරුම්දුන් අතර එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ හා පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පිවිසි මන්ත්‍රීවරුන්ගෙන්ද සමන්විත අමාත්‍ය මණ්ඩලයක්ද පිහිටුවන ලදි. මෙම රජය යහපාලන රජය ලෙස නම් විය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නියමිත කාලවකවානුවේදී සිදු නොවීය. මේ පිළිබඳව කනස්සල්ලට පත් සාධාරණ සමාජයක් ඇතුළු යහපාලන රජය බලයට ගෙන ඒමට ක්‍රියාකර සිවිල් සංවිධාන සහ වෘත්තීය සමිති නව ආණ්ඩුවට එරෙහිව විශාල විරෝධතා පෙළපාලියක් සංවිධානය කර පාර්ලිමේන්තුව දක්වා ගොස් කඩිනමින් නව ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන ලෙස ඉල්ලා සිටීම දැකිය හැකිවිය.

## 7.2. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත

නව ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා නව ආණ්ඩුව කටයුතු කළ අතර ජනාධිපතිගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ උපදේශක ලෙස ජනාධිපති නීතිඥ ආචාර්ය ජයම්පති වික්‍රමරත්න පත් කර තිබිණි. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න 2020 වසරේදී BOSTONLANKA NEWS වෙබ් අඩවියට ප්‍රකාශ කර ඇති පරිදි මෙම ව්‍යවස්ථා සංශෝධනය කෙටුම්පත් කිරීමේදී නීති කෙටුම්පත් සම්පාදක මණ්ඩලයට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු සහ තවත් පුද්ගලික නීතිඥ වෘත්තියේ නියුතු නීතිඥයකුද දායක වී ඇත.

කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබූ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත අගමැතිගේ නියමයෙන් 2015 මාර්තු 13 දින රජයේ ගැසට් පත්‍රයේ අතිරේකයක් ලෙස පළකරන ලදි. එය 2015 මාර්තු 24 දින පාර්ලිමේන්තුවට පළමුවර කියවීම සඳහා ඉදිරිපත් කරන ලදි. මේ අනුව 17 සහ 18 වන ව්‍යවස්ථා සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී භාවිත කරන ලද හදිසි පනත් ගෙන ඒමේ ක්‍රමවේදය භාවිත නොකර පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ සාමාන්‍ය ක්‍රමවේදය අනුගමනය කරමින් මෙම සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් විය.

## 7.3. 319 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ මූලිකාංග

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකිරීමට අපේක්ෂා කළ සංශෝධන පහත පරිදි සංක්ෂිප්ත කළ හැකිය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නැවත ස්ථාපනය කිරීම
- තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම මූලික අයිතිවාසිකමක් ලෙස ඇතුළත් කිරීම
- විගණන සේවා කොමිෂන් සභාව නමින් නව කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම
- ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව නමින් නව කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම
- අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව සීමා කිරීම
- අමාත්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ බලතල අඩු කිරීම-අගමැතිගේ බලතල වැඩිකිරිම
- ජනාධිපතිට සිය අභිමතය පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි කාලය වසර හතර හමාර දක්වා දීර්ඝ කිරීම
- හදිසි පනත් ගෙන ඒමේ ක්‍රමවේදය අහෝසි කිරිම
- ජනාධිපතිට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු පැවරීමට ප්‍රතිපාදන ඇතුළත් කිරීම
- ජනාධිපතිගේ ධුරකාල වසර පහ දක්වා අඩුකිරීම
- පාර්ලිමේන්තුවේ ධුරකාලය වසර පහ දක්වා අඩු කිරීම
- අධිකරණ සේවා කොමිෂන් සභාවේ බලතල වැඩි කිරිම
- මැතිවරණ කොමිෂන් සභාවේ බලතල වැඩි කිරිම
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ බලතල වැඩි කිරීම
- ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල වැඩි කිරිම
- විදේශ රටක පුරවැසිභාවය සහිත පුරවැසියකුට මැතිවරණයක තරඟ කිරීම නුසුදුසුකමක් ලෙස පත්කිරීම
- ජනාධිපති අපේක්ෂකයකුගේ අවම වයස අවුරුදු 35 දක්වා වැඩි කිරීම
- විගණකාධිපතිගේ විෂය පථය පුළුල් කිරීම
- පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ පක්ෂමාරු කිරීමට එරෙහිව දැඩි ව්‍යවස්ථාපිත බාධා ඇති කිරීම

## 7.4. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය ප්‍රශ්න කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සම් 13ක් යොමු විය. අගවිනිසුරු ප්‍රමුඛ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් විසින් මෙම පෙත්සම් අප්‍රේල් 1,2සහ 6 දිනවලදී විභාග කරන ලදි. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

කථානායක වෙත යොමුකළ අතර කථානායක විසින් එය අප්‍රේල් 09 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදි. ඒ අනුව අධිකරණය තීරණය කර තිබුනේ කෙටුම්පතේ 42(3), 43(1),44(2), 44(3), 44(5) යන ව්‍යවස්ථා සහ 26 වන වගන්තියේ 104(5)(ඇ) අනු ව්‍යවස්ථාව පනත් කෙටුම්පතේ පවතින ආකාරයෙන්ම සම්මත කිරීමට නම් පාර්ලිමේන්තුවේ 2/3 ක විශේෂ බහුතරයකට අමතරව ජනමත විචාරණයක්ද අවශ්‍ය බවයි. ඒ අනුව කෙටුම්පතේ වූ

- අග්‍රාමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානයා වන්නේය. යන ප්‍රතිපාදනය (43(3) ව්‍යවස්ථාව)
- අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සංඛ්‍යාව සහ විෂයන් නිශ්චය කිරීමේ බලතල අග්‍රමාත්‍ය වෙත පැවරීමේ ප්‍රතිපාදන (44(2) ව්‍යවස්ථාව )
- අමාත්‍යවරුන්ට පැවරිය යුතු විෂය පිළිබඳව නිශ්චය කිරිමේ බලතල අගමැතිට පැවරීම පිළිබඳ ප්‍රතිපාදන (44(2) ව්‍යවස්ථාව)
- අමාත්‍යවරුන්ට පවරන ලද විෂය වෙනස් කිරීමට අගමැතිට බලය පවරන ප්‍රතිපාදන (44(3) ව්‍යවස්ථාව)
- අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුට ගැසට් පත්‍රයේ පළකරන නිවේදනයක් මතින් යම් විෂයක් පැවරීමට අගමැතිට බලය පවරන ප්‍රතිපාදන (44(5) ව්‍යවස්ථාව)
- මැතිවරණ කාලපරිච්ඡේදයේදී මැතිවරණ කොමිෂන් සභාව විසින් පනවනු ලබන උපමාන උල්ලංඝනය කරන අවස්ථාවකදී රජයේ හෝ පෞද්ගලික ගුවන් විදුලි හෝ රූපවාහිනී නාලිකාවල කළමණාකරණය සඳහා නිසිබලධාරයකු පත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය පවරන ප්‍රතිපාදන (26 වගන්තියේ 104(5(ඇ) ව්‍යවස්ථාව)

මෙම නඩු තීන්දුව මගින් ජනමත විචාරණයක් අවශ්‍ය යැයි සඳහන් කරන ලද සංශෝධන, කෙටුම්පත පිළිබඳ විවාදයේ කාරක සභා අවස්ථාවේදී සංශෝධනය කිරීමට කටයුතු කරන බව, 2015 අප්‍රේල් 27 දින විජේදාස රාජපක්ෂ අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන ලදි (පිටු අංක 521 හැන්සාර්ඩ් වාර්තාව-2015 අප්‍රේල් 27 දින )

## 7.5. 19 සම්මත වූ පාර්ලිමේන්තුවේ සංයුතිය

2010 පාර්ලිමේන්තු මැතිවරණයේදී බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් වන 144 ක් ලබාගත්තේ පොදුජන එක්සත් ජාතික පක්ෂය මන්ත්‍රීධූර 60ක්ද ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය - 7 ක්ද (ජනතා විමුක්ති පෙරමුණ තරග කරන ලද්දේ මෙම පක්ෂය යටතේය) ඉලංගෙයි තමිල් අරසු කච්චු පක්ෂය 14ක්ද ලබාගෙන තිබුණි.

එක්සත් ජනතා සංන්ධානය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පැමිණි මන්ත්‍රීවරුන් රැසක් මේ වන විට කැබිනට් අමාත්‍යධූර, රාජ්‍ය අමාත්‍යධූර හෝ නියෝජ්‍ය අමාත්‍යධූර ලබාගෙන රජයට එකතු වී තිබිණි. එම පිරිස වන්නේ පාඨලී චම්පික රණවක (විදුලිබල හා බලශක්ති අමාත්‍ය). රාජිත සේනාරත්න (සෞඛ්‍ය සහ දේශිය වෛද්‍ය අමාත්‍ය), දුමින්ද දිසානායක ( වාරිමාර්ග හා කෘෂිකර්ම අමාත්‍ය), එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන (ඉඩම් අමාත්‍ය), රිෂාඩ් බදියුදීන් (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය), නන්දිමිත්‍ර ඒකනායක (සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍ය), සේදුවේල් සාමි රාධක්‍රිෂ්ණන් (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය), ෆයිසර් මුස්තාෆා (ගුවන් සේවා රාජ්‍ය අමාත්‍ය), රජීව් විජේසිංහ (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය), කරුපයියා වෙලායුදන් (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය), (2015-10-18 දින අංක 1897/16 දරන අති විශෙෂ ගැසට් පත්‍රය) අබ්දුල් හමීඩ් මොහොමඩ් ෆවුසි (ආපදා කළමනාකරණ අමාත්‍ය), එස්. බී. නාවින්න (කම්කරු අමාත්‍ය), පියසේන ගමගේ (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය), සරත් අමුණුගම (උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍ය), එස්.බී. දිසානායක (ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍ය) ජනකබණ්ඩාර තෙන්නකෝන් (පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය), ෆීලික්ස් පෙරේරා (විශේෂ ව්‍යාපෘති අමාත්‍ය), මහින්ද යාපා අබේවර්ධන (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය), රෙජිනෝල්ඩ් කුරේ (ගුවන් සේවා අමාත්‍ය), විජිත් විජයමුණි සොයිසා (වාරිමාර්ග අමාත්‍ය), මහින්ද අමරවීර (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය), පවිත්‍රාදේවි වන්නිආරච්චි (පරිසර රාජ්‍ය අමාත්‍ය), ජීවන් කුමාරණතුංග (කම්කරු රාජ්‍ය අමාත්‍ය), සී. බී. රත්නායක (රාජ්‍ය පරිපාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය) ඩිලාන් පෙරේරා (නිවාස හා සමෘද්ධි රාජ්‍ය අමාත්‍ය), දයාශ්‍රිත තිසේරා (ධීවර නියෝජ්‍ය අමාත්‍ය), රංජිත් සියඹලාපිටිය (ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය), ලක්ෂ්මන් යාපා අබේවර්ධන (ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය), ජගත් පුෂ්පකුමාර (වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍ය), ලලිත් දිසානායක (වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍ය), ලසන්ත අලගියවන්න (ග්‍රාමීය ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය), සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලෙ (උසස් අධ්‍යාපන හා පර්යේෂණ නියෝජ්‍ය අමාත්‍ය), ශාන්ත බණ්ඩාර (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍ය), සහ නෙරංජන් වික්‍රමසිංහ (මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය) ( 2015 මාර්තු 26 දින අංක 1907/48 දරන අති විශෙෂ ගැසට් පත්‍රය) වේ. තවත් පිරිසක් රජයට සහයෝගය දක්වන බවද ප්‍රකාශ කර තිබිණි. පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව 2/3 ක ඡන්දයෙන් එය සම්මත කිරිම සඳහා සාකච්ඡා ආරම්භ විය. විශේෂයෙන්ම ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මේ වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය භාරගෙන තිබූ අතර ඔහු විසින් සිය මන්ත්‍රීවරුන්ගේ ඡන්දය ලබාගැනීම සඳහා ඔවුන් සමග සාකච්ඡා කර පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය

ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි. එසේම පනත් කෙටුම්පත විවාදයට ගත් පළමු දින පාර්ලිමේන්තුවට පැමිණ මෙම පනත් කෙටුම්පත සම්මත කිරිමට සියලුම මන්ත්‍රිවරුන් සහයෝගය දක්වන ලෙස ඉල්ලා සිටින ලදි (516 පිටුව - හැන්සාර්ඩ් වාර්තාව - 2015 අප්‍රේල් 27 )

## 7.6. කාරක සභා අවස්ථාවේදී සිදුකරන ලද ප්‍රධාන සංශෝධන

පනත් කෙටුම්පතට කාරක සභා අවස්ථාවේදී සංශෝධනයන් සිදුකිරීම හේතු දෙකක් නිසා සිදුවිය. පළමු හේතුව වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුව කෙටුම්පතේ සඳහන්වූ පරිදි 43(3) 44(2) 44(3) 44(5) සහ 104(5) ඇ යන ව්‍යවස්ථා සම්මත කිරීමට 2/3 විශේෂ බහුතරයක් ලබාගැනීමට අමතරව ජනමත විචාරණයකින්ද සම්මත කළයුතු බව ප්‍රකාශ කළ නිසා එම ව්‍යවස්ථාවන් ජනමත විචාරණයකට තුඩු නොදෙන ලෙස සංශෝධනය කිරීමට අවශ්‍යතාවක් පැන නැගීමයි.

දෙවන හේතුව වූයේ 2/3 විශේෂ බහුතර ඡන්දය ලබාගැනීමට අවශ්‍ය නිසා විපක්ෂ මන්ත්‍රිවරුන් විසින් සිදුකරන ලද සංශෝධන ඉල්ලීම් සඳහා අවස්ථාව ලබාදීමයි. කෙසේ නමුත් මුල් කෙටුම්පතේ ව්‍යවස්ථා 54න් 32 ක් කාරක සභා අවස්ථාවේදී සංශෝධනය කරන ලදි.

එකී සංශෝධනවලට අනුව පනත් කෙටුම්පතේ සඳහන් ප්‍රතිපාදන අතරින් කමිටු අවස්ථාවේදී සිදුකරන ලද මූලික සංශෝධන වනුයේ

- කැබිනට් මණ්ඩලයේ විෂය සම්බන්ධයෙන් අගමැති වෙත කෙටුම්පත මගින් පවරා තිබූ ඇතැම් බලතල ජනාධිපති වෙත යළි ලබාදීම සඳහා ප්‍රතිපාදන සංශෝධනය කිරීම
- දේශපාලන පක්ෂ මාරුකිරීමේදී මන්ත්‍රිවරයකුගේ ආසනය අහිමි කිරීම සහතික කිරීම සඳහා කෙටුම්පත මගින් සලසා තිබූ සංශෝධනය ඉවත් කිරීම. මෙම ප්‍රතිපාදනයට අදාළ වගන්තිය පිළිබඳව කාරක සභා අවස්ථාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රි දිනේෂ් ගුණවර්ධන ප්‍රකාශ කරන ලද්දේ මෙම යෝජිත ප්‍රතිපාදනය මගින් පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකුට දේශපාලන පක්ෂය විසින් තමන්ට විරුද්ධව කටයුතු කිරිමේදී අධිකරණයට යාමට ඇති අයිතිය අහෝසි කරන බවයි. ඒ නිසා එම වගන්තිය සම්බන්ධයෙන් ඡන්දයක් විමසීම අවශ්‍ය බවයි. අධිකරණ අමාත්‍ය විජේදාස රාජපක්ෂ ප්‍රකාශකළේ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකුට ශ්‍රේෂ්ඨාධිකරණයට යාමට ඇති ඉඩකඩ මෙමගින් අහෝසි නොවන බැවින් එගඟ වන ලෙසයි.

නමුත් දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රිවරයා නැවත් ඒ සඳහා ඡන්ද විමසීමක් ඉල්ලා සිටින ලදි.එම අවස්ථාවේදී විජේදාස රාජපක්ෂ අමාත්‍යවරයා ප්‍රකාශ කළේ එම සංශෝධනය ඉවත් කරගන්නා බවයි. ( 953 සිට 957 දක්වා පිටු- 2015 අප්‍රේල් 28 හැන්සාර්ඩ් වාර්තාව)

- ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සභාවේ සාමාජික සංයුතිය සංශෝධනය කිරීම(පනත් කෙටුම්පත අනුව සංයුතිය වූයේ පාර්ලිමේන්තු මන්ත්‍රිවරු 7ක් සහ දේශපාලන පක්ෂවල සබඳතා නොමැති විද්වත් පුරවරසියන් වූ අතර කාරක සභා අවස්ථාවේදී එම සංයුතිය පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් 7 ක් සහ දේශපාලන සබඳතා නොමැති පුද්ගලයන් 3 දෙනෙකුගෙන් සමන්විත වන ලෙස සංශෝධනය කරන ලදි)
- මැතිවරණ සමයකදී මැතිවරණ කොමිසමේ උපමාන පිළිනොපදින විද්‍යුත් මාධ්‍ය ආයතන සදහා නිසි බලධාරියකු පත් කිරිම පිලිබදව කෙටුම්පතේ වූ ප්‍රතිපාදන කාරක සභා අවස්ථාවේදි සංශෝධනය කරමින් කොමිෂන් සභාවේ උපමාන අනුගමනය නොකරන රාජ්‍ය මාධ්‍ය ආයතන සම්බන්ධයෙන් නඩු පැවරීමේ බලතල මැතිවරණ කොමිසමට ලබාදෙන ලදි.
- නාමයෝජනා භාරදීමත් හෝ ජනමත විචාරණයක් ප්‍රකාශයට පත් කිරීමෙන් දින 7ක් ඇතුළත තමන් සහයෝගය දක්වන පක්ෂය හෝ කණ්ඩායම මැතිවරණ කොමිසම වෙත දැනුම්දෙන මාධ්‍ය ආයතන මැතිවරණ කොමිසමේ මාධ්‍ය උපමාන පිළිපැදීමේ වගකීමෙන් නිදහස් කිරීම පිළිබඳව වූ කෙටුම්පතේ ප්‍රතිපාදන ඉවත් කරන ලදි.
- රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීම සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ විෂය පථයෙන් ඉවත් කිරීම

## 7.7. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව ඡන්දය භාවිත කරන ලද්දේ එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් දිගාමඩුල්ල දිස්ත්‍රිකක්යෙන් තේරී පත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රි සරත් වීරසේකර පමණි. ඔහු සිය කථාවෙන් අවධාරණය කළේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් සහ ස්වාධීන කොමිෂන් සභා මගින් ශ්‍රී ලංකාවේ බහුතර ජනතාව වන සිංහලයන්ගේ

බලය අඩුවන බවත් ජනාධිපතිගේ බලය අඩු වන බවත්ය. දහනව වන ආණ්ඩුකම ව්‍යවස්ථා සංශෝධනය කියාත්මක වුණොත් රටේ සමස්ත පරිපාලනයට සිංහල ජනතාවගේ කිසිම දායකත්වයක් ඇති වෙන්නේ නැහැ." (793 පිටුව - හැන්සාර්ඩ් වාර්තාව-2015 අප්‍රේල් 28) යනුවෙනි.

ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සංධානය නියෝජනය කරමින් ගාල්ල දිස්ත්‍රික්කයෙන් තේරී පත්වූ අජිත් කුමාර මන්ත්‍රීවරයා (ඔහු ඒ වන විට පෙරටුගාමී පක්ෂයේ ක්‍රියාකාරිකයෙකි) ඡන්දය දීමෙන් වැළකී සිටින ලදි. ඔහු පාර්ලිමේන්තුව තුළ සිය කථාවෙන් අවධාරණය කළේ මෙම සංශෝධනය මගින් 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදන අහෝසි වීමට අමතරව ජනාධිපතිගේ විධායක බලතල සම්බන්ධයෙන් ඉතා සුළු සංශෝධන කිහිපයක් පමණක් සිදුවන බවයි. ඔහු සිය කථාව අවසන් කළේ "ඇත්තෙන්ම ඔබතුමන්ලා විධායක බලය අහෝසි කරන්නේ කවදාද? එසේ අහෝසි කරන වෙලාවට මහජන සම්මුතියකට ඇවිල්ලා, මහජනතාව එක්ක සාකච්ඡාකරලා, පුවත්පත්වල පළ කරලා, වෙබ් අඩවිවල පළ කරලා, මීට වඩා පුළුල් සංවාදයක් කරලා ජනතාවගේ සැබෑ ජනසම්මතවාදී ව්‍යවස්ථාවක් සම්මත කර ගන්නය කියා මේ රටේ ජනතාවට ආරාධනා කරමින් මම නිහඬ වෙනවා" යනුවෙනි (841පිටුව -හැන්සාර්ඩ් වාර්තාව- 2015 අප්‍රේල් 28) ඒ අනුව පනත් කෙටුම්පතට පක්ෂව ඡන්ද 215ක් ලැබුණ අතර විපක්ෂව එක් ඡන්දයක්ද ලැබිණි. ඡන්දය නොදුන් මන්ත්‍රිවරුන් 1කි.නොපැමිණි මන්ත්‍රිවරුන් සංඛ්‍යාව 07කි. ඒ අනුව 2010 අප්‍රේල් පාර්ලිමේන්තු මැතිවරණයෙන් තේරීපත් වූ මන්ත්‍රිවරුන් විසින් ඡන්ද 161 ක් ලබාදී සංශෝධනය කළ 18 වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ මූලික හරය සම්පූර්ණයෙන්ම සංශෝධනය කරමින් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනය එම පාර්ලිමේන්තුවේම මන්ත්‍රිවරුන් 215ක් විසින් සම්මත කරන ලදි.

එසේම පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කළ මන්ත්‍රිවරුන් රැසක්ම මෙම විවාදයේදී පවසා සිටියේ තමන් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පක්ෂව ඡන්දය ලබාදෙන්නේ කඩිනමින්ම මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන ආකාරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් (20 වන සංශෝධනය) ගෙන එන බවට එක්සත් ජාතික පක්ෂයේ වූ පොරොන්දුව මත බවයි,

## 7.8. 18 සහ 19 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන දෙකටම පක්ෂව ඡන්දය ලබාදුන් මන්ත්‍රිවරුන්

2010 පාර්ලිමේන්තු මැතිවරණයේදී එක් එක් දේශපාලන පක්ෂ ලබාගත් මන්ත්‍රී ආසන වූයේ

- පොදුජන එක්සත් පෙරමුණ - මන්ත්‍රීධුර 144
- එක්සත් ජාතික පක්ෂය - මන්ත්‍රීධුර 60
- ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සංන්ධානය- මන්ත්‍රීධුර 7 (ජනතා විමුක්ති පෙරමුණ තරග කරන ලද්දේ මෙම පක්ෂය යටතේය)
- ඉලංගෙයි තමිල් අරසු කච්චු පක්ෂය - මන්ත්‍රීධුර 14

ඒ අනුව පොදුජන එක්සත් පෙරමුණ නියෝජන මන්ත්‍රිවරුන් අතරින් චමල් රාජපක්ෂ කථානායකවරයා නිසා මෙම ව්‍යවස්ථා කෙටුම්පත් දෙකටම ඡන්දය ප්‍රකාශ නොකරන ලදි. දිගාමඩුල්ල පාර්ලිමේන්තු මන්ත්‍රි සරත් වීරසේකර 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදි. එසේම පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරන ලද ප්‍රේමලාල් ජයසේකර, ජානක බණ්ඩාර, ආචාර්ය ජගත් බාලසූරිය, පූජ්‍ය එල්ලාවල මේදානන්ද හිමි, කෙහෙළිය රඹුක්වැල්ල, බැසිල් රාජපක්ෂ සහ ඒ විනයාගමූර්ති යන මන්ත්‍රිවරුන් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වූ දිනයේ පාර්ලිමේන්තුට පැමිණ සිටියේ නැත. එසේම 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පක්ෂව ඡන්දය ලබාදුන් මෛත්‍රිපාල සිරිසේන අමාත්‍යවරයා මේ වන විට ජනාධිපතිවරයා නිසා ඔහුගේ ඡන්දය භාවිත නොවීය. එසේම පොදුජන එක්සත් පෙරමුණ පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එච්.එම්.අස්වර් මන්ත්‍රීවරයා 2015 පෙබරවාරි මාසයේදී ඉල්ලා අස් වී ඒ වෙනුවට අමීර් අලි සහබ්දීන් මන්ත්‍රීවරයා පත්කර තිබිණි. ඒ අනුව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් 133 දෙනෙකු ම 18 සහ 19 යන සංශෝධන දෙකම සඳහා ඡන්දය ලබාදී තිබිණි.

එසේම එක්සත් ජාතික පක්ෂය නියෝජය කරමින් පාර්ලිමේන්තුවට පිවිසි මන්ත්‍රිවරුන් 17ක්ද ඉලංකෙයි තමිල් අරසු කච්චි නියෝජනය කල මන්ත්‍රිවරයකුද 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ද පක්ෂව ඡන්දය ප්‍රකාශ කර තිබින. ඒ අනුව පහත සඳහන් ඒක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන් ද 18 සහ 19 යන සංශෝධන දෙකම සඳහා ඡන්දය ලබාදී තිබුණි.

අර්ල් ගුණසේකර, අබ්දුල් කාදර්, නිමල් විජේසිංහ, මනුෂ නානායක්කාර,ප්‍රභා ගනේෂන් (ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පක්ෂය), පලනි දිගම්බරන් (ජාතික කම්කරු සංගමය), ජේ.ශ්‍රී. රංගා. ලක්ෂ්මන් සෙනවිරත්න යන මන්ත්‍රිවරුන් සහ උපේක්ෂා ස්වර්නමාලි මන්ත්‍රීවරියද, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින්

පාර්ලිමේන්තුවට පිවිසි ශ්‍රී ලංකා මුස්ලිස් කොන්ග්‍රසයේ රවුෆ් හකීම්, එච්,එම්,එම් හරිස්, හුනෙයිස් ෆාරුක්, මොහොමඩ් අස්ලම්, නූර්දීන් මෂූර්, බෂීල් සේගු ඩාවුඩ්, ෆයිසාල් කාසීම්, එම්.එස්.තව්ෆික්. එමෙන්ම ඉලංගෙයි තමිල් අරසු කච්චි නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පිවිසි එච්.පී.පියසේන මන්ත්‍රීවරයා ද 18 සහ 19 ව්‍යවස්ථා සංශෝධන සදහා පක්ෂව ඡන්දය ලබාදී තිබිනි.

# අටවන පරිච්ඡේදය

## 19 වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනය මගින් සිදුකළ ව්‍යවස්ථා වෙනස

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද සංශෝධන අතරින් දැඩි මහජන ඉල්ලීමක් මත සිදුකරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ලෙස හඳුන්වාදිය හැකිය. මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තීරණාත්මක වෙනසකට භාජනය කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසක් සිදුකරන ලදි. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එතෙක් පැවති 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දක්වා සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද සංශෝධන සහ ඒවායේ බලපෑම් පිළිබඳව විග්‍රහ කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කරනු ලබයි.

### 8.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්ථාපනය කිරීම

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පළමු වරට ස්ථාපනය කරන ලද සහ 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් යළි ස්ථාපනය කරන ලදි. මෙම ව්‍යවස්ථා සභාවේ සංයුතිය වන්නේ

- අග්‍රාමාත්‍යවරයා;
- කථානායකවරයා;
- පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා;
- ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;

- අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාගේම නාමයෝජනා කිරීම මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු වූද, දෙදෙනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විය යුතු වූද, තැනැත්තන් පස් දෙනෙක්; සහ
- අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ නොවන පාර්ලිමේන්තුවේ නියෝජනය ඇති අනෙකුත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාම යෝජනා කොට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. (19 වන සංශෝධයෙන් සංශෝධනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාව) මේ අනුව මෙම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් 10 දෙනා අතරින් 7 දෙනෙකුම පාර්ලිමේන්තුව නියෝජනය කරන අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන ස්වාධීන පුරවැසියන් තිදෙනෙකු පමණක් ඇතුළත් වේ. 17 වන සංශෝධනයේ සදහන් ව්‍යවස්ථා සභාවේ මෙන්ම මෙහිද සභාපති වන්නේ කථානායක වේ.

ජනාධිපති විසින් සාමාජිකයන් පත් කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ ලබාගත යුතු කොමිෂන් සභා

- මැතිවරණ කොමිෂන් සභාව
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව
- මුදල් කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
- සීමා නිර්ණය කොමිෂන් සභාව
- ජාතික පොලිස් කොමිෂන් සභාව
- ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
- විගණන සේවා කොමිෂන් සභාව

ජනාධිපති විසින් සිදුකරනු ලබන නිර්දේශ සදහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමැතිය ලබාදිය යුතු තනතුරු

- අගවිනිසුරු සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්
- සභාපති සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන්
- සභාපති හැර අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්
- නීතිපති
- පොලිස්පති

- විගණකාධිපති
- ඔම්බුඩ්ස්මන්
- පාර්ලිමේන්තු මහ ලේකම්

කොමිෂන් සභාවල සාමාජිකයන් පත්කිරීම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය ලැබී දින 14ක් තුළ ජනාධිපති විසින් එම පත් කිරීම් සිදුකිරීම අනිවාර්ය වේ. එසේ නොකළහොත් 15 වන දිනයේ සිට එකී තනතුරු නිසි පරිදි පත් කළා සේ සලකන බව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(4) ව්‍යවස්ථාවේ දක්වේ.

එසේම ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයෙ විනිසුරුවරුන් පත් කිරිමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අගවිනිසුරුගේ අදහස් ලබාගත යුතු බව 17 වන ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ(4) ව්‍යවස්ථාවේ දක්වේ. ඒ අනුව 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපනය කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට වඩා බලවත් සහ වගකීමකින් යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් 19 වන සංශෝධනය මගින් ස්ථාපනය කර ඇත.

## 8.2. ජනාධිපතිගේ නිල කාලය අඩු කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිගේ නිලකාලය වසර 6කි. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම කාලය වසර 5 දක්වා අඩු කරන ලදි.( 19 වන සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ 30(2) වන ව්‍යවස්ථාව). මේ අනුව 2015 දී වසර 6ක නිලකාලයක් සඳහා පත්වූ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ නිලකාලය වසර 5කින් අවසන් විය.

## 8.3. පාර්ලිමේන්තුවේ නිල කාලය අඩු කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ නිලකාලය වසර 6කි. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම කාලය වසර 5 දක්වා අඩු කරන ලදි.( 19 වන සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ 62 වන ව්‍යවස්ථාව).

## 8.4. අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව සීමා කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවට අනුව අමාත්‍ය මණ්ඩයේ සංඛ්‍යව පිළිබඳව සීමා පනවා තිබුණේ නැත. ජනාධිපතිට අවශ්‍ය තරම් අමාත්‍යවරුන් නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ රාජ්‍ය අමාත්‍යවරුන් පත් කිරිමේ හැකියාව තිබිණි. මෙම තත්ත්වය නිසා 2010 පමණ වන විට විසල් අමාත්‍ය මණ්ඩල නිර්මාණය වන ලදි. ඒ අනුව 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් අමාත්‍ය මණ්ඩලයේ උපරිම සීමාව

30 දක්වා සීමා කරන ලද අතර නියෝජ්‍ය රාජ්‍ය සහ කැබිනට් නොවන අමාත්‍යවරුන්ගේ එකතුව 40 නොඉක්මවිය යුතු බවට ප්‍රතිපාදන සලසන ලදි. (19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(1) වන ව්‍යවස්ථාව) නමුත් පාර්ලිමේන්තුවේ වැඩිම ආසන ප්‍රමාණයක් ලබාගන්නා පක්ෂය සහ වෙනත් දේශපාලන පක්ෂයක් එක්ව ජාතික ආණ්ඩුවක් පිහිටුවන්නේ නම් අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව පිළිබඳව සීමාව පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් වැඩි කර ගත හැකිය. ( 19 වන සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(4) වන ව්‍යවස්ථාව).

19 වන ආණ්ඩුක්‍රම සංශෝධනයේ මුල් කෙටුම්පතේ සඳහන් වූයේ පාර්ලිමේන්තුවේ වැඩිම ආසන ප්‍රමාණයක් ලබාගත් පක්ෂය සහ ඊළඟට වැඩිම ආසන ප්‍රමාණයක් ලබාගත් පක්ෂය එක්ව පිහිටවන ආණ්ඩුව ජාතික ආණ්ඩුවක් ලෙස සලකන බවයි. නමුත් මෙම ප්‍රතිපාදනය කාරක සභා අවස්ථාවේදී සංශෝධනය කරමින් වැඩිම ආසන ප්‍රමාණයක් ලබාගන්නා පක්ෂය සහ පාර්ලිමේන්තුව නියෝජනය කරන වෙනත් දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් එක්වී පිහිටුවන ආණ්ඩුව ජාතික ආණ්ඩුව බවට ප්‍රතිපාදන ඇතිකරන ලදි.

## 8.5. ජනාධිපති මුක්තිය සීමා කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපති ධුරය දරන තැනැත්තෙකු විසින් පෞද්ගලික තත්ත්වයෙහිලා හෝ නිල තත්වයෙහිලා හෝ කරන ලද හෝ නොකරන ලද කිසිවක් සම්බන්ධයෙන් කිසිම අධිකරණයක හෝ විනිශ්චයාධිකරයක කිසිම නඩුවක් පැවරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතුය.(1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 25(1) ව්‍යවස්ථාව). 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් ජනාධිපතිට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු පැවරීමට පුරවැසියන්ට අයිතියක් ඇති බවට ප්‍රතිපාදන සලසන ලදි. නමුත් ජනාධිපතිවරයාගේ බලතල යටතට ගැනෙන යුද්ධය හා සාමය ප්‍රකාශකිරීමට අදාළ කාර්යය ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රශ්න කළ නොහැකි බවද දක්වන ලදි. 2018 නොවැම්බර් මාසයේදී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පුරවැසියන් විසින් අභියෝගයට ලක්කරන ලද්දේ, මෙම ප්‍රතිපාදනය භාවිතා කරමින්ය"(SC FR 351/2018)

## 8.6. තොරතුරු දැනගැනීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් බවට පත් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට 41අ ලෙස අලුත් ව්‍යවස්ථාවක් එක් කරමින් තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිවාසිකම පුරවැසියන්ට ඇති බවට ප්‍රතිපාදන සලසන ලදි. ඒ අනුව

14අ. (1) සෑම පුරවැසියකුට ම

(අ) රජය, අමාත්‍යාංශයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ යම් නීතියක් මගින් හෝ යටතේ පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් සතුව පවත්නා වූ;

(ආ) යම් පළාත් අමාත්‍ය මණ්ඩලයක අමාත්‍යවරයකුගේ යම් අමාත්‍යාංශයක් හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් මගින් පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සතුව පවත්නා වූ;

(ඇ) යම් පළාත් පාලන ආයතනයක් සතුව පවත්නාවූ; සහ

(ඈ) මේ අනු ව්‍යවස්ථාවේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් ආයතනවලට අදාළව වෙනත් යම් තැනැත්තකු සතුව පවත්නා වූ, සහ පුරවැසියකුගේ අයිතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආරක්ෂා කිරිම සඳහා අවශ්‍ය වූ යම් තොරතුරක් වෙත නීතියෙන් සලසා ඇති පරිදි ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

(2) ජාතික ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාව හෝ මහජන ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ද, විෂමාචාර හෝ අපරාධ වැළැක්වීම පිණිස ද, සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිස ද, අන් අයගේ කීර්තිය හෝ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස ද, පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම පිණිස ද, අධිකරණයට අපහාස කිරීම වැළැක්වීම පිණිස ද, පාර්ලිමේන්තු වරප්‍රසාද ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ද විශ්වාසය මත දැනුම් දෙන ලද තොරතුරු හෙළිදරව් කිරීම වැළැක්වීම පිණිස ද හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාම පිණිස ද, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය වන්නා වූ නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හැර වෙනත් කවර හෝ සීමාකිරීමක් මේ ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති අයිතිවාසිකම මත නොපැනවිය යුත්තේ ය.

මෙම ව්‍යවස්ථා ප්‍රතිපාදනය මගින් 1978 වසරෙන් පසුව පළමු වතාවට මූලික අයිතිවාසිකම් පුළුල් කිරීම සිදුවිය,

## 8.7. ජනාධිපතිට අමාත්‍ය ධුර දැරීමට නොහැකි බව

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිට අමාත්‍යධුර දැරීමේ හැකියාවක් ඇත.(1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව) ඒ අනුව 1978 වසරේ සිට 2015 දක්වා බලයට පැමිණි සෑම ජනාධිපතිවරයකුම යම් යම් අමාත්‍යංශ භාරව කටයුතු කරන ලදි. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙම අනු ව්‍යවස්ථාව ඉවත් කරන ලදි.

## 8.8. වර්තමාන ජනාධිපතිවරයා සම්බන්ධ අතුරු ප්‍රතිපාදන

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිට අමාත්‍යංශ ධුර දැරීමට නොහැකි වුවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත වන විට ධුරයේ සිටි ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ ධුරය සඳහා අන්තර්කාලීන විධිවිධාන සලසන ලදි. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පටහැණිව කුමක් සඳහන් වුව ද මේ පනත ආරම්භ වන දිනයේ දී ජනාධිපතිවරයා ලෙස ධුර දරන තැනැත්තා එසේ ජනාධිපති ධුරය දරන තාක් කල් රාජ්‍ය ආරක්ෂාව, මහවැලි සංවර්ධනය සහ පරිසරය යන විෂය සහ ඒවායේ කර්තව්‍ය තමන්ගේ භාරය වෙත පවරා ගැනීමද එකී කාර්යය සඳහා ඔහු වෙත පවරා ගත යුතු අමාත්‍යාංශ තීරණය කරනු ලැබීමද කළ හැකි අතර ඒ අනුව එකී විෂය හෝ කර්තව්‍ය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාට යම් ලිඛිත නීතියක කරනු ලබන යම් සඳහනක්, ජනාධිපතිවරයාට කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුත්තේය යනුවෙන් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අනෙකුත් ආනුෂංගික සංශෝධන 50 වගන්තියට ඇතුලත් කරන ලදි.

## 8.9. අමාත්‍ය මණ්ඩලය සම්බන්ධ ජනාධිපති බලතල අඩු කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව තීරණය කිරිමද, අමාත්‍යවරුන්ගේ විෂය පථය තීරණය කිරිමද අමාත්‍යංශ විෂය පථය සහ අමාත්‍යංශ වෙනස් කිරීමද ජනාධිපති වෙත බලය තිබුණි. 19 වන සංශෝධනය මගින් මෙකී ප්‍රතිපාදන සංශෝධනය කරමින් අමාත්‍යංශ තීරණය කිරිමේදී සහ අමාත්‍යවරුන් තීරණය කිරිමේදී අගමැතිගේ උපදෙස් මත ජනාධිපති කටයුතු කළ යුතු බවට ප්‍රතිපාදන සැලසිණි. ( 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(2) ව්‍යවස්ථාව). නමුත් අමාත්‍යංශවල විෂය පථය තීර්ණය කිරිමේ බලය ජනාධිපති වෙත හිමිවිය.

## 8.10. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ කාලය සංශෝධනය

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව ප්‍රථම වරට රැස්වීමෙන් වසරකින් පසුව එය විසුරුවා හැරිමේ බලය ජනාධිපතිට හිමිවිය. (70 ව්‍යවස්ථාව). 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් එම කාලය වසර හතර හමාර දක්වා දීර්ඝ කරන ලදි.

## 8.11. විදේශ පුරවැසියන් සම්බන්ධ ප්‍රතිපාදන

ජනාධිපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකු ලෙස කටයුතු කිරීමේ නුසුදුසුකමක් ලෙස විදේශ රටක පුරවැසිභාවයක් තිබීම 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඇතුළත් කරන ලදි.(91(ඈ)xii ව්‍යවස්ථාව)

## 8.12. ජනාධිපති අපේක්ෂකයන්ගේ අවම වයස වැඩි කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92(අ) ව්‍යවස්ථාවට අනුව ජනාධිපති අපේක්ෂකයකුගේ අවම වයස අවුරුදු 30 ක් ලෙස සඳහන්ව තිබිණි. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එම වයස අවුරුදු 35 දක්වා වැඩි කරන ලදි.

## 8.13. විගණන සේවා කොමිසම ස්ථාපනය කිරීම

මෙතෙක් ශ්‍රී ලංකාවට ආගන්තුක වූ විගණන සේවා කොමිෂන් සභාව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපනය කරන ලදි. මෙම කොමිෂන් සභාවේ අරමුණ වන්නේ ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධාරීන් බඳවා ගැනීම, ස්ථාන මාරුවීම්, උසස්වීම්, විනය පාලනය සහ සේවයෙන් නෙරපීම යන කටයුතු සිදුකිරීමයි. 19 වන ආණ්ඩුක්‍රම සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්තාවේ XIXආ වන පරිච්ඡේදය වෙන්වී ඇත්තේ විගණන සේවා කොමිෂන් සභාව වෙනුවෙනි. කොමිෂන් සභාවේ සභාපති නිල බලයෙන් විගණකාධිපති වන අතර සෙසු සාමාජිකයන් හතර දෙනා වන්නේ

- නියෝජ්‍ය විගණකාධිපති හෝ නියෝජ්‍ය විගණකාධිපති වරයාගේ ශ්‍රේණියට ඉහළින් වූ ධුරයක් උසුළන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයන් දෙදෙනෙකු;
- ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයකු; සහ
- ශ්‍රී ලංකා පරිපාලන සේවාවේ විශ්‍රාම ලත් 1 වන පන්තියේ නිලධරයකු.

මෙම සාමාජිකයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපති විසින් පත්කළ යුතුය. කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් පුද්ගලයකුට පරිපාලන අභියාචන විනිශ්චයාධිකරණයට අභියාචනා කළ හැකි බව 19 වන සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153උ ව්‍යවස්ථාවේ දැක්වේ.

විගණන සේවා කොමිෂන් සභාව සම්බන්ධ ප්‍රතිපාදන මගින් ශ්‍රී ලංකා විගණන සේවය නමින් අලුත් සේවයක් ස්ථාපනය වූ අතර ඒ පිළිබඳ විධිවිධාන පාර්ලිමේන්තුව විසින් සම්පාදනය කළයුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වේ.

මෙම ප්‍රතිපාදන අනුව යමින් 2018 අංක 19 දරන ජාතික විගණන පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදි.

රාජ්‍ය විගණනය වෙනම ස්වාධීන සේවයක් යටතට පත් කිරීම මගින් රාජ්‍ය විගණනය ස්වාධීන කිරිම විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපනය කිරිමේ අරමුණ විය.

## 8.14. ජාතික ප්‍රසම්පාදන කොමිසම ස්ථාපනය

19 වන සංශෝධනය මගින් අලුතින් හඳුන්වා දුන් කොමිෂන් සභාවකි. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIXආ පරිච්ඡේදය වෙන් කර තිබුණේ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙනුවෙනි. ඒ අනුව කොමිෂන් සභාවේ සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර එකී සභාවේ යටත් පිරිසෙයින් සාමාජිකයන් තිදෙනෙකු ප්‍රසම්පාදනය, ගණකාධිකරණය, නීතිය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පිළිගත් අත්දැකීම් සහිත තැනැත්තන් විය යුතු ය. මෙම සාමාජිකයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත වසර තුනක කාලයක් සදහා ජනාධිපති විසින් පත් කරනු ලබයි.(19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156අ ව්‍යවස්ථාව)
156ඇ ව්‍යවස්ථාවට අනුව කොමිෂන් සභාවේ කාර්ය වන්නේ

- සියලු රජයේ ආයතන විසින් භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කරනු ලැබීම සම්බන්ධයෙන් සාධාරණ, යුක්ති සහගත, විනිවිද පෙනෙනසුළු, තරගකාරී සහ වියදම් සපලතාවකින් යුත් පටිපාටි සහ උපමාන සකස් කිරීම

- රජයේ ආයතන විසින් කරනු ලබන භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය, පූර්වයේ අනුමත වූ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව පිළියෙළ කරන ලද ප්‍රසම්පාදන ක්‍රම මත පදනම්ව ඇත්ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

- රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා වූ සියලු සුදුසුකම් ලත් ලංසුකරුවන්ට එකී භාණ්ඩ හා සේවා සැපයීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියට සහභාගීවීම පිණිස සමාන අවස්ථා ලබාදී ඇත්ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

- රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තේරීමේ සහ කොන්ත්‍රාත් ලබාදීමේ ක්‍රියාපටිපාටිය සාධාරණ හා විනිවිද පෙනෙනසුළු වන්නේද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;
- රජයේ ආයතන විසින් කරනු ලබන ප්‍රසම්පාදනවලට සම්බන්ධිත සැපයුම් කමිටු සහ තාක්ෂණික ඇගයුම් කමිටුවල සාමාජිකයින් යෝග්‍ය පරිදි සුදුසුකම් ලබා ඇත්ද යන්න පිළිබඳව වාර්තා කිරීම; සහ
- රජයේ ආයතන විසින්, පිළිගත් පටිපාටිවලින් සහ මෙහෙයුම් නිර්ණායකවලින් බැහැරව කරන ලද ප්‍රසම්පාදන වාර්තා විමර්ශනය කිරීම සහ එකී ප්‍රසම්පාදන සම්බන්ධයෙන් වගකිවයුතු නිලධරයන් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ බලධාරීන්ට වාර්තා කිරීම, සභාවේ කර්තව්‍ය වන්නේය.

මෙම කාර්ය ඉටුකිරීම සඳහා යම් තැනැත්තෙකු වෙත යවන ලිඛිත දැන්වීමක් මගින් ඔහු/ඇය කොමිෂන් සභාව ඉදිරියට කැඳවා ප්‍රශ්න කිරීමට හා ලේඛන ඉදිරිපත් කරන ලෙස නියෝග කිරීමට කොමිසමට බලය ඇති අතර එකී ලිඛිත දැන්වීමකට අවනත නොවන පුද්ගලයකු වරදක් කරන අතර රුපියල් ලක්ෂයක් දක්වා දඩ හෝ වසර 7ක් දක්වා සිරදඬුවම් ලැබිය හැකිය.

## 8.15. විගණකාධිපති බලතල වැඩි කිරීම

19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ආකාර දෙකකින් විගණකාධිපතිගේ බලතල වැඩි කරන ලදි. එක් ආකාරයක් වන්නේ විගණකාධිපතිට විගණනය කළ හැකි රාජ්‍ය ආයතන ගණන වැඩි කිරීමය. ඒ අනුව එතෙක් පැවති ආයතනවලට අමතරව, ජනාධිපතිවරයාගේ ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්කාර්යාලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන සියලුම කොමිෂන් සභා කාර්යාල, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි ඇති කොටස්වලින් සියයට පනහකට වඩා රජයට අයත් පෞද්ගලික සමාගම්.(19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව) මේ අනුව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනය මගින් මෙතෙක් නොතිබුණ ආයතන 160ක් පමණ විගණකාධිපතිගේ විගණනයට යටත් වූ අතර එමගින්

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාරය කාරක සභාවේ අධීක්ෂණයටද ලක්විය. ඒ අනුව මෙම ප්‍රතිපාදනය මගින් විගණකාධිපතිගේ පමණක් නොව පාර්ලිමේන්තුවේ මුල්‍ය අධීක්ෂණ බලතලද පුළුල් විය.

විගණකාධිපතිගේ බලතල පුළුල් වූ දෙවන අකාරය වූයේ 154 ව්‍යවස්ථාවේ එතෙක් පැවතියේ විගණකාධිපති විසින් අදාළ ආයතනවල ගිණුම් විගණනය කළ යුතු බවයි. නමුත් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් 154 ව්‍යවස්ථාව සංශෝධය කරමින් “ගිණුම්ද ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේය” යනුවෙන් ප්‍රතිපාදන සලසන ලදි. ඒ අනුව විගණකාධිපතිට ගිණුම් පමණක් නොව අනෙකුත් ලේඛන සඳහාද ප්‍රවේශය හිමිවිය.

## 8.16. අල්ලස් කොමිසමේ බලතල වැඩි කිරීම

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවා ඇත්තේ 1994 අංක 19 දරන පාර්ලිමේන්තු පනත මගිනි. නමුත් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට XIXඅ නමින් නව පරිච්ඡේදයක් එක් කරමින් කොමිෂන් සභාව වෙත අතිරේක බලතල හිමිකර දෙන ලදි. ඒ අනුව

- අල්ලස් හෝ දූෂණ චෝදනාවක් සම්බන්ධයෙන් තමාගේම මෙහෙයවීමෙන් හෝ වෙනත් තැනැත්තකු විසින් කරනු ලබන පැමිණිල්ලක් මත යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් පිළිබඳව මූලික පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විමර්ශනයක් කිරීමට විධාන කිරීම සඳහා වූ බලතල සහ අල්ලස් හෝ දූෂණවලට අදාළව, බලපවත්නා නීතිය යටතේ වැරදි සඳහා නඩු පැවරීමට ඇති බලතලද ඇතුළු කොමිෂන් සභාවේ බලතල; සහ
- ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ දූෂණය වැළැක්වීමට අදාළ වෙනත් යම් ජාත්‍යන්තර සම්මුති ක්‍රියාත්මක කිරීම පිණිස ගත යුතු පියවර සඳහා, විධිවිධාන සැලැස්විය යුතුය.

පාර්ලිමේන්තුව විසින් එසේ විධිවිධාන සලස්වන තෙක්, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව පනත යටතේ පත් කරනු ලැබූ කොමිෂන් සභාව විසින් තම මෙහෙයවීමෙන්ම හෝ එය වෙත කරන ලිඛිත පැමිණිල්ලක් මත යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් විභාග කිරීම හෝ විමර්ශනය කිරීම නීත්‍යානුකූල බවට වූ සුළු වෙනස් කිරීමට යටත්ව, එකී පනත අදාළ විය යුත්තේය.” යනුවෙන් ප්‍රතිපාදන ඇතුළත් කරන ලදි (19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156අ ව්‍යවස්ථාව)

## 8.17. මැතිවරණ කොමිසමේ බලතල වැඩි කිරීම

19 වන සංශෝධනය මගින් මැතිවරණ කොමිෂන් සභාව වෙත එතෙක් නොපැවති බලතල දෙකක් ලබාදෙන ලදි. එනම් මැතිවරණ සමය තුළදී රාජ්‍ය දේපළ දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් ප්‍රවර්ධනයට යොදාගැනීම වැළැක්වීම සඳහා අදාළ විධාන නිකුත් කිරීමේ බලතල ලබාදීමයි. මෙම බලතල ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එකී නියෝගවලට අනුකූලව කටයුතු කිරීම සෑම ආයතන ප්‍රධානියකුගේම වගකීමකි.

එසේම මැතිවරණ කාලසීමාව තුළ ජනමාධ්‍ය සඳහා උපමාන නිකුත් කිරීමේ බලතල ලබාදෙන ලදි. මෙම මාධ්‍ය උපමානද ගැසට් පත්‍රයේ පළකළ යුතු අතර උපමානවලට අනුකූලව කටයුතු කිරීම මාධ්‍ය ආයතනවල වගකීමකි.

මෙම උපමාන හෝ විධාන කඩකරන රාජ්‍ය නිලධාරියකුට හෝ රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවසායක නිලධාරියකු වසරක් දක්වා සිරදඬුවම් ලබාදීමේ ප්‍රතිපාදනද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපනය කරන ලදි. එමගින් මැතිවරණ කොමිෂන් සභාව වඩාත් බලවත් ආයතනයක් බවට පත් කිරීම සංශෝධනයේ අරමුණයි.

## 8.18. රාජ්‍ය සේවා කොමිසමේ බලතල වැඩි කිරීම

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලබාදුන් අතිරේක බලතල 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආපසු අමාත්‍ය මණ්ඩලය වෙත ලබාගත් අතර එම බලතල නැවත 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙන ලදි.

ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව රාජ්‍ය සේවයේ පත් කිරීම් උසස් කිරීම් ස්ථාන මාරු කිරීම් හා විනය පාලනය කිරීම පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී තිබූ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරිණි. කෙසේ නමුත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සම්බන්ධ බලතල අමාත්‍ය මණ්ඩලය විසින්ම දරන ලදි.

එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(1) ව්‍යවස්ථාව සංශෝධනය කරමින් රජයේ නිලධරයන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහිලා විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබීය.

එසේම 55(3) ව්‍යවස්ථාව සංශෝධනය කරමින් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහිලා විනය පාලනය කිරීම සහ සේවයෙන් පහකිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා අමාත්‍ය මණ්ඩලය විසින් සිදුකළ යුතු බවටද ප්‍රතිපාදන ඇතුළත් කරන ලදි.

මේ අනුව කොමිසමට රාජ්‍ය සේවකයන් සම්බන්ධව විශාලය බලයක් ලැබුණ අතර එම හේතුවෙන් එතෙක් අමාත්‍ය මණ්ඩලයේ අභිමතය මත සිදුවූ රාජ්‍ය සේවයේ පත්කිරිම්, මාරුකිරීම් සහ විනය පාලනය සහ ඉවත්කිරීම් රාජ්‍ය සේවා කොමිසමට පැවරීම නිසා රාජ්‍ය නිලධාරීන්ට ස්වාධීනව කටයුතු කළහැකි වාතාවරණයක් ස්ථාපනය කරන ලදි.

## 8.19. ජාතික පොලිස් කොමිසමේ බලතල වැඩි කිරීම

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපනය කරන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ ඇතැම් බලතල 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පොලිස් කොමිෂන් සභාවෙන් ඉවත් කරන ලදි. එම ඉවත් කරන ලද බලතල නැවත වරක් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාවට ලබාදෙන ලදි. ඒ අනුව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලබාදුන් බලතල වනුයේ

- පොලිස්පතිවරයා හැර අනෙකුත් පොලිස් නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය හා ඉවත් කිරීම්. මෙහිදී උසස් කිරීම්, මාරු කිරීම්, විනය කටයුතු හා සේවයෙන් ඉවත් කිරීම් පොලිස්පතිවරයා විමසා සිදුකළයුතු බව දක්වයි.
- පොලිස් නිලධාරීන් බඳවාගැනීම, පුහුණු කිරීම, පිළිබඳව පටිපාටි සකස් කිරීම

- පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්ය වැඩි දියුණු කිරීම, ජාතික අංශයේ සහ පළාත් අංශවල භාවිතය සඳහා අවශ්‍ය අවි ආයුධ, වෙඩිද්‍රව්‍ය සහ වෙනත් උපකරණවල ස්වභාවය සහ වර්ගය, චර්යා සංග්‍රහ සහ උසස් කිරීමේදී සහ ස්ථාන මාරු කිරීමේදී අනුගමනය කළයුතු ප්‍රමිතිය තීරණය කිරීම
- පොලිස් නිලධරයන් සඳහා සුදුසු යැයි හෝ අවශ්‍ය යැයි කොමිෂන් සභාව සලකනු ලබන විවිධාන සැලැස්වීම. කොමිෂන් සභාවේ මෙම බලතල අතරින් පොලිස් නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය හා ඉවත් කිරීම් බලතල පොලිස්පතිවරයාට හෝ පොලිස්පතිවරායා විමසා වෙනත් නිලධාරියකුට පැවරිය හැකිය.

මෙවැනි බලය පැවරූ නිලධාරියකුගේ තීරණයකින් අතෘප්තිමත් වන පොලිස් නිලධාරියකුට පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචයක් සිදු කළහැකි බව 155ඒ ව්‍යවස්ථාවේ දක්වයි. පොලිස් කොමිෂන් සභාවේ තීරණයකට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය සභාව වෙත අභියාචනා කළ හැකිය. (19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ ව්‍යවස්ථාව)

## 8.20. හදිසි පනත් පිළිබඳ ප්‍රතිපාදන අහෝසි කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැවති සුවිශේෂ ව්‍යවස්ථා ප්‍රතිපාදනයක් වූයේ හදිසි පනත් ගෙන ඒමට කැබිනට් මණ්ඩලයට තිබූ බලයයි. හදිසි පනත් පිළිබඳව ප්‍රතිපාදන ඇතුළත්ව තිබුණේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාව තුළය. ඒ අනුව අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව ජාතියේ හිත පිණිස වහා අවශ්‍ය බවට අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ අත්සන සහිත පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් අනුගමනය කළ යුත්තේ මෙම විශේෂ ප්‍රතිපාදනය වේ . ඒ අනුව එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට දින 7කට පෙර ගැසට් පත්‍රයේ පළකිරීම අවශ්‍ය නොවන අතර ජනාධිපති විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව තීරණය ලබාදීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරනු ලැබේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ජනාධිපති සහ කථානායක වෙත යොමු කිරීමෙන් පසුව පාර්ලිමේන්තුවේ විවාද කර අනුමත කළ හැකිය (ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්දේශවලට යටත්ව). 19 වන ආණ්ඩක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලදි.

## 8.21. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර පනත් කෙටුම්පත් ප්‍රසිද්ධ කිරීමේ කාලය වැඩි කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77(1) ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන සෑම පනත් කෙටුම්පතක්ම එසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවම වශයෙන් දින 7කටවත් පෙර ජනතාවගේ දැනගැනීම පිණිස ගැසට් පත්‍රයේ පළකළ යුතු බවයි. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම ප්‍රතිපාදන සංශෝධනය කරමින් ප්‍රතිපාදන ඇතුළත් කළේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවම වශයෙන් දින 14කටවත් පෙර ගැසට් පත්‍රයේ පළකළ යුතු බවයි (19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78(1) ව්‍යවස්ථාව). මේ අනුව ආණ්ඩුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට මැදිහත් වීමට වැඩිපුර අවස්ථාවක් පුරවැසියන්ට හිමි වේ.

මේ අනුව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකරන ලද සංශෝධන මගින් 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන නැවත හඳුන්වාදීම. 18 වන සංශෝධනයේ ප්‍රතිපාදන අහෝසි කිරීම මෙන්ම මෙතෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ආගන්තුක වූ ප්‍රතිපාදන කිහිපයක්ද හඳුන්වා දී ඇති බව පැහැදිලිය. සමස්තයක් ලෙස මෙම ප්‍රතිපාදන මගින් ජනාධිපතිගේ බලතල අඩු වූ අතර එම බලතල අගමැති පාර්ලිමේන්තුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ගොනු වී තිබේ.

# නවවන පරිච්ඡේදය

## 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ක්‍රියාකාරිත්වය

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙරෙහි මූලික ලෙසම බලපෑවේ 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඇතිකරන ලද අධිකාරීවාදී ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනය. ඒ සඳහා විශාල මහජන බලපෑමක්ද වූ බව පසුගිය පරිච්ඡේදවල විස්තර විය. එසේම එය සම්මතවීමේදීද අති බහුතරයකින් (ඡන්ද 215කින් ) සම්මත විය. එසේ සම්මත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නීතිමය ප්‍රතිපාදන ප්‍රායෝගිකව භාවිතා වූයේ කෙසේද යන්න මෙම පරිච්ඡේදයෙන් විස්තර කරනු ලබයි.

### 9.1. පාර්ලිමේන්තු මැතිවරණය සහ ජාතික ආණ්ඩුව පිහිටුවීම

2015 ජුනි 26 දින ජනාධිපති විසින් අංක 1920/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද අතර පාර්ලිමේන්තු මැතිවරණය අගෝස්තු 17 දිනට නියම කරන ලදි. ඒ අනුව පැවැත්වූ මැතිවරණයෙන් එක්සත් ජාතික පෙරමුණට ආසන 106ක්ද පොදුජන එක්සත් පෙරමුණට ආසන 95ක්ද ඉලංගෙයි තමිල් අරසු කච්චි සඳහා 16ක්ද, ජනතා විමුක්ති පෙරමුණට ආසන 6ක්ද, ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණට සහ මුස්ලිම් කොංග්‍රසයට එක් ආසනය බැගින්ද ලැබිණි. (https://elections.gov.lk/web/wp-content/uploads/election-results/parliamentary-elections/PE_2015_All_Island_Results.pdf - 2020/11/29)

ඒ අනුව එක්සත් ජාතික පක්ෂයට ආණ්ඩුවක් පිහිටුවීම සඳහා ආසන 7 ක අඩුවක් තිබිණි.

ඒ අනුව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(4) සහ 46(6) ව්‍යවස්ථා අනුව යමින් ජාතික ආණ්ඩුවක් පිහිටුවීම සඳහා වූ පාර්ලිමේන්තු යෝජනාව අගමැති රනිල් වික්‍රමසිංහ විසින් 2015 සැප්තැම්බර් 03 දින පාර්ලිමේන්තුවට ගෙන ආ අතර එය සම්මත විය. එයින් ප්‍රකාශ වූයේ එක්සත් ජාතික පෙරමුණ සහ පොදුජන එක්සත් පෙරමුණ එක්ව ආණ්ඩුවක් පිහිටුවන බවත් ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(4) ව්‍යවස්ථාව අනුව යමින් කැබිනට් අමාත්‍යධුර සංඛ්‍යාව 45 දක්වාද කැබිනට් නොවන අමාත්‍යධුර සංඛ්‍යව 48 දක්වාද ඉහළ දමන බවත්ය. මේ නිසා සිදුවූ තවත් එක් වැදගත් සිසුවීමක් වූයේ එක්සත් ජාතික පක්ෂයට පසුව වැඩිම ආසන ප්‍රමාණයක් ලබාගත් පොදුජන එක්සත් පෙරමුණට විපක්ෂනායක්වය නොලැබීමයි. එය ආසන 16ක් ලබාගත් අකිල ඉලංගෙයි තමිල් අරසු කච්චු පක්ෂයට හිමිවිය. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරය ආසන 6ක් ලබාගත් ජනතා විමුක්ති පෙරමුණට හිමිවිය. නමුත් පොදුජන එක්සත් පෙරමුණේ මන්ත්‍රීවරුන් 56 දෙනෙක් ආණ්ඩුවට සහය නොදක්වමින් ඒකාබද්ධ විපක්ෂය ලෙස කටයුතු කරන්නට විය.

2015 සැප්තැම්බර් 03 වන දින ආරම්භ වූ ජාතික ආණ්ඩුව 2018 ඔක්තෝබර් 26 වන දින ජනාධිපතිවරයා විසින් රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා ඉවත් කිරීම දක්වාම පැවතිණ.

## 9.2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවීම

### 9.1.1 ප්‍රථම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

19 වන සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද සංශෝධනයන් අතරින් වඩාත්ම වැදගත් සංශෝධනය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පළමු රැස්වීම 2015 ජූලි මස 03 වන දින පවත්වා ඇත.( 1වන පිටුව-First Report of the Constitutional Council from July 2015 to November 2015) නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන සාමාජිකයන් තිදෙනා සඳහා 2015 සැප්තැම්බර් 22 වන දින පාර්ලිමේන්තුවේ පූර්ණ අනුමැතිය ලැබිණි (39 පිටුව හැන්සාර්ඩ් වාර්තාව-2015 සැප්තැම්බර් 22) ඒ අනුව පළමු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් වූයේ

- කරු ජයසූරිය (සභාපති) - කථානායක
- රනිල් වික්‍රමසිංහ-අගමැති
- ආර්. සම්පන්දන්-විපක්ෂනායක
- පාඨලි චම්පික රණවක-ජනාධිපතිගේ නියෝජිත
- ආචාර්ය විජේදාස රාජපක්ෂ - අගමැති සහ විරුද්ධපක්ෂ නාම යෝජනා

- විජිත හේරත් - අගමැති සහ විරුද්ධපක්ෂ නායක නියෝජනය නොකරන පක්ෂයේ නියෝජනය
- ඩබ්ලිව්.ඩී.ජේ.සෙනවිරත්න - අගමැති සහ විරුද්ධ පක්ෂ නාම යෝජනා
- ආචාර්ය ඒ. ටී. ආරියරත්න - අගමැති සහ විරුද්ධ පක්ෂ නාම යෝජනා
- ජනාධිපති නීතිඥ සිබ්ලි අසීස් - අගමැති සහ විරුද්ධ පක්ෂ නාම යෝජනා
- ආචාර්ය රාධිකා කුමාරස්සාමි - අගමැති සහ විරුද්ධ පක්ෂ නාම යෝජනා

සැප්තැම්බර් 10 වනදින පැවති ව්‍යවස්ථා සභාවේදී රාජ්‍ය සේවා කොමිෂන් සභා සඳහා සාමාජිකයන් නිර්දේශ කිරීම සඳහා විවෘතව නාමයෝජනා කැඳවීමට තීරණය කරන ලදි. ඒ අනුව 2015 සැප්තැම්බර් 30 වනදා වන විට නාම යෝජනා 482ක් ලැබී තිබිණි. එකී නාම යෝනා

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින්ගෙන් -191
- දේශපාලන පක්‍ෂ නායකයන්ගෙන් -09
- විද්වත් වෘත්තිකයන්ගේ සංවිධානයෙන් -160
- විශ්වවිද්‍යාල ආචාරවරුන්ගේ සම්මේලනයෙන් -09
- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කාන්තා සම්මේලනයෙන් -05
- වෙනත් සංවිධාන සහ පුද්ගලයන්ගෙන්-108 ක් ලෙස ලැබී

තිබුණි.

( 4 වන පිටුව - First Report of the Constitutional Council from July 2015 to November 2015 - https://www.parliament.lk/files/cc/reports /constitutional-council-reports-jul-2015-sep-2016.pdf -2020/11/14 )

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් තීරණය කරන ලද නිර්ණායක භාවිත කරමින් 2015 නොවැම්බර් මාසය වන විට ස්වාධීන කොමිෂන් සභා 9ක් සඳහා සාමාජිකයන් ජනාධිපති වෙත නිර්දේශ කරන ලදි.

එයට අමතරව ජනාධිපති විසින් නිර්දේශ කරන ලද පාර්ලිමේන්තු මහ ලේකම් අභියාචනාධිකරණ විනිසුරුවරුන් 2 ක් සඳහා සහ විගණකාධිපති සඳහා සභාව විසින් අනුමැතිය ලබාදී තිබිණි.

පත්කළ සාමාජිකයන්ගේ නිල කාලය 2018 වසරේදී නිමාවට පත් වූ අතර ඒ අනුව සිවිල් නියෝජිතයන් ලෙස නීතිඥ ජාවිඩ් යුසුෆ්, එන් සෙල්වකුමරන් සහ ආචාර්ය ජයන්ත ධනපාල යන අයව ජනාධිපතිවරයා විසින් 2018 වසරේදී පත් කරන ලදි.

### 9.1.2. දින 52 ආණ්ඩුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

2018 ඔක්තෝබර් 26 වන දින මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා විසින් රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා ඉවත් කර (2018-10-26 දින අංක 2101/39 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය) මහින්ද රාජපක්ෂ අගමැති ලෙස පත් කරන ලදි. එසේම 2018 නොවැම්බර් 07 දින අංක 2096/25 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් නව කැබිනට් මණ්ඩලයක්ද පත් කරන ලදි. ඒ අනුව නව ආණ්ඩුවක් පිහිටුවන ලදි. පසුව 2010 නොවැම්බර් 09 දින අංක 2096/70 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවාහරින ලද අතර ඒ සම්බන්ධව වූ මූලික අයිතිවාසිකම් නඩුවේ තීරණය ලබාදෙමින් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරන ලදීදේ එකී ගැසට් පත්‍රය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන බවයි. පසුව 2018 දෙසැම්බර් 15 දින මහින්ද රාජපක්ෂ අගමැතිවරයා සිය ඉල්ලා අස්වීම භාරදෙන ලදි. මෙම දින 52 ක කාලය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය වෙනස් විය. ඒ නමුත් එම කාලය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සඳහා නව සාමාජිකයින් පත් කළේ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රැස්වූයේ නැත.

### 9.1.3. දින 52 ආණ්ඩුවෙන් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

දින 52 ආණ්ඩුව සමාප්ත වීමෙන් පසුව නැවත රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා බවට පත්වූ අතර නව කැබිනට් මණ්ඩලයක් පත් කරන ලදි. එසේම ජාතික ආණ්ඩුව අවසන් වූ බැවින් විපක්ෂ නායක ලෙස මහින්ද රාජපක්ෂ පත්විය. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය නැවත සංශෝධනය විය. ඒ අනුව 2018 දෙසැම්බර් මාසයෙන් පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සඳහා මහින්ද රාජපක්ෂ විපක්ෂනායකවරයාද සාමාජිකයකු ලෙස පත්විය.

### 9.1.4. 2019 ජනාධිපතිවරණයෙන් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

2019 නොවැම්බර් මස පැවති ජනාධිපතිවරණයෙන් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ජයග්‍රහණය කිරීමත් සමගම එතෙක් අගමැතිවරයා ලෙස කටයුතු කල රනිල් වික්‍රමසිංහ සහ කැබිනට් මණ්ඩලය ඉල්ලා අස්වූ අතර විපක්ෂනායක ලෙස කටයුතු කල මහින්ද රාජපක්ෂ අගමැතිවරයා ලෙස දිවුරුම් දුන්නේය.ඉන්පසු විපක්ෂනායක ලෙස සජිත් ප්‍රේමදාස පත්විය. මෙම සිදුවීම් නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය නැවත වරක් සංශෝධනය විය. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයකු ලෙස සජිත් ප්‍රේමදාස විපක්ෂනායකවරයාද පත් විය, ඒ අනුව පාර්ලිමේන්තු සභාව පහත පරිදි විය.

- කරු ජයසූරිය (සභාපති) - කථානායක
- මහින්ද රාජපක්ෂ - අගමැති

- සජිත් ප්‍රේමදාස(විපක්ෂ නායක)
- මහින්ද සමරසිංහ (ජනාධිපති නියෝජිත)
- බිමල් රත්නායක (අගමැති සහ විපක්ෂ නායක නියෝජනය නොකරන පක්ෂවල නියෝජනය)
- තලතා අතුකෝරළ (අගමැති සහ විපක්ෂනායක නාම යෝජනා)
- ආර් සම්බන්ධන් (අගමැති සහ විපක්ෂනායක නාම යෝජනා)
- නීතිඥ ජාවිඩ් යූසුෆ්,(අගමැති සහ විපක්ෂනායක නාම යෝජනා-මන්ත්‍රීවරුන් නොවන)
- එන් සෙල්වකුමරන් (අගමැති සහ විපක්ෂනායක නාම යෝජනා-මන්ත්‍රීවරුන් නොවන )
- ආචාර්ය ජයන්ත ධනපාල (අගමැති සහ විපක්ෂනායක නාම යෝජනා - මන්ත්‍රීවරුන් නොවන)

මේ අතරින් ජාවිඩ් යූයුෆ්. එන් සෙල්වකුමාරන් සහ ජයන්ත ධනපාල යන සාමාජිකයන් 2018 ඔක්තෝබර් මාසයේදී වසර තුනක කාලයක් සඳහා පත්කළ සාමාජිකයන් වන අතර ආචාර්ය ජයන්ත ධනපාල 2020 මැයි මාසයේදී සෞඛ්‍යමය හේතු මත ඉල්ලා අස්විය.

### 9.1.5. 2020 පාර්ලිමේන්තු මැතිවරණ පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

2020 අගොස්තු මැතිවරණයෙන් පත් වූ පාර්ලිමේන්තුවේ කථානායකවරයා වූයේ මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීවරයායාය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඔහු ආණ්ඩු ක්‍රමව්‍යවස්ථා සභාවේ සභාපති විය.
නමුත් ඔහු යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රැස්කර තිබුණේ නැත.

## 9.3. කොමිෂන් සභා සඳහා පත් කිරීම්

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත වන අවස්ථාව වන විට

- රාජ්‍ය සේවා කොමිෂන් සභාව
- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
- ජාතික පොලිස් කොමිෂන් සභාව
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යන

කොමිෂන් සභාවල කොමසාරිස්වරුන්ගේ නිල කාලය අවසන් වී එම කොමිෂන් සභා අකර්මණ්‍ය වී තිබුණි. මැතිවරණ කොමිෂන් සභාව කිසිදිනෙක පත් නොකර තිබිණි.

2015 සැප්තැම්බර් 21 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ජාතික

පොලිස් කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා සාමාජිකයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපති විසින් පත් කරන ලදි (http://www.adaderana.lk/news/32777/sri-lanka-appoints-new-human -rights-commission -2020-11-14)

2015 නොවැම්බර් 13 වන දින මැතිවරණ කොමිෂන් සභාව සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපති විසින් සාමාජිකයන් පත් කරන ලදි. 2001 වසරේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපනය කරන ලද මැතිවරණ කොමිෂන් සභාව ප්‍රායෝගික තත්ත්වයට පත්වූයේ 2015 වසරේදීය. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාවට පත් වූ පළමු කොමසාරිස්වරුන් වූයේ

- මහින්ද දේශප්‍රිය - සභාපති
- ජනාධිපති නීතිඥ නලින් අබේසේකර - සාමාජික
- මහාචාර්ය - රත්නජීවන් එස් හූල් - සාමාජික

කොමිෂන් සභාව 2015 නොවැම්බර් 17 වන දින නිල වශයෙන් සිය රාජකාරී ආරම්භ කළේය,
( වටගෙදර, 2016:197)

## 9.4. නව කොමිෂන් සභා ස්ථාපනය

### 9.3.1. විගණන සේවා කොමිෂන් සභාව

2015 දෙසැම්බර් 11 වන දින පළමු විගනන සේවා කොමිෂන් සභාව සඳහා කොමසාරිස්වරු පත් කරන ලදි. එහි පළමු සාමාජිකයින් වූයේ

- එච්.එම්.ගාමිණී විජේසිංහ-විගණකාධිපති (සභාපති)
- විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ
- අයි.ගාමිණී අබේරත්න
- වී.කන්දසාමි
- ඩබ්ලිව්.ඒ.එස්.පෙරේරා

(http://www.asc.gov.lk/index.php/en/about-us/history.html 2020/11/14) ජාතික විගණන සේවා කොමිෂන් සභාවට කොමසාරිස්වරුන් පත් කරමින් එය ස්ථාපනය කළද ජාතික විගණන සේවය ආරම්භ කිරීම සහ විගණන පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කළයුතු බවට නීතිපති විසින් විගණන කොමිෂන් සභාවට උපදෙස් දී තිබිණි (2017 විගණන කොමිසමේ වාර්ෂික වාර්තාව) ඒ අනුව ජාතික විගණන සේවය ආරම්භ කිරීමට අවස්ථාව ලැබෙන්නේ 2018 අංක 19 දරන විගණන පනත සඳහා කථානායකගේ සහතිකය සටහන් කළ 2018 ජූලි 17 වනදායින් පසුවය.

### 9.3.2. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් හඳුන්වා දුන් ප්‍රසම්පාදන කොමිෂන් සභාව සඳහා කොමසාරිස්වරුන් පත්කිරීම සිදුකරන ලද්දේ 2015 නොවැම්බර් මාසයේදීය. පළමු කොමසාරිස් මඬුල්ල වූයේ

- ඉංජිනේරු බී.එන්.අයි.එෆ්.ඒ. වික්‍රමසූරිය
- මහාචාර්ය චිත්‍රා වෙඩික්කාර
- ක්‍රිස්ටි පෙරේරා
- එම්. වාමදේවන්
- ලීලසේන ලියනගම යන මහත්ම මහත්මීන්ය

(https://www.nprocom.gov.lk/web/index.php?option=com_content&view=article&id=15&Itemid=136&lang=si 2020/11/14)

කොමිසම විසින් මේ වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ඇ ව්‍යවස්ථාවට අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කර ඇත ( 2018-05-09 දින අංක 2070/15දරන අති විශෙෂ ගැසට් පත්‍රය හා 2019010-12 දින අංක 2144/68 අති විශෙෂ ගැසට් පත්‍රය) එසේම ප්‍රසම්පාදන චක්‍රලේඛ නිකුත් කර තිබේ.

## 9.5. තොරතුරු අයිතිවාසිකම් පනත සම්මත කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය සංශෝධනය කරමින් තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස ඇතුළත් කරන ලදි. එහි 14අ ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ **"පුරවැසියකුගේ අයිතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වූ යම් තොරතුරක් වෙත නීතියෙන් සලසා ඇති පරිදි ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ඇත්තේ ය"** යනුවෙනි. ඒ අනුව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපනය කරන ලද තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ අයිතිවාසිකම භුක්ති විඳීමට නම් ඒ සඳහා නීතියක් සකස් කළ යුතුය. එම ව්‍යවස්ථාමය ප්‍රතිපාදනය සම්පූර්ණ කිරීම සඳහා 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත 2016 ජූනි මාසයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදි. මෙම පනත ඡන්ද විමසීමකින් තොරව සියලුම මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත සම්මත කිරීම විශේෂත්වයකි.

## 9.6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට අතිරේක බලතල පැවරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නැවත ස්ථාපනය කළ පසුව පාර්ලිමේන්තු පනත් කිහිපයක් මගින් අතිරේක බලතල පවරන ලදි. එනම්

## 9.5.1. තොරතුරු අයිතිවාසිකම් පනත

2016 අංක 12 දරන තොරතුරු අයිතිවාසිකම් පනත යටතේ ස්ථාපනය කර ඇති තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිෂන් සභාවට කොමසාරිස්වරුන් ජනාධිපති වෙත නිර්දේශ කිරීමේ වගකීම පවරන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙතය. පනතේ 12 වන වගන්තිය අනුව

- නීතිඥවරයන් සහ නීති ක්ෂේත්‍රයේ විද්වත් ප්‍රජාව විමසා නීතිඥ වෘත්තියේ ප්‍රවීණත්වයක් ඇති නීතිඥවරයෙක් හෝ නීති විශාරදයෙක් නම් කළ යුතු ශ්‍රී ලංකා නීතිඥ සංගමය;
- ප්‍රකාශකවරුන්ගේ, කර්තෘවරුන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ සංවිධාන; සහ
- වෙනත් සිවිල් සමාජ සංවිධාන. වෙතින් නාමයෝජනා ලබාගෙන

නීතිය, පාලනය, රාජ්‍ය පරිපාලනය, සමාජ සේවා, පුවපත්පත් කලාවේදී, විද්‍යා හා තාක්ෂණ හෝ කළමනාකරණ යන ක්ෂේත්‍රවල සාධනය කළ දැනීමක්, අත්දැකීම් හා ප්‍රවීණත්වය සහිත පොදු සමාජ ජීවිතයේදී සුවිශේෂී තැනැත්තන් පුද්ගලයන් අතරින් පස්දෙනෙකු කොමසාරිස් ලෙස ජනාධිපති වෙත නිර්දේශ කළ යුතුය.

එසේම පනතේ තොරතුරු පනතේ උපලේඛනයේ දැක්වෙන්නේ ජනාධිපති විසින් තොරතුරු කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කිරිමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විමසා එය සිදුකළ යුතු බවයි.

## 9.5.2. අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ පනත

2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත යටතේ ස්ථාපනය කරන ලද අතුරුදහන්වූ තැනැත්තන්ගේ කාර්යාලය (ඕ.එම්.පී) සඳහා සාමාජිකයින් හත් දෙනෙකු ජනාධිපති වෙත නිර්දේශ කිරීමේ වගකීම පැවරුණේද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙතය. එකී පනතේ 4 වන වගන්තිය අනුව එම සාමාජිකයින් සිද්ධිමය කරුණු සෙවීම හෝ විමර්ශනය සිදු කිරීම, මානව හිමිකම් නීතිය ජාත්‍යන්තර මානුෂීය නීතිය, මානව ප්‍රතිචාර පිළිබඳ පූර්ව පළපුරුද්දක් සහිත හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කර්තව්‍ය ඉටු කිරීමට අදාළ වෙනත් සුදුසුකම් සහිත තැනැත්තන් විය යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සෑහීමකට පත් විය යුතුය. එසේම කාර්යාලයේ සාමාජිකයින් ගණන 5ක් වන අතර ඔවුන් ශ්‍රී ලාංකික සමාජයේ ඇති බහුත්ව ස්වභාවය පිළිබිඹුවන බවට වගබලා ගැනීමේද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ප්‍රයත්න දැරිය යුතුය. මෙම සාමාජිකයන් වසර 3ක නිල කාලයක් සඳහා පත් වේ.

### 9.5.3. හානිපූර්ණත්ව කාර්යාල පනත

2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනත යටතේ පිහිටුවන ලද හානිපූර්ණත්වය කාර්යාලය සඳහා සුදුසු සාමාජිකයින් පස් දෙනෙකු ජනාධිපති වෙත නිර්දේශ කිරීමේ වගකීම පවරා තිබුණේද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙතය. ඒ අනුව සාමාජිකයින් නිර්දේශ කිරීමේදී හානිපූරණය සඳහා වන කාර්යාලයේ සංයුතිය, ලිංගභේදය ඇතුළු ශ්‍රී ලාංකීය සමාජයේ බහුවිධ ස්වභාවය පිළිබිඹු කරන බව සහතික කරන බවට; මෙන්ම එකී සාමාජිකයින් පරිපූර්ණ තැනැත්තන් වන බව සහ හානිපූරණය සඳහා වන කාර්යාලයේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සතු බව සහතික කරන බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සැලකිල්ලක් දැක්විය යුතුබව පනතේ 4 වන වගන්තියේ දක්වයි.

## 9.7. ජනාධිපති ධුරකාලය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ මතය

2015 වසරේ ජනාධිපතිවරණය පවත්වන අවස්ථාව වන විට ජනාධිපතිගේ ධුර කාලය වසර 6කි. එය වසර 5ක් දක්වා අඩුකරන ලද්දේ ඉන් පසුව සම්මත කරන ලද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගිනි. ඒ අනුව 19 වන සංශෝධනයට පෙර ජනාධිපති ලෙස ධුරය ආරම්භ කරන ලද තමන්ගේ ධුරකාලය වසර 5ක් ද 6ක් ද යන්න පිළිබඳව ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 219(1) ව්‍යවස්ථා යටතේ පැවරී ඇති බලතල අනුව 2018 ජනවාරි මාසයේදී ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විමසීමක් සිදුකරන ලදි. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ශ්‍රී ලංකා නීතිඥ සංගමයටද ඒ සඳහා අදහස් දක්වන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා මගින් දැනුම්දී තිබිණි. එයට අමතරව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සභාපති මහාචාර්ය ජී.එල්.පීරිස්, උලපනේ සුමංගල හිමි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම් දුමින්ද දිසානායක, කැෆේ සංවිධානය සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයද මෙම නඩුවට මැදිහත්කරුවන් ලෙස සම්බන්ධ විය.

නීතිපතිවරයාගේ තර්කය වූයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කරන අවස්ථාව වන විට ජනාධිපති ධුරකාලය වසර 6ක් වන බැවින්19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදන අනුව ඔහුගේ ධුරකාලය වසර 5ක් ලෙස සලකනු ලබන්නේ නම් එය ජනතාවගේ පරමාධිපත්‍යය උල්ලංඝනය කිරීමක් බවයි. මැදිහත් පාර්ශ්ව වූ උලපනේ සුමංගල හිමි සහ දුමින්ද දිසානායකගේද තර්කය වූයේ එයයි. මහාචාර්ය ජී.එල්. පීරිස්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, සහ කැෆේ සංවිධානය ඉදිරිපත් කරන ලද තර්කය වූයේ 19 වන සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(1)(ආ) ව්‍යවස්ථාව අනුව එය දැනට ධුරයේ දරන ජනාධිපතිවරයාට සහ

අගමැතිටත් එය අදාළ බැවින් මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිවරයාගේ ධුරකාලය වසර 5කට සීමා වන බවයි, අගවිනිසුරු ප්‍රියශාන්ත් ඩෙප්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඊවා වනසුන්දර, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බී,පී,අලුවිහාරේ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු සිසිර ද ආබෲ සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ. ටී. චිත්‍රසේන යන විනිසුරු මඬුල්ල විසින් මෙම නඩුවිභාගය පවත්වන ලද අතර 2018 ජනවාරි 15 වන දින ජනාධිපතිවරයා වෙත දන්වා ඇත්තේ මෛත්‍රිපාල ජනාධිපතිවරයාගේ ධූරකාලය 2015 ජනවාරි 09 වනදා සිට වසර පහක් දක්වා පමණක් පවතින බවයි. (ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංකය Supreme Court Reference 01/2018)

## 9.8. ජනාධිපතිට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු පැවරීම්

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධනය වූ වැදගත් ප්‍රතිපාදනයක් වූයේ ජනාධිපතිට හිමිව තිබූ අධිකරණ විනිර්මුක්තිය සංශෝධනය වීමයි. ඒ අනුව ජනාධිපතිට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු පැවරීමේ හැකියාවක් පුරවැසියන්ට ලැබිණි. මෙම ප්‍රතිපාදනය පසුගිය කාලයේ පුරවැසියන් විසින් අත්හදා බලා තිබුණි.

### 9.7.1. 2018 නොවැම්බර් මස පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳ නඩුව

2018 නොවැවම්බර් මස 09 දින හා අංක 2096/70 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් පාර්ලිමේන්තුව විසුරුවාහැර පාර්ලිමේන්තු මැතිවරණයක් සඳහා දින නියම කරන ලදි. ජනාධිපතිගේ මෙම ක්‍රියාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැණි බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති මූලික අයිතිවාසිකම් එම ක්‍රියාව මගින් උල්ලංඝනය වී ඇති බවත් ප්‍රකාශ කරමින් පෙත්සම්කරුවන් රැසක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම් 10 ගොනුකරන ලදී ( SCFR 351/2018 සිට SCFR 361/2018 දක්වා) මෙම පෙත්සම්කරුවන් අතර විසුරුවාහරින ලද පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රිවරුන්, දේශපාලන පක්ෂ නායකයන් , සිවිල් සංවිධාන ක්‍රියාකාරීන් මෙන්ම මැතිවරණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරයකු වන රත්නජීවන් හූල්ද විය (SCFR 361/2018 ). මෙම නඩුව විභාග කරන ලද්දේ අගවිනිසුරු එච්.එන්.ජේ.පෙරේරා අගවිනිසුරු සහ බුවනෙක අලුවිහාරේ, සිසිර ද ආබෲ, ප්‍රියන්ත ජයවර්ධන, ප්‍රසන්න ජයවර්ධන, විජිත් මලල්ගොඩ, මුර්දු ප්‍රනාන්දු යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගෙන් සමන්විත සත් පුද්ගල විනිශ්චය සභාවක් විසිනි, දීර්ඝ නඩු විභාගයකින් පසුව විනිසුරු මඬුල්ල ඒකමතිකව තීරණය කරන ලද්දේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද පාර්ලිමේන්තුව විසුරුවාහැරීම සඳහා වූ අති විශේෂ ගැසට් පත්‍රය නීතියේ සීමාවලින් ඔබ්බට ගොස් නිකුත් කර ඇති බවත්

එමගින් පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්ය. එබැවින් එම නිවේදනය සහ එහි නීතියේ බලපෑම අවලංගු කළ යුතු බවත්ය. ශ්‍රී ලංකා ඉතිහාසයේ බලයේ සිටින ජනාධිපතිවරයකුට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩුවක් පවරා ජනාධිපතිවරයාගේ ක්‍රියාවකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් ලබාගත් පළමු අවස්ථාව මෙය විය.

මෙම නඩුවේ ප්‍රතිඵලයක් ලෙස පාර්ලිමේන්තුව නැවත කැඳවීමට සිදුවූ අතර දින 52ක් අගමැති ධුරය දැරූ මහින්ද රාජපක්ෂ මෙම නඩු තීන්දුවෙන් පසුව අගමැති ධුරයෙන් ඉල්ලා අස්විය( 2018 දෙසැම්බර් මස 16 දින අංක 2101/39 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

### 9.7.2. එම්.සී.සී ගිවිසුම අත්සන් කිරීමෙන් වැළැක්වීමේ පෙත්සම

ඇමරිකා එක්සත් ජනපදය සමග එම්.සී.සී ගිවිසුම අත්සන් කිරිමට කැබිනට් අනුමැති ලැබීමෙන් පසුව නීතිඥ දර්ශන වෙරදුවගේ විසින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, අගමැති රනිල් වික්‍රමසිංහ, විදේශ අමාත්‍ය තිලක් මාරපන, මුදල් අමාත්‍ය මංගල සමරවීර සහ නීතිපතිවරයාව වගඋත්තරකරුවන් කරමින් මූලික අයිතිවාසිකම් නඩුවක් පවරනු ලැබීය.
(http://www.themorning.lk/fr-petition-filed-against-the-signing-of-mcc-deal/)

### 9.7.3. 2019 අප්‍රේල් 21 පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට අපොහොසත් වීම පිළිබඳ පෙත්සම්

2019 අප්‍රේල් 21 දින සිදුවූ බෝම්බ ප්‍රහාරය වළක්වා ගැනීමට අපොහොසත්වීම පිළිබඳව මූලික අයිතිවාසිකම් පෙත්සම් 12ක් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමුවී තිබූ අතර එහිදීද ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වගඋත්තරකරු ලෙස නම් කර තිබිණි. එම පෙත්සම් 2020 වසරේදී විභාගයට ගත් අවස්ථාවේදී නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දන්වා සිටියේ තමන් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වෙනුවෙන් මින් ඉදිරියට පෙනී නොසිටින බවයි.
(http://www.colombopage.com/archive_20A/May13_1589349233CH.php 2020/12/12 )

### 9.7.4. රෝයල් පාර්ක් ඝාතනයේ විත්තිකරුට ජනාධිපති සමාව දීමට එරෙහි මූලික අයිතිවාසිකම් පෙත්සම

මරණීය දණ්ඩනය ලැබූ රෝයල් පාර්ක් ඝාතන සිදුවීමේ විත්තිකරුට ජනාධිපති සමාව දීමට එරෙහිව මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනුකර තිබේ. කාන්තා මාධ්‍ය සාමූහිකය විසින් මෙම පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකර තිබේ. මෙම පෙත්සම විභාගයට ගැනීමට තීරණය කළ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජනාධිපති සමාව ලැබූ චූදිතට එරෙහිව විදේශ ගමන් තහනමක්ද පනවන ලදි.
( https://archive.ceylontoday.lk/print-more/47079 2020/12/12 )

### 9.7.5. දෙමළ බසින් ජාතික ගීතය ගායනා කිරීම පිළිබඳව මූලික අයිතිවාසිකම් පෙත්සම

2016 පෙබරවාරි 04 වන දින ජාතික නිදහස් උත්සවයේදී දෙමළ භාෂාවෙන්ද ජාතික ගීය ගායනා කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) වන ව්‍යවස්ථාවෙන් සහතික කරදී ඇති මූලික අයිතිවාසිකම කඩවී ඇති බවට චෝදනා කරමින් පුරවැසියන් දෙදෙනෙකු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා සහ නීතිපතිවරයා වගඋත්තරකරුවන් කරමින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදි. ( SC FR 67/2016) මෙම පෙත්සම සලකා බැලූ ශ්‍රේෂ්ඨාධිකරණය එය 2016 නොවැම්බර් 18 වන දින නිශ්ප්‍රභ කරන ලදි
(https://www.cpalanka.org/sanjeewa-sudath-perera-and-two-others-vs-h-e-maithreepala-sirisena-sc-fr-67-2016-fundamental-rights-application-challenging-the-tamil-version-of-the-national-anthem/ 2020/12/12)

චන්ද්‍රිකා බණ්ඩාරණායක කුමාරතුංග ජනාධිපතිවරියට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙකක් ගොනු වී ඇයට එරෙහිව තීන්දු ලැබුණ නමුත් එම පෙත්සම් දෙකම පවරා තිබුනේ ඇයගේ නිල කාලයයෙන් පසුවය. ( බලන්න - Senarath and others v Chandrika Bandaranayake Kumaratunga and others (SC FR 503/2005) සහ Sugathapala Mendis and Another v Chandrika Kumaratunga and Others SC ( Waters Edge Case)( SC FR 352/07) නමුත් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව බලයේ සිටින ජනාධිපතිවරයාට එරෙහිවද මූලික අයිතිවාසිකම් නඩු පැවරීමේ පැහැදිලි නීතිමය ප්‍රතිපාදන ඇතුළත් වීම මගින් ජනාධිපතිධුරයට පුරවැසියන් සම්බන්ධ වගවීම වර්ධනය වී තිබේ.

## 9.9. සම්මත නොකළ 20 වන සංශෝධනය

2015 අප්‍රේල් මාසයේදී 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව ඡන්දය ලබාදුන් බොහෝ පොදුජන එක්සත් පෙරමුණු මන්ත්‍රීවරුන් එම ඡන්දය භාවිතා කරන ලද්දේ මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන 20 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් නුදුරේදීම ගෙන එන බවට වූ එක්සත් ජාතික පක්ෂ පොරොන්දුව මත බව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ දෙදින විවාදය දෙස බැලීමේදී පැහැදිලිවේ.

කෙසේ නමුත් 2015 අප්‍රේල් 22 වන දින (19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමට පෙර සතියේ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී නව මැතිවරණ ක්‍රමයක් සඳහා වන කෙටුම්පතක් පිළිබඳව සාකච්ඡා කර ඇති අතර 2015 අප්‍රේල් 29 වන දින ජනාධිපති විසින් නව මැතිවරණ ක්‍රමයක් සඳහා වන කෙටුම්පතක් අමාත්‍ය මණ්ඩලයේ අවධානයට ඉදිරිපත් කරන ලද අතර තවදුරටත් ඒ සම්බන්ධව සිය අදහස් මීළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරුන්ගෙන් ඉල්ලා සිටින ලදි (http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=si&dID=6066 – 20202/11/15) පසුව 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත අග්‍රාමාත්‍යවරයාගේ නියමය පරිදී 2015 ජුනි මස 12 වන දින ගැසට් පත්‍රයේ අතිරේකයක් ලෙස පළකරන ලදී.

යෝජනා කරන ලද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පාර්ලිමේන්තුවේ සමස්ත මන්ත්‍රී සංඛ්‍යාව 237ක් වන අතර එයින් 160 ක් මැතිවරණ කොට්ඨාශ මට්ටමින් තෝරාගන්නා අතර 40 දෙනෙකු සමානුපාතික නියෝජන ක්‍රමයට තෝරාගනු ලබයි. ඉතිරි 37 දෙනා ජාතික ලැයිස්තු තුළින් තෝරාගනු ලබයි. එසේම සෑම නාමයෝජනා ලැයිස්තුවකම කාන්තා අපේක්ෂිකාවන් 10 %ක් සිටිය යුතු බවටද ප්‍රතිපාදන ඇතුළත් විය.

එවකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැවති ප්‍රතිපාදන අනුව ජුනි 19 වන දිනෙන් පසුව (දින 7කට පසුව) එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබුණි. නමුත් එය එසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකළ අතර 2015 ජුනි 26 දින මධ්‍යම රාත්‍රියේදී පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද අතර ඉන් පසුව මෙම කෙටුම්පත පිළිබඳව සාකච්ඡාවක් සිදු නොවීය. 2015 අගෝස්තු මැතිවරණයෙන් පසුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳව පාර්ලිමේන්තුව තුළ යෝජනාවක් සම්මත කරගෙන ඒ සඳහා සමස්ත පාර්ලිමේන්තුවම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් ලෙස කටයුතු කරන ලදි. නව ව්‍යවස්ථාව සම්බන්ධ කටයුතුද අසාර්ථක විය.

## 9.10. 19 වන සංශෝධනයට එරෙහි චෝදනා

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ 215 ක් වැනි ඉහළ බහුතරයකින් සම්මත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකි. ඒ යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්ථාපනය කර කොමිෂන් සභා සඳහා සාමාජිකයන් පත් කර ක්‍රියාත්මක වන විට 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් විපක්ෂය චෝදනා කරන්නට විය. විශේෂයෙන්ම 2018 ඔක්තෝබර් මාසයේ සිදුවූ පාර්ලිමේන්තුවේ දින 52ක බල වෙනසත් සමග මෙම චෝදනා වඩාත් තීව්‍ර විය. 19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහයෝගය දක්වූ පුද්ගලයන්ද විශේෂයෙන්ම 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙන ඒමේ විවාදයේදී ජනාධිපති මෛත්‍රීපාල සිරසේන ජනාධිපතිවරයා විසින් විවාදය ආරම්භ කරමින් සිදුකළ යෝජනාව සම්මත කළ එවකට අධිකරණ අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ මන්ත්‍රීවරයාද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩුපාඩු පිළිබඳව විවේචනය කරන ලදි. එකී විචේන අතර ප්‍රධාන කරුණු පහත පරිදි ගොනුකළ හැකිය. මෙම චෝදනාවලින් සාධාරණ අසාධාරණ බව පිළිබඳව මෙහිදී විග්‍රහයක් සිදු නොකරන අතර 2018 මුල් කාලයේ ආරම්භව 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වූ කාලය දක්වා ජනමාධ්‍ය ඔස්සේ පළ වූ විවේචන විස්තර කිරීමක් පමණක් සිදුවේ.

### 9.9.1. බල කේන්ද්‍ර 3ක් නිර්මාණය වී ඇති බව

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් මූලිකම චෝදනාවක් ලෙස ඉදිරිපත් වූ කරුණක් වූයේ මහජන ඡන්දයෙන් පත් වූ ජනාධිපතිවරයා කටයුතු කිරීමට අවශ බලතල නොමැති බවයි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනාධිපති වෙත ලබාදී තිබූ ඇතැම් බලතල අගමැතිවරයා සහ කථානායක වෙත පැවරීමක් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුවී ඇති නිසා මෙම සංශෝධනය මගින් ජනාධිපති අගමැති සහ කථානායක වශයෙන් බලකේන්ද්‍ර 3ක් නිර්මාණය වී ඇති බව ඉන් කියැවිණ. 19 වන සංශෝධනය සම්බන්ධයෙන් මෙම චෝදනා එල්ලවූයේ 2018 ඔක්තෝබර් මාසයේ 26 වනදා ආරම්භ වූ දින 52 ආණ්ඩුකාලය තුළදී සහ ඉන් පසුවය. අමාත්‍ය මණ්ඩලය සහ අගමැති පත් කිරීම පිළිබඳව ජනාධිපතිට තිබූ අභිමතය සීමා වීම සහ පාර්ලිමේන්තුව විසුරුවාහැරීමට ජනාධිපතිට තිබූ බලතල සීමා වීම මගින් ජනාධිපතිගේ බලතල අගමැතිවරයා ලබාදී ඇති බවට චෝදනා එල්ලවිය. එසේම ස්වාධීන කොමිෂන් සභා සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නිර්දේශ කරනු ලබන පුද්ගයන් දින 14ක් තුළ පත් කිරීමේ අනිවාර්ය වගකීම ජනාධිපතිට පැවරීම සම්බන්ධ ප්‍රතිපාදන නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති වූ කථානායකද විධායක බලය භාවිත කරනට චෝදනා එල්ල විය.

### 9.9.2. රට අස්ථාවර කළ බවට චෝදනා

ඉහත සඳහන් කරන ලද බලකේන්ද්‍ර 3ක් නිර්මාණය වීම නිසා සහ ජනාධිපතිගේ බලතල අඩුවීම නිසා එමගින් රට අස්ථාවර වූ බවට ඇතැම් පාර්ශ්ව විසින් චෝදනා කරන ලදි.

### 9.9.3. පාස්කු ප්‍රහාරයට හේතුව ලෙස 19 වන සංශෝධනය

2019 අප්‍රේල් 21 පාස්කු ඉරිදා දිනයේ සිදුවූ අන්තවාදී ප්‍රහාරය වළක්වාගත නොහැකි වූයේද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකළ අස්ථාවර තත්ත්වය නිසා බවට ඇතැම් අය විසින් චෝදනා කරන ලදි.

### 9.9.4. පොලිස්පති ඉවත් කළ නොහැකි බව

19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවතින අඩුපාඩුවක් ලෙස ඇතැම් පාර්ශ්ව චෝදනා කරන ලද්දේ එමගින් පොලිස්පතිවරයා ඉවත් කිරීමේ ප්‍රතිපාදනය අහෝසි වී ගිය බවයි. විශේෂයෙන්ම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා සහ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ (2019 නොවැම්බර් මාසයේදී තේරී පත් වූ ජනාධිපති) ඝාතන සැලැස්ම සම්බන්ධයෙන් වූ සාකච්ඡාවේදීද පොලිස්පතිවරයා සම්බන්ධයෙන් 2018 මැදභාගයේදී වූ සංවාදවල පොලිස්පති ඉවත් කළයුතු බවද ඇතැම් පාර්ශ්ව ප්‍රකාශ කළ අතර එවකට විපක්ෂය ප්‍රකාශ කරන ලද්දේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන නිසා පොලිස්පති ඉවත් කළ නොහැකි බවයි. නමුත් පොලිස්පති ඉවත් කිරීම පිළිබඳව ප්‍රතිපාදන වෙනසක් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා සිදු නොවූ අතර ඒ ගැන 2002 අංක 05 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටික) පනතේ ඇතුළත්ව පවතියි. නමුත් එම ප්‍රතිපාදන උපයෝගී කරගෙන පොලිස්පති ඉවත් කිරීමට ජනපති හෝ පාර්ලිමේන්තුව ක්‍රියා නොකළ අතර 2019 අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසුව ජනාධිපතිවරයා විසින් පොලිස්පතිව අනිවාර්ය නිවාඩු යවන ලදි.

### 9.9.5. කොමිෂන් සභා ස්වාධීන නැත

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපනය කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් නිර්දේශ කරන ලද කොමිෂන් සභා සාමාජිකයන් ස්වාධීනව කටයුතු නොකරන බවටද චෝදනාවක් එල්ල විය. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් නියෝජනය වූයේ එක්සත් ජාතික පක්ෂය, පොදුජන එක්සත් පෙරමුණ, ජනතා විමුක්ති පෙරමුණ, ඉලන්කෙයි තමිල් අරසු කච්චි යන පක්ෂවලින් වූ අතර ( සිවිල් නියෝජිතයන් තිදෙනා හැර) ඒකාබද්ධ විපක්ෂයේ නියෝජනයක් නොමැති වීම මගින් ඔවුන්ට මෙම කොමසාරිස්වරු පත් කිරීමේදී කිසිදු අවස්ථාවක් නොමැති වීම පිළිබඳව චෝදනා එල්ල විය. ඔවුන්ට චෝදනා කරන ලද්දේ ජවිපෙ සහ ඉලංකෙයි තමිල් අරසු කච්චු පක්ෂයද

ආණ්ඩුපක්ෂයම නියෝජනය කළ බවයි. ඒ නිසා ඔවුන්ගේ ලැදියාවන් මත කොමිෂන් සභාවලට කොමසාරිස්වරුන් නිර්දේශ කළ අතර එකී කොමසාරිස්වරුන් ආණ්ඩුවට පාක්ෂිකව කටයුතු කළ බවට චෝදනා එල්ලවිය.

### 9.9.6. කොමිෂන් සභා අකාර්යක්ෂමය

කොමිෂන් සභා සිය තීරණ ලබාදීමට විශාල කාලයක් ගත කරන බවත් ඒ නිසා කොමිෂන් සභා යටතේ සිදුවූ කාර්යේදී බොහෝ කටයුතුවලට බාධා ඇති වූ බවට චෝදනා කරන ලදි. ඒ නිසා ජනාධිපතිවරයාගේ ක්‍රියාකාරකම්වලට බාධා එල්ල වූ බවටද චෝදනා එල්ලවිය.

### 9.9.7. එන්ජීඕ වැඩක්

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිටුපස සිටියේ රාජ්‍ය නොවන සංවිධාන බවත් එසේම ස්වාධීන කොමිෂන් සභාවල සාමාජිකයන්ද බොහොමයක් රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරීන් වූ බවත් චෝදනා කරන ලදි. (නමුත් එම කාලය තුළ කොමිෂන් සභාවල සාමාජිකයන් ලෙස කටයුතු කළ බොහෝ දෙනෙක් විශ්‍රාමික රාජ්‍ය සේවකයන් විශ්‍රාමික විනිසුරුවරුන්ගෙන් හා වෘත්තිකයන්ගෙන් සමන්විත වූ අතර රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරීන් සිටියේ අතළොස්සක් පමණි.)

### 9.9.8. පොරොන්දු වූ 20 වන සංශෝධනය පාර්ලිමේන්තුවට නොගෙන රැවැට්ටුවා

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පොදුජන එක්සත් පෙරමුණ මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් පක්ෂව ඡන්දය දීමට ප්‍රධාන හේතුවක් වූයේ මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම සඳහා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් නුදුරේදීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවට එක්සත් ජාතික පක්ෂයේ වූ පොරොන්දුව අනුව බවත් එය ඉටු නොකිරීම මගින් එක්සත් ජාතික පක්ෂය වංචාවක් සිදුකළ බවටත් පොදුජන එක්සත් පෙරමුණ මන්ත්‍රීවරු විසින් චෝදනා කරන ලදි.

### 9.9.9. රාජපක්ෂ පවුල අරමුණු කරගෙන සිදුකරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක්

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ වූ විශේෂ ප්‍රතිපාදන වූ ජනාධිපති අපේක්ෂකයකු ලෙස සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ඉදිරිපත් වීමට නුසුදුසකමක් ලෙස විදේශීය පුරවැසිභාවය ඇතුළත් කරන ලද්දේ රාජපක්ෂ පවුලේ සෝඨාභය රාජපක්ෂ සහ බැසිල් රාජපක්ෂ යන දෙදෙනා ඉලක්ක කරගෙන බවත් ජනාධිපති අපේක්ෂකයකුගේ අවම වයස අවුරුදු 30 සිට 35 දක්වා වැඩි කරන ලද්දේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා ඉලක්ක කරගෙන බවත් ඒ අනුව

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපේක්ෂා කළේ රාජපක්ෂ පවුලෙන් පලිගැනීමක් බවත් චෝදනා එල්ල විය. (නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයාද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පක්ෂව ඡන්දය ප්‍රකාශකරන ලදි)

## 9.11. 19 වන සංශෝධනය සම්මත වීමේ සිට 2019 ජනාධිපතිවරණය දක්වා විශේෂ දේශපාලන තත්ත්වය

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ වූ ප්‍රධාන ප්‍රතිපාදන වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කොමිසන් සභාවල ස්වාධීනබව ප්‍රසම්පාදන සහ විගණන සේවා කොමිෂන් සභා ක්‍රියාත්මක වූ 2015 අගභාගයේ සිට 2020 පාර්ලිමේන්තු මැතිවරණය දක්වා කාලය ශ්‍රී ලංකාවේ පැවති දේශපාලන වාතාවරණ ඉතාමත් සුවිශේෂය. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වූ 2015 අප්‍රේල් 28 වනදා වන අතර ජූනි 26 වන දින පැවති පාර්ලිමේන්තුව ජනපතිවරයා විසින් විසුරුවා හරින ලදි. එම නිසා එම පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන තෙක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පත් නොවීය. අගෝස්තු මැතිවරයෙන් පසුව එක්සත් ජාතික පක්ෂය සහ පොදුජන එක්සත් පෙරමුණ එක්ව ජාතික ආණ්ඩුවක් පිහිටුවීය. රජය සමග එක්වීමට අකැමැත්ත ප්‍රකාශ කරන ලද පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කළ මන්ත්‍රීවරුන් 56ක් විසින් වෙනම පෙනී සිටිමින් විපක්ෂ නායකත්වය ඔවුන්ට ලබාදෙන ලෙස කථානායක වෙත ලිඛිත ඉල්ලීමක් සිදුකරන ලදි (පිටු අංක 93-2015 සැප්තැම්බර් 3 දින හැන්සාර්ඩ් වාර්තාව ) නමුත් පොදුජන එක්සත් පෙරමුණ පක්ෂය ජාතික ආණ්ඩුවට එකතු වී ඇති නිසා විපක්ෂනායක තනතුර මන්ත්‍රීධුර 16ක් ලබාගත් අකිල ඉලංකෙයි තමිල් අරසු කච්චු පක්ෂයට හිමිවිය. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරය මන්ත්‍රීධුර 6ක් ලබාගත් ජනතා විමුක්ති පෙරමුණට හිමිවිය. ජනාධිපතිවරණයේදී විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වූ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති වීමෙන් පසුව ඔහු සාමාජිකත්වය දැරූ සහ ඔහුට එරෙහි අපේක්ෂකයා මහින්ද රාජපක්ෂ රාජපක්ෂ මහින්ද රාජපක්ෂ නායකත්වය දැරූ පොදුජන එක්සත් පෙරමුණේ නායකත්වය ගැනීමද සුවිශේෂී සිදුවීමකි.

ජාතික ආණ්ඩුවක් පිහිටවුවද හවුල්කාර පක්ෂයක් වූ පොදුජන එක්සත් පෙරමුණ තුළ බෙදීමක් දක්නට ලැබුණා සේම කැබිනට් මණ්ඩලය තුළද බෙදීමක් දක්නට ලැබිණි. 2018 වසරේදී පවත්වන ලද පළාත් පාලන ඡන්ද විමසීමේදී මෙම පක්ෂ දෙක වෙන වෙනම තරග කරන ලද අතර ඒකාබද්ධ විපක්ෂය විසින් සහයෝගය දක්වන ලද අලුතින්ම පිහිටවූ පක්ෂය වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට විශාල ජයග්‍රහණයක් ලබාගැනීමට හැකියාවක් ලැබිණි. මේ අනුව ජනාධිපතිවරණයේදී ජනාධිපතිවරයා මෙන්ම පාර්ලිමේන්තු මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය

ලබාගත් ජනවරම වෙනස්වී ඇති බවට විවේචනයක් එල්ලවිය.
ආණ්ඩුවට එරෙහිව එකාබද්ධ විපක්ෂය විසින් ගෙනඑන ලද දෝෂාභියෝගයට විපක්ෂනායක සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක නියෝජනය කරන ලද පක්ෂද ආණ්ඩුවට පක්ෂව ඡන්දය ලබාදීමෙන් එම දෝෂාභියෝගය පරාජය කිරීම විශේෂ තත්ත්වයක් විය.

2018 ඔක්තෝබර් 26 දින මෛත්‍රීපාල ජනාධිපතිවරයා විසින් රනිල් වික්‍රමසිංහ අග්‍රාමාතවරයා නෙරපා හැර මහින්ද රාජපක්ෂ අගමැති ලෙස පත් කර නව කැබිනට් මණ්ඩලයක්ද පත් කරන ලදි. පාර්ලිමේන්තුවේදී නව ආණ්ඩුවට එරෙහිව දෝෂාභියෝගයක් මතු වූ අතර ඡන්දය ලබාගැනීමකින් තොරව අවසන් වූයේ විශාල ගැටුමක් මගිනි.

පසුව ජනාධිපති විසින් 2018/11/09 දින පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදි. එකී ක්‍රියාවට එරෙහිව කණ්ඩායම් කිහිපයක් විසින් මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනුකරන ලදි. එහිදී ජනාධිපතිවරයාගේ ගැසට් පත්‍රය අත්හිටුවීමේ අතුරු තහනම් නියෝගයක් ශ්‍රේෂ්ඨාධිකරණය නිකුත් කරන ලදී. එසේම අගමැති හා කැබිනට් මණ්ඩලයේ ක්‍රියා අත්හිටවීමට අභියාචනාධිකරණයෙන් රිට් ආඥාවක්ද ලබාගන්නා ලදි. 2018/11/09 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒකමතික තීන්දුව ප්‍රකාශයට පත් කරමින් එකී ගැසට් නිවේදනය නීතියේ බලාත්මක නැති බව ප්‍රකාශ කරන ලදි. එකී නිවේදනයෙන් පසුව මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යවරයා ඉල්ලා අස්වූ අතර නව අමාත්‍ය මණ්ඩලයක් ජනාධිපතිවරයා විසින් පත් කරන ලදි. පොදුජන එක්සත් පෙරමුණ ජාතික ආණ්ඩුවෙන් ඉවත් වූ අතර ඒ අනුව එක්සත් ජාතික පක්ෂයෙන් පමණක් අමාත්‍ය මණ්ඩලය පත් විය. ඉන්පසුව ජනාධිපතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය අතර පැවතියේ එතරම් හොඳ සබඳතාවක් නොවේ.

2019 අප්‍රේල් 21 වන දින සිදුවූ ප්‍රහාරය නිසා ජනාධිපතිට සහ ආණ්ඩුවට බරපතල චෝදනා ජනතාවගෙන් එල්ලවිය.

2019 නොවැම්බර් 16 දින ජනාධිපතිවරණය පැවැත්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කරන ලද අතර එයින් 52.25 % ක ප්‍රතිශතයක් ලබාගනිමින් ගෝඨාභය රාජපක්ෂ ජයග්‍රහණය කළේය. එකී ජයග්‍රහණයත් සමගම පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් ලබාගෙන සිටි එක්සත් ජාතික පක්ෂයේ අමාත්‍යවරුවන් ඉල්ලා අස්විය. ඉන් පසුව ජනාධිපතිවරයා විසින් මහින්ද රාජපක්ෂ අගමැතිවරයා ලෙස පත්කළ අතර නව අමාත්‍ය මණ්ඩලයක්ද පත් කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව ජනාධිපතිවරයා කිසිදු

අමාත්‍යංශයක් භාර නොගත් අතර ආරක්‍ෂක අමාත්‍යංශය සඳහා කැබිනට් අමත්‍යවරයකුද පත් නොකරන ලදි.

ජනවාරි මාසයේදී කොවිඩ්-19 රෝගියකු වාර්තා වූ අතර, ඒ වන විට පාර්ලිමේන්තුවේ කාලය අවුරුදු හතරහමාරක් පිරෙන දිනය වූ 2020 මාර්තු 02 දින ජනාධිපති විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැර පාර්ලිමේන්තු මැතිවරණ අප්‍රේල් 25 දිනට නියම කරන ලදි. නමුත් කෝවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පාර්ලිමේන්තු මැතිවරණය 2020 අගෝස්තු 05 දින දක්වා ප්‍රමාද විය. 2020 අගෝස්තු පාර්ලිමේන්තු මැතිවරණයෙන් මන්ත්‍රී ආසන 145 ක් ලබාගත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජයග්‍රහණය කරන ලදි.

මේ අනුව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වූයේ දේශපාලන වශයෙන් ස්ථාවර කාලපරිච්ඡේදයක නොවන අතර දේශපාලන බල අරගල සහ මන්ත්‍රීවරුන් විසින් සිය දේශපාලන කඳවුරු සහ ස්ථාවර වෙනස් කළ කාල පරිච්ඡේදයකය.

# දසවන පරිච්ඡේදය

## 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා පෙළගැස්ම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද මූලික වෙනස්කම් අහෝසි කළ යුතු බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට පක්ෂපාතී කණ්ඩායම් සැමවිටම ප්‍රකාශ කරන ලදි. විශේෂයෙන්ම 2018 ඔක්තෝබර් 26 දේශපාලන අර්බුදයෙන් පසුව මෙම තත්ත්වය වඩාත් තීව්‍ර විය. ඒ අනුව තමන්ගේ ආණ්ඩුවක් පිහිටවූ පසුව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කරන බවට ශ්‍රී ලංකා පොදුජන එක්සත් පෙරමුණු පාක්ෂිකයන් විසින් ප්‍රකාශ කරන ලදි. මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කරන්නේ 2019 ජනාධිපතිවරණයේ සිට 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම දක්වා පෙළගැස්වීමයි.

### 10.1. 2019 ජනාධිපතිවරණය

මැතිවරණ කොමසාරිස්ගේ 2019 නොවැම්බර් 18 වන දින අංක 2141/25 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ජනාධිපතිවරණය 2019 නොවැම්බර් 16 වන දිනට දින නියම කරන ලදි. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජනාධිපති අපේක්ෂකයා ලෙස ගෝඨාභය රාජපක්ෂ ඉදිරිපත් විය. ඔහුගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය සෞභාග්‍යයේ දැක්ම ලෙස හඳුන්වන ලදි. එකී ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන සඳහන් වූයේ තරමක් වෙනස් ආකාරයෙනි එහි පළමු කොටසේ දසවැදෑරුම් ප්‍රතිපත්තිවල 4වන ශීර්ෂය වූ ජනතාවට වගකියන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයෙහි සඳහන් වූයේ දේශපාලන පක්ෂවල සහ ඒවායේ නායකයින්ගේ උවමනා එපාකම් සහ පෞද්ගලික අභිලාෂ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව භාවිත කළ යුගය අවසන් කර

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදු කර තිබෙන ව්‍යාකූලත්වය පිටුදකිමින් ජනතාවගේ පරමාධිපත්‍ය බලය ප්‍රමුඛත්වයේ තබා ක්‍රියාත්මක කරන නව ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක් අප නොපමාව ඉදිරිපත් කරන්නෙමි, යනුවෙනි (පිටුව 2 - ගෝඨාභය - රට හදන සෞභාග්‍යයේ දැක්ම)
එසේම එහි දෙවන කොටසේ "දූෂණයෙන් තොර කාර්යක්ෂම පාලනයක් ජාතික සමගියට මග කියන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් " යන ශීර්ෂය යටතේ සඳහන් වූයේ වත්මන් ව්‍යවස්ථාව පිළිබඳ සමාජයේ ඇත්තේ ප්‍රබල විවේචනයකි. එහි අඩුපාඩු දුරු කිරීමට ගෙනා 19වන සංශෝධනයෙන් සිදු වූයේ ප්‍රශ්න නැති කිරීමට ගොස් නැති ප්‍රශ්න ඇති කිරීමකි. එබැවින් ලෝක බලවතුන්ගේ සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල අභිලාෂ වෙනුවට ජනතාවගේ අභිලාෂ මත නව ව්‍යවස්ථාවක් හඳුන්වාදීමට අපි කටයුතු කරන්නෙමු. මහජනතාවගේ මෙන් ම විවිධ දේශපාලන සහ බහුජන සංවිධානවල යෝජනා ලබා ගෙන නවව්‍යවස්ථාව බිහි කිරීම සඳහා පාර්ලිමේන්තුවේ සියලු ම පක්ෂ නියෝජනය කරන තේරීම් කාරක සභාවක් පත් කිරීමට කටයුතු යොදනු ලැබේ" යනුවෙනි (පිටුව 9-ගෝඨාභය - රටහදන සෞභාග්‍යයේ දැක්ම ) මේ අනුව පැහැදිලි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් නොව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන එන බවය. කෙසේ නමුත් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන වෙනස් කරන බව පැහැදිලිව ප්‍රකාශ කරන ලදි.

මෙම මැතිවරණයෙන් ඡන්ද 6924255 ක් සහ 52.25% ක ප්‍රතිශතයක් ලබා ගනිමින් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ලෙස පත්විය. ජනාධිපතිවරයාගේ දිවුරුම් දීමත් සමගම අගමැති සහ කැබිනට් අමාත්‍යවරුන් ඉල්ලා අස්වීම නිසා නව ආණ්ඩුවක් පිහිටු වීමට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට අවස්ථාව ලැබිණි. එකී ආණ්ඩුව ක්‍රියාත්මක වන ලද්දේද 19 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේය. ඒ අනුව ජනාධිපතිවරයාට නිදහසේ වැඩ කිරීමට අවස්ථා පවතින ව්‍යවස්ථාමය ප්‍රතිපාදන අනුව නොහැකි බව ආණ්ඩු පක්ෂය විසින් නිරන්තරයෙන් ප්‍රකාශ කරන ලදි.

## 10.2. 2020 පාර්ලිමේන්තු මැතිවරණය

2020 මාර්තු 02 දින පාර්ලිමේන්තුවට වසර හතර හමාරක් සම්පූර්ණ වනදා ජනාධිපති විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැර පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දින නියම කරන ලදි. එම මැතිවරණයේදීද මැතිවරණ ප්‍රකාශය ලෙස සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය භාවිත කරන බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ප්‍රකාශ කළේය. කෝවිඩ් 19 නිසා කල්ගිය පාර්ලිමේන්තු මැතිවරණ 2020 අගොස්තු 08 දින පවත්වන ලදි. මෙම මැතිවරණයේද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රමුඛ ඉල්ලීමක් වූයේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසි කිරීම

සඳහා 2/3ක බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් ලබාදෙන ලෙසයි. මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට මන්ත්‍රීධුර 142 ක් ලැබිණි.එසේම ඩග්ලස් දේවානන්ද නායකත්වය දරන ලද ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් නායක්වය දරන තමිල් මක්කල් විඩුදලෛප්පුලිකල් පක්ෂයේ සහ අතාවුල්ලා අහමඩ් ලෙබ්බේ නායකත්වය දරන ජාතික කොංග්‍රසය පක්ෂයේ සහයද ආණ්ඩුවට ලැබිණි.

## 10.3. නව රජයේ ප්‍රථම අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසි කරන ආකාරයට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ඒමට 2020 අගෝස්තු 19 වන දින පැවති පළමු කැබිනට් රැස්වීමේදී තීරණය කළේය. ඒ අනුව අලිසබ්‍රි අධිකරණ අමාත්‍යවරයාගේ නායකත්වයෙන් යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කෙටුම්පත් කිරීමේ කමිටුවක් පත් විය. නිමල් සිරිපාල ද සිල්වා, මහාචාර්ය ජී.එල්.පීරිස්, උදය ගම්මන්පිල, දිනේෂ් ගුණවර්ධන යන අමාත්‍යවරුන් එහි සෙසු සාමාජිකයින් විය. (ttps://divaina.com/daily/index.php/visheshanga3/46895-17-5996 2020/12/01)

## 10.4. ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව ඇමතීම - 2020 අගෝස්තු 20

නව රජය බලයට පත් වීමෙන් පසුව රැස් වූ මංගල පාර්ලිමේන්තු සභාව විවෘත කරමින් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් සිදුකරන ලද පාර්ලිමේන්තුව ඇමතීමේදීද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීම තම රජයේ ප්‍රමුඛ කාර්යය බවට ප්‍රකාශ කරන ලදි. එහිදී ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක සාර්ථකත්වය රඳා පවතින පදනම වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. 1978 සිට දහනව වතාවක් සංශෝධනය වී ඇති අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඇති අවිනිශ්චිතභාවය සහ ව්‍යාකූලත්වය නිසා වර්තමානයේ ගැටලු රැසක් නිර්මාණය වී තිබෙනවා. ව්‍යවස්ථාවේ වෙනසක් සඳහා අප ඉල්ලූ ජනවරම ජනතාව අපට ලබාදී තිබෙන නිසා අපගේ පළමු කාර්යයක් ලෙස අප ජනතාවට පොරොන්දු වූ පරිදිම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කිරීමට කටයුතු කරනවා, ඉන්පසු සියලුදෙනා සමග එක්ව රටට අවශ්‍ය සහ ගැළපෙන නව ව්‍යවස්ථාවක් ගෙන එනවා, මෙහිදී මේ රටේ සියලු ජනතාව සම්බන්ධයෙන් එක රටක්-එක නීතියක් යන සංකල්පයට මූලිකත්වය දෙනවා. (44 පිටුව හැන්සාර්ඩ් වාර්තාව 2020-08-20 දින) යනුවෙන් ප්‍රකාශ කරන ලදී.

## 10.5. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණ

ඒ අනුව 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙන ඒම සඳහා අවශ්‍ය පියවර ආරම්භ

කිරීමට ඔවුහු කටයුතු කළහ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 2015 වර්ෂයේදී සිදු කරන ලද 19 වන සංශෝධනය හේතුවෙන් ඇති වී තිබෙන විසමතා සහ අඩුපාඩු මගහැරවීම සඳහා කෙටිකාලීන පියවරක් වශයෙන් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා වන කෙටුම්පත සකස් කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමට 2020 08 19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය විය.

ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද එකී පනත් කෙටුම්පත අධිකරණ අමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත 2020 සැප්තැම්බර් 02 වන දින ඉදිරිපත් කරන ලදි. එම පනත් කෙටුම්පත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය හා අනනුකූල නොවන බවටත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82(5) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ 2/3කට නොඅඩු ඡන්දයෙන් සම්මත කර ගැනීමට හැකියාව පවතින බවටත් නීතිපති විසින් ලබාදී ඇති මතය අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන එම පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදි. (http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=si&dID=10594-2020-11-16)

ඒ අනුව කැබිනට් අනුමැති ලත් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත 2020 සැප්තැම්බර් 02 වන දින (අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලත් දිනම) අධිකරණ අමාත්‍යවරයාගේ නියෝගයෙන් ගැසට් පත්‍රයේ අතිරේකයක් ලෙස පළ විය.

## 10.6. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

එසේම ගැසට් පත්‍රයේ පළකරන ලද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ අලි සබ්රි විසින් 2020 සැප්තැම්බර් 22 දින පාර්ලිමේන්තුවේ පළමු කියවීම සඳහා ඉදිරිපත් කරන ලදි. (56 පිටුව හැන්සාර්ඩ් වාර්තාව 2020 සැප්තැම්බර් 22 දින)

# එකොළොස්වන පරිච්ඡේදය

## 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකිරීමට අපේක්ෂා කළ වෙනස්කම්
### (විසිවන සංශෝධනයේ අන්තර්ගතය)

1979 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ගෙන ආ ඉතා තීරණාත්මක සංශෝධනයක් වූයේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි. ජනාධිපතිගේ බලතල ජනමත විචාරණයකට තුඩු නොදෙන ආකාරයට උපරිම සීමාව දක්වා මෙම සංශෝධනය මගින් අඩුකර ඇති බව එකී සංශෝධනය පිළිබඳ වූ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙන් පැහැදිලි වේ (SC SD 04/2015). 19 සංශෝධනය සම්මත කිරීමට ඇතැම් පාර්ශ්ව එකඟ වූයේ මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමේ විසිවන සංශෝධනය ගෙන ඒමේ ආණ්ඩුවේ පොරොන්දුව මත බව පවසමින් 19 වන සංශෝධනයේ පැවැත්මට එරෙහි විය. සංශෝධනය ගෙන ඒමට දැඩි කැපවීමක් කළ පාර්ශ්වද පසුව ප්‍රකාශ කළේ 19 වන සංශෝධනයේ ඇතැම් අඩුපාඩු පවතින බවයි. කෙසේ නමුත් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැසට් පත්‍රයේ පළකර එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. එකී කෙටුම්පතේ අන්තර්ගතය හෙවත් එතෙක් බලාත්මක වූ 19 වන සංශෝධනය දක්වා සංශෝධනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්තාවට සිදුකිරීමට අපේක්ෂා කරන වෙනස්කම් පිළිබඳව විග්‍රහයක් සිදු කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණයි.

## 11.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කර පාර්ලිමේන්තු සභාව පිහිටුවීම

17වන මෙන්ම 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේද වඩාත් තීරණාත්මක සංශෝධනය වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්ථාපනය කිරීමයි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්තා සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කර ඒ වෙනුවට පාර්ලිමින්තු සභාව නැමති ආයතනය ස්ථාපනය කිරීමට යෝජනා කර තිබිණි.( කෙටුම්පතේ 6 වගන්තිය) මෙමගින් යෝජනා කරන ලද පාර්ලිමේන්තු සභාව 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපනය කරන ලද පාර්ලිමේන්තු සභාවට සෑම අතින්ම සමාන සංයුතියකින් සහ කාර්යයභාරයකින් යුතු ආයතනයක් විය. එහි සංයුතිය පාර්ලිමේන්තු නියෝජිතයන්ගෙන් පමණක් සමන්විත වූ අතර සිවිල් නියෝජිතයන් කිසිවෙකුගේ නියෝජනයක් නොමැත. එහි කාර්යභාරයද ජනාධිපති විසින් කොමිෂන් සභා සාමාජිකයන් සහ උසස් ධුර සඳහා නිර්දේශ කරනු ලබන නම් සදහා නිරීක්ෂණ ලබාදීමට පමණක් සීමා විය. ඒ අනුව එකී සභාව කිසිදු බලයක් නොමැති ආයතනයක් විය. 20 වන ව්‍යවස්ථා සංශෝධනයේ මෙම ප්‍රතිපාදනය මගින් කොමිෂන් සභා සහ අගවිනිසුරු ඇතුළු උසස් නිලතල සදහා පුද්ගලයන් පත් කිරීමේ පරම අභිමතය ජනාධිපති වෙත නැවත හිමිවිය.

## 11.2. විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපනය කරන ලද විගණන සේවා කොමිෂන් සභාව මෙම සංශෝධනය මගින් අහෝසි කිරිම සදහා යෝජනා කර තිබේ.(කෙටුම්පතේ 31 සිට 39 දක්වා වගන්ති) ඒ අනුව රාජ්‍ය විගණන සේවාවද අහෝසි වීමේ අර්බුදයකට මුහුණපාන අතර 2018 අංක 18 දරන විගණන සේවා පනතේ ප්‍රතිපාදන සමග ගැටීමක්ද ඇති කරනු ලබයි.

## 11.3. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දුන් ජාතික ප්‍රසම්පාදන කොමිසන් සභාව සම්පුර්ණයෙන්ම අහෝසි කිරීම මෙම කෙටුම්පතේ 54 වන ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු සමාලෝචනය උපදේශනය සහ වාර්තා කිරීම පිළිබඳව වූ ස්වාධීන ආයතනය අවසන් වනු ඇත.

## 11.4. ජනාධිපතිවරයාගේ වගකීම් ඉවත් කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපති වෙත පවරන ලද අතිරේක වගකීම් කිහිපයක් අහෝසි කිරීමට කෙටුම්පතේ 3 සහ 4 වන ව්‍යවස්ථා මගින් යෝජනා කර තිබිණි. ඒ මගින් ජනාධිපතිවරයාගේ පහත සඳහන් වූ

වගකීම් ජනාධිපතිගේ බලතල කාර්යය සහ කර්තව්‍ය ලැයිස්තුවෙන් ඉවත් කිරීමට යෝජනා කරන ලදි.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවටද, ආරක්ෂා කරන බවටද වගබලා ගැනීම;
- ජාතික ප්‍රතිසන්ධානය හා ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම;
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ VIIඅ ව්‍යවස්ථාවේ සඳහන් ආයතනවල නිසි ක්‍රියාකාරීත්වය පහසු කරලීම; සහ
- මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණ නිර්මාණය කිරීම තහවුරු කිරීම,

මේ අනුව ජනාධිපති ජනතාවට කොමිෂන් සභාවට සහ විශේෂයෙන්ම මැතිවරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ වගකීම්වලින් මුක්ත කිරීමට යෝජනා කර තිබිණි.

## 11.5. ද්විත්ව පුරවැසියකුට පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට ඉඩදීම

19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකරන ලද විශේෂිත සංශෝධනයක් වූයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස සැසිවාරවලට සහභාගීවීමට සහ පාර්ලිමේන්තුව තුළ ඡන්දය භාවිත කිරීම් නුසුදුසුකමක් ලෙස "විදේශ රටකද පුරවැසියකු වන ශ්‍රී ලාංකික පුරවැසියකු" යන්න ඇතුළත් කරන ලදි. (19 වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(ඇ)(xii) ව්‍යවස්ථාව). 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ 14(4) ව්‍යවස්ථාව මගින් මෙම ප්‍රතිපාදනය ඉවත් කිරීමට යෝජනා කරන ලදි. එමගින් ද්විත්ව පුරවැසිභාවයක් හිමි පුද්ගලයකුට වුවද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමේ අවස්ථා හිමිවේ.

## 11.6. ද්විත්ව පුරවැසියකුට ජනාධිපතිධුරය දැරීමේ අවස්ථා ලබාදීම

ජනාධිපතිවරයා ලෙස තෝරාපත් කරගැනීමට නුසුදුසුකම් පිළිබඳව ප්‍රතිපාදන දක්වා ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කිරීමට නුසුදුසුකමක්, ජනාධිපතිවරයකු ලෙස පත් කිරීමටද නුසුදුසුකමක් වේ. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ 14(4) ව්‍යවස්ථාව මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ නුසුදුසුකමක් වූ "විදේශ රටකද පුරවැසියකු වන ශ්‍රී ලාංකික පුරවැසියකු" යන ප්‍රතිපාදනය ඉවත් කිරීම මගින් ජනාධිපතිධුරය දැරීම සඳහා ද්විත්ව පුරවැසිභාවය තවදුරටත් නුසුදුසුකම් නොවනු ඇත.

## 11.7. ජනාධිපති මුක්තිය පුළුල් කිරීම

19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු පැවරීමේ අයිතිය පුරවැසියන්ට ලබාදී තිබිණි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ 5 වන ව්‍යවස්ථාව මගින් මෙකී අයිතිය සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබිණි. ඒ අනුව ධූරකාලය තුළ ජනාධිපති විසින් සිදුකරන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් සිවිල් හෝ අපරාධ වරදක් පැවරීමේ හැකියාව අහෝසි කර පූර්ණ මුක්තිය ලබාදීමට යෝජනා කර තිබිණි.

## 11.8. ජනාධිපතිට අමාත්‍යධුර දැරීමට අවස්ථාව ලබාදීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපති අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා වුවත් ජනාධිපතිට අමාත්‍යධුර දැරීමේ අවස්ථාව අහිමි කර තිබුණි (මෛත්‍රිපාල සිරිසේන ජනාධිපති වෙත අමාත්‍යධුර දැරීමේ හැකියාව අන්තර්කාලීන විධිවිධානයක් ලෙස ලබාදී තිබිණි) 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 7 වන වගන්තිය මගින් මෙම ප්‍රතිපාදනය අහෝසි කරමින් දක්වා ඇත්තේ "ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් ද අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා ද වන්නේ ය" යනුවෙන් ප්‍රතිපාදන ඇතුසත් කර තිබිනි.

## 11.9. අමාත්‍ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව පිළිබඳ සීමාව ඉවත් කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යව සම්බන්ධයෙන් සීමාවක් පනවමින් කැබිනට් අමාත්‍යවරුන් ගණන 30 දක්වාද කැබිනට් නොවන සියලු අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව 40 දක්වාද සීමා කරන ලදි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 7 වන වගන්තිය මගින් මෙම ප්‍රතිපාදනය ඉවත් කර තිබිණි. ඒ අනුව කැබිනට් මණ්ඩලය මෙන්ම නියෝජ්‍ය අමාත්‍යවරුන් රාජ්‍ය අමාත්‍යවරුන් සහ කැබිනට් නොවන අමාත්‍යවරුන් ජනාධිතිගේ අභිමතය මත අවශ්‍යතරම් සංඛ්‍යාවක් පත් කිරීමේ ප්‍රතිපාදන සැලසීමට යෝජනා කර තිබිණි.

## 11.10.අමාත්‍ය මණ්ඩලය පත් කිරීමේදී ජනාධිපති වෙත පරම අභිමතයක් හිමිවීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අමාත්‍ය මණ්ඩලය නම් කිරීමේදී අගමැතිවරයාගේ උපදෙස් මත එය සිදුකළ යුතු බවට ප්‍රතිපාදනයක් ඇතුළත් විය. (19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(2) ව්‍යවස්ථාව) 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7 වන වගන්තිය මගින් මෙම ප්‍රතිපාදන ඉවත් කරන ලදි. ඒ අනුව අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් තීරණය කිරීම පිළිබඳ පූර්ණ බලතල ජනාධිපතිට හිමි කිරීමට යෝජනා විය.

## 11.11. හදිසි පනත් පිළිබඳ ප්‍රතිපාදන යළි ඇති කිරීම

ජාතියේ යහපත සඳහා වහා අවශ්‍යය යැයි අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කළපසු එම පනත් කෙටුම්පත් ගැසට් පත්‍රයේ පළ නොකර කඩිනමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව තිබූ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කළ අතර 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 20 වන වගන්තිය මගින් හදිසි පනත් ගෙන ඒම පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන යළි හඳුන්වාදීමට යෝජනා කරන ලදි.

## 11.12. සාමාන්‍ය පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුව ඉදිරිපත් කිරීමට පෙර ගැසට් පත්‍රයේ පළකළ යුතු කාලය පිළිබඳ ප්‍රතිපාදන සංශෝධනය කිරීම

පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට දින 14කට පෙර ජනතාවගේ දැනගැනීම පිණිස ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට වූ ප්‍රතිපාදනය 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතේ 15 වන වගන්තිය මගින් දින 07 දක්වා අඩු කිරිමට යෝජනා කරන ලදි.

## 11.13. පොලිස්පතිවරයා පත්කිරීම පිළිබඳව බලතල ජනාධිපති යටතට ගැනීම

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතෙහි 12 වන වගන්තිය මගින් පොලිස්පතිවරයා පත් කිරීම ජනාධිපති විසින් පත් කළයුතු බවට ප්‍රතිපාදනයක් සලසා තිබිණි.

## 11.14. පාර්ලිමේන්තුව විසුරවීම පිළිබඳව ජනධිපතිට ඇති බලතල සංශෝධනය කිරීම

පාර්ලිමේන්තුවේ 2/3ක යෝජනා සම්මතයක් නොමැතිව වසර හතරහමාරක් යනතෙක් පාර්ලිමේන්තුව විසුරුවා හැරිය නොහැකි බවට ප්‍රතිපාදනයක් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සලසා තිබිණි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 14 වන වගන්තිය මගින් මෙම කාලය වසරක් දක්වා අඩු කරන ලදි.

## 11.15. මැතිවරණ කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම

මැතිවරණ සමයකදී මැතිවරණ කොමිෂන් සභාවට රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථානමාරු සහ රාජ්‍ය දේපළ භාවිතය සම්බන්ධ බලතල සීමා කිරීම සහ කොමිෂන් සභාවේ විධාන සහ උපමානවලට අවනත නොවන රාජ්‍ය

නිලධාරින්ට එරෙහිව නඩු පැවරීම සම්බන්ධව තිබූ බලතල ඉවත් කිරීම 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 20 හා 22 වගන්තිවලින් සිදුකරන ලදි.

## 11.16. මැතිවරණ කොමිෂන් සභාවට පත්කිරීම් සම්බන්ධව ජනාධිපති අභිමතය පුළුල් කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මැතිවරණ කොමිෂන් සභාවට කොමසාරිස්වරු නිර්දේශ කිරීමේදී පත් කරන එක් කොමසාරිස්වරයෙක් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයකු වශයෙන් හෝ එයට ඉහළ නිලධාරියෙක් විය යුතු බවට ප්‍රතිපාදනයක් සම්පාදනය කරන ලදි (19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 ව්‍යවස්ථාව) 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ 19 වන වගන්තිය මගින් ඉහත කී 103 ව්‍යවස්ථාව සංශෝධනය කරමින් එම ප්‍රතිපාදනය ඉවත් කරමින් ජනාධිපතිට කොමසාරිස්වරුන් පත් කිරීමේ අභිමතය පුළුල් කරන ලදි.

## 11.17. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම

රාජ්‍ය සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ස්ථානමාරු කිරීම, විනය කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ලබාදී තිබූ බලතල කොමිෂන් සභාවේ අභිමතය පරිදී කමිටුවලට පැවරීම හෝ රාජ්‍ය නිලධාරීන්ට පැවරීම පිළිබඳව 56 සහ 57 ව්‍යවස්ථාවලින් රාජ්‍ය සේවා කොමිසමට ලබාදී තිබිණි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 9 වන වගන්තිය සහ 10 වන වගන්තිය මගින් සංශෝධනයක් අදාළ පැවරීම් සිදුකිරීම අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන සේවා සම්බන්ධයෙන් සිදුකළයුතු බවට යෝජනා කරන ලදි.

## 11.18. ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම

පොලිස්පති හැරුණ විට අනෙකුත් පොලිස් නිලධාරීන් බඳවාගැනීම, උසස් කිරීම, ස්ථානමාරු කිරීම, විනය කටයුතු පිළිබඳව පොලිස් කොමිෂන් සභාවට තිබූ බලතල සහ පොලිස් සේවයට සහ අදාළ උපකරණ අවිආයුධ ගැනීමට අදාළව මාර්ගෝපදේශ සකස් කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාවට 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ලබාදී තිබූ බලතල 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 46 වන වගන්තිය මගින් ඉවත් කරන ලදි. ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවට ඉතිරි වූ එකම බලය වන්නේ පොලිසියට එරෙහිව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම පමණි.

## 11.19. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම

පැමිණිල්ලක් නොමැතිව වුවද යම් තොරතුරක් මත ස්වකැමැත්තෙන් අල්ලස් වරදක් පිළිබඳව විමර්ශනය කර නඩු පැවරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ලබාදී තිබූ බලතල 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 54 වන වගන්තිය මගින් ඉවත් කර තිබේ. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත කිසිදු අතිරේක බලයක් නොලැබේ.

## 11.20. විගණකාධිපතිවරයාගේ බලතල අඩු කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විගණකාධිපතිවරයාගේ බලතල පුළුල් කරමින් සමාගම් පනත යටතේ ලියාපදිංචිකරන ලද රජයට සියයට පහනකට වඩා කොටස් හිමි සමාගම්, මෙන්ම ජනාධිපති ලේකම් කාර්යාලය සහ අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයද විගණකාධිපතිට විගණනය කළහැකි ආයතන බවට පත් කරන ලදි. එසේම විගණකාධිපතිට ගිණුම්ද ඇතුළුව විගණනය කිරීමේ බලතල පුළුල් කරන ලදි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 40වන වගන්තිය මගින් විගණකාධිපති වෙත තිබූ ඉහත බලතල ඉවත් කිරීමට යෝජනා කරන ලදි.

## 11.21. විගණකාධිපති ලෙස සුදුසුකම් ලත් විගණකවරයකු වෙනුවට ඕනෑම අයෙක් පත් කිරීමට ජනාධිපතිට බලය ලැබීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවට අනුව විගණකාධිපති සුදුසුකම් ලත් විගණකවරයකු විය යුතුය. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ 31 වන වගන්තිය මගින් ඉහත කී 153 ව්‍යවස්ථාව සංශෝධනය කරමින් සුදුසුකම් ලත් විගණකවරයකු යන්න ඉවත් කරන ලදි. ඒ අනුව විගණකාධිපති පත් කිරීමේදී ජනාධිපතිවරයා තමන් කැමති ඕනෑම පුද්ගලයකු පත් කිරීමේ අභිමතයක් ප්‍රදානය කිරීමට යෝජනා කර තිබේ.

## 11.22. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් ඉවත් කිරීමේ බලය ජනාධිපතිට පැවරීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කරන්නේ නම් ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ජනාධිපති විසින් ලබාගත යුතු බවට 19

වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ප්‍රතිපාදනයක් ඇතුළත් කරන ලදි. 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය මගින් ජනාධිපතිට හේතු දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඕනෑම සාමාජිකයකු ඉවත් කිරීමේ බලතල ලබාදෙන ලදි.

## 11.23. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉවත් කිරීමේ බලය ජනාධිපතිට පැවරීම

අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ඉවත් කරන්නේ නම් ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ජනාධිපති විසින් ලබාගත යුතු බවට 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ප්‍රතිපාදනයක් ඇතුළත් කරන ලදි. 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 26 වන වගන්තිය මගින් ජනාධිපතිට හේතු දක්වා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඕනෑම සාමාජිකයකු ඉවත් කිරීමේ බලතල ලබාදෙන ලදි.

## 11.24. ජනාධිපති අපේක්ෂකයකුගේ අවම වයස අවුරුදු 30 දක්වා අඩු කිරීම

1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපති අපේක්ෂකයකුගේ අවම වයස අවුරුදු 30 වූ අතර 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එම වයස අවුරුදු 35 දක්වා ඉහළ දමන ලදි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතේ 18 වන වගන්තිය මගින් එම වයස නැවතත් අවුරුදු 30 දක්වා අඩු කරන ලදි.

## 11.25. පාර්ලිමේන්තුවේදී ප්‍රතික්ෂේප කරන ලද පනත් කෙටුම්පතක් ජනමත විචාරණයක් වෙත යොමුකර සම්මත කරවා ගැනීමේ බලය ජනාධිපතිට පැවරීම

පාර්ලිමේන්තුව විසින් පරාජයට පත්කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන පනත් කෙටුම්පතත් ජනමත විචාරණයකට යොමුකර සම්මත කරගැනීමට ජනාධිපතිට බලය පවරන ලද ව්‍යවස්ථා ප්‍රතිපාදනයක් 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් වූ අතර එය 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අහෝසි කරන ලදි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ 16 වන වගන්තිය මගින් එම බලතල ජනාධිපතිට නැවත ලබාදීමට යෝජනා කරන ලදි.

## 11.26. කාරක සභා අවස්ථාවේදී පනත් කෙටුම්පතකට සිදුකරන සංශෝධන සඳහා සීමා පැනවීම

පනත් කෙටුම්පතක් පිළිබඳ විවාදයේ කාරක සභා අවස්ථාවේදී එය ඕනෑම

ආකාරයකට සංශෝධනය කිරීමේ බලතල පාර්ලිමේන්තුවට ඇත. ඒ සඳහා කිසිදු ව්‍යවස්ථාපිත සීමාවක් නොමැත. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථා කෙටුම්පතේ 15වන වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 ව්‍යවස්ථාවට 3 වන අනු ව්‍යවස්ථාවක් එක් කරමින් පනත් කෙටුම්පතකට පාර්ලිමේන්තුව තුළදී යෝජනා කරනු ලබන යම් සංශෝධනයක් ඒ පනත් කෙටුම්පතේ හරයට සහ මූලධර්මවලට පරිබාහිර සංශෝධනයක් නොවිය යුත්තේය යනුවෙන් නව සංශෝධනයක් එක් කිරීමට යෝජනා කරන ලදි. මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අලුතින්ම එක්වන සංශෝධනයකි.

## 11.27. වැඩබලන අගවිනිසුරු සහ වැඩබලන අභියාචනාධිකරණ සභාපති පත් කිරීමේදී ජනාධිපති අභිමතය පුළුල් කිරීම

රෝගාතුර වීම නිසා හෝ විදේශගත වීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා අදාළ කාර්ය සිදු කිරීමට නොහැකි වන්නේ නම් එම කාලය සඳහා වැඩබලන අගවිනිසුරු හෝ වැඩබලන අභියාචනාධිකරණ විනිසුරුවරයකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචානාධිකරණයේ වෙනත් විනිසුරුවරයකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය මත ජනාධිපති විසින් පත් කළ යුතු බව 19වන සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පත් කිරීමේදී ජනාධිපති විසින් 109 ව්‍යවස්ථාවේ දැක්වේ. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ 24 වගන්තිය මගින් මෙම ප්‍රතිපාදනය සංශෝධනය කරමින් ඉහත කී ධුර සඳහා ජනාධිපතිට ඕනෑම තැනැත්තෙකු පත් කිරීමේ අයිතිය ලබාදී ඇත.

## 11.28. නිල දිවුරුම සංශෝධනය කිරීම

අමාත්‍ය මණ්ඩලයේ සියලුම දෙනා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන උපලේඛනයේ සඳහන් දිවුරුම ලබාදිය යුතු බවට 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 53 වන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයක් ඇතුළත් වී ඇත. එයට 1983 අගෝස්තු මස 8 වන දින කථානායකගේ සහතිකය සටහන් කරන ලද 6 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 7 වන උපලේඛනයේ දිවුරුමද ලබාදිය යුතු බවට සංශෝධනයක් එක් විය. 6 වන උපලේඛනයේ දිවුරුම යනු

"............................................................................................ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවට ද, ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රජයක් පිහිටුවීමට, කෙළින් ම හෝ අන්‍යාකාරයකින්, ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී ආධාර දීම, අනුබල දීම, අනුග්‍රහය දැක්වීම, මුදල් යෙදවීම, ධෛර්ය දීම හෝ දේශනා කිරීම නොකරන බවට ද, ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි./ දිවුරුම් දෙමි" යන්නයි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ 7

වන වගන්තිය මගින් මෙම 53 වන ව්‍යවස්ථාව සංශෝධනය කරමින් 4වන උපලේඛනයේ සඳහන් දිවුරුම පමණක් ලබාදීමට යෝජනා කරන ලදි.

## 11.29. විසර්ජන පනත් කෙටුම්පත පරාජයට පත්වීමේදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳ විධිවිධාන සංශෝධනය

1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සදහන් වූයේ "පාර්ලිමේන්තුව විසින් විසර්ජන පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු නොලැබූ අවස්ථාවක ඊළඟ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුත්තේය". (70(1) ව්‍යවස්ථාව). මෙම ප්‍රතිපාදනය 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් 70 වන ව්‍යවස්ථාවට සිදුකරන ලද සංශෝධන මගින් ඉවත් කරන ලදී, 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 14 වන වගන්තිය මගින් නැවත එම ප්‍රතිපාදනය ඇතුළත් කිරීමට යෝජනා කරන ලදි.

## 11.30. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය සම්බන්ධයෙන් වූ සංශෝධනය

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් වූයේ අගවිනිසුරු(සභාපති) සහ වෙනත් ජ්‍යෙෂ්ඨ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් දෙදෙනෙකු විය යුතු බවය. (111(ඇ) ව්‍යවස්ථාව) මෙම විනිසුරුවරුන් තෝරාගනීමේ නිර්ණායක පිළිබඳව එහි 2වන උපවගන්තියේ දක්වා ඇත. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 25 වන වගන්තිය මගින් මෙම ප්‍රතිපාදන ඉවත් කර අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය "අගවිනිසුරු(සභාපති) හා ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිසුරුවරුන් දෙදෙනෙකු විය යුත" බවට සංශෝධනය කරන ලදි. මෙහි ප්‍රතිඵලය වන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත සාමාජිකයන් දෙදෙනා පත් කිරීමේදී ජනාධිපතිවරයාට විශාල අභිමතයක් ලැබීමයි.

## 11.31. අමාත්‍යංශ ලේකම්වරුන්ගේ ධුරය අවසන් වූ පසු ප්‍රතිපාදන සංශෝධය

යම් රාජ්‍ය සේවකයකු අමත්‍යංශ ලේකම් ධුරයකට පත් කිරීමේදී එය තාවකාලික මුදා හැරීමක් ලෙස හැඳින්විය හැකි බවටද ඔහු එකී ධුරය අවසන් වූ පසු නැවත එම තැනැත්තාට ජ්‍යෝෂ්ඨතාව අහිමිවීමක් නොමැතිව එකී සේවයට ආපසු පැමිණීමට හිමිකම තිබිය යුතු බවට 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන

ඇතුළත් වූ අතර (52 ව්‍යවස්ථාව) එය 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කරන ලදී. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7 වගන්තිය මගින් එම ප්‍රතිපාදනය නැවත ස්ථාපනය කරන ලදි.

## 11.32. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදන සංක්ෂිප්තය

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ එහි සංශෝධන සහ විශේෂයෙන් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත සමග සංසන්දය කර බලන විට පැහැදිලි වන කරුණක් වන්නේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ ප්‍රතිපාදන මගින් සිදුකරන ලද ප්‍රධාන සංශෝධනයන් වන්නේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කරන ලද සංශෝධනයන් රැසක් ඉවත් කිරීමයි. ඒ අනුව 19 වන ආණ්ඩුක්‍රම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කරන ලද ප්‍රතිපාදන 3ක් හැර අනෙක් ප්‍රතිපාදන සියල්ලම ඉවත් කර ඇත. ඒ අනුව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනයෙන් ඇතුළත් කරන ලද සංශෝධන අතරින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මගින් ඉවත් නොකරන ලද ප්‍රතිපාදන වන්නේ

- ජනාධිපතිගේ නිලකාලය පිළිබඳ ප්‍රතිපාදනය
- පාර්ලිමේන්තුවේ නිලකාලය පිළිබඳ ප්‍රතිපාදනය
- අවස්ථා දෙකකට වඩා ජනාධිපති ලෙස පත්වීමට අවස්ථාවක් නොමැති වීම
- තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා ප්‍රවේශවීමේ අයිතිය පිළිබඳ ප්‍රතිපාදන
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවට රාජ්‍ය සේවකයන් බඳවාගැනීම, ස්ථානමාරු, උසස් කිරීම් විනය පාලනය සහ සේවා සමාප්තියට අදාළ බලතල පිළිබඳ ප්‍රතිපාදන, යන ප්‍රතිපාදනය.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අලුතින්ම හඳුන්වා දුන් සංශෝධනය වන්නේ එහි පනත් කෙටුම්පතේ 15 වගන්තිය මගින් යෝජනා කරන ලද පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විවාදයේ කාරක සභා අවස්ථාවේදී එකී කෙටුම්පත සම්බන්ධයෙන් සිදුකළ හැකි සංශෝධන සම්බන්ධයෙන් සීමාවක් පැනවීමයි.

# දොළොස්වන පරිච්ඡේදය

## විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතට එරෙහි විවේචන

2019 නොවැම්බර් මාසයේදී පැවති ජනාධිපති මැතිවරණයේදී මෙන්ම 2020 අගෝස්තු මාසයේ පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදීද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රධාන සටන් පාඨයක් වූයේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසි කරන බවයි. ඒ අනුව ආණ්ඩුවක් පිහිටුවා මාස කිහිපයක් ඇතුළත ගෙන ආ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැසට් පත්‍රයේ පළකළ වහාම එයට විරෝධතා මතුවිය.

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකරන අවස්ථාව වන විටත් කොවිඩ්-19 වසංගත තත්ත්වය පැවති අතර පසුව කොවිඩ්-19 රෝගීන් බහුල ලෙස හමුවීමත් සමග බස්නාහිර පළාත සහ දිවයිනේ ඇතැම් පොලිස් වසම් සඳහා සංචරණ සීමා පනවා තිබිණි (මෙම තත්ත්වය මාධ්‍ය විසින් කොවිඩ්-19 දෙවන රැල්ල ලෙස හඳුන්වා තිබිණි) 2020 මාර්තු අප්‍රේල් සහ මැයි මාසවලට වඩා රෝගීන් හමුවීමත් සමගම රට තුළ විශාල සෞඛ්‍ය ගැටලුවක් මෙන්ම සංචරණ සීමා පැනවීම නිසා ජීවනෝපාය ගැටලුවකට බොහෝ දෙනෙක් මුහුණ දී තිබිණි. නිරෝධායන නියෝගවලට අනුව රැස්වීම් සීමාකර තිබිණි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධව විරෝධතා පෝස්ටර් ප්‍රදර්ශනය කළ ඇතැම් කණ්ඩායම් නිරෝධායන නියෝග මත යැයි පවසමින් පොලිසිය විසින් විසුරුවාහැර තිබිණි. 20 වන සංශෝධනයට අදාළ විවේචන සහ විරෝධතා පැවතියේ මෙවැනි සංචරණය සහ රැස්වීම පිළිබඳ නීතිමය සහ සෞඛ්‍යමය සීමා පැවති කාල පරිච්ඡේදයක් තුළය.

එවැනි කාල පරිච්ඡේදයකදී වුවද 20 වන සංශෝධනය සම්බන්ධයෙන් දක්වන ලද විවේචන සහ විරෝධතාවල අන්තර්ගතය මෙන්ම එකී විරෝධතා දැක්වූ කණ්ඩායම්වල දේශපාලන සහ සමාජ පසුබිම පිළිබඳව විග්‍රහයක් සිදුකිරීම මෙම පරිච්ඡේදයෙන් සිදුකරනු ලබයි.

## 12.1. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එරෙහි වූ කණ්ඩායම්

20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විවේචන සහ විරෝධතා එල්ල කරන ලද කණ්ඩායම් හඳුනා ගැනීමේදී ඔවුන්ගේ දේශපාලනික සහ සමාජීය පසුබිම අනුව සරල වර්ගීකරණයක් කළ හැකිය. එනම්

- විරෝධතාවය පළකළ ආණ්ඩු පක්ෂයට සම්බන්ධ පක්ෂයේ දේශපාලන පක්ෂ
- විරෝධතාවය පළකළ ආණ්ඩුවට සහයෝගය දැක්වූ කණ්ඩායම්
- විරෝධතාවය පළකළ විරුද්ධ පක්ෂයේ දේශපාලන පක්ෂ
- විරෝධතාවය පළකළ වෘත්තීය සමිති
- විරෝධතාවය පළකළ පූජ්‍ය/පූජක පක්ෂය
- විරෝධතාවය පළකළ සිවිල් සංවිධාන

## 12.2. 20 වන ව්‍යවස්ථා සංශෝධනයට විරෝධය පළකළ ආණ්ඩුවේ දේශපාලන පක්ෂ

2019 ජනාධිපතිවරණයේදී සහ 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී ආණ්ඩුවේ හවුල්කාර පක්ෂ ලෙස කටයුතු කළ දේශපාලන පක්ෂ කිහිපයක් විසින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ ඇතැම් වගන්ති සම්බන්ධයෙන් විරෝධතා පළකරන ලදි. ඒ අනුව හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සභාපති වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ නායකත්වය දැක්වූ ජාතික සමගි පෙරමුණ පක්ෂය, බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල නායකත්වය දරූ පිවිතුරු හෙළ උරුමය පක්ෂය,ජලසම්පාදන අමාත්‍ය වාසුදේව නානායක්කාර නායකත්වය දරනු ලබන නව සමසමාජ පක්ෂය, මහාචාර්ය තිස්ස විතාරණ නායකත්වය දැරූ - ලංකා සමසමාජ පක්ෂය, මෙම 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඇතැම් ප්‍රතිපාදන සම්බන්ධයෙන් විරෝධය දක්වන ලද ආණ්ඩුව නියෝජනය කරන ලද දේශපාලන පක්ෂ වේ. එයට අමතරව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ විජේදාස රාජපක්ෂ සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කළ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී

දොලවත්තද 20 වන ව්‍යවස්ථා සංශෝධනයේ ඇතැම් ප්‍රතිපාදන පිළිබඳව සිය විරෝධය දක්වන ලදි.මෙම සැම දෙනාම 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසි කිරිමට එකඟවන නමුත් 20 වන සංශෝධන කෙටුම්පතේ ඇතැම් වගන්ති සංශෝධනය විය යුතුය යන ස්ථාවරයේ සිටි කණ්ඩායම් වේ.

මේ අතරින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලේකම්වරයා වන බතික් අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරෝධතාව දක්වන ලද්දේ විදේශ පුරවැසියකුට ජනාධිපති ලෙස සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමට අවස්ථාව මෙමෙ සංශෝධනය මගින් ඉඩසැලසෙන ප්‍රතිපාදනවලටය. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් තම පක්ෂය විසින් ඉදිරිපත් කළ යෝජනා මාලාව පිළිබඳව මේ දක්වා කිසිඳු ප්‍රතිචාරයක් දක්වා නොමැති බවත් රජයට අයත් ආයතන විගණනය කිරීමේ බලය විගණකාධිපතිවරයාගේ ඉවත් කිරීම සුදුසු නොවන බවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රකාශ කර තිබේ.
( https://www.bbc.com/sinhala/sri-lanka-54582561-2020/12/02 )
ජාතික නිදහස් පෙරමුණේ නායක කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ 20 වන සංශෝධනයේ ඇතැම් ප්‍රතිපාදන පිළිබඳව සිය විරෝධය දක්වා මාධ්‍යය වෙත අදහස් ප්‍රකාශ කළ අතර එහි ඇතැම් ප්‍රතිපාදන සංශෝධනය විය යුතු බවද ඔහු විසින් පවසන ලදි.

2020 ඔක්තෝබර් 02 ජාතික නිදහස් පෙරමුණේ ලේකම් මහ ලේකම් එස් විජේසිරි ජනාධිපතිවරයා වෙත ලිපියක් යොමුකරමින් ප්‍රකාශ කර ඇත්තේ ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ විසින් පනත් කෙටුම්පතේ ඇතැම් ප්‍රතිපාදන සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මූලික විරෝධතා පිළිබඳව එකඟතාවකට පැමිණීමට උත්සහ කිරීම පිළිබඳව ජනාධිපතිතුමාට පක්ෂයේ ස්තුතිය පිරිනමන බවයි. නමුත් පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේදී සංශෝධනයට නියමිත බවට නීතිපතිවරයා විසින් මෙමෙ පනත් කෙටුම්පත පිළිබඳව වූ නඩු විභාගයේදී ශ්‍රේෂ්ඨාධිකරණයට දක්වා ඇති කරුණුවලට අමතරව පහත සඳහන් ප්‍රතිපාදනද සංශෝධනය විය යුතු බව දක්වන ලදි.

- සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි කොට ඇති රජයට බහුතර කොටස් හිමි සමාගම් විගණකාධිපතිවරයාගේ විගණනයෙන් නිදහස් කිරීම.
- මහජනයාගේ දැනගැනීම පිණිස ගැසට් කිරීමෙන් තොරව හදිසි පනත් සම්මත කිරීම

- ද්විත්ව පුරවැසි බාධකය පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගෙන් ඔබ්බට තානාපතිවරුන් සහ රජයේ ප්‍රධාන උසස් නිලතලවලටද පැනවීම වෙනුවට එම බාධකය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම (බලන්න ඇමුණුම් IX)

පසුව විමල් වීරවංශ සහ උදය ගම්මන්පිල අමාත්‍යවරුන් ජනාධිපතිවරයා සමග මෙම කරුණ පිළිබඳව සාකච්ඡාවක් පවත් වන ලද අතර 2020 ඔක්තෝබර් 21 වන දින විමල් වීරවංශ අමාත්‍යවරයා මාධ්‍ය වෙත පවසා සිටියේ තමන් ඉල්ලා සිටින ලද ඉල්ලීම් 4න් තුනකටම ජනාධිපතිතුමා එකඟ වී අදාළ සංශෝධන සිදු කිරීමට පොරොන්දු වූ බවත් ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ ප්‍රතිපාදනය පමණක් ඉතිරිව ඇති බවත් තමන් 20වන සංශෝධනයට පක්ෂව ඡන්දය ලබාදෙන බවත්ය. බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල පිවිතුරු හෙළ උරුමයේ නායක වූ අතර ඔහු විසින්ද 20 වන සංශෝධනයේ ඇතැම් ප්‍රතිපාදන පිළිබඳව විවේචනය කරන ලදි. විශේෂයෙන්ම ද්විත්ව පුරවැසියන්ට ජනාධිපතිවරණයට ඉදිරිපත්වීමට සහ පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට අවස්ථාව ලැබීම සහ විගණකාධිපතිගේ විෂය පථය සම්බන්ධයෙන් සිදුකරන ලද සංශෝධන සහ අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව පිළිබඳ සීමාව ඉවත් කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රතිපාදන වෙනස් කළයුතු බව උදය ගම්මන්පිල පවසන ලදි. ඔහු නායකත්වය දරන පිවිතුරු හෙළ උරුමය පක්ෂය විසින් 2020 ඔක්තෝබර් 19 වන දින ජනාධිපතිවරයා වෙත ලිපියක් යොමුකරමින් මෙම ප්‍රතිපාදන සම්බන්ධයෙන් තවදුරටත් සිතා බලන ලෙස ඉල්ලා සිටින ලදී. (උපග්‍රන්ථයේ අංක X)

පසුව 2020 ඔක්තෝබර් 20 වන දින ජනාධිපතිවරයා සමග පවත්වන ලද සාකච්ඡාවකින් පසුව මාධ්‍ය වෙත අදහස් ප්‍රකාශ කරමින් උදය ගම්මන්පිල ප්‍රකාශ කරන ලද්දේ ජනාධිපතිවරයා හැඟීම්බර ප්‍රකාශයක් කරමින් කීවා "මෙම ද්විත්ව පුරවැසි වගන්තිය පිළිබඳව රටේ සංවාදයක් තිබුණේ නැහැ. මේ වගන්තිය ගෙනාවෙ මම ජනාධිපතිවරයට ඉදිරිපත් වෙන එක වළක්වගන්න" යනුවෙනි. "රටේ ආරක්ෂක ලේකම් ලෙස රට රැක්ක මම, නාගරික සංවර්ධන ලේකම් ලෙස රට හදපු මම, ජනාධිපතිවරණයට ඉදිරිපත් වීම වැළැක්වීම කියන ද්වේශ සහගත අරමුණින් තමයි මෙම වගන්තිය ඉදිරිපත් කළේ." යැයි ඔහු පවසා ඇත. ගම්මන්පිල තවදුරටත් පැවසුවේ "ඒ වගේම මැතිවරණ ව්‍යාපාරය මැදදී පවා නඩු පවරමින් මගේ අපේක්ෂත්වය පිළිබඳව ජනතාව තුළ සැක සංකා මතුකරන්න මෙම වගන්තිය පාවිච්චි කළා. මම ජයග්‍රහණය කලත් එතුමාගේ පත්වීම වලංගු නැති බවට විපක්ෂය ප්‍රකාශ කළා. එනිසා මෙම වගන්තිය පිළිබඳව මට තියෙන්නේ හැඟීම්බර ප්‍රශ්නයක් ඒ නිසා මට මෙම වගන්තිය ඉවත්කරගන්න ඉඩදෙන්න. ඔබේ අනෙක් කාරණාවලට මම එකඟයි. ඒ නිසා නව ව්‍යවස්ථාවට

අනිවර්යයෙන්ම මෙම වගන්තිය යළි එකතු කරමු" යනුවෙන් ජනාධිපතිවරයා පැවසූ බවයි (http://www.newswire.lk/2020/10/22/dual-citizens-in-parliament-wimal-gammanpila-vasu-agree-to-vote-for-20a-after-emotional-appeal-from-president/2020/11/18) ඒ අනුව උදය ගම්මන්පිල මුලින් විරෝධය ප්‍රකාශ කළද තමන් විරුද්ධ වූ එක් කාරණයක් හැර අනෙක් කරුණු සංශෝධනය වූ බැවින් 20 වන ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව ඡන්දය ලබාදෙන බව ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ විජේදාස රාජපක්ෂ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඇතැම් ප්‍රතිපාදන සම්බන්ධයෙන් විරෝධය පළකරන ලදි. ඒ සම්බන්ධව ඔහු විසින් ජනමාධ්‍ය ඔස්සේද තම විරෝධය ඉදිරිපත් කරන ලදි. 2020/09/28 දින සහ 2020/10/12 දිනවලදී ඔහු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා අමතමින් ලිපි 2ක් යවමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ පවතින දෝෂ පිළිබඳව සිය විරෝධය ඉදිරිපත් කළේය (උපග්‍රන්තයේ අංක xii)

- ජනාධිපතිවරයා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පැවරී ඇති වගකීම් සහ යුතුකම් රැසක් ඉවත් කිරීම.
- විගණන සේවා කොමිෂන් සභාව සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කිරීම
- කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව 30 නොඉක්මවිය යුතු බව සහ රාජ්‍ය සහ නියෝජ්‍ය අමාත්‍යවරු සංඛ්‍යාව 40 නොඉක්මවිය යුතුය යන සීමා ඉවත් කිරීම.
- පාර්ලිමේන්තුව රැස් වූ දින සිට වසරක් ඇතුළත විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට බලය පැවරීම.
- හදිසි අවස්ථා පනත් ඉදිරිපත් කිරීම පිණිස නැවත ප්‍රතිපාදන හඳුන්වා දීම.
- ද්විත්ව පුරවැසියකුට මන්ත්‍රීවරයකු සහ ජනාධිපතිවරයකු වීමට සුදුසුකම් ඇති බවට නීතිය වෙනස් කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයෙන් ඉවත් කිරීම.
- සමාගමක ප්‍රාග්ධනයෙන් 50%කට වඩා වැඩි මුදලක් රජය හෝ රාජ්‍ය ආයතනයක් මගින් ආයෝජනය කර ඇත්නම් එය විගණකාධිපතිගේ අධීක්ෂණයට ලක් විය යුතු බවට ඇති ව්‍යවස්ථා ප්‍රතිපාදනය අහෝසි කිරීම.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIX (අ) පරිච්ඡේදය අවලංගු කිරීම මගින් දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුති සහ දූෂණ වැළැක්වීමට වෙනත් යම් ජාත්‍යන්තර සම්මුති ක්‍රියාත්මක කිරීම පිණිස අල්ලස් හෝ දූෂණ විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල අහෝසි කිරීම.
- ශ්‍රී ලංකාව දෙකඩ නොකරන බවට දක්වන උපලේඛනයේ ඇති දිවුරුම ඉවත් කිරීම.

මෙම ලිපියේ පිටපත් පාර්ලිමේන්තු මන්ත්‍රී විජේදාස රාජපක්ෂ විසින් සියලුම අතිගෞරවණීය මහානායක හිමිපාණන් වහන්සේලා ඇතුළු නායක හිමිපාණන් වහන්සේලා, අති උතුම් කාදිනල් හිමිපාණන් වහන්සේ, හින්දු හා මුස්ලිම් ආගමික නායකතුමන්ලා, අග්‍රාමාත්‍යතුමා, සභානායකතුමා, විපක්ෂනායකතුමා, සියලු දේශපාලන පක්ෂ නායකයින් වෙතද යොමු කර තිබිණි.

නමුත් ඔහු 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පක්ෂව ඔක්තෝබර් 22 වන දින ඡන්දය ප්‍රකාශ කළේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත පිළිබඳව වූ දෙදින විවාදයේ හැන්සාර්ඩ් වාර්තා අනුව මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේ දී කෙටුම්පත පිළිබඳව අදහස් දක්වා නැත.

20 වැනි සංශෝධනයට එරෙහිව අදහස් දක්වමින් ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක වාසුදේව නානායක්කාර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ වෙත ලිපියක් යවා තිබුණි.

20 වැනි සංශෝධනයෙන් ජනාධිපතිවරයාගේ බලතල වැඩි කර තිබෙන බවත්, එසේ නොවී පාර්ලිමේන්තුව සහ ජනාධිපතිවරයා අතර බලය තුලනය විය යුතු බවත් එම ලිපියෙන් පෙන්වා දී ඇත. 20 වැනි සංශෝධනයෙන් විගණන ක්‍රියාවලිය දුර්වල වන බව පෙන්වා දී ඇත. ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තු මන්ත්‍රීධුර සහ ජනාධිපතිධුරය දැරීමට හැකිවන ආකාරයට 20 වැනි සංශෝධනයෙහි ප්‍රතිපාදනවලටද විරුද්ධ බව එම ලිපියෙන් දැනුම් දී ඇත. (2020/12/04 අනිද්දා පුවත්පත )

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික ලැයිස්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීවරයා විසින්ද විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඇතැම් ප්‍රතිපාදන සම්බන්ධයෙන් විරෝධතාවය දක්වන ලදි. ඔහු නායකත්වය දරන **යුතුකම** නැමති සංවිධානයෙන් 2020-10-02 දින අග්‍රාමාත්‍යවරයා වෙත ලිපියක්

යොමුකරමින් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ සඳහන් විදේශ පුරවැසිභාවය පිළිබඳ ප්‍රතිපාදන, අමාත්‍ය මණ්ඩල සීමාව ඉවත් කිරීම සහ හදිසි පනත් කෙටුම්පත් පිළිබඳ ප්‍රතිපාදන සංශෝධනය විය යුතු බවද යෝජනා කරන ලදි. එයට අමතරව 13 සහ 16 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සහ මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීමේ අවශ්‍යතාව පිළිබඳවද මෙම ලිපියෙන් අවධාරණය කර තිබිණි. මෙම ලිපියේ පිටපත් අධිකරණ අමාත්‍යවරයා වෙතද ශ්‍රී ලංකා පොදුජන නිදහස් සන්ධානයේ සියලු පක්ෂ නායකයින් වෙතද ඉදිරිපත් කරන ලද අතර එහි පිටපත් ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීවරයා විසින් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තු විවාදයේදී සභාගත කරන ලදී (1695 පිටුව හැන්සාර්ඩ් වාර්තාව 2020 ඔක්තෝබර් 22 දින) (උපග්‍රන්ථයේ අංක xiii)

ආණ්ඩුවේ හවුල්කාර පක්ෂයක් වු ලංකා සම සමාජ පක්ෂයේ නායක තිස්ස විතාරණ මණ්ත්‍රිවරයා විසින් ජනාධිපතිවරයා වෙත ලිපියක් ඉදිරිපත් කරමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ යෝජිත සංශෝධනවල සාධනීය කරුණුවලට අප පක්ෂය ඉහළින් ම සහය පළකරන අතර ද්විතව පුරවැසිභාවය සහිත අයට පාර්ලිමේන්තුවට තේරී පත්වීමට අවස්ථාව දීමෙන් ද්‍රවිඩ ඩයස්පෝරාව වැනි රටට හානිකර පුද්ගලයන්ට ව්‍යවස්ථාදායකය තුළදීම මෙරට අනාගතයට අහිතකර ක්‍රියාමාර්ග ගැනීමට ඉඩසැලසීමේ විධිවිධානවලට එකඟවීමට නොහැකි බව අප පක්ෂයේ මතය ප්‍රකාශ කරන ලදි. එසේම විධායක ජනාධිපතිධුරය අහෝසි කිරීමේ අවශ්‍යතාවයද එම ලිපිය මගින් අවධාරණය කර ඇත. (උපග්‍රන්ථයේ අංක xii)

ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායකද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතැම් ප්‍රතිපාදන විවේචනය කළ ආණ්ඩුවේ සාමාජිකයෙකි. 2020 ඔක්තෝබර් 10 වන දින කොළඹ පැවති මාධ්‍ය හමුවකදී ප්‍රකාශ කළේ 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත තුළ එකඟවිය හැකි වගන්ති මෙන්ම කිසිසේත් එකඟවිය නොහැකි කරුණුද අඩංගුවන බවයි. 20 වන සංශෝධනය හරහා නැවතත් 18 වැනි සංශෝධනය තිබූ තැනටම ගමන් කිරීමට අපේක්ෂා කරන්නේ නම් එය කිසිසේත්ම සුදුසු නොවන බව ප්‍රකාශ කළ ඔහු එසේ වුවහොත් හදවතට එකඟව තීන්දුවක් ගැනීටම සිදුවන බවයි (https://www.lankanewsweb.net/sinhala/127-general-news/70034-20-%E0%B6%B1%E0%B7%8A-%E0%B6%B8%E0%B7%9A-%E0%B7%84%E0%B6%AF%E0%B6%B1%E0%B7%8A%E0%B6%B1%E0%B7%99-%E0%B6%86%E0%B6%BA%E0%B7%99-18-%E0%B6%A7-%E0%B6%BA%E0

%B6%B1%E0%B7%8A%E0%B6%B1-%E0%B6%B1%E0%B6%82-%E0%B6%AD%E0%B7%93%E0%B6%B1%E0%B7%8A%E0%B6%AF%E0%B7%94%E0%B7%80%E0%B6%9A%E0%B7%8A-%E0%B6%9C%E0%B6%B1%E0%B7%8A%E0%B6%B1-%E0%B7%80%E0%B7%99%E0%B6%B1%E0%B7%80%E0%B7%8F---%E0%B7%80%E0%B7%92%E0%B6%AF%E0%B7%94%E0%B6%BB– 2020/12/02)

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී දොලවත්ත මන්ත්‍රීවයාද 20 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ ඇතැම් ප්‍රතිපාදන පිළිබඳව විවේචනය කරමින් එම ප්‍රතිපාදන සංශෝධනය කරන ලෙස ජනාධිපතිවරයා සහ අගමැතිවරයා වෙත 2020-10-19 දින වෙත ලිපියක් යොමුකර තිබිණි. එමගින් ඔහු විරෝධතාවය පළකරන ලද්දේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අඩංගු වූ අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව පිළිබඳ සීමාව ඉවත් කිරීමට, ඇතැම් රාජ්‍ය ආයතන විගණකාධිපතිගේ අධීක්ෂණයෙන් ඉවත් කිරීමට සහ හදිසි පනත් ගෙන ඒමේ ප්‍රතිපාදන නැවත ස්ථාපනය කිරීමටයි. එබැවින් එම ප්‍රතිපාදන සංශෝධනය කිරීමට කටයුතු කරන ලෙස ඔහු විසින් ඉල්ලා සිටින ලදි. එයට අමතරව ඔහු එකී ලිපියෙන් ප්‍රකාශ කරන ලද්දේ ද්විත්ව පුරුවැසියන්ට ජනාධිපති හෝ මන්ත්‍රීධුරයක් ලබාගැනීමේ අවස්ථාව අහිමි කළ 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ අඩංගු වූ ප්‍රතිපාදනයට තමන් විරුද්ධ බවයි.(එනම් 20 වන සංශෝධනයේ ද්විත්ව පුරවැසිභාවය පිළිබඳව ප්‍රතිපාදනය ඉවත් කිරීමට ඔහු එකගය) https://www.facebook.com/PremnathSL -2020-11-18) (උපග්‍රන්ථයේ අංක xiii)

## 12.3. විරෝධතාවය පළකළ ආණ්ඩුවට සහයෝගය දැක්වූ කණ්ඩායම්

### 12.3.1. ජාතික සංවිධාන එකමුතුව

ආණ්ඩුවගෙන ඒමට සහය දක් වූ කණ්ඩායමක් වන ජාතික සංවිධාන එකමුතුව විසින් 20 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ ඇතැම් ප්‍රතිපාදන පිළිබඳව සිය විරෝධය මාධ්‍ය ඉදිරියේද දක්වන ලදි. එයට අමතරව එකී පනත් කෙටුම්පතේ පවතින මූලික අඩුපාඩු 3ක් පිළිබඳව දක්වමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වෙත ලිපියක් යවන ලදි. එහිදී ඔවුන් විරෝධතාවය දක්වන ලද්දේ

- ද්විත්ව පුරවැසියන්ට ජනාපතිධුරයේ සහ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට අවස්ථාව සැලසීම
- හදිසි පනත් ගෙන ඒමේ ප්‍රතිපාදනය
- පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමට පෙර ගැසට් කළ යුතු කාලය දින 7 දක්වා අඩු කිරීම
- විගණන සේවා කොමිසම අහෝසි කිරීම

- අතැම් රාජ්‍ය ආයතන විගණකාධිපතිගේ විගණනයෙන් ඉවත් කිරීම

ජාතික සංවිධාන එකමුතුවේ කැඳවුම්කරු මහාචාර්ය ගුණදාස අමරසේකරගේ අත්සනින් යොමුකර තිබූ එම ලිපියේ දක්වා තිබූ තවත් කරුණක් වනුයේ මහජන නියෝජිතයන් නොව රජයේ ඉහළ තනතුරුද ද්විත්ව පුරවැසියන් විසින් නොදැරිය යුතු බවයි. මෙම සංශෝධන ඇතුළත් කර නැවත කෙටුම්පත ගැසට් කරන ලෙස එකී ලිපිය මගින් ඉල්ලා තිබිණ.
(http://vfmradio.lk/2020/09/09/%E0%B6%A2%E0%B6%B1%E0%B6%B4%E0%B6%AD%E0%B7%92%E0%B6%A7-%E0%B6%BD%E0%B7%92%E0%B6%B4%E0%B7%92%E0%B6%BA%E0%B6%9A%E0%B7%8A/-2020/11/18) (උපග්‍රන්ථයේ අංක xii)

## 12.3.2. ජාතික විද්වත් භික්ෂු සංසදය

ජාතික විද්වත් භික්ෂු සංසදයේ මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමියන් මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් කියා සිටියේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතේ ඇතැම් ප්‍රතිපාදන පිළිබඳව එකග විය නොහැකි බවයි.හදිසි පනත් ගෙන ඒමේ ප්‍රතිපාදනය, විගණකාධිපතිවරයාගේ විෂය පථය පටු කිරීම, ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුවට පිවිසීමට සහ ජනාධිපති වීමට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම, සහ අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව පිළිබඳ සීමාව ඉවත් කිරීම ගැන තම සංවිධානයට එගඟවිය නොහැකි බව පැවසීය.20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දිනවිය යුතු බවත් එය දිනවිය යුත්තේ ඉහතකී අනවශ්‍ය කොටස් ඉවත් කර බවත් ප්‍රකාශ කරන ලදි.
(https://www.youtube.com/watch?v=orLGlSP1T3U 2020/12/16)

## 12.3.3. සිංහල රාවය ජාතික සංවිධානය

ආණ්ඩුව බලයට පත් කිරිමට සහය දක්වූ පිරිසකගෙන් සමන්විත වූ සිංහල රාවය ජාතික සංවිධානයද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඇතැම් ප්‍රතිපාද වලට විරුද්ධව අදහස් ඉදිරිපත් කරන ලද සංවිධානයකි. එම සංවිධානයේ අක්මීමන දයාරත්න හිමියන් මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් ප්‍රකාශ කළේ ද්විත්ව පුරවැසියකුට පාර්ලිමේන්තුවට ඒමට අවස්ථාව මෙම කෙටුම්පත තුළ ඇතුළත් කර ඇති අතර එය බේදවාචකයක් බවයි.
(https://www.facebook.com/%E0%B7%83%E0%B7%92%E0%B6%82%E0%B7%84%E0%B6%BD-%E0%B6%BB%E0%B7%8F%E0%B7%80%E0%B6%BA-%E0%B6%B8%E0%B7%8F%E0%B6%B0%E0%B7%8A%E0%B6%BA-%E0%B6%85%E0%B6%82%E0%B7%81%E0%B6%BA-554788061270160 (2020/11/18)

## 12.4. විරෝධතාව පළකළ පූජ්‍ය/පූජක පක්ෂය

### 12.4.1. අමරපුර-රාමඤ්ඤ සාමග්‍රී මහා සංඝ සභාව

අමරපුර - රාමඤ්ඤ සාමග්‍රී සංඝ සභාව 2020 ඔක්තෝබර් 12 දින මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ ඇතැම් වගන්ති සම්බන්ධයෙන් සිය විරෝධතාවය දක්වමින් ඒවා සංශෝධනය කරන ලෙස ආණ්ඩුවට අනුශාසනා කරන ලදි. එසේම ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ මහා ලේඛකාධිකාරී පූජ්‍ය පල්ලේ කන්දේ රතනසාර අනුනායක හිමියන් සහ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකායේ මහා ලේඛකාධිකාරී පූජ්‍ය අන්තංගනේ සාසන රතන නායක ස්වාමීන් වහන්සේලාගේ අත්සනින් යුක්තව ජනාධිපතිවරයා වෙත ලිපියක් යොමුකරමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ පහත ප්‍රතිපාදන සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටියහ.

- ඇතැම් රාජ්‍ය ආයතන විගණනයෙන් ඉවත් කිරීම
- අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව පිළිබඳ සීමාව ඉවත් කිරීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීම නිසා රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය අහෝසි වීම
- මැතිවරණ කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම
- ජනාධිපති වෙත පූර්ණ නීති මුක්තියක් හිමි කිරීම
- විගණන කොමිසම අහෝසි කිරීම

(බලන්න උපග්‍රන්ථයේ අංක i)

### 12.4.2. සියම් මහා නිකාය

සියම් නිකායේ මල්වතු පාර්ශ්වයේ ලේඛකාධිකාරී පූජ්‍ය පහමුණේ සුමංගල හිමියන් සිය 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව සිය ස්ථාවරය දක්වමින් මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් ප්‍රකාශ කරන ලද්දේ 20 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ ඇති රටට වැඩදායී ප්‍රතිපාදන ඇතුළත් කරමින් අනෙක් ඒවා එක්කෝ සංශෝධනය කරමින් හෝ ප්‍රතික්ෂේප කරමින් සුබදායී ව්‍යවස්ථාවක් සම්මත කරනු දැකීම සැමදෙනාගේම අපේක්ෂාව බවයි.

සියම් නිකායේ අස්ගිරි පාර්ශ්වයේ ලේඛකාධිකාරී පූජ්‍ය මැදගම ධම්මානන්ද ස්වාමීන් වහන්සේ මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් ප්‍රකාශ කරන ලද්දේ මහජනතාවගේ අදහස් ලබාගනිමින් අගමැතිතුමා පත්කළ කමිටුවේ නිර්දේශවලටත් ඇහුම්කන් දෙමින් යහපත් විදියේ සංශෝධනයක් අනුමත කරගැනීම තම අපේක්ෂාව බවයි. එමෙන්ම දිගු කාලීනව පවත්වාගෙන යා හැකි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කඩිනමින් සම්මත කිරීමේ අවශ්‍යතාව පිළිබඳවද එහිදී අවධාරණය විය. (https://www.youtube.com/watch?v=orLGlSP1T3U -2020/12/16)

### 12.4.3. ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

සාමාජික සහා 11ක අත්සන්වලින් යුක්තව "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය පිළිබඳව ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ප්‍රකාශනය" නමින් ප්‍රකාශනයක් නිකුත් කරමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතැම් ප්‍රතිපාදන සඳහා ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ විරෝධතාවය දක්වා තිබිණි. එකී ලිපිය මගින් පහත 20 වන ව්‍යවස්ථා සංශෝධක කෙටුම්පතේ ප්‍රතිපාදන සමාලෝචනය ලෙස ඉල්ලා තිබිණි.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීම
- විගණන සේවා කොමිෂන් සභාව සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කිරීම
- අමාත්‍ය මණ්ඩලය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට අධික බලයක් ප්‍රදානය කිරීම
- හදිසි පනත් ගෙන ඒම පිළිබඳ ප්‍රතිපාදන

19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි ඇති ප්‍රධාන ආයතනවල ස්වාධීනත්වය සහ වගකීමෙන් යුතු රාජ්‍ය පාලනය ප්‍රවර්ධනය කෙරෙන අංග ආරක්ෂා කරන ලෙසට රජයෙන් ඉල්ලා සිටි ජාතික ක්‍රිස්තියානි සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ප්‍රධාන අරමුණුවලින් එකක් වන්නේ රජයට වඩා ජනතාව ආරක්ෂා කිරීම සහ සවිබල ගැන්වීම වන බැවින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ විවාද කිරීමට පෙර ඒ පිළිබඳව මහජනතාවගේ අදහස් සලකා බැලීමට හැකි වන පරිදි එහි ඇති සියලුම සංශෝධන මහජනතාවට දැන ගැනීමට සලස්වන ලෙසද එකී ලිපිය මගින් ජාතික ක්‍රිස්තියානි සභාව ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටින ලදි. (බලන්න උපග්‍රන්ථයේ අංක vi)

### 12.4.4. කතෝලික රදගුරු සම්මේලනය

2020 ඔක්තෝබර් 13 වන දින "20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත පිළිබඳව ශ්‍රී ලංකා කතෝලික බිෂොප් සම්මේනලයේ අදහස" නැමති නිවේදනය නිකුත් කරමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීම ඇතුළු ප්‍රතිපාදන කිහිපයක් සම්බන්ධයෙන් විරෝධය පලකරන ලදි. ශ්‍රී ලංකා රදගුරු සම්මේලනයේ සභාපති බදුල්ල රදගුරු හිමිපාණන් සහ එම සම්මේලනයේ ලේකම් කොළඹ රදගුරු හිමිපාණන්ගේ අත්සන්වලින් යුක්තව මෙම නිවේදනය නිකුත් කර තිබිණි.

(බලන්න උපග්‍රන්ථයේ අංක v)

## 12.4.5. ඇල්ලේ ගුණවංශ හිමි ඇතුළු භික්ෂූන් වහසේලාගේ එකතුව

2020 ඔක්තෝබර් 15 දින ජනාධිපතිවරයා වෙත පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමි, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි, පූජ්‍ය බෙන්ගමුවේ නාලක හිමි, පූජ්‍ය මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි, පූජ්‍ය මල්වානේ චන්දරතන හිමි, පූජ්‍ය කපුගොල්ලෑවේ ආනන්දකිත්ති හිමි යන ස්වාමීන් වහන්සේලාගේ අත්සනින් යුක්තව ලිපියක් නිකුත් කරමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ ඇතැම් ප්‍රතිපාදන සම්බන්ධව සිය විරෝධය ඉදිරිපත් කරන ලදි. ඒ අනුව

- හදිසි පනත් පිළිබඳ ප්‍රතිපාදන
- අමාත්‍යවරුන් නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ ලේකම්වරුන්ගේ සේවය ආරම්භ කිරීමේ දිවුරුමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 7 වන උපලේඛනයේ සඳහන් දිවුරුම ඉවත් කිරීම (ශ්‍රී ලංකාව තුල වෙනම රාජ්‍යයක් බිහිකිරීමට ආධාර අනුබල නොදෙන බවට)
- ද්විත්ව පුරුවැසිභාවය සහිත පුද්ගලයකුට ජනාධිපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්වීමට අවස්ථාව සලසා දීම
- රාජ්‍ය ආයතන රැසක් විගණකාධිපතිගේ අධීක්ෂණයෙන් ඉවත් කිරීම
- ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් පත් කිරීමේදී ජනාධිපතිවරයාට අසීමිත බලයක් ලබාදීම
- විධාන සහ උපමාන කඩකරන රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව නඩු පැවරීමට මැතිවරණ කොමිසම ලබාදී තිබූ බලතල ඉවත් කිරීම
- අමාත්‍යවරුන්ගේ සාමාජික සංඛ්‍යාව පිළිබඳ සීමාව ඉවත් කිරීම

මෙම ලිපියේ පිටපත් ත්‍රෛනිකායික මහානායක ස්වාමීන් වහන්සේලා වෙත, සෙසු ආගමික නායකතුමන්ලා වෙත, අගමැතිවරයා වෙත, පාර්ලිමේන්තුවේ කථානායකවරයා වෙත සහ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා වෙත යොමුකර තිබිණි. (බලන්න උපග්‍රන්තයේ අංක iv)

## 12.4.6. හෙළ බොදු සවිය

බෞද්ධ සංවිධානයක් වන හෙළබොදු සවිය සංවිධානයද ජනාධිපතිවරයා වෙත ලිපියක් යොමු කරමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත සම්බන්ධයෙන් ශාසනික හා සමාජ මෙහෙවරේ විවිධාකාරයෙන් නිරත වී සිටින භික්ෂූන් වහන්සේලාගේද අගරදගුරු මණ්ඩලයේද සිවිල් සංවිධානවලද අප්‍රසාදය පළකර ඇති හෙයින් එකී විරෝධතා කෙරෙහි අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටියේය. හෙළ බොදු සිවිය සංවිධානයේ අනුශාසක ඕමල්පේ සෝභිත හිමියන්ගේ අත්සනින් මෙම ලිපිය නිකුත් කර ඇත. (උපග්‍රන්ථයේ අංක iii)

### 12.4.7. බුද්ධ ශාසන කාර්ය සාධක මණ්ඩලය

බුද්ධ ශාසන කාර්ය සාධක මණ්ඩලයද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට විරෝධය දක්වන ලද තවත් සංවිධානයකි. එම සංවිධානය වෙනුවෙන් ඉත්තෑපානේ ධර්මාලංකාර නායක ස්වාමීන් වහන්සේ සභාපති දිවියාගහ යසස්සි හිමියන් ඇතුළු ස්වාමීන් වහන්සේලා 11 සහ විද්වතුන් 19 ක් ජනාධිපති වෙත ලිපියක් ඉදිරිපත් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිදු නොකර නව ව්‍යවස්ථාවක් ගෙන එන ලෙස ඉල්ලා සිටියි සියල්ල නිවැරදි කරන අලුත් ව්‍යවස්ථාවක් වහා ගෙන ආ යුතුව ඇත. ඊට අදාළ කාර්ය පසුවට කල් තබා ඊට පළමුව 19 වැනි සංශෝධනය පමණක් නිවැරදි කිරීම ප්‍රමාණවත් නොවන අතර, අනෙකුත් සංශෝධනද කඩිනමින් කළ යුතුය. එසේ නොකළහොත් එය රජයට ලැබී ඇති ජනවරමට එදිරිවීමකි.බහුතර ජනතාව තුනෙන් දෙකක විශිෂ්ට ජනවරමක් රජයට ලබාදී ඇත්තේ ශ්‍රී ලංකාවේ ජනතාවට හා ඒකීයභාවයට විරුද්ධව විවිධ විජාතික බලවේගවල මැදිහත් වීමෙන් ගෙන එනු ලැබ ඇති භයානක විධිවිධාන වහා නිවැරදි කිරීමටය. එය සිදු නොකොට පසුවට කල් දැමීම ජනතාවට කරන බලවත් අසාධාරණයකි. එබැවින් 19 වැනි සංශෝධනය පළමුව සිදු කොට, ඊටත් වඩා වැදගත් සංශෝධනයන් පසුව සිදු කිරීම පිළිබඳව ඉදිරිපත් කර ඇති අදහස් රජය ක්‍රියාත්මක නොකළ යුතු බව අපගේ අදහස වන බවයි. ඒ අනුව 19 වන ව්‍යවස්ථා සංශෝධනය පමණක් නොව 13 හා 16 ව්‍යවස්ථාද ඉවත් කරන නව ව්‍යවස්ථාවක් ගෙන ආයුතු බව එම සංවිධානයේ අදහසයි.

(බලන්න උපග්‍රන්ථයේ අංක ii)

## 12.5. විරෝධතාවය පළකළ වෘත්තීය සමිති

### 12.5.1. විස්සට එරෙහි වෘත්තීය සමිති ව්‍යාපාරය

ලංකා වෙළෙඳ කාර්මික හා පොදු සේවක සංගමය, එක්සත් කම්කරු සම්මේලනය, ලංකා ගුරු සංගමය, සමස්ත ලංකා රාජ්‍ය කළමනාකරණ නිලධාරී සංගමය, තැපැල් ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානය, සෞඛ්‍ය වෘත්තීය වේදීන්ගේ විද්වත් සංගමය, ලංකා වෘත්තීය සමිති සම්මේලනය යන වෘත්තීය සමිතිවලින් සමන්විත වූ විස්සට එරෙහි වෘත්තීය සමිති ව්‍යාපාරයේ සටහන් පාඨය වූයේ “සංශෝධන සහිතවත් 20 එපා” යන්නයි, ඒ අනුව ඔවුන් පොස්ටර් ව්‍යාපාර සහ විරෝධතා දැක්වීම් මගින් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සියලු ප්‍රතිපාදනවලට විරෝධය දක්වන ලදි. මෙම කණ්ඩායම මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන් නායකත්වය දුන් වෘත්තීය සමිති සමගද ඒකාබද්ධ මාධ්‍ය සාකච්ඡා පවත්වන ලද අතර ජනාධිපති වෙත ලිපියක්ද නිකුත් කරන ලදි (බලන්න උපග්‍රන්ථයේ අංක xv)

එසේම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව පාර්ලිමේන්තු විවාදය ආරම්භකරන ලද ඔක්තෝබර් 20 වන දින පාර්ලිමේන්තුව අසළ විරෝධතාවක්ද සංවිධානය කරන ලදි.

## 12.5.2. ශ්‍රී ලංකා විගණන සේවා සංගමය

ශ්‍රී ලංකා විගණන සේවා සංගමය විසින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවතින ප්‍රතිපාදන දෙකක් සම්බන්ධයේ සිය විරෝධතාවය පළකරන ලදි. එනම් විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කිරීම සහ විගණකාධිපතිගේ විෂය පථය සහ බලතල අඩු කිරීම සම්බන්ධයෙන් මෙම වෘත්තීය සමිතිය සිය විරෝධතාවය දක්වන ලදි. ඔවුන් විසින් මේ සම්බන්ධව සිය විරෝධතාව මල්වතු සහ අස්ගිරි නායක හිමිවරුන් හමුවී දක්වන ලද අතර මාධ්‍ය සාකච්ඡාද පවත්වන ලදි. එසේම ජනාධිපතිවරයා හමුවී මේ පිළිබඳව සාකච්ඡා කරතිබේ (http://www.themorning.lk/sri-lanka-audit-service-association-discussion-on-20a-with-president/ 2020/11/19) එසේම 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය ප්‍රශ්න කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්ද ඉදිරිපත් කරන ලදි ( නඩු අංකය SC SD 34/2020)

## 12.5.3. ශ්‍රී ලංකා විගණන සේවා පරීක්ෂක සේවා සංගමය

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඇතැම් වගන්ති මගින් රාජ්‍ය විගණනයට ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වන බැවින් ඒවා සංශෝධනය කරන ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකා විගණන පරීක්ෂකවරුන්ගේ සංගමය සංශෝධන මගින් මහජනතාවට රටේ සමස්ත මූල්‍ය පාලනය පිළිබඳ දැනගැනීමට ඇති ශුද්ධ වූ අයිතියද අහිමිකර ඇතැයි එම සංගමය යවා ඇති ලිපියෙන් පෙන්වාදී ඇත.

ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව මගින් විගණනයට භාජනය කිරීම සඳහා විණකාධිපතිවරයා වෙත පවරා තිබූ රාජ්‍ය අයවැයෙන් මුදල් වෙන්වන හා පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනයට යටත් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක කොමිෂන් සභා, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්ගේ කාර්යාල විෂය පථයෙන් ඉවත් කර තිබීමද ගැටලු සහගත යැයි එහි සඳහන් වෙයි.

එමෙන්ම සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති කොටස් ප්‍රාග්ධනයෙන් 50% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථා හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරන සමාගම්ද විගණන විෂය පථයෙන් ඉවත්කර ඇතැයිද

රාජ්‍ය මූල්‍ය පාර්ලිමේන්තු පාලනයෙන් මුළුමනින් බැහැර වීමට මේ තත්ත්වය හේතු වන බවද එම ලිපියේ සඳහන් වේ.

50% වැඩි කොටස් හිමිකමක් ඇති රාජ්‍ය සමාගම් පිළිබඳ විගණනය විගණකාධිපති විෂය පථයෙන් බැහැර කිරීම හේතුවෙන් "සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළෙහි ප්‍රතිපත්තිවලට අනුකූලව එකී සමාගම් ක්‍රියාත්මක වන්නේදැයි බැලීමට හැකි යන්ත්‍රණය බිඳ වැටෙන බව එම ලිපිය මගින් පෙන්වා දෙන අතර, සමහර සමාගම් මේ යෝජනා ඉදිරිපත් වීමත් සමග රාජ්‍ය විගණන යන්ත්‍රණයෙන් ඉවත් වීමට පිඹුරුපත් සකසමින් සිටින බව වාර්තා වී ඇතැයිද සඳහන් කර ඇත.

මෙකී සංශෝධන මගින් විගණකාධිපතිවරයා රාජ්‍ය නිලධාරියෙක් බවට පත් කරමින් ඔහුගේ ස්වාධීනත්වයට බරපතල ලෙස හානිකර ඇති බවත් එහි පැවැසේ.
http://www.lankadeepa.lk/latest_news/%E0%B7%80%E0%B7%92%E0%B6%9C%E0%B6%AB%E0%B6%B1-%E0%B6%B1%E0%B7%92%E0%B6%BD%E0%B6%B0%E0%B6%BB%E0%B6%BA%E0%B7%9D-%E0%B6%A2%E0%B6%B1%E0%B6%B4%E0%B6%AD%E0%B7%92%E0%B6%A7-%E0%B6%BD%E0%B7%92%E0%B6%BA%E0%B6%AD%E0%B7%92/1-578625

## 12.6. විරෝධතාවය පළකළ සිවිල් සංවිධාන

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකළ අවස්ථාවේ සිටම ජාතික මෙන්ම ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වන බොහෝ සිවිල් සංවිධාන විසින් එකී කෙටුම්පතේ ඇතැම් ප්‍රතිපාදන සම්බන්ධයෙන් සිය විවේචන මතු කරන ලදි. මාධ්‍ය නිවේදන, නිහඬ විරෝධතා, මාර්ගගත පෙත්සම්, මාධ්‍ය සාකච්ඡා, සම්මන්ත්‍රණ මෙන්ම පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව නඩු පැවරීම් මගින්ද ඔවුන් සිය විරෝධතා දක්වන ලදි. මේ අතරින් ජනමාධ්‍ය ඔස්සේ වඩාත් ප්‍රකට වූ සිවිල් සංවිධාන කිහිපයක් සිය විවේචන එල්ල කළ පදනම පිළිබඳව පහත පළ වේ,

### 12.6.1. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

මාධ්‍ය නිදහස සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳව කටයුතු කරන සිවිල් සංවිධානයක් වන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අගමැතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන් වෙත ලිපියක් යොමුකරමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පවතින කරුණු කිහිපයක් පිළිබඳව අවධාරණය කරන ලදි.

විශේෂයෙන්ම කොමිෂන් සභා ස්වාධීන බවින් මිදීම, ජනාධිපති වෙත සුවිශේෂී බලතල කෙන්ද්‍රගතවීම හදිසි පනත් සම්මත කිරීම ආදි ප්‍රතිපාදන පිළිබඳව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විවේචනය කරන ලදි. (බලන්න උපග්‍රන්තයේ අංක xvi) මෙම ලිපිය යැවීමට පෙර එය මාර්ගත පෙත්සමක් ලෙස සකස්කර අත්සන් සඳහා විවෘත කළ අතර ලිපිය මන්ත්‍රීවරුන් වෙත යොමුකරන අවස්ථාව වන විට අත්සන් 111ක් ලැබී තිබිණි.

එයට අමතරව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය විසින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳව විවෘත සංවාදයක්ද පැවැත්වූ අතර එහිදීද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි වීම, කොමිෂන් සභාවල ස්වාධීනත්වය අහිමි වීම, ජනාධිපති වටා විශාල බලයක් ඒකරාශී වීම, හදිසි පනත් ගෙනඒම, රාජ්‍ය විගණනයට සිදුකරන බාධා ආදිය පිළිබඳව විවේචනය කරන ලදි.
(https://www.fmmsrilanka.lk/thirty-sections-of-the-20th-amendment-to-the-constitution-are-against-democracy-and-freedom-of-expression-ermiza-tegal-attorney-at-law/ 2020/12/04)

## 12.6.2. මාධ්‍ය කර්මාන්තය නියෝජනය කරන සංවිධාන

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, ශ්‍රී ලංකා පුවත්පත් හිමිකරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය, මුස්ලිම් මාධ්‍ය සංසදය, දෙමළ මාධ්‍ය සන්ධානය, දකුණු ආසියානු නිදහස් මාධ්‍ය සංගමය- ශ්‍රී ලංකා පාර්ශ්වය යන සංවිධාන විසින් “20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් මාධ්‍ය කර්මාන්තය නියෝජනය කරන සංවිධානවල අවධානය” නමින් ඒකාබද්ධ මාධ්‍ය නිවේදනයක් නිකුත් කරන ලදි. මැතිවරණ සමයේදී මාධ්‍ය නියාමනය සම්බන්ධව කෙටුම්පතේ පවතින ප්‍රතිපාදන, සිවිල් පුරවැසියන් නියෝජනය නොකරන පාර්ලිමේන්තු සභාව, කොමිෂන් සභා ස්වාධීන නොවීම සහ හදිසි පනත් ගෙන ඒම පිළිබඳව ප්‍රතිපාදන ගැන මෙම මාධ්‍ය නිවේදනය මගින් විවේචනය කරන ලදි (බලන්න උපග්‍රන්තයේ අංක xvii) එසේම මෙම ඒකාබද්ධ මාධ්‍ය නිවේදනයට අත්සත් කළ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව අභියෝග කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්ද ගොනු කරන ලදි (SC SD 22/2020)

## 12.6.3. සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය

2015 ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ ජයග්‍රහණය වෙනුවෙන් කටයුතු කළ ප්‍රමුඛ සංවිධානයක් වන සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරයද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඇතැම් විධිවිධාන පිළිබඳව සිය විරෝධය දක්වන ලදි. මාර්ගගත පෙත්සමක් ඉදිරිපත් කරමින් ඔවුන් මූලිකව දක්වා සිටියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීම ජනාධිපතිගේ බලය වැඩි කිරීම, ප්‍රසම්පාදන සහ විගණන සේවා කොමිෂන් සභා අහෝසි කිරීම, ඇතැම් ආයතන විගණකාධිපතිගෙන් ඉවත් කිරීම, ජනාධිපති විනිර්මුක්තිය පුළුල් කිරීම සහ ද්විත්ව පුරවැසිභාවය පිළිබඳව ප්‍රතිපාදන ඉතා අයහපත් ලෙස රටට බලපාන බවයි, (බලන්න උපග්‍රන්තයේ අංක xvii) එසේම මාධ්‍ය සාකච්ඡා කිහිපයක්ම පවත්වමින්ද සිය විරෝධය දැක්වූ මෙම සංවිධානය සියම් මහ නිකායේ මල්වතු සහ අස්ගිරි පාර්ශවයන්ගේ මහා සංඝනායකවරුන් මෙන්ම අමරපුර සහ රාමඤ්ඤ මහානිකායන්ගේ මහා නාහිමිවරුන්ද හමුවී කරුණු පැහැදිලි  කරන ලදි.

එසේම විපක්ෂයේ සියලුම පක්ෂ එකතු කරමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව ඒකාබද්ධ මාධ්‍ය සාකච්ඡාවක්ද ඔවුහු සංවිධානය කළහ.

## 12.6.4. මාර්තු 12 ව්‍යාපාරය

ප්‍රජාතන්ත්‍රවාදය සහ පිරිසිදු දේශපාලනයක්  වෙනුවෙන් කටයුතු කරන සිවිල් සංවිධාන ගණනාවකින් සමන්විත මාර්තු 12 ව්‍යාපාරය මාධ්‍ය හමුවක් පවත්වමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ ඇතැම් ප්‍රතිපාදන විවේචනය කරන ලදි. එහිදී ඔවුන් ප්‍රකාශ කරන ලද්දේ.

විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එහි වත්මන් ස්වරූපයෙන් සම්මත වුවහොත් මෙරටේ චිරාත් කලක් ස්ථාපිතව පැවති පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය මෙන්ම ජනතා පරමාධිපත්‍ය හා සබැඳි මාහැඟි පුරවැසි අභිමානය බිඳ වැටෙනු ඇති බවත් පර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක රටක නිරායාසයෙන් පැවතිය යුතු යහලක්ෂණයක් සේ සැලකිය හැකි සංවරණ හා තුලන පාලන රටාව බිඳ වැටෙනු ඇති බවත්ය. එමෙන්ම රාජ්‍ය මූල්‍ය අධීක්ෂණභිලා පාර්ලිමේන්තුව සතු පරම බලයද ගිලිහී යනු  ඇති බවත්ය. එසේම 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පරිපූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් නොවුණත් එමගින් ආරම්භ කරන ලද නවමු ප්‍රවේශ සම්පූර්ණයෙන් බිඳ දමා එක් පුද්ගලයකු වටා බලය කේන්ද්‍රගත කිරීම පිළිගත නොහැකි බව ප්‍රකාශ විය.

එසේම ඔවුන්ගේ ඉල්ලීමක් වූයේ මෙම කෙටුම්පතට ඡන්දය දීමට පෙර දෙවරක් සිතා බලන ලෙසයි. එසේම මෙම පනත් කෙටුම්පත පිළිබඳව පාර්ලිමේන්තු ඡන්ද විමසීමේදී වගන්තියෙන් වගන්තිය රහස් ඡන්දයක් පවත්වන ලෙසත් ඔවුන් ඉල්ලා සිටින ලදි. (http://vivaranews.com/archives/40258?fbclid=IwAR3 KPfWklq3NWFGUxSEpGi30HEyyMUiJ9NxufD1uIuMOXsWLATiKTZDMtws -2020/ 12/05)

මේ හැරුණ විට ප්‍රගතිශීලී ගොවි සංවිධානය ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය දාබිදු සාමූහිකය ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය යන සංවිධාන, ද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ව්‍යවස්ථානුකූලභාවය ප්‍රශ්න කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනුකර තිබිණි (SC SD 35/2020)
මේ හැරුණ විට 19 සුරකිමු යනුවෙන් නව සංවිධානයක්ද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට එරෙහිව සංවිධානය විය.

## 12.7. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත විවේචනය කළ වෘත්තීය සංවිධාන

### 12.7.1. ශ්‍රී ලංකා නීතිඥ සංගමය

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව එකී කෙටුම්පත පිළිබඳව විමසා බලා නීතිඥ සංගමය වෙත වාර්තා කිරීම පිණිස නීතිඥ සංගමය විසින් ජ්‍යෙෂ්ඨ නීතිඥයන් 17 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලදි. එකී කමිටුවේ සාමාජිකයන් වූයේ ජනාධිපති නීතිඥ නිහාල් ජයමාන්න, ජනාධිපති නීතිඥ ඉක්රාම් මොහොමඩ්,ජනාධිපති නීතිඥ එම්.එම් සුහයිර්,ජනාධිපති නීතිඥ එල්.එම්.කේ අරුලානන්දම්,ජනාධිපති නීතිඥ ප්‍රසන්න ලාල් ද අල්විස්, ජනාධිපති නීතිඥ නිහාල් ජයමාන්න, ජනාධිපති නීතිඥ නලින් ලද්දුවහෙට්ටි, ජනාධිපති නීතිඥ මෛත්‍රි වික්‍රමසිංහ, ජනාධිපති නිතිඥ උදිත ඉහළහේවා, ජනාධිපති නීතිඥ අනුර මැද්දෙගොඩ, ජනාධිපති නීතිඥ මොහාන් වීරකෝන්, ජනාධිපති නීතිඥ එස්.ටී. ජයනාග, ජනාධිපති නීතිඥ ප්‍රියාල් විජයවීර, ජනාධිපති නීතිඥ මයුරපාද ගුණවංශ, ජනාධිපති නීතිඥ ජගත් වික්‍රමසිංහ, ජනාධිපති නීතිඥ රවී අල්ගම යන ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන්ය. මෙම කමිටුවේ කැඳවුම්කරු ලෙස නීතිඥ ශාන්ත ජයවර්ධන කටයුතු කළේය.

සැසිවාර කිහිපයකින් පසුව කමිටුව විසින් සකස් කරන ලද වාර්තාව සැප්තැම්බර් 21 වන දින නීතිඥ සංගමයට භාරදෙන ලදි.
මෙම වාර්තාව මගින් අවධාරණය කරන ලද කරුණු අතර

- විනිසුරුවන් සහ නීතිපතිවරයා පත්කිරීම ඇතුළු අධිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ කරුණු පිළිබඳව එම කමිටුවේ නිගමනය වී තිබෙන්නේ එමගින් තුලන හා සංවරණ ක්‍රමවේදය යටපත් වන බවය.
- විශේෂයෙන්ම රජයේ එක් අංශයකට තවත් අංශයක සංයුතිය සම්බන්ධයෙන් අධිකාරි බලයක් තිබිය නොහැකි බව පෙන්වාදෙන කමිටු වාර්තාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වෙනි ව්‍යවස්ථාව ප්‍රකාර විනිසුරුවන්, අධිකරණ සේවා කොමිසම සහ නීතිපතිවරයා පත්කිරීමේ බලය විධායකයට හිමිවිය යුතු නැති බව අවධාරණය කරයි.
- කිසියම් ලෙසකින් ආණ්ඩුවේ එක් අංශයකට එවැනි බලයක් තිබෙන්නේ නම් එම බලය හිමිවිය යුත්තේ ජනාධිපතිවරයාට නොව පාර්ලිමේන්තුවටය.
- කමිටුව යෝජනා කරන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණයට සහ අභියාචනාධිකරණයට විනිසුරුවන් පත්කිරීමේදී ජනාධිපතිවරයා සිය නාම යෝජනා පාර්ලිමේන්තු සභාවට ඉදිරිපත් කළ යුතු අතර, පාර්ලිමේන්තු සභාව අනුමත කරන පුද්ගලයන් ජනාධිපතිවරයා විසින් අදාළ තනතුරුවලට පත්කරනු ලැබිය යුතු බවය. (බලන්න උපග්‍රන්ථයේ අංක-XIV)

( https://www.bbc.com/sinhala/sri-lanka-54295428 -2020/11/20)

එසේම ව්‍යවස්ථා කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්ද ඉදිරිපත් කර තිබිණි (නඩු අංකය SC SD 27/2020)

## 12.7.2. ජනතා නීතිඥයෝ

නීතිඥ එකතුවක් වූ ජනතා නීතිඥයෝ සංවිධානය ව්‍යවස්ථා සංශෝධන ගැසට් පත්‍රයේ පළකළ පසුව මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා එයට විරෝධය පළකළ අතර එහි සාමාජිකයන් 20කගේ නම්වලින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලදි. (නඩු අංකය SC SD 36/2020)

## 12.7.3. තරුණ නීතිඥයෝ සංවිධානය

තරුණ නීතිඥයන්ගේ සංවිධානයද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ යම් ප්‍රතිපාදනයවලට එරෙහිව අදහස් ප්‍රකාශ කර ඇති අතර එකී සංවිධානයේ විධායක කමිටු සාමාජිකයන් මෙම කෙටුම්පතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය

පිළිබඳව ප්‍රශ්න කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරන ලදි ( SC SD 15/2020)

### 12.7.4. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නීති එකමුතුව

නීතිඥයින්ගෙන් සමන්විත වූ සංවිධානයක් වන ප්‍රජතන්ත්‍රවාදය සදහා නීති එකමුතුව විසින්ද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව අදහස් දක්වන ලදි. රැස්වීම් සහ මාධ්‍ය සාකච්ඡා පවත්න ලදි.
(https://www.youtube.com/watch?v=VESvzmkg2-g 2020/12/16)

## 12.8. විරෝධය පළකළ විපක්ෂයේ දේශපාලන පක්ෂ

ප්‍රධාන විපක්ෂය වූ සමගි ජනබලවේගය සහ එහි හවුල්කාර පක්ෂ සියල්ලම ( ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ, ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය, ජාතික කම්කරු සංගමය, සමස්ත ලංකා මක්කල් කොංග්‍රසය වැනි පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් සහිත පක්ෂද ඇතුළුව) 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් සිය විරෝධය දක්වන ලදි. මාධ්‍ය සාකච්ඡා පවත්වමින්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කරමින්ද සිය විරෝධය ඉදිරිපත් කරන ලදි.

ජනතා විමුක්ති පෙරමුණද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට දැඩි විරෝධතාවක් එල්ල කළ අතර ඔවුන් ඒ සම්බන්ධව ප්‍රවෘත්ති සාකච්ඡා පවත්වමින් විරෝධතාවය දක්වන ලදි.

එසේම එක්සත් ජාතික පක්ෂය විසින්ද මාධ්‍ය නිවේදන නිකුත් කරමින් 20 වන ව්‍යවස්ථා සංශෝධනයට සිය විරෝධතාව දක්වන ලදි. එසේම එහි ලේකම් අකිල කාරියවසම්, 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය ප්‍රශ්න කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්ද ඉදිරිපත් කරන ලදි ( SC SD 25/2020) අකිල ඉලංගෙයි තමිල් අරසු කච්චු පක්ෂයද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සිය විරෝධය දැක්වූ අතර එහි නායක පාර්ලිමේන්තු මන්ත්‍රි ආර්. සම්බන්ධන් විසින් 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය ප්‍රශ්න කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්ද ඉදිරිපත් කරන ලදි (SC SD 04/2020) මෙම විරෝධතාවල ප්‍රධාන කරුණු වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීම, ද්විත්ව පුරවැසිභාවය පිළිබඳව ප්‍රතිපාදන, විගණන කොමිසම අහෝසි කිරීම සහ රාජ්‍ය විගණනය දුර්වල කිරීම, හදිසි පනත් ගෙන ඒමේ ප්‍රතිපාදන ඇතුළත් කිරීම අධිකරණයට සිදුකරන බලපෑම් සහ ජනාධිපතිගේ වගකීම් අඩු කිරීම සහ බලතල වැඩි කිරීම පිළිබඳවයි.

පෙරටුගාමී සමාජවාදී පක්ෂය විසින්ද මාධ්‍ය සාකච්ඡා පවත්වමින් මෙම කෙටුම්පතට විරෝධය දක්වන ලදි

## 12.9. විවේචන එල්ල කළ ජාත්‍යන්තර සංවිධාන

පොදු රාජ්‍ය මණ්ඩලීය මහේස්ත්‍රාත්වරුන්ගේ සහ විනිසුරුවරුන්ගේ සංසදය (CMJA), පොදු රාජ්‍ය මණ්ඩලීය නීති අධ්‍යාපන සංසදය (CLEA), පොදු රාජ්‍ය මණ්ඩලීය නීතිඥ සංසදය (CLA), පොදු රාජ්‍ය මණ්ඩලීය මාධ්‍යවේදීන්ගේ සංසදය (CJA) සහ විනිසුරුවන් වෙනුවෙන් විනිසුරුවෝ (Judges for Judges) යන සංවිධාන විසින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කරන ලදි. මෙම ව්‍යවස්ථා සංශෝධනය මගින් ශ්‍රී ලංකාවේ අධිකරණයේ ස්වාධීනත්වයට එල්ලවිය හැකි බලපෑම පිළිබඳව බරපතල අවධානය පළ කර තිබිණ.

කෙටුම්පත මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107, 109 සහ 111 සම්බන්ධයෙන් සිදුකරන සංශෝධන මගින් ජ්‍යෙෂ්ඨ විනිසුරුවරුන් පත් කිරීමේදී ජනාධිපතිවරයාගේ අභිමතය සුදුසු නොවන බව පවසන එම සංවිධාන අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව එක්සත් ජාතීන්ගේ මූලධර්ම සහ පොදුරාජ්‍ය මණ්ඩලයේ ප්‍රඥප්තිය සහ බලබෙදීමේ මූලධර්මයේ සාරය රජය සැලකිලිමත්ව මෙම සංශෝධන අනුමත කිරීමට උනන්දුවන ලෙස ශ්‍රී ලංකාවේ විධායකයෙන් සහ ව්‍යවස්ථාදායකයෙන් ඉල්ලා සිටින ලදි. (බලන්න උපග්‍රන්ථයේ අංක-XIX)
(https://www.commonwealthlawyers.com/wp-content/uploads/2020/09/CMJA-CLEA-CLA-CJA-Rechters-voor-Rechters-Statement-on-Sri-Lanka-22092020.pdf - 2020/12/02)

# දහතුන්වන පරිච්ඡේදය

## විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකරන අවස්ථාවේදී සිටම පනත් කෙටුම්පත සම්බන්ධව විරෝධතා එල්ල වුවද එකී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කිරීමට අවස්ථාව ලැබෙන්නේ එය පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළු කළ පසුවය. මෙම අවස්ථාවේදී අදාළ කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලභාවය පිළිබඳව අභියෝග කළ හැකිය. නමුත් එම ප්‍රතිපාදන ජනතාවාදීද නැද්ද යන්න මෙම පෙත්සම් විභාගයේදී සිදු නොවේ. නමුත් පනත් කෙටුම්පතට විරෝධය දක්වන ලද බොහෝ කණ්ඩායම් මෙවැනි අවස්ථාවකදී එයට විරෝධතාවය දැක්වීමේ එක් ක්‍රමවේදයක් ලෙසද පනත් කෙටුම්පත් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ඉතිහාසයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් වැඩිම පෙත්සම් ගණනක් ඉදිරිපත් වූයේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙනි. අධිකරණය හමුවේ පෙත්සම් ඉදිරිපත් කරන ලද පාර්ශ්ව සම්බන්ධයෙන්ද පෙත්සම් විභාගය සහ අධිකරණයේ තීරණය සම්බන්ධයෙන්ද විස්තරයක් සිදුකිරීම මෙම පරිච්ඡේදයෙන් සිදුවේ.

## 13.1. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පිලිබද ශ්‍රේෂ්ඨාධිකණ තීරණය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව අනුව පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව පරීක්ෂා කිරීමේ බලය පවතින්නේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙතය. 121(1) ව්‍යවස්ථාවට අනුව පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වී දින 7ක් තුළ ඕනෑම පුරවැසියකුට මෙම ව්‍යවස්ථාව යටතේ යටතේ පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ හැකිය. එහිදී අදාළ පනත් කෙටුම්පතේ යම් ප්‍රතිපාදනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84 ව්‍යවස්ථාව අනුව විශේෂ (2/3 ක ඡන්දයෙන්) සම්මත විය යුතුද එයට අමතරව එකී පනත් කෙටුම්පත (හෝ එහි යම් වගන්තියක් ) සම්මත වීම සඳහා ඉහත කී පාර්ලිමේන්තුවේ විශේෂිත ඡන්දයකට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාවේ සඳහන්වන ජනමත විචාරණයකින්ද සම්මත විය යුතුද යන්න තීරණය කරනු ලබයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(3) ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ජනාධිපති වෙත සහ කථානායකවරයා වෙත රහසිගතව යොමු කරනු ලබයි. කථානායක වෙත ලැබෙන ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ කථානායක විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අතර එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන දිනයේ හැන්සාර්ඩ් වාර්තාවට ඇතුළු කරනු ලැබේ.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත පළමුවර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද්දේ 2020 සැප්තැම්බර් 22 දිනය. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් 38ක් ඉදිරිපත් වී තිබිණි. එසේම මෙම පෙත්සම් සඳහා ඇතුළත්වන පාර්ශ්ව 9 ක් විය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්. සිවිල් ක්‍රියාකාරීන්. වෘත්තීය සමිති නායකයින්. නීතඥයන්, ශ්‍රී ලංකා නීතිඥ සංගමය සහ වෙනත් නීතිඥ සංවිධාන, සිවිල් සංවිධාන ආදී විවිධ පාර්ශ්වලින් මෙම පෙත්සම්කරුවන් සමන්විත විය. එසේම විශේෂිතම සිදුවීමක් වූයේ මැතිවරණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරයකු වන රත්නජීවන් හූල් කොමසාරිස්වරයාද මෙහි පෙත්සම්කරුවෙකු වීමයි. එසේම එක් පෙත්සමක නීතඥයන් 20ක්" පෙත්සම්කරුවන් වී "විස්සට එරෙහිව නිතිඥයින් 20ක් ලෙස සංකේතාත්මක විරෝධාවක්ද සමග ඉදිරිපත් විය.

## 13.2. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පෙත්සම් විභාගය

අගවිනිසුරු ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය,ජනාධිපති නීතිඥ බී.පී.අලුවිහාරේ. සිසිර ද ආබෲ, ජනාධිපති නීතිඥ ප්‍රියන්ත ජයවර්ධන, ජනාධිපති

නීතිඥ විජිත් කේ. මලල්ගොඩ යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසින් මෙම පෙත්සම් විභාග කරන ලදි.

පෙත්සම් විභාගය සැප්තැම්බර් 29, 30 සහ ඔක්තෝබර් 2,5 දිනවලදී පවත්වන ලදි.
පෙත්සම් විභාගය ආරම්භයේදීම නීතිපතිවරයා කරුණු ඉදිරිපත් කරමින් රජය විසින් මෙම ව්‍යවස්ථා කෙටුම්පතට පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී සංශෝධන රැසක් කිරීමට අදහස් කරන බව ප්‍රකාශ කරමින් එම යෝජිත සංශෝධන පිළිබඳව ලේඛනයක් අධිකරණයට ඉදිරිපත් කරන ලදි. එකී ලේඛනය අනුව කාරක සභා අවස්ථාවේදී සිදුකිරීමට අපේක්ෂා කරන ලද සංශෝධන පිළිබඳ ලේඛන පරීක්ෂා කරන විට කෙටුම්පතේ 3, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15, 17, 19, 21, 22, 24, 25, 26, 31, 40, 41, 42, 43, 45, 53ඃ 56, 57 යන සමස්ත වගන්ති ගණන වූ වගන්ති 58න් වගන්ති 28ක් සම්බන්ධයෙන් කාරක සභා අවස්ථාවේදී සංශෝධන සිදුකිරිමට ආණ්ඩුව විසින් අපේක්ෂා කරන ලදී.

නමුත් පෙත්සම්කරුවන් අධිකරණයෙන් ඉල්ලා සිටියේ නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජිත සංශෝධන සම්බන්ධයෙන් නොව ගැසට් පත්‍රයේ පළකරන ලද ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ ප්‍රතිපාදන අනුව තමන් මෙම පෙත්සම් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනු ලබන බවයි. ඒ අනුව පෙත්සම්කරුවන් විසින් සිය පෙත්සම් මගින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පනත් කෙටුම්පතේ පහත වගන්ති පිළිබඳව විමසා බැලීම සිදුකරන ලදි.

- 3 වන වගන්තිය (ජනාධිපතිගේ කාර්යය)
- 5 වන වගන්තිය( ජනාධිපති මුක්තිය
- 6 වන වගන්තිය (පාර්ලිමේන්තු සභාව)
- 7 වන වගනත්තිය (විධායකය)
- 15 සහ 27 වගන්ති (පනත් කෙටුම්පත් ගැසට් කිරීමේ කාලය සහ හදිසි පනත්)
- 16 වන වගන්තිය ( පාර්ලිමේන්තුවේ සම්මත නොවූ කෙටුම්පත් ජනමත විචාරණයට ලක් කිරීම)
- 14 වන වගන්තිය (පාර්ලිමේන්තුව විසුරුවාහැරීම)
- 17 (4) වගන්තිය (ද්විත්ව පුරවැසිභාවය)
- 20(3) වගන්තිය ( මාධ්‍ය උපමාන)
- 22 වගන්තිය ( මැතිවරණ කොමිසන් සභාවේ නියම පිළිපැදීමට අසමත් වීම)
- 31,32සිට 39 සහ 40 (විගණකාධිපති)

මෙම වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82 ව්‍යවස්ථාවට අනුව 2/3 ක විශේෂ බහුතර ඡන්දයකින් සම්මත වීම පමණක් සෑහේද නැතහොත් ජනමත විචාරණයක් මගින් සම්මත විය යුතුදැයි දිර්ඝ ලෙස පරීක්ෂාවට ලක්විය. පසුව අනෙකුත් වගන්ති සම්බන්ධයෙන්ද සලකා බැලීමක් සිදුකරන ලදි.

## 13.3. ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

නඩු විභාගය අවසානයේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය සියලුම විනිසුරුවරුන්ගේ ඒකමතික තීරණයක් ලෙස ජනාධිපති සහ කථානායක වෙත යොමුකරන ලදි. එකී තින්දුවට අනුව

- සමස්තයක් ලෙස 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82(1) වන ව්‍යවස්ථාවට අනුකූලව බවත්,
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82(5) වැනි ව්‍යවස්ථාවට අනුව විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කිරීම අවශ්‍ය බවත්
- පනත් කෙටුම්පතේ 3, 5, 14 සහ 22 වන වගන්ති පවතින තත්ත්වාකාරයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු 3 වැනි ව්‍යවස්ථාවට අනනුකූල වන බැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 වැනි ව්‍යවස්ථාට අනුව ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කළ යුතු බවත්,

එසේ වුවද 3 සහ 14 යන වගන්තිවල ඇති අනනුකූලතාව යෝජිත කාරක සභා සංශෝධන ප්‍රකාරව සංශෝධනය කිරීම මගින් ඉවත් කර ගැනීම කළ හැකි බවත්, 5 වැනි වගන්තියේ ඇති අනනුකූලතාව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයේ දක්වා ඇති ආකාරයට සුදුසු පරිදි සංශෝධනය කිරීම මගින් ඉවත් කර ගැනීම කළ හැකි බවද ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදි.

ඒ අනුව පනත් කෙටුම්පතේ 3 වන වගන්තියේ සඳහන් වූ ජනාධිපතිවරයාගේ කාර්ය සහ බලතල අතරට පහත සඳහන් කොටසද එකතු කරන බව නීතිපති ශ්‍රේෂ්ඨාධිකරණයට දන්වා සිටි අතර ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේ එසේ එකී වගන්තිය සංශෝධනය වන්නේ නම් පාර්ලිමේන්තුවේ 2/3 ක විශේෂ බහුතරයකින් සම්මත කිරීම කිරීම ප්‍රමාණවත් බවයි "මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීමට සඳහා උචිත වාතාවරණයන් ඇති කිරීම තහවුරු කිරීම සඳහා බලය ඇත්තේය".

එසේම 14 වන වගන්තිය කාරක සභා අවස්ථාවේදී සංශෝධනය කරමින් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි කාලය වසරකට පසුවී වෙනුවට වසර දෙකහමාරකට පසුව යනුවෙන් සංශෝධනය කරන බව නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම්දුන් අතර ඒ අනුව 2/3ක බහුතරයකින් එම වගන්තිය සංශෝධනය කළ හැකි බව දන්වන ලදි.

එසේම කෙටුම්පතේ 5 වන වගන්තිය මගින් ජනාධිපතිවරයාට පූර්ණ මුක්තියක් හිමිකරදීම හෙවත් ජනාධිපතිවරයාට එරෙහිම මූලික අයිතිවාසිකම් නඩු පැවරීමට පුරවැසියන්ට හිමිකර දී තිබූ බලය ඉවත් කිරීම ජනතාවගේ පරමාධිපත්‍ය උල්ලංඝනයක් වන නිසා එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4 ව්‍යවස්ථාවලට අනනුකූල වන බැවින් කෙටුම්පතේ පවතින ආකාරයෙන්ම එය සම්මත කරගැනීමට නම් පාර්ලිමේන්තුවේ 2/3 ක විශේෂ බහුතර ඡන්දයකට අමතරව ජනමත විචාරණයකින්ද සම්මත කළ යුතු යැයි ප්‍රකාශ කළ අධිකරණය ජනාධිපතිවරයාට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු පැවරීමට අයිතිය ලබාදෙන ලෙස එකී වගන්තිය සංශෝධනය සිදුකරන්නේ නම් එකී වගන්තිය 2/3ක විශේෂ බහුතරයකින් සම්මත කිරීම ප්‍රමාණවත් බව පවසන ලදි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ 22 වන වගන්තිය මගින් යෝජනා කර තිබුනේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104උඋ ව්‍යවස්ථාව ඉවත් කිරීමටය. 104 උඋ ව්‍යවස්ථාවෙන් ප්‍රතිපාදන සලසන්නේ මැතිවරණ සමයකදී මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන රාජ්‍ය දේපළ අයථා පරිහරණය වැළැක්වීම සඳහා පනවනු ලබන විධාන සහ අපක්ෂපාතී මාධ්‍ය භාවිතාවක් සඳහා පනවනු ලබන මාධ්‍ය උපමානවලට අනුකූල නොවන රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව නඩු පැවරීමට කොමිෂන් සභාවට බලය පැවරීමයි. මෙම ව්‍යවස්ථාව ඉවත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4 ව්‍යවස්ථාවන්ට අනනුකූල වන බැවින් 104උඋ ව්‍යවස්ථාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉවත් කිරිමට නම් පාර්ලිමේන්තුවේ 2/3ක විශේෂ බහුතරයකට අමතරව ජනමත විචාරණයකින්ද එය සම්මත විය යුතු බව ගරු අධිකරණය විසින් දක්වන ලදි.

## 13.4. පෙත්සම්කරුවන් සහ ඇතුළත් වූ පෙත්සම්කරුවන්

### 13.4.1. පෙත්සම්කරුවන්

1. ඉංදික ගාල්ලගේ
2. රංජිත් මද්දුමබණ්ඩාර
3. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
4. ආර්.සම්බන්ධන්
5. හෙට්ටි ආරච්චිගේ අනිල් කාරියවසම්
6. නාගානන්ද කොඩිතුවක්කු
7. එස්.සී.සී.ඉලංකෝවන්
8. සිතාරා ශ්‍රීන් අබ්දුල් සරූන්
9. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා
10. රංජිත් කීර්ති කෙන්නකෝන්
11. මරියන් ලිහිණි ප්‍රනාන්දු

12. රසික ලක්මාල් ජයකොඩි
13. ආචාර්ය අජන්තා පෙරේරා සහ තවත් තිදෙනෙක්
14. සිල්වෙස්ටර් ජයකොඩි සහ තවත් දෙදෙනෙක්
15. නීතිඥ ජයන්ත  දෙහිඅත්තගේ සහ මිගාර දාස් ( ශ්‍රී ලංකා තරුණ නීතිවේදී සංවිධානය)
16. තිසත් විජේගුණවර්ධන
17. කපිල රේණුක පෙරේරා
18. ලංකා ගුරු සංගමය,සෞඛ්‍ය වෘත්තික පීඨය, තැපැල් සහ විදුලි සංදේශ සේවා සංගමය
19. මයන්ත දිසානායක
20. ආරිස් සම්සුදීන් සහ තවත් අයෙක්
21. නීතිඥ පී. ලියන ආරච්චි
22. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
23. රත්නජීවන්.එච්. හූල්
24. එරික් සේනාරත්න
25. අකිල විරාජ් කාරියවසම්
26. රුවන් විජේවර්ධන
27. ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස, සභාපතී ශ්‍රී ලංකා නීතිඥ සංගමය
28. රවුෆ් හකීම්
29. ආචාර්ය විශාකේෂ චන්ද්‍රසේකරම්
30. මංගල සමරවීර
31. රුවන් ලක්නාත් ජයකොඩි සහ තවත් දෙදෙනෙක්
32. එම්බීසී නෙට්වර්ක් ලිමිඩට් සහ එම්ටීවී චැනල් ලිමිඩට්
33. ප්‍රසන්න පුෂ්පකුමාර-සභාපති රාජ්‍ය විගණන සේවා සංගමය
34. මාසල කෝරාළගේ ජයතිස්ස සහ තවත් 6 දෙනෙක් (සිවිල් සංවිධාන නියමුවන්)
35. චූලසිංහ ද සොයිසා ඇතුලු 20 ක් (20ට එරෙහි නීතිඥයින් 20ක්)
36. බෙනට් සුමනසිරි ජයවර්ධන
37. පැල්පොලගේ දොන් සමරපාල
38. සුසන්ත හර්ෂ කුමාර් සූරිය ආරච්චි

## 13.4.2. ඇතුළත් වූ පෙත්සම්කරුවන්

1. මහාචාර්ය ජී, එල් පීරිස්
2. ඩබ්ලිව්.ඒ,ඩී, වී, වීරතිලක
3. ඩී, ජී, වී. අබේරත්න
4. ඕමාරේ කස්සප හිමි සහ තවත් හය දෙනෙක්
5. සාගර කාරියවසම්
6. ඩී. එම්. දයාරත්න
7. දඩල්ලගේ ටයිටස් ප්‍රේමසිරි
8. නිමල් සිරිපාල ද සිල්වා
9. මහඔය සෝභිත හිමි

# දාහතරවන පරිච්ඡේදය

## විසිවන සංශෝධනයට එරෙහි විරෝධය හමුවේ ආණ්ඩුවේ ක්‍රියාමාර්ග

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන බවද ඒ සඳහා 2/3ක ජනවරමක් ලබාදෙන ලෙසද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ 2020 පාර්ලිමේන්තු මැතිවරණයේදී ජනතාවගෙන් ඉල්ලා සිටින ලදි. 19 වන සංශෝධනය ඉවත් කිරීම පිළිබඳව එකඟතා තිබුණද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ගැසට් පත්‍රයේ පළවූ විට එහි ඇතැම් ප්‍රතිපාදන සම්බන්ධයෙන් මතු වූ විරෝධතා පසුගිය පරිච්ඡේදයේදී විස්තර විය. මේ අනුව පනත් කෙටුම්පත සම්මත කිරීමේදී 2/3ක විශේෂ බහුතරයක් ලබාගැනීමේ අර්බුදයට ආණ්ඩු පක්ෂය මුහුණ දුනි. එබැවින් ආණ්ඩුපක්ෂයේ සියලු පක්ෂ එකඟ කරවා ගැනීම මෙන්ම සමාජයෙන් එල්ල වූ විරෝධතාවලටද පිළිතුරු ලබාදීම සඳහා ආණ්ඩුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ මෙම පරිච්ඡේදයෙන් විස්තර කරනු ලබයි.

### 14.1. අගමැතිවරයාගේ කමිටුව

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත සම්බන්ධව විවිධ විවේචන එල්ල වන විට එකී කෙටුම්පත පිළිබඳව සමාලෝචනය කර වාර්තාවක් ලබාදීම සඳහා අගමැති මහින්ද රාජපක්ෂ විසින් පාර්ලිමේන්තු සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවක් පත්කරන ලදි. මෙම කමිටුවේ සාමාජිකයන් වූයේ

- අමාත්‍ය ජී.එල්.පීරිස්
- අමාත්‍ය උදය ගම්මන්පිල

- අමාත්‍ය මොහොමඩ් අලී සබ්‍රි
- අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා
- අමාත්‍ය විමල් වීරවංශ
- රාජ්‍ය අමාත්‍ය එස්.වියලේන්ද්‍රන්
- පාර්ලිමේන්තු මන්ත්‍රී ඩිලාන් පෙරේරා
- පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී දොලවත්ත

මෙම 2020 සැප්තැම්බර් 12 වන දින පත් කරන ලද මෙම කමිටුවේ සභාපති වූයේ අමාත්‍ය ජී.එල්.පීරිස්ය. කමිටුවේ වාර්තාව සැප්තැම්බර් 15 වන දින අගමැතිවරයාට භාරදීමට නියමිත බවද අගමැති මාධ්‍ය අංශයේ අධ්‍යක්ෂක රොහාන් වැලිවිටගේ අත්සනින් යුතු මාධ්‍ය නිවේදන අංක 27 මගින් දක්වා තිබිණි.

කැබිනට් මණ්ඩලය වෙත කෙටුම්පත ඉදිරිපත් කරන ලද අධිකරණ අමාත්‍යවරයාද කෙටුම්පත 2020 අගෝස්තු 28 දින සම්මත කරන ලද කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් 4ක්ද මෙම කමිටුවේ සාමාජිකයන් වීම විශේෂත්වයකි. සමාලෝචන කමිටුව විසින් සිය වාර්තාව අගමැතිවරයා වෙත භාරදුන් බව මාධ්‍ය විසින් වාර්තා කරන ලදි. නමුත් එම වාර්තාව මගින් සිදුකරන ලද සමාලෝචනයන් හෝ නිර්දේශ පිළිබඳව කරුණු ප්‍රසිද්ධ කළේ නැත,

## 14.2. පනත් කෙටුම්පත සංශෝධනය පිලිබද කැබිනට් තීරණය

ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත සම්බන්ධයෙන් සමාජයේ විවිධ පාර්ශ්වල විවේචකයන්ට ප්‍රතිචාරයක් ලෙස 2020 ඔක්තෝබර් 19 වන දින අමාත්‍ය කැබිනට් රැස්වීමේදී ( 20 වන සංශෝධනය සම්බන්ධ පාර්ලිමේන්තු විවාදයට පෙර පැවති අවසන් කැබිනට් රැස්වීම) කෙටුම්පතේ සංශෝධන කිහිපයක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබිණි. මෙම සංශෝධන යෝජනා කර තිබුණේ කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකල සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අධිකරණ අමාත්‍ය අලි සබ්‍රි අමාත්‍යවරයාය.ඒ අනුව එදින අමාත්‍ය මණ්ඩලය විසින් විසිවන ආණ්ඩුක්‍රම සංශෝධන කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුකූල ලෙස පනත් කෙටුම්පත සංශෝධනය කිරීම සඳහා සහ පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වන විධිවිධානද විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ කාරක සභා අවස්ථාවේදී ඇතුළත් කළ යුතු බවට මෙම අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තිරණය කරන ලදි.

- ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණවල පවතින අධික නඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන එම අධිකරණවල විනිශ්චයකාරවරු සංඛ්‍යාව වැඩි කිරීම සඳහා වන විධිවිධාන.

- ජාතික ආරක්ෂාව හා ආපදා අවස්ථාවලදී පැන නැගෙන කරුණුවලට අදාළ පනත් පමණක් හදිසි පනත් සේ සලකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ විධිවිධාන.
- රාජ්‍ය සංස්ථාවක් වන හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් කොටස්වලින් 50%ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගම් විගණනය කිරීමේ බලතල විගණකාධිපතිවරයාට පැවරෙන පරිදි විධිවිධාන.
- අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් සංඛ්‍යාව, අමාත්‍ය මණ්ඩලයේ නොවන අමාත්‍යවරුන් සංඛ්‍යාව සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාව තීරණය කිරීමට අදාළව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් විධිවිධාන එලෙසම 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් කිරීම.

මෙම සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධ පාර්ලිමේන්තු විවාදයේ කාරක සභා අවස්ථාවේදී සිදුකිරීමට කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරන ලදි. http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=si&dID=10687

## 14.3. ජනාධිපතිවරයා විසින් සාකච්ඡා ලබාදීම

20 වන ව්‍යවස්ථා කෙටුම්පතට විරෝධය දක්වන සහ විවේචනය සිදුකරන යම් යම් කණ්ඩායම් විසින් සිදුකරන ලද ඉල්ලීම් මත ජනාධිපතිවරයා එකී කණ්ඩායම් සඳහා සාකච්ඡා ලබාදුනි. ඒ අනුව ජනමාධ්‍ය මගින් ප්‍රසිද්ධියට පත් සාකච්ඡා පහත පරිදි සංක්ෂිප්ත කළ හැකිය.

### 14.3.1. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමග සාකච්ඡාව

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත සම්බන්ධයෙන් විවිධ පාර්ශ්ව මෙන්ම ආණ්ඩුව නියෝජනය කරන අමාත්‍යවරුන්ද විවේචන සිදුකරන විට ජනාධිපතිවරයා විසින් ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු සහ මන්ත්‍රීවරු සියලු දෙනාම ඔක්තෝබර් මස 09 වන දින අරලියගහ මන්දිරය වෙත කැඳවා සාකච්ඡාවක් ලබාදෙන ලදී. නමුත් එම රැස්වීමේදී “ඒ පිළිබඳ සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවක් නොමැති බවත්, එය අනිවාර්ය ලෙස සම්මත කළ යුතු බවත් ප්‍රකාශ කරමින් කිසිවකුටත් අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාවක් ජනාධිපතිතුමා ලබා නොදුන් බව” විජයදාස රාජපක්ෂ මන්ත්‍රීවරයා විසින් ඔක්තෝබර් 13 වන දින ජනාධිපතිවරයා වෙත ලියූ ලිපියක සඳහන් විය.(උපග්‍රන්ත xii)

### 14.3.2. රජයේ විගණන සේවා සංගමයේ නියෝජිතයන් සමග සාකච්ඡාව

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කිරීම සහ විගණකාධිපතිගේ බලතල අඩු කිරීම පිළිබඳව විරෝධය දක්වන ලද මෙම සංගමය සඳහා ජනාධිපතිවරයා විසින් 2020 ඔක්තෝබර් මාසයේදී සාකච්ඡාවක් ලබාදී තිබිණි.

### 14.3.3. විමල් වීරවංශ සහ උදය ගම්මන්පිල අමාත්‍යවරුන් සමග සාකච්ඡාව

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි ඇතැම් ප්‍රතිපාදන පිළිබඳව විරෝධතාව දක්වන ලද විමල් වීරවංශ සහ උදය ගම්මන්පිල යන අමාත්‍යවරුන්ට 2020 ඔක්තෝබර් 20 වන දින ජනාධිපතිවරයා සාකච්ඡාවක් ලබාදුන්නේය. එකී සාකච්ඡාවෙන් පසුව මාධ්‍ය ඇමතූ එම අමාත්‍යවරුන් දෙදෙනා ප්‍රකාශ කරන ලද්දේ ඔවුන්ගේ ඉල්ලීම් අතරින් විදේශ පුරවැසියන්ට ජනාධිපතිවරය සහ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඉදිරිපත්වීමට අවස්ථාව සැලසීම පිළිබඳ ප්‍රතිපාදනය හැර අනෙකුත් ඉල්ලීම් සියල්ල සඳහා ජනාධිපතිවරයා එකඟ වූ බවයි. එකී ප්‍රතිපාදනය සම්බන්ධව ජනාධිපතිවරයා ඉතා හැඟීම්බර වූ බවත් ඉදිරියේදී ගෙන එන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනයේදී මෙම ප්‍රතිපාදනය ඉවත් කරන බවත් පොරොන්දු වූ බැවින් තමන් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා පක්ෂව ඡන්දය භාවිතා කරන බවයි.

### 14.3.4. ආණ්ඩුවේ පක්ෂ නියෝජිතයින් සහ අගමැතිතුමාගේ සාකච්ඡාව

ආණ්ඩුව නියෝජනය කරන දේශපාලන පක්ෂවල නියෝජිතයන්ගේ හමුවක් 2020 ඔක්තෝබර් 18 වන දින කොළඹ විජේරාම පාරේ පිහිටි මහින්ද රාජපක්ෂ අගමැතිවරයාගේ කාර්යාලයේදී පැවැත්විණ. එහි අරමුණ වූයේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා සියලු පක්ෂවල සහය ලබාගැනීමයි. එම රැස්වීමෙන් අනතුරුව මාධ්‍යයට අදහස් දැක්වූ පක්ෂ නියෝජිතයින් ප්‍රකාශ කළේ සංශෝධන සහිතව 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමට අපේක්ෂා කරන බවයි.

### 14.3.5. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන පක්ෂ නායකයන් සමග සාකච්ඡාව

ජනාධිපතිවරයාගේ කැඳවීමකට අනුව ඔක්තෝබර් 21 දින ආණ්ඩු පක්ෂය නියෝජනය කරන දේශපාලන පක්ෂ නායකයන් විසින් රැස්වීමක් පවත්වන ලදි. පසුදින 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට 2/3 ඡන්දය ලබාගැනීමේදී තම තමන්ට තිබෙන ගැටලු සහ එකඟවිය නොහැකි කාරණා සම්බන්ධයෙන් සාකච්ඡා කර විසඳුමක් ලබාගැනීමෙ මෙම රැස්වීමේ අරමුණ බව ප්‍රකාශ විය ඇමතිවරුන් වන විමල් වීරවංශ, උදය ගම්මන්පිලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන තිස්ස විතාරණ, විජයදාස රාජපක්ෂ, වීරසුමන දිසානායක, ටිරාන් අලස් සහ

අසංක නවරත්න ඇතුළු 9 දෙනෙකු මේ සඳහා සහභාගී වී තිබේ, මෙම සාකච්ඡාව සඳහා සහභාගී වී තිබුණි.
( https://mawbima.lk/news/23/print-more/34511-2020/12/02)

## 14.4. දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් විවිධ පාර්ශ්ව සිදුකරන විවේචනවලට පිළිතුරු ලබාදීම සඳහා ආණ්ඩුවට සහයෝගය දක්වන ඇතැම් සංවිධාන විසින් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ සංවිධානය කරනු දක්නට ලැබිණි. මෙවැනි එක් සම්මන්ත්‍රණයක් මහනුවර වෘත්තීයවේදීන් විසින් සංවිධායකත්වයෙන් මහනුවරදී පැවති අතර එහිදී මහාචාර්ය ජී.එල්.පීරිස් අමාත්‍යවරයා සහභාගී විය.19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැවති අඩුපාඩු මෙන්ම 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අපේක්ෂිත අරමුණු පිළිවෙළ පුළුල්ව සාකච්ඡා කරන ලදි
(http://www.dinamina.lk/2020/09/14/%E0%B7%80%E0%B7%92%E0%B7%81%E0%B7%9A%E0%B7%82%E0%B7%8F%E0%B6%82%E0%B6%9C/103912/%E0%B7%80%E0%B7%92%E0%B7%83%E0%B7%92%E0%B7%80%E0%B6%B1-%E0%B7%80%E0%B7%8A%E2%80%8D%E0%B6%BA%E0%B7%80%E0%B7%83%E0%B7%8A%E0%B6%AE%E0%B7%8F-%E0%B7%83%E0%B6%82%E0%B7%81%E0%B7%9D%E0%B6%B0%E0%B6%B1%E0%B6%BA%E0%B6%9A%E0%B7%8A-%E0%B6%85%E0%B7%80%E0%B7%81%E0%B7%8A%E2%80%8D%E0%B6%BA-%E0%B7%80%E0%B6%B1%E0%B7%8A%E0%B6%B1%E0%B7%9A-%E0%B6%87%E0%B6%BA%E0%B7%92 2020/12/04)

### වියත්මග ප්‍රවෘත්ති සාකච්ඡාව

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහය දැක්වීම සඳහා වියත්මග සංවිධානය විසින් 2020 ඔක්තෝබර් 19 දින මාධ්‍ය සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී අචාර්ය සරත් වීරසේකර අමාත්‍යවරයා මාධ්‍යයට ප්‍රකාශ කළේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදුවන්නේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමට පෙර තිබූ තත්ත්වයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන ඇතුළත් කිරීම බවයි. (https://www.youtube.com/watch?v =orLGlSP1T3U-2020-12-16)

## 14.5. අගමැතිවරයාගේ මාධ්‍ය නිවේදනය

විගණකාධිපතිවරයාගේ බලතල 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීම පිළිබඳව සමාජය තුළ වැඩි කථාබහකට ලක්ව තිබූ අවස්ථාවක මහින්ද රාජපක්ෂ

අග්‍රාමාත්‍යවරයා (මුදල් අමාත්‍යවයාද වන) ඒ පිළිබඳව මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින් ප්‍රතිචාර දක්වීය."විසි වෙනි සංශෝධනයෙන් විගණකාධිපතිවරයාගේ බලතල කප්පාදු වෙන බවට විපක්ෂය ගෙන යන ප්‍රචාරය" යන තේමාව යටතේ නිකුත් කර තිබූ එම මාධ්‍ය නිවේදනය මගින් ඒ වන විට විපක්‍ෂය, විගණන වෘත්තිකයන්, සහ ආණ්ඩු පක්‍ෂයේම ඇතැම් කණ්ඩායම් විසින් මතු කර තිබූ චෝදනා කිහිපයකට ප්‍රතිචාර දක්වා තිබුණි.

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විගණන කොමිෂන් සභාවක් ස්ථාපනය කර නොතිබූ බවත් ස්ථාපනය කර තිබුණේ විගණන සේවා කොමිෂන් සභාවක් බවත් එය විගණන කටයුතු නොකළ බවත් එකී නිවේදනයේ සඳහන් විය. එසේම අගමැති කාර්යාලය ජනාධිපති කාර්යාලය ආදිය දෙපාර්තමේන්තු ලෙස සලකන බැවින් ඒවා අදාළ ලැයිස්තුවෙන් ඉවත් කළද විගණකාධිපතිගේ විගණනයෙන් ඉවත් නොවන බවත් එම කාර්යාල පමණක් නොව විශ්‍රාමික ජනාධිපති කාර්යාල පවා විගණනය වන බවත් එහි සඳහන් විය.

රාජ්‍ය සංස්ථා හා රජයේ අයිතිය යටතේ පවතින සමාගම් (එනම්, කොටස් 50% කට වඩා රජයට අයත් සමාගම්) විගණන කටයුතු පාලනය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(2) වගන්තිය යටතේය. 154(2) වගන්තියට අනුව විෂයභාර ඇමතිවරයාට තමන් යටතේ පවතින රාජ්‍ය සංස්ථාවක හෝ රජයට අයත් සමාගමක විගණන කටයුතු සුදුසුකම් ලැබූ වෙනත් විගණන සමාගමකට පැවරිය හැකිය. නමුත් එසේ කිරීමට පෙර එයට අනිවාර්යයෙන්ම මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ලබාගත යුතු අතර විගණකාධිපතිවරයාගෙන්ද ඒ ගැන විමසා බැලිය යුතුය. මෙම ව්‍යවස්ථා සංශෝධනය මගින් 154(2) ව්‍යවස්ථාව සංශෝධනය නොවන බවත් මාධ්‍ය නිවේදනයේ සඳහන් විය. එසේම විගණකාධිපති ලෙස පත් කළ යුත්තේ සුදුසුකම් ලත් විගණකවරයකු යන්න ඉවත් කිරිම මගින් කිසිදු හානියක් නොවන අතර සුදුසුකම් ලත් විගණකවරයකු නොවන වෙනත් අයෙකු මේ වන තෙක් පත් කර නොමැති බවත් පෙන්වා දුන් එම මාධ්‍ය නිවේදනය අවසන් කර තිබුණේ මෙසේය "20 වෙනි සංශෝධනයෙන් කෙරෙන්නේ විගණකාධිපතිවරයා සම්බන්ධ වගන්තිවලට 19 වෙනි සංශෝධනයෙන් ඇති කළ වෙනස්කම් අහෝසි කොට 19 වෙනි සංශෝධනයට පෙර ව්‍යවස්ථාවේ තිබුණු වගන්ති එලෙසම නැවත ස්ථාපිත කිරීම පමණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ වගන්ති ගැන බොහෝ අයට අවබෝධයක් නැත යන උපකල්පනය මත විපක්ෂයේ උදවිය ජනතාව මුලා කිරීමේ අරමුණින් කිසිදු පැකිළීමකින් තොරව දිව අගට එන හැම බොරුවක්ම කියමින් සිටී. කරුණු හරි හැටි අවබෝධ කරගෙන විපක්ෂයේ මේ දුෂ්ඨ උත්සාහය පරාජය කිරීම අප කාගෙත් යුතුකමකි, යනුවෙනි.(https://sinhala.news.lk/news/political-current-affairs/item/40118-2020-10-04-12-37-59-2020/12/04)

## 14.6. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීම

20 වන සංශෝධනය ගෙන එන්නේ 19 වන සංශෝධනයෙන් සිදුවූ අවුල් සහගත තත්ත්වය මගහැරවීම සඳහා කඩිනම් පියවරක් වශයෙන් බවත් ඉදිරියේදී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන එන බවත් ප්‍රකාශ කළ ආණ්ඩුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සඳහා විශේෂඥ කමිටුවක්ද පත් කරන ලදි. අධිකරණ අමාත්‍යවරයා විසින් 2020 සැප්තැම්බර් 02 වන දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් මෙම විශේෂඥ කමිටුව පත් කරන ලදි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලත් විශේෂඥ කමිටුව වන්නේ

- ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා (සභාපති)
- ජනාධිපති නීතිඥ ගාමිණී මාරපන මහතා
- ජනාධිපති නීතිඥ මනෝහර ද සිල්වා මහතා
- ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා
- මහාචාර්ය නසීමා කමුර්දීන් මහත්මිය
- ආචාර්ය ඒ. සර්වේස්වරන් මහතා
- ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්තේ මහතා
- මහාචාර්ය වසන්තා සෙනෙවිරත්න මහත්මිය
- මහාචාර්ය ජී.එච්. පීරිස් මහතා

http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=si&dID=10594– 2020/12/04)

අධිකරණ අමාත්‍යාංශය විසින් 2020 ඔක්තෝබර් 20 වන දින අංක 2198/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් දැන්වීමක් නිකුත් කරමින් කැබිනට් මණ්ඩලය විසින් පත්කර ඇති විශේෂඥ කමිටුව වෙත මහජන අදහස් ලබාදෙන ලෙස ආරාධනා කරන ලදි.

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ කෙටුම්පතේ සඳහන් ඇතැම් වගන්ති සම්බන්ධයෙන් විවිධ පාර්ශ්ව විසින් සිදුකරන ලද විවේචනය හමුවේ ඒවාට මුහුණ දීම සඳහා ආණ්ඩුපක්ෂය විසින් ගන්නා ලද ඉහත කී ක්‍රියාමාර්ගවලට අමතරව පක්ෂයේ ප්‍රධාන ක්‍රියාකාරීන් මල්වතු සහ අස්ගිරි මහානායක හිමියන් මුණ ගැසීම් සංවිධානය කිරීම, මාධ්‍ය සාකච්ඡා මගින් චෝදනාවලට පිළිතුරු ලබාදීම සහ කරුණු පැහැදිලි කිරීම, යම් යම් චෝදනාවලට ආණ්ඩුවට හිතවත් වෘත්තීයවේදීන් විසින් පිළිතුරු ලිපි මාධ්‍යය වෙත යොමු කිරීම ආදියද සිදුකරන ලදි.

මෙම සියලු කරුණු අතරින් ආණ්ඩුව ගත් වඩාත් ප්‍රායෝගික ක්‍රියාමාර්ගය වූයේ ආණ්ඩු පක්ෂයේ කණ්ඩායමට ඇහුම්කන් දෙමින් හැකි උපරිම ආකාරයට ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතට කාරක සභා අවස්ථාවේදී සංශෝධන එකතු කිරීමට එකඟතාව පළ කිරීමයි.

# පහළොස්වන පරිච්ඡේදය

## විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තනි පක්ෂයක් ලබාගත් වැඩිම මන්ත්‍රී ආසන ප්‍රමාණය ලබාගත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය බලයට පත් වී මාස කිහිපයකින් ගෙන ආ 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගැනීමේදී මුල් අවස්ථාවේදී අභියෝගය මතු වූයේ ආණ්ඩු පක්ෂය නියෝජනය කළ කණ්ඩායම් තුළින්ය. නමුත් ආණ්ඩු පක්ෂයේ සියලුම මන්ත්‍රිවරු කෙටුම්පතට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළහ. කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තුව තුළ ඡන්දය ප්‍රකාශ කළ ආකාරය පිළිබඳවත් පළමුව විරෝධය පළකර පසුව කෙටුම්පතට පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් සාධාරණීකරණය සඳහා දක්වන ලද හේතුද විපක්ෂ මන්ත්‍රිවරුන් ලෙස පාර්ලිමේන්තුව නියෝජනය කරමින් පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය ප්‍රකාශකරන ලද මන්ත්‍රීවරුන් පිළිබඳව මෙන්ම එකිනෙකට පරස්පර ප්‍රතිපාදන ඇතුළත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයන් වන 17, 18, 19, සහ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධවලට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලද මන්ත්‍රීවරුන් පිළිබඳව විස්තරයක් මෙම පරිච්ඡේදය තුළින් සිදුවේ.

### 15.1. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව පාර්ලිමේන්තු විවාදය

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තු විවාදය පැවැත්වූයේ 2020 ඔක්තෝබර් මස 21 හා 22 දෙදින තුළය. කොවිඩ්-19 වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා එම දිනවල ඇතැම් පොලිස් බලප්‍රදේශ සඳහා සංචරණ සීමා පනවා තිබූ අතර රටපුරාම දැඩි නිරෝධායන රීති බලාත්මකව පැවැතිණි. මෙම තත්ත්වය හමුවේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

සංශෝධනය සම්බන්ධ වූ විරෝධතාද රජය විසින් නිරෝධායන රීති භාවිතා කරමින් මර්ධනය කරනු දක්නට ලැබිණි. උද්ගතවූ තත්ත්වය හමුවේ පාර්ලිමේන්තු විවාදය කල් දමන ලෙස ඉල්ලා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල විසින් 2020 ඔක්තෝබර් 19 වන දින ලිපියක් යොමුකරමින් ඉල්ලා සිටින ලදි. ඔහු එහිදී අවධාරණය කරන ලද මූලික කරුණු 2ක් වූයේ, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් අසුන් ගන්නා ආකාරය රජයේ රෙගුලාසිවලට පරස්පර වීමත්, රැස්වීම් සීමා කර ඇති අවස්ථාවක පාර්ලිමේන්තුව පැවැත්වීමද එම නීතිරීතිවලට පටහැණි වීමත් යන කරුණුය. නමුත් විවාදය පැවැත්වීමේ දිනවල වෙනසක් සිදු නොවීය.

විවාදයේ පළමු දිනයේදී විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස ප්‍රමුඛ මන්ත්‍රී කණ්ඩායමක් විපක්ෂනායක කාර්යාලයේ සිට විරෝධතා රථ පෙළපාලියකින් පාර්ලිමේන්තුවට පැමිණෙන ලදි. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඔවුන් පැළඳ සිටි මුව ආවරණවල "20 එපා" යනුවෙන් විරෝධතා පාඨ සටහන් කර තිබිණි. එසේම "20 එපා" යනුවෙන් සඳහන් අත්පටි පැළඳ සිටියහ.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත සඳහා වූ විවාදය ආරම්භ කරමින් දෙවන වර කියවීම සඳහා කෙටුම්පත ඉදිරිපත් කිරීම සිදුකරන ලද්දේ අධිකරණ අමාත්‍ය අලි සබ්‍රි අමාත්‍යවරයාය. 17, 18 සහ 19 යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ඉදිරිපත් කරන ලද්දේ අග්‍රාමාත්‍යවරුන්ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ආණ්ඩුව වෙනුවෙන් ඉදිරිපත් කරන විට අග්‍රාමාත්‍යවරයා නොවන වෙනත් ඇමතිවරයකු ඉදිරිපත් කළ මෑත කාලීන එකම අවස්ථාව විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වීම විශේෂත්වයකි.

විවාදය ආරම්භ කරමින් අධිකරණ අමාත්‍යවරයා මෙම පනත් කෙටුම්පත ගෙන ඒමේ අභිලාශය මෙසේ ප්‍රකාශ කරන ලදි. "ගරු කථානායකතුමනි, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කෙටුම්පත අප විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබුවා. එසේ පළ කරනු ලැබුවේ මොකද කියනවා නම්, ජනාධිපතිවරණයට යන අවස්ථාවේදී සහ මහ මැතිවරණයට යන අවස්ථවේදී අප විසින් පැහැදිලිවම ප්‍රකාශ කර සිටි නිසායි, දහනව වැනි ආණ්ඩක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය ඉවත් කරලා, මේ රටේ ජනාධිපතිවරයා සතුව තිබෙන, මේ රටේ ජනාධිපතිවරයා සතුව තිබෙන, මේ රටේ විධායකයේ සම්පූර්ණ බලතල ජනාධිපතිවරයාට සහ කැබිනට් මණ්ඩලයට යළි ලබා දෙනවා කියලා (1408 පිටුව හැන්සාර්ඩ් වාර්තාව-2020 ඔක්තෝබර් 21), එසේම ඔහු විසින් ප්‍රකාශ කරන ලද්දේ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අනුව මෙම පනත් කෙටුම්පතේ වගන්ති 4ක් හැර අනෙක් වගන්ති පාර්ලිමේන්තුවේ 2/3ක බහුතර ඡන්දයෙන්

සම්මත කිරීම නිත්‍යානුකූල බව පවසා ඇති බවයි.

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජනමත විචාරණයක් අවශ්‍යයැයි ප්‍රකාශ කළ වගන්ති 4ද ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සඳහන් ආකාරයට සංශෝධනය කිරීමට රජය අපේක්ෂා කරන බැවින් සමස්ත පනත් කෙටුම්පතට 2/3ක බහුතරයකින් සම්මත කිරීමට අපේක්ෂා කරන බවයි.

එසේම එයට අමතරව සංශෝධන කිහිපයක් ගෙන ඒමටත් රජය අපේක්ෂාකරන බව ඔහු විසින් ප්‍රකාශ කරන ලදි. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එක බස් එකකට රියදුරන් දෙදෙනෙකු ලැබුණ බවත් එය ව්‍යාකූල තත්ත්වයක් බවත් එබැවින් එම තත්ත්වය මගහැරවීම සඳහා විසිවන ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන බව ප්‍රකාශ කළේය. කෙසේ නමුත් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට වඩා වැඩි බලයක් මෙම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාට නොලැබෙන බවද ඔහු ප්‍රකාශ කළේය.

විවාදය පුරාම දක්නට ලැබුණ ලක්ෂණයක් වූයේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිපාදනවල දක්නට ලැබුණ අඩුපාඩු විශේෂයෙන්ම ජනාධිපති සහ අගමැති අතර ගැටුමකට මගපෑදීම සහ ජනාධිපතිට බලය නොමැති වීමේ ගැටලුව පිළිබඳව අවධාරණය කිරීමත්, විපක්ෂ මන්ත්‍රීවරුන් විසින් 20 වන ව්‍යවස්ථා සංශෝධනයේ පවතින අධිකාරිවාදී ස්වරූපයේ ආදීනව පිළිබඳව පැහැදිලි කිරීමත්ය.

විශේෂයෙන්ම විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ තර්කය වූයේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ යම් යම් අඩුපාඩු පවතින්නේ නම් එම අඩුපාඩු සකස්කරන සංශෝධනයකට යාමට එකඟ වන නමුත් මෙම සංශෝධනය මගින් ඒකාධිපතිත්වයක් කරා රට රැගෙන යාමක් වන බැවින් එයට එකඟ විය නොහැකි බවයි. ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක මන්ත්‍රීවරයා ප්‍රකාශ කළේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාවට නගන ලද්දේ බලලෝභි අගමැතිවරයකු සහ බලලෝභි ජනාධිපතිවරයකු යටතේ බැවින් අදාළ සංශෝධනයේ ප්‍රතිපාදන පිළිබඳව ඇගයීමකට ලක් කිරීමට එම කාලය සුදුසු නොවන බවයි.

## 15.2. කෙටුම්පත සඳහා ඡන්ද විමසීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82 ව්‍යවස්ථාවට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සම්මත වීම සඳහා නොපැමිණි මන්ත්‍රීවරුන්ද ඇතුළුව 2/3ක ඡන්දයකින් එය සම්මත වීම අවශ්‍යය. එනම් වර්තමාන පාර්ලිමේන්තුවේ 150කට

වඩා මන්ත්‍රීවරුන් එයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ යුතුය. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දෙවනවර කියවීමේ ඡන්ද විමසීම පවත්වන ලද්දේ 2020 ඔක්තෝබර් 21 වන දිනය. ඒ වනවිට පාර්ලිමේන්තුවේ 2020 අගෝස්තුමස පැවති පාර්ලිමේන්තු මැතිවරණයට අනුව ආසන මෙසේය.

1. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ -145
2. සමගි ජන බලවේගය- 54
3. ජාතික ජන බලවේගය 3
4. ඉලංකෙයි තමිල් අරසු කච්චු- 10
5. අකිල ඉලංගෙයි තමිල් කොන්ග්‍රස්- 2
6. තමිල් මක්කල් විදුගල් පුලිගල්- 1
7. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය-1
8. ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ-2
9. මුස්ලිම් ජාතික පෙරමුණ-1
10. තමිල් මක්කල් දේශිය කුට්ටානි-1
11. සමස්ත ලංකා මක්කල් කොන්ග්‍රස් -1
12. ජාතික කොන්ග්‍රසය -1
13. ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය-1
14. එක්සත් ජාතික පක්ෂය -1
15. අපේ ජනබල පක්ෂය-1

( http://elections.news.lk/election/ 2020/11/21)

මේ අනුව ආණ්ඩු බලය ඇති ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට මන්ත්‍රීධුර 145 පැවති අතර ආණ්ඩුවේ හවුල්කාර පක්ෂ ලෙස ඍජුවම පෙනී සිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ තමිල් මක්කල් විදුගල් පුලිගල් යන පක්ෂවලට මන්ත්‍රීධුර 4ක් හිමිව තිබිණි. එක්සත් ජාතික පක්ෂය සහ අපේ ජනබල පක්ෂය සිය ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර ඒවන විට නම් කල නොතිබිනි. එසේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණුවේ රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමලාල් ජයසේකර මන්ත්‍රීවරයා මහාධිකරණයෙන් මරණීය දණ්ඩනය හිමිවී අභියාචනාධිකරණයට අභියාචනය කර බන්ධනාගාර ගත කර තිබිණි. 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විවාදයට සහභාගී වීම සඳහා කථානායකගේ නියමයෙන් ඔහුව පාර්ලිමේන්තුවට කැඳවා තිබිණි.

එසේම සමගි ජනබලවේගයේ වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රි රිෂාඩ් බදුර්දීන් සහ ආණ්ඩුවේ හවුල්කාර පක්ෂයක් වූ තමිල් මක්කල් විඩුදලෛප්පුළිකල් පක්ෂයේ මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රි සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් ද රක්ෂිත බන්ධනාගාර ගතකර තිබූ අතර ඔවුන්ද මෙම විවාදය සඳහා කැඳවා තිබිණි.

දෙවනවර කියවීමේ ඡන්ද විසීමේදී පනත් කෙටුම්පතට පක්ෂව ඡන්ද 156ක් ලැබිණි. විපක්ෂව ලැබුණේ ඡන්ද 65 කි. නොපැමිණි මන්ත්‍රීවරුන් එක් අයෙකි. ඒ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාය. මේ අනුව විපක්ෂ මන්ත්‍රීවරුන් ලෙස ක්‍රියාකළ මන්ත්‍රීවරුන් 8 ක් මෙම ඡන්ද විමසීමේදී පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය ලබාදී තිබිනි

## 15.3. කෙටුම්පතට පක්ෂව ඡන්දය දුන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්

කෙටුම්පතට පක්ෂව ඡන්දය ලබාදුන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් වන්නේ:-

1. ඩයනා ගමගේ (ජාතික සමගි බලවේගය-ජාතික ලැයිස්තුව)
2. ඉෂාක් රහුමාන්, (ජාතික සමගි බලවේගය-අනුරාධපුර දිස්ත්‍රික් මන්ත්‍රී)
3. නසිර් අහමඩ් (ජාතික සමගි බලවේගයේ හවුල්කාර පක්ෂයක් වන මුස්ලිම් කොන්ග්‍රසය)
4. ෆයිසාල් කාසීම්, (ජාතික සමගි බලවේගයේ හවුල්කාර පක්ෂයක් වන මුස්ලිම් කොන්ග්‍රසය)
5. එච්.එම්.එම් හාරිස්, (ජාතික සමගි බලවේගයේ හවුල්කාර පක්ෂයක් වන මුස්ලිම් කොන්ග්‍රසය)
6. එම්.එස් තව්ෆික්, (ජාතික සමගි බලවේගයේ හවුල්කාර පක්ෂයක් වන මුස්ලිම් කොන්ග්‍රසය)
7. මොහොමඩ් අලි සබ්රි, ( මුස්ලිම් ජාතික සන්ධානයේ පුත්තලම දිස්ත්‍රික් මන්ත්‍රී)
8. අරවින්ද් කුමාර් (ජාතික සමගි බලවේගයේ හවුල්කාර පක්ෂයක් වන දෙමළ ප්‍රගතිශීලි පෙරමුණ)

සමගි බලවේගයේ හවුල්කාර පක්ෂ 3ක පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් 6 දෙනෙකු මෙම කෙටුම්පතට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළද එකී පක්ෂවල නායකයන් පනත් කෙටුම්පතට විරුද්ධත්වය ප්‍රකාශ කර තිබිණි.

## 15.4. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට එරෙහි වූ සහ පසුව පක්ෂව ඡන්දය දුන් මන්ත්‍රිවරුන්ගේ ස්ථාවරය

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකළ අවස්ථාවේදී එයට එරෙහිව හඬ නැගූ ආණ්ඩුවේ හවුල්කාර පක්ෂයක් වූ පිවිතුරු හෙළ උරුමය පක්ෂයේ නායක බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල පාර්ලිමේන්තුව අමතමින් පවසා සිටියේ කෙටුම්පතේ ඔවුන් එරෙහිවූ ද්විත්ව පුරවැසිභාවය පිලිබද වගන්තිය හැර අනෙක් සියලු ප්‍රතිපාදන මේ වන විට සංශෝධනය වීමට නියමිත

බවයි. "පිවිතුරු හෙළ උරුමයේ මධ්‍යම කාරක සභාව ද්විත්ව පුරවැසියන් පාර්ලිමේන්තුවට සහ උසස් නිලතල දැරීමට විරුද්ධ බවයි. එනම් වෙනත් රටක පක්ෂපාතීත්වය පළ කරන ලද පුද්ගලයකු ඇමතිවරයෙකු ජනාධිපතිවරයකු හෝ මන්ත්‍රීවරයකු ලෙස එම රට සමග ගනුදෙනු කිරීමේදී බැඳියා අතර ගැටුමක් සිදුවීම, මෙරට අපරාධයක් කර තමන් පුරවැසිභාවය තිබෙන රටට පලායාමට හැකිවීම,බොහෝ රටවල් ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට ඉඩකඩ ලබානොදීම යන ප්‍රතිපත්තිමය කරුණු මත ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට හෝ ජනාධිපති වීමට විරුද්ධ බවයි. එම ප්‍රතිපාදනය මෙම කෙටුම්පත තුළ තිබුණත් ඉදිරියේදී සම්පාදනය කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මෙම ප්‍රතිපාදනය ඉවත් කරන බවට ජනාධිපතිතුමා පොරොන්දුවීමත් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මෙම ප්‍රතිපාදනය ඇතුළත් කළේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවීම වැළැක්වීමට නිසාත් තමන් මෙම සංශෝධනයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන බවයි ( 1671 පිටුව හැන්සාර්ඩ් වාර්ථාව 2020/10/22)

එසේම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ ඇතැම් වගන්තිවලට විරෝධය පෑ කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ අමාත්‍යවරයා විසිවන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පිළිබඳ විවාදයට එක් වෙමින් ප්‍රකාශ කරන ලද්දේ 20 වන ව්‍යවස්ථා කෙටුම්පතේ වූ කරුණු තුනක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට කරුණු දැක්වූ බවයි. ඉන් විගණකාධිපතිගේ බලතල සම්බන්ධ ප්‍රතිපාදන 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබූ ආකාරයටම තැබීමටත්, හදිසි පනත් ගෙන ඒම පිළිබඳ ප්‍රතිපාදන ජාතික ආරක්ෂාවට අදාළව පමණක් ගෙනඒමටත් ජනාධිපතිතුමා එගග වූ බවත් ඉතිරි වූයේ ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ ප්‍රතිපාදන පමණක් බවත් සඳහන් කරන ලදි. "එසේම ද්විත්ව පුරවැසියන් ගැන අද විශාල සාකච්ඡාවක් තිබෙනවා ද්විත්ව පුරවැසි කථාවත් ඒ සංශෝධනයට ඇතුළක් වුණේ පෞද්ගලික කෝන්තර පිරිමහ ගැනීමේ පරමාර්ථයෙන් මිස, ඒකෙන් ඇත්තටම සිද්ධ වෙන අගතියක් දැකලා ඒ අගතියට වැට බැඳීමේ පරමාර්ථයෙන් නොවෙයි" යනුවෙන් ප්‍රකාශ කළේය. (1680 පිටුව- හැන්සාර්ඩ් වාර්තාව 2020/10/21)

විසිවන ආණ්ඩුක්‍රම සංශෝධන කෙටුම්පතේ සංශෝධනය විය යුතු කරුණු පිලිබදව ජනාධිපතිවරයා වෙත ලිපියක් යොමුකළ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී දොලවත්ත මන්ත්‍රිවරයා විවාදයේදී ප්‍රකාශ කරන ලද්දේ තමන් ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පතේ සංශෝධනය විය යුතු කරුණු පිළිබඳ ජනාධිපතිවරයා අවධානය යොමුකරන ලද බවත් ඒ අනුව කෙටුම්පතට පක්ෂව ඡන්දය ලබාදෙන බවත්ය (1522 පිටුව -හැන්සාර්ඩ් වාර්තාව 2020/11/21) විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ

ඇතැම් ප්‍රතිපාදන සංශෝධනය කරන ලෙස ඉල්ලා ජනාධිපති වෙත ලිපියක් යොමුකළ යුතුකම සංවිධානයේ නායක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග ප්‍රකාශ කළේ "විසිවන ආණ්ඩුක්‍රම සංශෝධනයේ මුල් කෙටුම්පතේ නිවැරදි විය යුතු කරුණු ගණනාවක් "යුතුකම" සංවිධානය නියෝජනය කරන අප දුටු බවත්, ඒ නිවැරදි කිරීම් කරගැනීමට අප මැදිහත් වූ බවත් කවුරුත් දන්නවා. එහි හත්වැනි උපලේඛනයට අනුව. බෙදුම්වාදී ප්‍රයත්නකට දායක නොවන බවට වන ප්‍රතිඥාව 53වන හා 61ඇ ව්‍යවස්ථාවල යළි ඇතුළත් කිරීම, ජනාධිපති ලේකම් කාර්යාලය හා අගමැති ලේකම් කාර්යාලය විගණකාධිපතිගේ විෂය පථයට අයත් බවට අවධාරණය කිරීම නීතිපතිතුමා මගින් අධිකරණයට දැනුම් දුන් සංශෝධනවලට ඇතුළත්ව තිබුණා යනුවෙන් පැවසුවේය. ඉන් පසුවද තම කණ්ඩායම විසින් තවත් කරුණු 7ක් පිළිබඳව ජනාධිපතිවරයාගේ අවධානය යොමුකළ බවත් ඒවා බොහොමයක් කැබිනට් මණ්ඩලය මගින් සම්මත කළ සංශෝධනවලට ඇතුළත්ව ඇති බවත් පැවසූ ඔහු විසින් තවත් ඇතැම් සංශෝධන පිළිබඳව අධිකරණ අමාත්‍යවරයාගේ අවධානය යොමුකරන ලදී (1695 පිටුව - හැන්සාර්ඩ් වාර්ථාව - 2020/10/21)

සමගි බලවේගයේ හවුල්කාර පක්ෂයක් වූ ශ්‍රී ලංකා මුස්ලිස් කොන්ග්‍රසයේ මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නසීර් මොහොමඩ් මන්ත්‍රීවරයා නැගී සිට විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් තම අදහස් පළ කිරීමේදී නායක රවුෆ් හකීම්ට ස්තුතිකරන ලදි. එසේම 2015 දි සිදුකරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන නිසා ආරක්ෂාව කඩා වැටුණ බවත් විධායක ක්‍රමය ශක්තිමත් කළ යුතු බවත් දැක්වීය( 1765 පිටුව - හැන්සාර්ඩ් වාර්ථාව 2020/10/21) විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඇතැම් වගන්ති සම්බන්ධයෙන් ජනමාධ්‍ය හමුවේ විවේචනය කරන ලද ජලසම්පාදන සහ ජලාප්‍රවාහන අමාත්‍ය වාසුදේව නානායක්කාර අමාත්‍යවරයා සිය පාර්ලිමේන්තු කථාවේදී විධායක බලය පවතින ජනාධිතිතුමාට එය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරිමට අවශ්‍ය පහසුකම් සැලසීමට 20 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආ බවත් එහි ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ ප්‍රතිපාදනය පිළිබඳ විවේචනය කරමින් කාරක සභා අවස්ථාවේදී එම ප්‍රතිපාදන සංශෝධනය කිරීමට අධිකරණ අමාත්‍යවරයා කටයුතු කරනු ඇතැයි විශ්වාසය පළ කරන ලදි. (පිටු අංක 1662 හැන්සාර්ඩ් වාර්තාව 2020/10/20)

ඩයනා ගමගේ මන්ත්‍රීවරිය සහ විජේදාස රාජපක්ෂ මන්ත්‍රීවරයා මෙම විවාදයේදී අදහස් දැක්වූයේ නැත.

## 15.5. කාරක සභා අවස්ථාවේදී කෙටුම්පතට සිදුකරන ලද සංශෝධන

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ වගන්ති 58 ක් පැවති අතර කාරක සභා අවස්ථාවේදී එම එක් එක් වගන්තිය පිළිබඳව සාකච්ඡා කරමින් ඇතැම් වගන්තිවලට සංශෝධන එකතු කිරීම සිදුවිය. මෙම ක්‍රියාදාමය සිදුවන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 ව්‍යවස්ථාව සහ පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 57 සිට 65 දක්වා වූ ප්‍රතිපාදනවලට අනුකූලවය.

ඒ අනුව කාරකසභා අවස්ථාවේදී පනත් කෙටුම්පතේ වගන්ති සඳහා සංශෝධන එකතු කිරීමට සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අවස්ථාව සැලසෙනවා. මෙම කෙටුම්පත පිළිබඳව කාරක සභා අවස්ථාවේදී පහත සඳහන් වගන්ති සංශෝධන සිදු විය. 3,5,6,7,8,9, 11, 12, 13, 14, 19, 21, 23, 24, 25, 26, 27, 31, 40, 41, 42, 43, 45, 53, 56, 57, එසේම 10, 17 සහ 22 වගන්ති කෙටුම්පතෙන් ඉවත් විය. එයට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වන ව්‍යවස්ථාව සංශෝධනය සඳහා නව වගන්තියක් ඇතුළත් කරන ලදි.

ඒ අනුව මුල් කෙටුම්පතේ වගන්ති 30ක් සඳහා කාරක සභා අවස්ථාවේදී සංශෝධන සිදුවිය.

ඒ අනුව පනත් කෙටුම්පතට සිදුකරන ලද මූලික සංශෝධනයන් පහත පරිදි සංක්ෂිප්ත කළ හැකිය

- මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණ ඇති කිරීම තහවුරු කිරීම සඳහා බලය ඇත්තේය යනුවෙන් ජනාධිපතිට නව කාර්යයක් ඇතුළත් කිරීම (මෙය 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ වූ ප්‍රතිපාදනයට සමාන ප්‍රතිපාදනයකි. ශ්‍රේෂ්ඨාධිකරණයේ නියමය මත ඇතුළත් කරන ලදි)
- ජනාධිපතිට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු පැවරිය හැකි බවට ප්‍රතිපාදන නැවත ඇතුළත් කිරීම (ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මත මෙම ප්‍රතිපාදන ඇතුළත් විය)
- පොලිස්පතිවරයා පත් කිරීමේදී ජනාධිපති විසින් පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ලබාගත යුතු බවට ප්‍රතිපාදන ඇතුළත් කිරීම
- අමාත්‍ය මණ්ඩලයේ සහ අමාත්‍ය මණ්ඩලයට අයත් නොවන අමාත්‍යවරුන්ගේ සීමාව 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ තිබූ ආකාරයට යළි සැකසීම
- විධායකයේ අමාත්‍යවරුන් සහ නිලධාරීන්ගේ නිල දිවුරුමට

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 7 වන උපලේඛනයේ සඳහන් දිවුරුම්ද යළි ඇතුළත් කිරීම

- මුල් කෙටුම්පතේ පැවතියේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් 9 දෙනෙකුට නොවැඩි යන්නයි. එය පස්දෙනෙකුට නොඅඩු සහ 9 දෙනෙකුට නොවැඩි යනුවෙන් සංශෝධනය විය
- වසරකින් පසුව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා බලතල ලබාදුන් මුල් කෙටුම්පතේ ප්‍රතිපාදනය වසර දෙකහමාර දක්වා වැඩි කිරීම(ශ්‍රේෂ්ඨාධිකරණයේ නියමය මත සංශෝධනය විය)
- මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් ගණන 3 සිට 5 දක්වා වැඩි කිරීම සහ කොමිෂන් සභාවේ එක් සාමාජිකයකු මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ ධුරය දරා තිබිය යුතුය යනුවෙන් ඇතුළත් කිරීම.
- මැතිවරණ කොමිසම විසින් පනවන ලද විධාන සහ මාධ්‍ය උපමාන පිළිපැදීමට අපොහොසත්වන රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව නඩුපැවරීමේ බලතල නැවත ඇතුළත් කිරීම (ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මත කෙටුම්පතට මෙම සංශෝධනය සිදුවිය)
- හදිසි පනත් ගෙන ඒමේ ප්‍රතිපාදන පිළිබඳව ප්‍රතිපාදන සංශෝධනය කරමින් ජාතික ආරක්‍ෂාව ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හෝ ආපදා කළමනාකරණයට අදාළ යම් කාරණයක් පිළිබඳ පමණක් හදිසි පනත් ගෙන ඒමේ ප්‍රතිපාදන ඇතුළත් කිරීම.
- විගණකාධිපති සුදුසුකම්ලත් විගණකවරයකු විය යුතු බවට සංශෝධනයක් ඇතුළත් කිරීම
- විගණකාධිපතිගේ විෂය පථය 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් ආකාරයටම යළි සංශෝධනය කිරීම
- ජාතික පොලිස් කොමිෂන් සභාවේ සනපූර්ණය 4 සිට 5 දක්වා වැඩි කිරීම

මෙයට අමතරව කෙටුම්පතේ නොතිබුණු නව සංශෝධන දෙකක් ඇතුළත් කරන ලදි. එනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 ව්‍යවස්ථාව අනුව එතෙක් තිබූ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් 10 වෙනුවට විනිසුරුවරුන් 16 දක්වා වැඩි කිරීම. 137 ව්‍යවස්ථාවට අනුව අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් 11 වෙනුවට විනිසුරුවරුන් 19 දක්වා වැඩි කිරීම

කාරක සභා අවස්ථාවේදී කෙටුම්පතේ 15 වන වගන්තිය එනම් ද්විත්ව

පුරවැසියකුට ජනාධිපතිවීමට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමේ බාධකය ඉවත් කිරීම සම්බන්ධයෙන් විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීවරයා විසින් ඡන්දයක් ඉල්ලා සිටින ලදි. ඒ අනුව පනත් කෙටුම්පතේ එම වගන්තියට පක්ෂව ඡන්ද 157 ක් ලැබුණ අතර විපක්ෂව ලැබුණේ ඡන්ද 64කි. දෙවනවර කියවීමේදී පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළ තමිල් ඉලංගෙයි මහජන කොන්ග්‍රසයේ එස්.එම්.මුෂාරෆ් මන්ත්‍රීවරයා විසින් එකී වගන්තියට පක්ෂව සිය ඡන්දය ප්‍රකාශ කරන ලදි. ඒ පිලිබඳව අදහස් දක්වමින් ඔහු ප්‍රකාශ කරන ලද්දේ මෙම සංශෝධනය මගින් බැසිල් රාජපක්ෂ මහතාට පාර්ලිමේන්තුවට ඒමට අවස්ථාවක් සැලසෙන බැවින් තමන් එම වගන්තියට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ බවයි.

මෙම කාරක සභා අවස්ථාවේදි විපක්ෂය විසින් ඇතැම් වගන්තිවලට විරුද්ධත්වය ප්‍රකාශ කළා මිස යෝජනා කිසිවක් ඉදිරිපත් නොකළේය.

## 15.6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක්කළ 17/18/19/20 සංශෝධන සියල්ලටම පක්ෂව ඡන්දය දුන් මන්ත්‍රිවරුන්

එකිනෙකට පරස්පර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන වූ 17,18,19 සහ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන හතරටම පක්ෂව ඡන්දය ලබාදුන් පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් රැසක් සිටියහ. එනම් මහින්ද සමරසිංහ, රංජිත් සියඹලාපිටිය, ප්‍රියංකර ජයරත්න, එස්.බී.දිසානායක, සුසිල් ප්‍රේමජයන්ත, ඩලස් අලහප්පෙරුම, ජොන්ස්ටන් ප්‍රනාන්දු, අනුර ප්‍රියදර්ශන යාපා, විමල් වීරවංශ, පවිත්‍රා වන්නිආරච්චි, ජෝන් සෙනෙවිරත්න, දිනේෂ් ගුණවර්ධන, ගාමිණී ලොකුගේ, බන්දුල ගුණවර්ධන, ඩිලාන් පෙරේරා, ඒ.එල්.එම්. අතාවුල්ලා, ජී. එල්.පීරිස් , මහින්දානන්ද අලුත්ගමගේ, නිමල් සිරිපාල ද සිල්වා, දුමින්ද දිසානායක, එම්.එස්. තව්ෆීක්, ජනක බණ්ඩාර තෙන්නකෝන්, ජයරත්න හේරත්, යන මන්ත්‍රිවරුන් සහ මන්ත්‍රීවරියන් වේ.

# දහසයවන පරිච්ඡේදය

## 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනස

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කරන ලද තීරණාත්මක සංශෝධන වන 17 18 සහ 19 සංශෝධන මගින් සිදුකරන ලද වෙනස්කම් පිළිබඳව අප ඉහත පරිච්ඡේද මගින් අධ්‍යයනය කරන ලදි. 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත සම්බන්ධව පාර්ලිමේන්තුවේ සම්මත වූ පසුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මෙම කෙටුම්පත මගින් සිදුකරන ලද වෙනස්කම් මොනවාද යන්න පිළිබඳ විග්‍රයක් මෙම පරිච්ඡේදය මගින් සිදු කරනු ලැබේ.

## 16.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කර පාර්ලිමේන්තු සභාව ස්ථාපනය කිරීම

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එකෙත් බලපැවැත්වූ 19 වන අණඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දක්වා සංශෝධනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද ප්‍රධානම වෙනස්කම වූයේ එතෙක් පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීමය. ඒ වෙනුවට පාර්ලිමේන්තු සභාව නැමති ආයතනය ස්ථාපනය කළේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මුල්වරට හදුන්වා දුන්නේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධයෙනි. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එම අහෝසි කර ඒ වෙනුවට පාර්ලිමේන්තු සභාව හඳුන්වා දීම සිදුවිය. මෙවර විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වාදී ඇත්තේද එසේ 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වාදුන් පාර්ලිමේන්තු සභාවමය.

## පාර්ලිමේන්තු සභාවේ සංයුතිය වන්නේ

- අගමැති
- කථානායක
- විපක්ෂනායක
- අගමැතිගේ නියෝජිතයකු වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු
- විපක්ෂනායකගේ නියෝජිතයකු වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු

මෙම පත්කිරීම්වලදී අගමැතිගේ නියෝජිතයා සහ විපක්ෂනායකගේ නියෝජිතයා අගමැති, කථානායක හෝ විපක්ෂනායක නියෝජනය නොව ජනකොට්ඨාශවලින් තෝරාගත යුතු බව 41අ ව්‍යවස්ථාව දක්වයි. අගමැති සහ විපක්ෂනායක විසින් සිය නියෝජිතයන් කථානායකගේ දැනුම්දීමෙන් සතියක් තුළ පත් නොකරන්නේ නම් එම පත් කිරීම් කථානායක විසින් එම පත් කිරීම් සිදු කළ යුතුය.

මේ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන විද්වත් පුද්ගලයින් මෙම සභාව නියෝජනය කරන්නේ නැත.
පාර්ලිමේන්තු කාරක සභාවේ කාර්යභාරයද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යයට හාත්පසින්ම වෙනස්ය.

පාර්ලිමේන්තු සභාවේ කාර්යය වන්නේ ජනාධිපතිවරයා විසින් යම් යම් ධුර සඳහා පත් කරනු ලබන පුද්ගලයන්ගේ නම් සඳහා නිරීක්ෂණ ලබාදීමයි. වර්ග 3ක පත් කිරීම් සඳහා පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ජනාධිපති විසින් ලබාගත යුතුය.

එහි පළමු වර්ගය වන්නේ කොමිෂන් සභාය. ඒ අනුව පහත සඳහන් කොමිෂන් සභාවල සාමාජිකයන් පත් කිරීමේදී ජනාධිපති විසින් පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ලබාගත යුතුය.

1. මැතිවරණ කොමිෂන් සභාව.
2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
3. ජාතික පොලිස් කොමිෂන් සභාව.
4. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
5. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව.
6. මුදල් කොමිෂන් සභාව.
7. සීමා නිර්ණය කොමිෂන් සභාව.

දෙවන වර්ගයේ පත්වීම් වන්නේ අධිකරණ ක්‍රියාවලියට අදාළ පහත සදහන් තනතුරු

1. අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්.
2. අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ විනිශ්චයකාරවරයන්.
3. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන්.

තුන්වන වර්ගයේ වන්නේ රජයේ උසස් තනතුරු ලෙස සලකන පහත සඳහන් පත්වීමිය,

1. නීතිපතිවරයා.
2. විගණකාධිපතිවරයා.
3. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු
4. කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්).
5. පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා.
6. පොලිස්පතිවරයා.

මේ අනුව පාර්ලිමේන්තු සභාව යනු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගෙන් පමණක් සමන්විත ආයතනයක් වන අතර කාර්යභාරය වන්නේ ජනාධිපති විසින් ඉහත සඳහන් තනතුරු සහ කොමිෂන් සභා සදහා නම් කරනු ලබන පුද්ගලයන් සදහා නිරීක්ෂණ ලබාදීමය. ජනාධිපති විසින් එම නිරීක්ෂණ පිළිපැදීම අනිවාර්ය නොවේ.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පත් කරන ලද පලමු පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයන් වූයේ

- මහින්ද රාජපක්ෂ (අගමැති)
- මහින්ද යාපා අබේවර්ධන (කථානායක)
- සජිත් ප්‍රේමදාස (විපක්ෂ නායක)
- ඩග්ලස් දේවානන්ද (අගමැතිගේ නියෝජිත)
- කබීර් හෂීම් (විපක්ෂනායකගේ නියෝජිත)

පාර්ලිමේන්තු සභාවේ පළමු රැස්වීම 2020 නොවැම්බර් 04 දින කථානායක නිල නිවසේදී පවත්වන ලදි.
( https://www.itnnews.lk/2020/11/05/295932/ 2020/11/22)

## 16.2. විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත කරන ලද විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කිරීම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුවිය. ඒ අනුව විගණන කටයුතුවලට අදාළ රජයේ නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වනු ඇත. (විගණන සේවා කොමිෂන් සභාවේ බලතල සහ කාර්යභාරය පිළිබඳ විස්තරයක් නමවන පරිච්ඡේදයේ ඇතුළත් වේ)

## 16.3. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත කරන ලද විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කිරීම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුවිය. ඒ අනුව ප්‍රසම්පාදන සම්බන්ධ කටයුතු නියාමනය පිළිබඳව ස්වාධීන යන්ත්‍රණයක් අහිමි විය. (ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ බලතල සහ කාර්යභාරය පිළිබඳ විස්තරයක් නවවන පරිච්ඡේදයේ ඇතුළත් වේ)

## 16.4. ජනාධිපතිට අමාත්‍යධුර දැරීමට ප්‍රතිපාදන සැලසීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ජනාධිපති හට අමාත්‍ය ධූර දැරීමේ අයිතිය අහෝසි කර තිබිණි. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට පමණක් සීමාවන පරිදි අන්තර්කාලීන විවිධිධාන පවවා තිබිණි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවසථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාට අමාත්‍යධුර දැරීම සඳහා අවස්ථාව යළි හිමිකර දී තිබිණි. ඒ අනුව ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් ද අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියාද වන්නේ යϲ(විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(2) ව්‍යවස්ථාව) යනුවෙන් ප්‍රතිපාදනයක් ඇතුළත් කර ඇත.

## 16.5. හදිසි පනත් ගෙන ඒමේ ප්‍රතිපාදන යළි ඇතුළත් කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හදිසි පනත් පාර්ලිමේන්තුට ගෙන ඒමේ ක්‍රමවේදයක් තිබූ අතර 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එම ප්‍රතිපාදනය ඉවත් කර තිබුණි. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එම ප්‍රතිපාදන නැවත ස්ථාපනය කරන ලදි. මුල් කෙටුම්පතේ මෙම ප්‍රතිපාදනය ඕනෑම විෂයයක් පිළිබඳව හදිසි පනත් ගෙන ඒම සඳහා කැබිනට් මණ්ඩලයට අවස්ථාව ලබාදී තිබුණද විවිධ පාර්ශ්වවලින් පැමිණි විරෝධතා හමුවේ හදිසි පනත් ගෙන ඒම "ජාතික ආරක්‍ෂාව තහවුරු කිරීම සඳහා හෝ ආපදා කළමණාකරණයට අදාළව" පමණක් සිදුකිරීමේ ප්‍රතිපාදන ඇතුළත් විය.

ඒ අනුව අමාත්‍ය මණ්ඩලයේ අදහසට අනුව ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හෝ ආපදා කළමණාකරණයට අදාළ යම් කාරණයකට අදාළ කාර්ය සඳහා වහා අවශ්‍ය වන්නාවූ පනත් කෙටුම්පත් සාමාන්‍ය පනත් කෙටුම්පත් මෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම අවශ්‍ය නොවේ. ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හෝ ආපදා කළමනාකරණයට අදාළ යම් කාරණයක කාර්යයක් සඳහා වහා අවශ්‍ය වන බවට අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් අත්සන් කරනු ලබන පනත් කෙටුම්පතක්, ඒ පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල ද යන්න පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ තීරණය අග්‍රවිනිශ්චයකාරවරයා අමතා යවන ලිඛිත යොමු කිරීමක් මගින් ජනාධිපතිවරයා විසින් ඉල්ලා සිටිය යුත්තේ ය. ඒ යොමුකිරීමේ පිටපතක් ඒ අවස්ථාවේ දීම කථානායකවරයා වෙත භාර දිය යුතුය.

ශ්‍රේෂ්ඨාධිකරණය කැඳවනු ලැබ පැයවිසිහතරක් ඇතුළත (හෝ ජනාධිපතිවරයාවිසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ඊට වැඩි, එහෙත් දවස් තුනක් නොඉක්මවන කාලයක් ඇතුළත) ඒ අධිකරණය විසින් ස්වකීය තීරණයට එළඹිය යුත්තේ ය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ තීරණය ජනාධිපතිවරයාට සහ කථානායකවරයාට පමණක් දැනුම් දිය යුතුය. (20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධය දක්වා සංශෝධනය වූ ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාව)

## 16.6. පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර ප්‍රසිද්ධ කිරීමේ අවම කාලය අඩු කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර අවම වශයෙන් දින 7 කට පෙර ගැසට් පත්‍රයේ පළකළ යුතුය. එම ප්‍රතිපාදනය 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් දින 14 දක්වා දීර්ඝ කරන ලදි. ඒ අනුව ජනතාවට එකී පනත් කෙටුම්පතට අදහස් දැක්වීමට සහ විරෝධය දැක්වනීමට ලැබෙන කාලය දීර්ඝ කිරීමක් සිදුවිය. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම කාලය නැවත දින 7 දක්වා අඩු කරන ලදි ( 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දක්වා සංශෝධනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව)

## 16.7. කාරක සභා අවස්ථාවේදී සංශෝධන සම්බන්ධ සීමා

පනත් කෙටුම්පත් පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙවනවර කියවීමෙන් පසුව පවත්වන කාරක සභා අවස්ථාවේදී එකී පනත් කෙටුම්පතට සංශෝධන ඇතුළත් කිරීම සිදුකරනු ලබයි. එකී සංශෝධන සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ කිසිදු සීමාවක් මෙතෙක් නොපැවතිණි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

මගින් 78 ව්‍යවස්ථාවට අලුතින් තුන්වන අනුව්‍යවස්ථාව මෙසේ එකතු කරන ලදි "(3) පනත් කෙටුම්පතකට පාර්ලිමේන්තුව තුළ දී යෝජනා කරනු ලබන යම් සංශෝධනයක් ඒ පනත් කෙටුම්පතේ හරයට සහ මූලධර්මවලට පරිබාහිර සංශෝධනයක් නොවිය යුත්තේ ය". මේ අනුව කාරක සභා අවස්ථාවේදී සංශෝධන සිදුකිරිමට සීමාවක් පනවා තිබේ. එමගින් ගැසට් පත්‍රයේ පළකරන ලද සහ ඇතැම්විට ශ්‍රේෂ්ඨාධිකරණයේ විමසීමට භාජනය වූ පනත් කෙටුම්පතට වඩා බොහෝ දුරස් වූ පනතක් පාර්ලිමේන්තුව තුළින් සම්මත වීම ඇති අවස්ථාව අහුරා තිබේ.

## 16.8. පාර්ලිමේන්තුව සම්මත නොකරන පනත් කෙටුම්පත් ජනමත විචාරණයට

1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85(2)ව්‍යවස්ථාව මගින් ජනාධිපතිට ලබාදී තිබූ විශේෂ බලයක් වූයේ පාර්ලිමේන්තුවේ පරාජයට පත් වූ (සම්මත නොවූ) පනත් කෙටුම්පතක් ජනමත විචාරණයකට ලක් කිරීමෙන් එය සම්මත කරගැනීමට තිබූ බලයයි. මෙම බලතල මෙතෙක් කිසිදු අවස්ථාවකදී භාවිත වී නැත. මෙම වගන්තිය 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉවත්කරන ලදි. එය නැවත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙසේ ඇතුළත් කර තිබේ.

"පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන ලද(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් පරිච්ඡින්නකිරීම හෝ සංශෝධනය කිරීම හෝ සඳහා වූ පනත්කෙටුම්පතක් නොවන නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යම් විධිවිධානයක් එකතු කිරීම සඳහා වූ පනත්කෙටුම්පතක් නොවන, එසේත් නැතහොත් ආණ්ඩුක්‍රමව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රතියෝජනය කිරීම සඳහා වූ පනත්කෙටුම්පතක් නොවන හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයකට අනනුකූල පනත් කෙටුම්පතක් නොවන) පනත් කෙටුම්පතක් ජනාධිපතිවරයා විසින් ස්වකීය අභිමතය පරිදි ජනමත විචාරණයක් මගින් ජනතාවවෙත ඉදිරිපත් කළ හැක්කේ ය". ( 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85(2) ව්‍යවස්ථාව)

## 16.9. ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම

19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව පොලිස් නිලධාරීන් (පොලිස්පති හැර) බඳවාගැනීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, විනය කටයුතු පිළිබඳව පොලිස් කොමිෂන් සභාවට තිබූ බලතල සහ පොලිස් සේවයට සහ අදාළ උපකරණ අවිආයුධ ගැනීමට අදාළව මාර්ගෝපදේශ සකස් කිරීමට ජාතික පොලිස්

කොමිෂන් පැවරී තිබුණි.එම බලතල 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉවත් කරන ලද අතර ජාතික කෙටුම්පතේ 46 වන වගන්තිය මගින් ඉවත් කරන ලදි.

ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවට ඉතිරිවූයේ "නිලධරයකුට හෝ පොලිස් බලකායට එරෙහිව ජනතා සාමාජිකයන්ගෙන් හෝ යම් අතෘප්තියට පත් තැනැත්තකුගෙන් හෝ ලැබෙන පැමිණිලි භාරගැනීම සහ ඒ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවට බලතල ලබාදිය යුතු අතර, පාර්ලිමේන්තුව මගින් පනවන ලද යම් නීතියක විධිවිධානවලට අනුකූලව ඒ සම්බන්ධයෙන් සහන සැලසිය යුතු වන්නේ ය. මේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින්, ජනතා සාමාජිකයන්ගෙන් හෝ යම් අතෘප්තියට පත් තැනැත්තකුගෙන් ලැබෙන පැමිණිලි භාරගැනීම සඳහා සහ විමර්ශනය කිරීම සඳහා කාර්ය පටිපාටි ස්ථාපිත කිරීමට රීති සාදනු ලැබිය හැකි වන්නේ ය". ( 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊ ව්‍යවස්ථාව).
ඒ අනුව පොලිස් කොමිෂන් සභාව මහජන පැමිණිලි විභාග කිරීමේ කාර්යයට පමණක් සීමා වූ ආයතනයක් බවට පත්විය.

## 16.10. අල්ලස් කොමිසමේ බලතල අඩු කිරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය මගින් XIXඅ ලෙස නව පරිච්ඡේදයක් ඇතුළත් කරමින් අල්ලස් හෝ දූෂණ චෝදන විමර්ශන කොමිෂන් සභාව සඳහා අතිරේක බලතල පැවරීමක් සිදුකරන ලදි. එකී බලතල අනුව තම මෙහෙයවීමෙන් (විධිමත් පැමිණිල්ලක් නොමැතිව වුවද) අල්ලස් හෝ දූෂණ චෝදනාවක් පිළිබඳ විමර්ශන කිරිමේ බලතල පැවරිණි.( 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156අ(2) ව්‍යවස්ථාව) 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 55 වගන්තිය මගින් මෙම පරිච්ඡේදය සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලදි.

## 16.11. ජනාධිපති අපේක්ෂකුගේ අවම වයස සීමාව අඩුකිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 00 ව්‍යවස්ථාවට අනුව ජනාධිපති අපේක්ෂකයකුගේ අවම වයස අවුරුදු 30ක් විය. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම වයස අවුරුදු 35 දක්වා වැඩිකරන ලදි. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නැවත එම වයස අවුරුදු 30 දක්වා අඩුකරන ලදි.( විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සංශෝධනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 ව්‍යවස්ථාව)

## 16.12. විදේශ පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකිකයකුට ජනාධිපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකු වීමට තිබූ බාධකය ඉවත් කිරීම-

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනාධිපති වීමේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකු වීමේ නව නුසුදුසුකමක් ලෙස විදේශ පුරවැසිභාවයක් තිබීම හඳුන්වා දෙන ලදි. ( 19 වන ආණ්ඩුක5ම ව්‍යස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 හා 92ව්‍යවස්ථා බලන්න). 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 15 වන වගන්තිය මගින් මෙම ප්‍රතිපාදන ඉවත් කරන ලදි. ඒ අනුව විදේශ පුරවැසිභාවයක් සහිත පුරවැසියකුට ජනාධිපති හෝ පාර්ලිමේන්තු මන්ත්‍රි වීමේ හැකියා ඇත.

## 16.13.පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සම්බන්ධයෙන් ජනාධිපතිගේ බලතල පුළුල් කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව රැස්වීමෙන් වසරක් ගිය පසුව ජනාධිපතිට සිය අභිමතය පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හැරිමේ බලය පැවතිණි. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම කාලය වසර හතර හමාර දක්වා දීර්ඝ කරන ලදි ( 19වන ව්‍යවස්ථා සංශෝධන දක්වා සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව) 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 12 වගන්තිය මගින් මෙම කාලය වසර දෙකහමාර දක්වා අඩුකරන ලදි. (විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ මෙම කාලය වසරක් ලෙස සඳහන් වූ අතර ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව වසර දෙකහමාර දක්වා දීර්ඝ කරන ලදී)

එසේම 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 70ඇ ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ "පාර්ලිමේන්තුව විසින් විසර්ජන පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු නොලැබූ අවස්ථාවක ඊළග විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසරුවා හැරිය යුත්තේය" යනුවෙනි. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනතේ 17 වන වගන්තිය මගින් මෙම ප්‍රතිපාදනය ඉවත් කරන ලදි. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතේ 12 වන වගන්තිය මගින් යළිත් එම ප්‍රතිපාදනය ස්ථාපිත කරන ලදි.

ඒ අනුව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳව වූ අභිමත බලය තවදුරටත් පුළුල් වීමක් සිදු වේ.

## 16.14. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් ඉවත් කිරීම බලය ජනාධිපතිට පැවරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ඇතුළත් කරන ලද ප්‍රතිපාදනයක් වූයේ කොමිෂන් සභාවේ සාමාජිකයින් ඉවත් කිරීමේදී ජනාධිපති විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ලබාගත යුතු බවයි (19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දක්වා සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(4) ව්‍යවස්ථාව). නමුත් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 8 වන වගන්තිය මගින් ඉහත කී 54(4) ව්‍යවස්ථාව සංශෝධනය කරමින් කොමිෂන් සභා සාමාජිකයන් ඉවත් කිරීමේ අභිමත බලය ජනාධිපතිට ප්‍රදානය කර තිබේ.

## 16.15. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉවත් කිරීමේ අභිමතය ජනාධිපතිට පැවරීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයක් ඉවත් කිරිම පිළිබඳව එතෙක් තිබූ ප්‍රතිපාදනවල සංශෝධනයක් සිදුකරමින් "ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය සහිතව කොමිෂන් සභාවේ කවර වූ හෝ සාමාජිකයකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය" (19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ(6) ව්‍යවස්ථාව ) විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එකී ව්‍යවස්ථාව යළිත් සංශෝධනය කරමින්
(6) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ කවර වූ හෝ සාමාජිකයකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය." යනුවෙන් ප්‍රතිපාදන ඇතුළත් කරමින් අධිකරණ සේවා කොමිෂන් සභාවි ඕනෑම සාමාජිකයකුව ඉවත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට අභිමත බලයක් ලබාදී ඇත.

## 16.16. මැතිවරණ කොමිසමේ බලතල අඩු කිරීම

මැතිවරණයක් පැවැත්වෙන කාලසීමාව තුළ රාජ්‍ය දේපළ යම් දේශපාලන පක්ෂයක හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීම හෝ වළක්වාලීම සඳහා රාජ්‍ය නිලධාරීන් වෙත නියම පැනවීම පිළිබඳව පුළුල් බලතල ලබාදී තිබිණි. එම නියම ගැසට් පත්‍රයේ පළකිරීම පිළිබඳව ප්‍රතිපාදන සලසා තිබිණි. එම බලතල සීමා කරමින් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධන ඇතුළත් කර තිබුනේ (අ)"අවස්ථාවෝචිත පරිදි, අදාළ මැතිවරණය පැවැත්වීම සමග හෝ අදාළ ජනමත විචාරණය පැවැත්වීම සමග හෝ ඍජුව සම්බන්ධ වූ කාරණාවලට පමණක් සීමා විය යුතු බවත සහ(ආ) රාජ්‍ය සේවයට අදාළ යම් කාරණයකට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලන

සීමාව ඇතුළත වූ යම් කාරණයකට හෝ ඍජුව සම්බන්ධ නොවිය යුතු බව,සැක දුරුකිරීම සඳහා මෙයින් සඳහන් කරනු ලැබේ." (විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104අ(2)ආ ව්‍යවස්ථාව) වශයෙනි. එසේම අදාළ නියම ගැසට් පත්‍රයේ පළකිරීම පිළිබඳව තිබූ ප්‍රතිපාදනද මෙම සංශෝධනය මගින් ඉවත් කරන ලදි.

එසේම මාධ්‍ය උපමාන සම්බන්ධව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් ලබාදී තිබූ පුළුල් බලතල සහ එම උපමාන ගැසට් පත්‍රයේ පළකිරීම පිළිබඳව තිබූ ප්‍රතිපාදන විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කර තිබේ.

උපමාන සහ නියමය සාධාරණ හේතුවක් නොමැතිව පිළිපැදීමට අපොහොසත් වන රාජ්‍ය නිලධාරීන්ට දඩ සහ සිරදඬුවම් නියම කිරීම පිළිබඳව ප්‍රතිපාදනද විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කෙටුම්පත මගින් ඉවත් කිරීමට යෝජනා කර තිබුණද කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය මත එම ප්‍රතිපාදන ඉවත් කිරීම වළක්වන ලදි.

## 16.17. ජනාධිපතිගේ වගකීම් අඩු වීම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් 33(1) ව්‍යවස්ථාව යටතේ යන ජනාධිපතිවරයාගේ බලතල සහ කර්තව්‍ය ලෙස පහත සඳහන් වගකීම් පවරා තිබිණ.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද, ආරක්ෂා කරන බවට ද වගබලා ගැනීම;

(ආ) ජාතික ප්‍රතිසන්ධානය හා ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ VIIඅ ව්‍යවස්ථාවේ සඳහන් ආයතනවල නිසි ක්‍රියාකාරීත්වය පහසුකරලීම; සහ

(ඈ) මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණ නිර්මාණය කිරීම තහවුරු කිරීම වන්නේ ය.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනතේ 03 වගන්තිය මගින් මෙම 33(1) ව්‍යවස්ථාව ද ඇතුළුව 33 වන ව්‍යවස්ථා සම්පූර්ණයෙන්ම ඉවත් කර වෙනත් ව්‍යවස්ථාවක් ඇතුළත් කරන ලදි. එකී සංශෝධිත ව්‍යවස්ථාව තුළ ඉහත සඳහන් සියලුම වගකීම් ජනාධිපතිවරයාගෙන් ඉවත් කරන ලදි. නමුත් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පිළිබඳව වූ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුව ඉහත සඳහන් වගකීම් අතරින් (ඇ) වගකීම පහත සඳහන් පරිදි අලුතින් ඇතුළත් කරන ලදි.

"මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි, නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණයක් ඇති කිරීම තහවුරු කිරීම සඳහා බලය ඇත්තේ යත" (20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(ඇ) ව්‍යවස්ථාව) මේ අනුව ජනාධිපතිවරයාගේ වගකීම් අතරින් ඉහත සඳහන් කරන ලද (අ) ආ) සහ (ඇ) යන වගකීම් සම්පූර්ණයෙන්ම ඉවත්වී (ඈ) ව්‍යවස්ථාවද යම් ආකාරයකට සංශෝධනයකට ලක්වී ඇතිබව පැහැදිලිය,

## 16.18. අමාත්‍යංශ ලේකම්වරුන්ගේ ධුරය අවසන්වූ පසු ප්‍රතිපාදන සංශෝධනය

අමාත්‍යංශ ලේකම්වරයකු ධුරය දැරීම නතර වූ විට ඔහු/ඇය කැබිනට් මණ්ඩලය විසින් වෙනත් තනතුරකට පත් කළහැකි බවද එසේ කිරීමේදී ඔහු/ඇයගේ ජ්‍යෙෂ්ඨත්වය අහිමි නොවන බවද 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවි 54(4) ව්‍යවස්ථාවේ සඳහන්ව තිබිණි. මෙම ප්‍රතිපාදනය 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කර තිබිණි.

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් නැවත එම ව්‍යවස්ථාව එසේම ඇතුළත් කර ඇත. ඒ අනුව 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52(4) ව්‍යවස්ථාවෙන් මෙසේ සඳහන් වේ.
අමාත්‍යාංශයක ලේකම්වරයා ධුරය දැරීම එසේ නතර වූ අවස්ථාවක අමාත්‍ය මණ්ඩලය විසින් ඒ ලේකම්වරයා රජයේ සේවයේ වෙනත් යම්කිසි තනතුරකට පත් කරනු ලැබිය හැක්කේ ය. එසේ වුව ද, ලේකම් ධුරයට පත් කරනු ලැබීමට පෙරාතුව ම රජයේ සේවයෙහි හෝ පළාත් පාලන සේවයෙහි හෝ යම්කිසි රාජ්‍ය සංස්ථාවක සේවයෙහි යෙදී සිටි තැනැත්තකු ඒ සේවයෙන් තාවකාලිකව මුදා හරිනු ලැබුවාක් සේ සැලකියයුතු අතර, ලේකම්වරයකු වශයෙන් ධුරය දැරීම නතර වූ විට ඒ තැනැත්තාට ජ්‍යෙෂ්ඨතාවය අහිමි වීමක් නොමැතිව එකී සේවයට ආපසු පැමිණීමට හිමිකම තිබිය යුත්තේ ය.

## 16.19. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් වැඩි කිරීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119(1) ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ සංයුතිය වන්නේ "ශ්‍රේෂ්ඨාධිකරණය, අග්‍ර විනිශ්චයකාරවරයාගෙන් ද හය දෙනකුට නොඅඩු සහ දස දෙනකුට නොවැඩි වෙනත් විනිශ්චයකාරවරයන් සංඛ්‍යාවකගෙන් ද සමන්විත වන්නේය." යනුවෙනි. ඒ අනුව 1978 වසරේ සිටම ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්ගේ උපරිම සීමාව එකළොස් දෙනෙකුට සීමා වී තිබිණි. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් 119 (1) ව්‍යවස්ථාවට සංශෝධනයක් එක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ උපරිම සංඛ්‍යව අගවිනිසුරු සහ වෙනත් විනිශ්චයකාරවරුන් 16ක් දක්වා වැඩි කරන ලදි.

මෙම සංශෝධනය නවතම සංශෝධනයක් වන අතර එය විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ ඇතුළත්ව නොතිබුණ අතර එය 2020 ඔක්තෝබර් 19 දින කැබිනට් තීරණයක් මගින් තීරණය කරන ලද කරුණක් වේ.

## 16.20. අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් වැඩි කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 137 ව්‍යවස්ථාවට අනුව අභියාචනාධිකරණයේ විනිසුරුවරුන්ගේ සංයුතිය වන්නේ සභාපතිවරයා සහ වෙනත් විනිශ්චයකාරවරයන් හය දෙනකුට නොඅඩු හා එකළොස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්ද වේ. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් 137 ව්‍යවස්ථාව සංශෝධනය කරමින් අභියාචනාධිකරණයේ උපරිම විනිසුරු සංඛ්‍යාව සභාපති සහ වෙනත් විනිශ්චයකාරවරයන් 19ක් දක්වා වැඩි කර ඇත. මෙම සංශෝධනය නවතම සංශෝධනයක් වන අතර එය විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේ ඇතුළත්ව නොතිබුණ අතර එය 2020 ඔක්තෝබර් 19 දින කැබිනට් තීරණයක් මගින් තීරණය කරන ලද කරුණක් වේ.

## 16.21. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පැරණි සහ නව සංශෝධන

මෙම සංශෝධන සියල්ල පිළිබඳව සැලකිල්ලෙන් පරීක්ෂා කරන විට මෙහි සඳහන් වන බොහෝ සංශෝධන 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පෙර ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රතිපාදන නැවත හඳුන්වාදීමක් ලෙස පෙනී යයි.

ඒ අනුව මෙතෙක් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සදහන් නොවූ අලුතින්ම හඳුන්වා දුන් සංශෝධන වන්නේ

- ◆ පනත් කෙටුම්පතක් පිළිබඳව පාර්ලිමේන්තු විවාදයේ කාරක සභා අවස්ථාවේදී එකී පනත් කෙටුම්පතට සිදුකළ හැකි සංශෝධන සම්බන්ධයෙන් සීමා ඇති කිරීම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද නවතම සංශෝධනයකි. ඒ අනුව "(3) පනත් කෙටුම්පතකට පාර්ලිමේන්තුව තුළ දී යෝජනා කරනු ලබන යම් සංශෝධනයක් ඒ පනත් කෙටුම්පතේ හරයට සහ මූලධර්මවලට පරිබාහිර සංශෝධනයක් නොවිය යුත්තේ ය. යනුවෙන් නව ප්‍රතිපාදනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලදි( විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78(3) ව්‍යවස්ථාව)
- ◆ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව අගවිසුරුවරයාත් ඇතුළුව 17 දෙනෙක් දක්වා වැඩි කිරීම විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දුන් නවතම ප්‍රතිපාදනයකි. විශේෂයෙන්ම 1978 වසරෙන් පසුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවූ පළමු අවස්ථාව මෙම අවස්ථාවයි.

- අභියාචනාධිකරණයේ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව සභාපති විනිසුරුද ඇතුළුව 20 දෙනෙක් දක්වා වැඩි කිරීම විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දුන් නවතම ප්‍රතිපාදනයකි. විශේෂයෙන්ම 1978 වසරෙන් පසුව අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවූ පළමු අවස්ථාව මෙම අවස්ථාවයි.

මෙයට අමතරව හදිසි පනත් කෙටුම්පත් ගෙන ඒම පිළිබඳව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉවත් කරන ලද ප්‍රතිපාදනය 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නැවත හඳුන්වාදීමේදීද එකී ව්‍යවස්ථාව 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැවති ව්‍යවස්ථාවට වඩා සංශෝධන 2ක් එකතු කර ඇත. එනම් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව හදිසි පනත් ගෙන ආ හැක්කේ අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හෝ ආපදා කළමනාකරණයට අදාළ යම් කාරණයක කාර්යය සඳහා වහා අවශ්‍ය වන්නා වූද පනත් කෙටුම්පත් පමණි.

දෙවන සංශෝධනය නම් හදිසි පනත් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ගෙන ආ නොහැකි බවට වන ප්‍රතිපාදනයයි. ඒ අනුව මෙම 122 ව්‍යවස්ථාව නැවත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වාදී ඇත්තේ යම් ආකාරයක කැබිනට් මණ්ඩලයේ අභිමතය අඩු කරමින් බව පෙනී යයි. මෙම ප්‍රතිපාදනය ඉවත් කරන ලෙස ආණ්ඩුවට බාහිරව සහ අභ්‍යන්තරව ඇති වූ බලපෑම නිසා මෙම වෙනස්කම් සිදුවූ බව විශ්වාස කළ හැකිය.

# දාහත්වන පරිච්ඡේදය

## විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ බලපෑම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් වූ ප්‍රධානතම විවේචනයක් වූයේ ජනාධිපතිධුරය වටා විශාල බලයක් ඒකරාශී වීමය. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව සහ ජනාධිපති අතර සබඳතාවය පිළිබඳව විවේචනයක යෙදෙන ආචාර්ය එන්.එම්. පෙරේරා පවසන්නේ "පාර්ලිමේන්තුව අසමාන වූ යටහත් තත්ත්වයකට හෙළා තිබේ" (පෙරේරා, 1996:67) යනුවෙනි.  එසේම රාජ්‍ය සේවය සම්බන්ධ වූ සියලුම බලතල කැබිනට් මණ්ඩලයට ලබාදීම මගින් රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීමට අවස්ථාව සලසා තිබිණි (1972 ව්‍යවස්ථාවට වඩා 1978 ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් තත්ත්වය යහපත්ය). එසේම 1978 ව්‍යවස්ථාව භාවිතාව තුළින් හඳුනාගත් තවත් ප්‍රශ්නකාරී තත්ත්ව දෙකක් වූයේ පොලිසිය දේශපාලනීකරණය වීම සහ මැතිවරණ ස්වාධීන නොවීමයි. මෙම තත්ත්වයට පිළියමක් ලෙස 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හඳුන්වාදීම මැතිවරණ සහ ජාතික පොලිස් කොමිෂන් සභාව පිහිටුවීම සිදුකරන ලදි. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙම තත්ත්වය ආපසු හැරවීමක් සිදුකළා පමණක් නොව ජනාධිපති ධුර දැරීමේ වාර ගණනද අසීමිත කරන ලදි.19 වන සංශෝධනයෙන් නැවත වරක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යළිත් බලවත්ව ස්ථාපනය කරන ලද අතර විගණන සේවා කොමිෂන් සභාව සහ ප්‍රසම්පාදන කොමිෂන් සභාවද ස්ථාපනය කරන ලදි. ජනාධිපතිගේ බලතල යම්තාක් දුරට අඩු කරන ලදි. එකී ව්‍යවස්ථා ප්‍රතිපාදන මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අවුල් සහගත තත්ත්වයක් ඇති වූ බව ප්‍රකාශ කරමින් ගෙන ආ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුවිය හැකි බලපෑම් පිළිබඳව මෙම පරිච්ඡේදය මගින් විග්‍රහයක් සිදු කරනු ලැබේ.

## 17.1. රාජ්‍ය සේවයට සිදුවන බලපෑම

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් රාජ්‍ය සේවයට සිදු වූ ප්‍රධානතම බලපෑම වන්නේ රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ස්වාධීනතාව අහිමි වීමයි. කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීමේදී මෙන්ම ඉවත් කිරීමේදීද ජනාධිපතිගේ අභිමතය පමණක් ක්‍රියාත්මක වන අතර පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ පමණක් ලබාගනියි. එය හුදු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සැරසිල්ලක් පමණක් වන අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ස්වාධීනතාව ජනාධිපති වෙත යටහත් වී ඇත. රාජ්‍ය සේවයේ නියාමනය සිදුකරන යන්ත්‍රණය ස්වාධීනත්වයෙන් තොර වූ විට සිදුවන අනිවාර්ය සිදුවීම වන්නේ ඒ යටතේ පවතින රාජ්‍ය සේවයද ස්වාධීනතාවයෙන් තොරව දේශපාලනීකරණය වීමයි. එම නිසා රාජ්‍ය සේවයේ පත්වීම්, ස්ථානමාරු, උසස්වීම් මෙන්ම විනය කටයුතු සඳහාද දේශපාලන බලපෑම් එල්ලවීම වැළැක්විය නොහැකිය.

## 17.2. අධිකරණ ක්ෂේත්‍රයට සිදුවන බලපෑම

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඕනෑම සාමාජිකයකු හේතු දක්වා ඉවත් කිරීමේ බලතල 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපති වෙත පැවරේ.අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකත්වය දරන්නේ අගවිනිසුරු සහ තවත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකි. එවැනි ඉහළ පෙළේ විනිසුරුවරු අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් ඉවත් කිරීමේ අභිමත බලය ජනාධිපතිට පැවරිම මගින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ස්වාධීනත්ව කෙරෙහි තදබල ලෙස බලපානු ඇත. පහළ අධිකරණවල විනිසුරුවරු පත් කිරීම, ස්ථාන මාරු සහ විනය කටයුතු මෙන්ම මහාධිකරණ විනිසුරුවරුන්ගේ ස්ථාමාරු කිරීම්ද භාරව කටයුතු කරන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවයි. එමෙන්ම අධිකරණවල සේවය කරන උපලේඛනගත නිලධාරීගේ පත්කිරීම්, ස්ථාන මාරු, උසස් කිරීම් සහ විනය කටයුතු භාරවන්නේද අධිකරණ සේවා කොමිෂන් සභාවටයි. ඒ හැරුණු විට පරිපාලන අභියාචන විනිශ්චය සභාවේ විනිසුරුවරුන් පත් කිරීම සහ කාති මණ්ඩලය පත්කිරීමද අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි. අධිකරණ ක්‍රියාවලියේ වැදගත් නියාමන ආයතනයක් වන මෙම කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට බාධා ඇති වීම යනු සමස්ත අධිකරණ පද්ධතියේම ස්වාධීනතාවයට බරපතල ලෙස බලපෑම් සිදුවේ.

එසේම අභියාචනාධිකරණයට සහ ශ්‍රේෂ්ඨාධිකරණයට විනිසුරුවරුන් පත් කිරීම මෙන්ම අගවිනිසුරු සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් පත් කිරීම පිළිබඳව අභිමත බලය ජනාධිපති වෙත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ලබාදී තිබේ. කිසිම සීමාවකින් හෝ පාලනයකින් තොරව ලැබී

ඇති මෙම බලතල මගින් ජනාධිපතිට ඉහළ අධිකරණවලට බලපෑම් සිදු කිරීම සඳහා අවස්ථාවක් හිමිකර දෙනු ලැබේ.

විශේෂයෙන්ම අධිකරණය විධායකයෙන් සහ ව්‍යවස්ථාදායකයෙන් වෙන්ව ස්වාධීනව පැවිතිය යුතු ආයතනයක් ලෙස සලකනු ලබන්නේ එහි ස්වාධීනත්වය නීතියේ ආධිපත්‍යයට එතරම්ම වැදහත් වන බැවිනි.

## 17.3. මානව හිමිකම් ක්ෂේත්‍රයට සිදුවන බලපෑම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ සඳහන් මූලික අයිතිවාසිකම් ආරක්ෂාකර දීම සම්බන්ධයෙන් රජයේ ආයතන කිහිපයක් වැදගත් වේ. එනම් 4(ඇ) වන ව්‍යවස්ථාවේ දක්වන්නේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම රජයේ සියලුම පාලන ආයතනවලට ඇති බවයි. එසේම විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයකදී හෝ උල්ලංඝනය වීමට අත්‍යාසන්න අවස්ථාවකදී ඒ සඳහා සහන ලබාගැනීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සමක් ගොනුකළ හැකි බව දක්වේ. එයට අමතරව 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත යටතේ දක්වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයකදී හෝ උල්ලංඝනයට අත්‍යාසන්න තත්ත්වයකදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඒ පිළිබඳව විමර්ශනයක් සිදුකර සහන නිර්දේශ කළ හැකි බවයි. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අදාළ මෙම ප්‍රධාන ආයතන ව්‍යුහ තුනටම බලපෑම් ඇති වී තිබෙන බව පැහැදිලිය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) වන ව්‍යවස්ථාවේ සඳහන් පරිදි මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ සහ ප්‍රවර්ධනය කිරීමේ වගකීම පැවරී ඇති රජයේ පාලන ආයතන තුන වන විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය අතරින් විධායකට අයත්වන රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් බලපෑම් ඇති වූ බව ඉහත ඡේදයෙන් අප සාකච්ඡා කළෙමු. එසේම පාලන ආයතනවල තවත් අංගයක් වන අධිකරණයේ ස්වාධීනත්වයටද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් බාධා ඇතිවන බව සාකච්ඡා කළෙමු. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ වගකීම පැවරී ඇති ආයතන තුනෙන් දෙකකම ස්වාධීනත්වයට බලපෑම් එල්ල වීම පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂාවට හිතකර තත්ත්වයක් නොවන බව අමුතුවෙන් විස්තර කළ යුතු නැත.

එසේම 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට කොමසාරිස්වරුන් පත් කිරීමේ අභිමත බලය 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

සංශෝධනය මගින් ජනාධිපති වෙත පැවරේ. එමගින් කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට විශාල බලපෑමක් සිදුවේ. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වන පැමිණිලි පිළිබඳව පමණක් නොව ස්වකැමැත්ත මත ස්වේච්ඡාවෙන් මූලික අයිතිවාසිකම් පිළිබඳවගැටලු ඇතිවන විට මැදිහත්වීමේ අයිතියද පවතී. එබැවින් කොමිෂන් සභාවේ ස්වාධීනත්වය පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සෘජුවම බලපානු ලබයි.

## 17.4. රාජ්‍ය විගණනයට සිදුවන බලපෑම

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය විගණනය ස්වාධීන කිරීම සඳහා ගත් උත්සාහයක් වූයේ විගණන සේවා කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීමයි. එමගින් අපේක්ෂා කරන ලද්දේ රාජ්‍ය විගණන කාර්යයට සම්බන්ධ සියලු රාජ්‍ය සේවකයයින් සඳහා වෙනම සේවාවක් ස්ථාපනය කර එකී සේවාව නියාමනය කිරීම සඳහා වෙනම කොමිෂන් සභාවක් ආරම්භ කිරීමයි. එමගින් විගණන සේවාව ස්වාධීන කිරීම අපේක්ෂා කරන ලදි. ස්වාධීන විගණන සේවාවක් මගින් බලපෑම්වලින් තොරව විගණනය සිදු කිරීම වඩාත් ඵලදායි ලෙස සිදුකිරීමට අවස්ථාව එමගින් ලැබෙනු ඇත. නමුත් 20 වන සංශෝධනය මගින් විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කරන ලදි. එමෙන්ම විගණනයේ යෙදෙන සියලුම නිලධාරීන් රාජ්‍ය සේවා කොමිසන් සභාවට යටත් කරන ලදි. එමගින් විගණනයේ ස්වාධීනත්වය බරපතල ලෙස උල්ලංඝනය වනු ඇත.

## 17.5. පාර්ලිමේන්තුවේ බලතල සම්බන්ධයෙන් සිදුවන බලපෑම

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනාධිපතිධුරයේ බලතල වැඩි කිරීම හරහා පාර්ලිමේන්තුවේ බලතල කප්පාදු වීමක්ද සිදුවී ඇත. විශේෂයෙන් පාර්ලිමේන්තුව තම අභිමතය මත වසර හතරහමාරකින් පසුව විසුරුවා හැරීමට ජනාධිපතිට තිබූ බලතල වසර දෙකහමාර දක්වා අඩු කිරීමෙන් පාර්ලිමේන්තුවේ බලතල සඳහා බලපෑමක් සිදුවේ. ඒ අනුව වසර දෙකහමාරකින් පසුව පාර්ලිමේන්තුවේ පැවැත්ම පවතින්නේ ජනාධිපතිගේ අභිමතය මතය. එසේම අයවැය එකපිටම දෙවරක් පරාජය වුවහොත් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලයද ජනාධිපති වෙත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් නැවත හඳුන්වා දීමක් සිදුකර ඇත.

එමෙන්ම පාර්ලිමේන්තුවේ ප්‍රධානියා වන අගමැතිට 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පවරා තිබූ අමාත්‍ය මණ්ඩලය සම්බන්ධ සියලු බලතලද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් යළි ජනාධිපති වෙත පවරා තිබේ.

## 17.6. තොරතුරු දැනගැනීමේ අයිතියට සිදුවන බලපෑම

තොරතුරු දැනගැනීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් අතර 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් එකී ව්‍යවස්ථාවේ කිසිදු සංශෝධනයක් සිදුනොකරන ලදි. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීම සහ ඒ වෙනුවට පාර්ලිමේන්තු සභාව ස්ථාපනය කිරීම මගින් තොරතුරු අයිතිවාසිකම් කොමිෂන් සභාව සඳහා කොමසාරිස්වරුන් පත්කිරීමේ අභිමතය ජනාධිපති වෙත පැවරීම 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුව ඇත. තොරතුරු අභියාචනා විනිශ්චය කිරීම, තොරතුරු රීති පැනවීම, මාර්ගෝපදේශ නිකුත් කිරීම, නඩු පැවරීම ආදී තොරතුරු අයිතියට අදාළ නියාමන කටයුතු සිදුකර තොරතුරු කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් පත් කිරීම සඳහා 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ සම්පාදනය කර ඇති ඉතාමත් ස්වාධීන වූ ප්‍රතිපාදන මෙම සංශෝධනය මගින් සම්පූර්ණයෙන්ම අහෝසි වී යයි. එසේම කොමසාරිස්වරුන් ඉවත් කිරීමේ අභිමත බලයද මෙම සංශෝධනය මගින් ජනාධිපති වෙත පැවරී ඇත. එමගින් කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට බරපතල ලෙස හානි සිදුවේ. මෙම තත්ත්වය පුරවැසියන්ගේ තොරතුරු අයිතියට සෘජුවම බලපානු ලබයි. එසේම තොරතුරු ලබාදීමේ ව්‍යවස්ථාපිත වගකීම පැවරී ඇත්තේ පොදු අධිකාරි වෙතය. පොදු අධිකාරිවල තොරතුරු භාරය සන්තකය සහ පාලනය දරනු ලබන්නේ රාජ්‍ය සේවකයන්ය. 20 වන සංශෝධනය මගින් රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට බාධා පැමිණවීමත් පුරවැසියන්ගේ තොරතුරු අයිතියට සෘජුවම බලපානු ලබයි.

## 17.7. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලයට සිදුවන බලපෑම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් විශේෂිත ප්‍රතිපාදනයක් වූයේ හදිසි පනත් ගෙන ඒමට රජයට බලයක් ලබාදීමයි. ඒ අනුව ජනතාවට අදහස් දැක්වීමට අවස්ථාවක් නොදී පනත් ගෙන ඒමේ හැකියාව පැවතිණි. එම ප්‍රතිපාදන ඇතුළත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මුළුමනින්ම අහෝසි කරන ලදි. නමුත් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එකී වගන්තිය නැවත හඳුන්වාදෙන ලදි. නමුත් 1978 ව්‍යවස්ථාවේ සඳහන් වූ ආකාරයට වඩා වෙනස් ආකාරයකට මෙම ව්‍යවස්ථාව හඳුන්වා දෙන ලදි. ඒ අනුව හදිසි පනත් ගෙන ඒමට සීමාවක් පනවමින් හදිසි පනත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැක්කේ ජාතික ආරක්ෂාව හෝ ආපදා කලමණාකරනයට න කරුණු දෙක සඳහා පමණක් බවයි. දෙවෙනි සංශෝධනය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන හදිසි පනත් ලෙස ගෙන ඒමට බලයක් නොමැති බවට ප්‍රතිපාදනයක් ඇතුළත් කිරීමයි. මේ අනුව හිදිසි පනත් ගෙන ඒමේ ක්‍රමවේදය නැවත හඳුන්වාදීම මගින් ජනතාවට එකී පනත්

පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාවක් නොමැති වීම මත ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සම්බන්ධයෙන් තිබෙන බලතල සීමාවන නමුත් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාවට වඩා 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් 122 ව්‍යවස්ථා යම් ආකාරයක සීමාවලට යටත්ව ක්‍රියාත්මක වන බව අපේක්ෂා කළ හැකිය.

එසේම 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට දින 14කට පෙර ගැසට් පත්‍රයේ පළකළ යුතු වුවද 20 වන සංශෝධනය මගින් එම කාලය දින 7 දක්වා අඩු කරන ලදි. එම ප්‍රතිපාදනය මගින්ද නීති පැනවීමේ කාර්යයේදී ජනතාව සහභාගීවීමට පවතින ඉඩකඩ සීමා කිරීමක් සිදු වේ.

## 17.8. පාර්ලිමේන්තු පනත් මගින් ස්ථාපනය කරන ලද ඇතැම් ස්වාධීන ආයතනවලට සිදුවන බලපෑම

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදුකරන ලද ප්‍රධානම ව්‍යවස්ථා වෙනස වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කිරීමය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මගින් ලබාදී ඇති වගකීම්වලට අමතරව පහත සඳහන් පනත් මගින්ද වගකීම් පවරා ඇත.

- 2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනත
- 2002 අංක 32 දරන මුදල් නීති (සංශෝධන) පනත
- 2002 අංක 35 දරන මහජන උපයෝගිතා පනත
- 2016 අංක 12 දරන තොරතුරු අයිතිවාසිකම් පනත
- 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනත
- 2018 අංක 34 දරන හානිපූර්ණය සඳහා වන කාර්යාල පනත

ඒ අනුව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මුදල් මණ්ඩලයේ සහ මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සමාජිකයන් පත්කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟතාවය ලබාගත යුතුය. එසේම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිෂන් සභාව, අතුරුදහන් වූ තැනැත්තන් සඳහා වූ කාර්යාලය සදහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින් පත් කිරීම සඳහා ජනාධිපති වෙත නිර්දේශ කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසිනි. එසේම ඔවුන් ඉවත් කිරීමේදීද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟතාව ලබාගත යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කර ඒ වෙනුවට පිහිට වූ පාර්ලිමේන්තු සභාව ඒ වෙනුවට මෙම පනත් සම්බන්ධයෙන් ආදේශ වන බව 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 59 වන වගන්තියේ මෙසේ සඳහන් වේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය හෝ අනුමතය ලබාගැනීම සඳහා යම් ලිඛිත නීතියකින් නියම කර ඇති අවස්ථාවක දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කරනු ලබන ඒ සඳහන, පාර්ලිමේන්තු සභාවට කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු යයි සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ".

නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කර 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපනය කරන ලද පාර්ලිමේන්තු සභාව කිසිදු බලයක් නොමැති ආයතනයක් වීම මත මෙම ආයතන සියල්ලේම පත් කිරීම් ජනාධිපතිගේ පරම අභිමතය මත සිදුවනු ඇත. එය මෙම සියලුම ආයතනවල ස්වාධීන පැවැත්මට ඉතාමත් අහිතකරය.

කෙසේ නමුත් 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ආරම්භයේ සිටම එරෙහි වූයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ වමේ පක්ෂ කීහිපයයි. විරෝධයට ප්‍රධාන හේතුව වූයේ ජනාධිපති වටා අධික බලයක් සංකේන්ද්‍රණය වීම මගින් ව්‍යවස්ථාපිත ඒකාධිපතියෙකු බිහිවන බවයි. 1978 ව්‍යවස්ථාවේ විධායක ජනාධිපති බලතල ආරක්ෂා කිරීමට එවකට උත්සාහ දරන ලද්දේ එක්සත් ජාතික පක්ෂයයි. නමුත් 2005 වසරේ සිට මෙම තත්ත්වය වෙනස් වන්නට විය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ ඔවුන්ගේ අනුප්‍රාප්තික පාක්ෂිකයන් මෙන්ම වමේ පක්ෂද (ජවිපෙ හැරුණ විට) විධායක ජනාධිපති ධුරය අවසන් කිරීමට එතරම් උනන්දුවක් දක්වූයේ නැත. ඔවුන් ඒ වන විට ආණ්ඩු බලය අත්පත් කරගෙන සිටි අතර 2001 වසරේදී සිදුකරන ලද 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිගෙන් ඉවත් කරන ලද බලතල පවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පිටින් යමින් භාවිත කිරීමට උත්සාහ කරන ලදි. එක්සත් ජාතික පක්ෂය විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කරන සහ විධායක ජනාධිපතිධුරය අවසන් කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්බන්ධව සහයෝගය පළකරමින් පසුවිය. විශේෂයෙන්ම 2010 වසරේදී එවකට පොදුජන එක්සත් පෙරමුණ නමින් හැඳින්වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ වාමාංශික පක්ෂ රැසකින් සමන්විත ආණ්ඩු පක්ෂය විසින් 1978 ව්‍යවස්ථාවට මෙතෙක් නොවූ විරූ ආකාරයේ ශක්තිමත් විධායක ජනාධිපති ධුරයක් ප්‍රධානය කරන ලද බව පැහැදිලිය. එකී අධිබලැති විධායක ජනාධිපතිධුරයට එරෙහි වූයේද 19 වන සංශෝධනය මගින් යළිත් ජනාධිතිධුරයේ බලතල අඩු කිරීමට පියවර තැබුවේද එක්සත් ජාතික පක්ෂයේ මූලිකත්වයෙනි. යළිත් 2020 වසරේදී අධිබලැති ජනාධිපති ධුරයක් ස්ථාපනය වන

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනුප්‍රාප්තියකයන් සහ පැරණි වමේ එකතුවක් වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු ආණ්ඩුවක් මගිනි. දේශපාලන පක්ෂවල අභිලාෂ මේ ආකාරයට අංශක 180කින්ම වෙනස් වීම දෛවෝපගත කරුණකි.

# ආශ්‍රිත මූලාශ්‍රය

## ග්‍රන්ථ


1. පෙරේරා. ඇන්. ඇම්. (1996) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි විවේචනාත්මක විශ්ලේෂණයක්, කොළඹ, ස්ටාර් මුද්‍රණාලය
2. නිශ්ශංක, කමල් (2008) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෙවත් 1931 ලංකා (රාජ්‍ය මන්ත්‍රණ සභා) රාජ මණ්ඩල ආඥාව, කර්තෘ ප්‍රකාශන
3. ද සොයිසා, එම්. ඕ. ඒ. (2009) දේශපාලන විද්‍යාවේ මූලික සිද්ධාන්ත, කැලණිය, සංඛ පොත්හල
4. සෝමසුන්දරම්, එම්. තර්මකුලසිංහම්, ආර්. අහමඩ්, සෙයිඩ් එම්. අයි. (2000)ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 2000ඵපාර්ලිමේන්තු විවාද එම්. අයි. සෙයිඩ් අහමඩ් ජනවාර්ගික කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අංශය
5. දිසානායක ධම්ම, ලියන ආරච්චි ජගත් (2020) ශ්‍රී ලංකාවේ ස්වාධීන කොමිෂන් සභා,පැෆ්රල් සංවිධානය, කොළඹ
6. හේරත්, හේ. මු. ති. දි. (2016) මැතිවරණ දෙපාර්තමේන්තුවේ සිට මැතිවරණ කොමිෂන් සභාව තෙක්, සුගත් වටගෙදර සංස්කරණය, සර්වජන ඡන්ද බලය 1931 - 2016ත ඩොනමෝර් කොමිෂන් සභාවේ සිට මැතිවරණ කොමිෂන් සභාව දක්වා, කොළඹ, මැතිවරණ කොමිෂන් සභාව.
7. ජාතික සාම මණ්ඩලය (2008) 17 වන සංශෝධනය විමර්ශනාත්මක ලිපි එකතුව. කොළඹ
8. අලවත්තගේ, ප්‍රේමදාස ශ්‍රී (2014) ශ්‍රී ලංකා මැතිවරණ ප්‍රතිඵල සංග්‍රහය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ කොළඹ

9. ලියන ආච්චි ජගත් (2017), 17, 18 සහ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ හැඳින්වීමක්, ජනාධිපති මාධ්‍ය ඒකකය, කොළඹ
10. විජේසූරිය, සරත් (2016) යහපත් රාජ්‍ය පාලනයක් උදෙසා කැප කළ ජීවිතය - සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරය, කොළඹ.
11. තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව (1990), කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
12. වෙනසකට එක්වෙමු මෛත්‍රී පාලනයක් 100 දිනකින් අලුත් රටක් ( 2014)
13. මහින්ද චින්තන (2005) කොළඹ
14. මහින්ද චින්තන ඉදිරිදැක්ම (2010) කොළඹ
15. මහින්ද චින්තන ලොව දිනන මග (2014) කොළඹ
16. මෛත්‍රී පාලනයක් ස්ථාවර රටක් (2014) කොළඹ
17. ගෝඨාභය රටහදන සෞභාග්‍යයේ දැක්ම (2019) කොළඹ
18. Edirisinghe, Rohan, Gomez, Mario, Thamilmaran, VTand Welikala, Asanga(2008),Power-Sharing in Sri Lanka Constitutional and Political Documents- 1926-2008, Colombo, Centre for Policy Alternatives (CPA)
19. Decision of The Supreme Court on Parliamentary Bills-1991-2003 Volume VII, Parliamentary secretariat, (2001) Kotte,
20. The report of the citizens consultation on free & fair elections and depoliticization of key institutions (1998), Colombo, Drafting Committee of citizens consultation on free & fair elections and depoliticization of key institutions
21. The Government's Proposals for Constitutional Reform (1997) Colombo
22. Seventeenth Amendment to the Constitution (2000), Colombo, The Organization of the Professional Associations of Sri Lanka

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

- The Constitution of Ceylon; February, 1948(1970) Colombo, Department of Government Printing
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (2001 ඔක්තෝබර් මස 03 වන දින දක්වා සංශෝධිතයි) (ප්‍රතිශෝධිත මුද්‍රණය 2009) බත්තරමුල්ල, පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (2010 සැප්තැම්බර් මස 09 වන දින දක්වා සංශෝධිතයි) (ප්‍රතිශෝධිත මුද්‍රණය 2013) බත්තරමුල්ල,පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව(2015

මැයි මස 15 වන දින දක්වා සංශෝධිතයි) (ප්‍රතිශෝධිත මුද්‍රණය 2015)බත්තරමුල්ල,පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය

## පනත්/ගැසට් නිවේදන/චක්‍රලේඛ පනත්


- 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනත (2002) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත (1996) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 1994 අංක 1 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව පනත (1994)කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2002 අංක 05 දරන නිලධරයන් ඉවත්කිරීමේ (කාර්ය පටිපාටිය) පනත (2002) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත (2016) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත (2016) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2018 අංක 34 දරන හානි පූරණය සඳහා වන කාර්යාලය පනත (2018) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2002 අංක 24 දරන සුබසාධන ප්‍රතිලාභ පනත (2002) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2002 අංක 32 දරන මුදල් නීති (සංශෝධන) පනත (2002) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත (2002) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2018 අංක 19 දරන ජාතික විගණන පනත (2018)කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2002 අංක 3 දරන නිසි බලධාරී (බලතල හා කර්තව්‍ය) පනත (2002) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 1951 අංක 13 දරන විවාහ සහ දික්කසාද(මුස්ලිම්) පනත - https://www.lawnet.gov.lk/marriage-and-divorce-muslim-3/ (Accessed on - 2/9/2020)
- 1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනත https://www.lawnet.gov.lk/02-of-1978-37-of-1979/(Accessed on- 2/9/2020)

## ගැසට් නිවේදන

- 2009 පෙබරවාරි 20 වැනි දින අංක 1589/30 දරන අති විශෙෂ ගැසට් පත්‍රය (2009)කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2014 නොවැම්බර් 20 දින අංක 1889/31 දරන අති විශෙෂ ගැසට් පත්‍රය (2014) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2017 අප්‍රේල් මස 24 වන දින අංක 2016/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය (2017)කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2018 මැයි 09 දින හා අංක 2070/15 දරන අති විශේෂ ගැසට් පත්‍රය (2018)කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2018 ජූනි 13 දින හා අංක 2075/26 දරන අති විශේෂ ගැසට් ගැසට් පත්‍රය (2018)කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2019 ඔක්තෝබර් 12 දින හා අංක 144/68 දරන අති විශේෂ ගැසට් පත්‍රය(2019)කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2018 නොවැවම්බර් මස 09 දින හා අංක 2096/70 දරන අති විශෙෂ ගැසට් පත්‍රය (2018) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- 2018 දෙසැම්බර් මස 16 දින අංක 2101/39 දරන අති විශෙෂ ගැසට් පත්‍රය (2018) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

## චක්‍රලේඛ, උපදෙස් මාලා, වාර්තා

- 2011-12-13 දිනැති හා අංක 05/2011 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛය
- 2011-12-20 දිනැති හා අංක 05/2011(ස) දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛය
- PROCUREMENT MANUAL; Selection and Employment of Consultants (2018) Colombo, National Procurement Commission
- PROCUREMENT MANUAL; Good, works, services and information systems (2018) Colombo, National Procurement Commission
- Sri Lanka National Procurement Commission Action Plan (2016) Colombo National Procurement Commission
- ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2016-08-30 දින අංක NPC/CIRCU/2016/01/02 දරන චක්‍රලේඛය
- ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ අංක NPC/ESTAB/2016/02 දරන චක්‍රලේඛය (2016-05-30 දින)
- ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාා චක්‍රලේඛ අංක 3 (2017-04-05 දින) NPC/ESTAB/2016/03

- ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාා චක්‍රලේඛ අංක 4 (2018-06-08 දින) NPC/PP/Circulars/57
- වාර්ෂික වාර්තාව 2016 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණන සේවා කොමිෂන් සභාව, කොළඹ, ජාතික විගණන කොමිෂන් සභාව
- වාර්ෂික වාර්තාව 2017 - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණන සේවා කොමිෂන් සභාව, කොළඹ, ජාතික විගණන කොමිෂන් සභාව
- First Report of the Constitutional Council from July 2015 to November 2015 – 2016 Constitutional Council
- අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ 2009 ජූනි 25 දින අංක 09/1041/360/034 දරණ ලිපිය
- අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ 2009 නොවැම්බර් 11 දින අංක 09/1041/360/034 දරණ ලිපිය

## හැන්සාඩ් වාර්තා

- පාර්ලිමේන්තු විවාද (හැන්සාඩ්) 2001-09 -24 - කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- පාර්ලිමේන්තු විවාද (හැන්සාඩ්) 2008-03-18 -කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- පාර්ලිමේන්තු විවාද (හැන්සාඩ්) 2010-09-07 -කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- පාර්ලිමේන්තු විවාද (හැන්සාඩ්) 2010-09-08 -කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- පාර්ලිමේන්තු විවාද ( හැන්සාඩ්) 2015-04-28 -කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- පාර්ලිමේන්තු විවාද ( හැන්සාඩ්) 2015-04-27 -කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- පාර්ලිමේන්තු විවාද ( හැන්සාඩ්) 2015-11-22-කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- පාර්ලිමේන්තු විවාද ( හැන්සාඩ්) 2018-03-18 -කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තු විවාද ( හැන්සාඩ්) 2020-09-08 කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- පාර්ලිමේන්තු විවාද ( හැන්සාඩ්) 2020-09-22 කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- පාර්ලිමේන්තු විවාද ( හැන්සාඩ්)2020-08-20 -කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

- පාර්ලිමේන්තු විවාද ( හැන්සාඩ්) 2020-10-21 -කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව-
- පාර්ලිමේන්තු විවාද ( හැන්සාඩ්) 2020-10-22 -කොළඹ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

## වෙබ් අඩවි

- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය - http://www.psc.gov.lk
- ජාතික පොලිස් කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය - https://www.npc.gov.lk
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවිය - https://www.parliament.lk
- අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නිල වෙබ් අඩවිය - http://www.cabinetoffice.gov.lk
- විගනන සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවිය - http://www.asc.gov.lk
- ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභා නිල වෙබ් අඩවිය - https://www.nprocom.gov.lk
- මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය - https://elections.gov.lk
- රජයේ නිල පුවත් වෙබ් අඩවිය- https://news.lk
- නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ නිල වෙබ් අඩවිය - https://www.fmmsrilanka.lk
- විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නිල වෙබ් අඩවිය - https://www.cpalanka.org
- අයිටීඑන් ප්‍රවෘත්ති වෙබ් අඩවිය - https://www.itnnews.lk
- දිනමිණ ප්‍රවෘත්ති වෙබ් අඩවිය - http://www.dinamina.lk
- අද දෙරන ප්‍රවෘත්ති වෙබ් අඩවිය - http://www.adaderana.lk
- බීබීසී ප්‍රවෘත්ති වෙබ් අඩවිය - https://www.bbc.com
- ඉන්ෆොලංකා ප්‍රවෘත්ති වෙබ් අඩවිය - http://www.infolanka.com
- මව්බිම ප්‍රවෘත්ති වෙබ් අඩවිය - යttps://mawbima.lk
- ලංකාදීප ප්‍රවෘත්ති වෙබ් අඩවිය - http://www.lankadeepa.lk
- දිවයින ප්‍රවෘත්ති වෙබ් අඩවිය - https://divaina.com/
- නිව්ස් වයර් ප්‍රවෘත්ති වෙබ් අඩවිය -http://www.newswire.lk/
- අනිද්දා ප්‍රවෘත්ති වෙබ් අඩවිය - https://www.anidda.lk/
- වීඑෆ්එම් රේඩියෝ වෙබ් අඩවිය - http://vfmradio.lk

- විවර ප්‍රවෘත්ති වෙබ් අඩවිය - http://vivaranews.com
- ලංකා නිව්ස් වෙබ් ප්‍රවෘත්ති වෙබ් අඩවිය - https://www.lankanewsweb.net
- The Morning ප්‍රවෘත්ති වෙබ් අඩවිය - http://www.themorning.lk
- කලම්බු පේජ් ප්‍රවෘත්ති වෙබ් අඩවිය - http://www.colombopage.com
- Ceylon today. ප්‍රවෘත්ති වෙබ් අඩවිය - https://ceylontoday.lk
- පොදු රාජ්‍ය මණ්ඩලයීය නීතිඥයින්ගේ නිල වෙබ් අඩවිය - https://www.commonwealthlawyers.com

# උපග්‍රන්ථය

I. ශ්‍රී ලංකා අමරපුර - රාමඤ්ඤ සාමග්‍රී මහා සංඝ සභාව නිකුත් කළ නිවේදනය

II. බුද්ධශාසන කාර්ය සාධක මණ්ඩලය ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය

III. හෙළ බොදු සවිය ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය

IV. ඇල්ලේ ගුණවංශ හිමියන් ඇතුළු ස්වාමීන් වහන්සේලා ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය

V. කතෝලික රදගුරු සම්මේලනය නිකුත් කළ නිවේදනය

VI. ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ප්‍රකාශනය

VII. ජාතික සංවිධාන එකමුතුව ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය

VIII. යුතුකම සංවිධානය අගමැතිවරයා වෙත යොමුකළ කළ ලිපිය

IX. ජාතික නිදහස් පෙරමුණ අගමැතිවරයා වෙත යොමුකළ ලිපිය

X. පිවිතුරු හෙළ උරුමය ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය

XI. ලංකා සම සමාජ පක්ෂය ජනාධිපතිවරයා වෙත යොමුකල ලිපිය

XII. පාර්ලිමේන්තු මන්ත්‍රී විජේදාස රාජපක්ෂ විසින් ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය

XIII. පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමනාත් සී දොලවත්ත විසින් ජනාධිපති වෙත යොමුකළ ලිපිය

XIV. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විශේෂඥ කමිටුවේ වාර්තාව

XV. වෘත්තීය සමිති එකතුව විසින් ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය

XVI. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මාර්ගගත පෙත්සම

XVII. මාධ්‍ය සංවිධාන එකමුතුවේ ඒකාබද්ධ නිවේදනය

XVIII. සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරයේ නිවේදනය

XIX. ජාත්‍යන්තර නීතිඥ සංවිධාන ඒකාබද්ධ නිවේදනය

# I.

# ශ්‍රී ලංකා අමරපුර - රාමඤ්ඤ සාමග්‍රී මහා සංඝ සභාව නිකුත්කල නිවේදනය

**ශ්‍රී ලංකා අමරපුර - රාමඤ්ඤ සාමග්‍රී මහා සංඝ සභාව**

පූජ්‍ය මහාචාර්ය පල්ලෙකන්දේ රතනසාර අනුනායක ස්ථවිර
මහා ලේඛකාධිකාරී-ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාව
ශ්‍රී සාරිපුත්තාරාමය-මාතා පාර-කොළඹ 08
දුර: 011-2687766

පූජ්‍යතර අත්තංගනේ සාසන රතන නායක මහාස්ථවිර
මහා ලේඛකාධිකාරී-ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය
ශ්‍රීපති පිරිවෙන් මහා විහාරය-දියකළමුල්ල-කුලියාපිටිය
දුර: 071-8297580

2020.10.12

**මානව සමාජයේ ඉදිරිගාමී පියවරක් වූ ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි වන 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අක්‍රීය කළ යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදය හා නීතියේ ආධිපත්‍යය සුරැකෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනයට කටයුතු කළ යුතුයි.**

මේ මොහොතේ රට තුල ආන්දෝලනයට තුඩුදෙමින් තිබෙන 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව අමරපුර-රාමඤ්ඤ සාමග්‍රී මහා සංඝ සභාව සාකච්ඡාවට භාජනය කළ අතර, එය මානව සමාජයේ දියුණු ලක්‍ෂණයක් වන මිනිස් චින්තනයේ නිදහසටත්, ක්‍රියාකාරීත්වයටත් බරපතල ලෙස බාධා කරන නොදියුණු ගෝත්‍රික සමාජයකට ආපසු ගමන් කරන නීති සම්මතයක් බව තහවුරු වූ හෙයින්, එය සම්මත නොකරන ලෙස ආණ්ඩුවට අවධාරණය කිරීමට අප සංඝ සභාව තීරණයට කොට ඇත.

මේ මොහොතේ ලෝකයේ බොහොමයක් රාජ්‍ය අනුගමනය කරන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අංග තුන වන විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය එකිනෙකට පරීක්‍ෂාවට ලක්වෙමින් තුලනය පවත්වාගත යුතුය යන්න සම්මත පිළිගැනීමයි. සංවරණ හා තුලන ක්‍රියාවලිය ලෙස එය පිළිගනු ලබන අතර 1978 නව ජනරජ ව්‍යවස්ථාව තුළින් ජේ.ආර් ජයවර්ධන මහතා එකී සංවර්ණ හා තුලන ක්‍රියාවලිය අහෝසි කර විධායකයට අසීමාන්තික බලයක් කේන්ද්‍රගත කර ගන්නා ලදි. ඒ මොහොතේ පටන් ම එකී බලයේ අහිතකර තත්වය පිළිබඳව විශාල සංවාදයක් පැණනැගුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස වසර 37 කට පසු 2015 වසරේ දී ප්‍රජාතන්ත්‍රවාදයට සාධනීය එකතු කිරීමක් ලෙස 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන ලදි. එමගින් සිදුවූයේ ජයවර්ධන මහතා විසින් අහෝසිකර තිබූ ප්‍රජාතන්ත්‍රවාදයට අදාල සංවරණ හා තුලන ක්‍රියාවලිය බලාත්මක කිරීමයි. 20 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුකරනු ලබන්නේ යලිත් වතාවක් සංවරණ හා තුලන ක්‍රියාවලිය අහෝසි කර ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම අභියෝගයට ලක් කිරීමයි. මෙහි කෙලවර නිසැක වශයෙන් ම සටහන් වනු ඇත්තේ ඒකාධිපති වාදයයි. අත්තනෝමතික බලාධිකාරියයි.

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කිරීමට අදාලව ආණ්ඩුව පවසන කරුණු වන්නේ ඊට පෙර සම්මත කර තිබූ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය රටේ ඉදිරි ගමනට කර ඇති බාධා ඉවත් කිරීමට බවකි. එය එසේම ද යන්න ගැඹුරින් පැහැදිලි කරගත යුතුව තිබේ. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා රටේ යහ පැවැත්මට මෙන්ම ජනතාවගේ පරමාධිපත්‍ය අයිතිය තහවුරු කිරීමට හේතු වූ කරුණු කිහිපයකි.

1. 18 වන ව්‍යස්ථා සංශෝධනයෙන් සම්මත කර තිබූ අසීමාන්තිකව ජනාධිපති වරයාගේ ධූර දැරීමේ වාර ගණන 19 වන ව්‍යවස්ථාවේ 31 (2) අනුව දෙවතාවක් කිරීම.

2. 19 වන ව්‍යවස්ථාවේ 91 (ඈ) (XIII) අනුව ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තු මන්ත්‍රී ධූර හෝ ජනාධිපති ධූර දැරීම අහෝසි කිරීම.

3. 41 (අ) ව්‍යවස්ථාව අනුව ඉහල තනතුරු සඳහා රාජ්‍ය නිලධාරීන් පත්කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීම.

4. 41 (ආ) (VI) ව්‍යවස්ථාව අනුව ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කිරීම.

5. 41 (ඇ) ව්‍යස්ථාව අනුව උපරිමාධිකරණ විනිසුරුවරුන් පත්කිරීමේ දී ජනාධිපති වරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සභාවේ නිර්දේශ ලබා ගැනීම.

ඉහත සඳහන් කරුණු වලින් පමණක් වුවද තහවුරු වන්නේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආණ්ඩුව සඳහන් කරන ආකාරයට අගතිගාමී එකක් නොවන බවයි. මෙහි සම්පූර්ණ නොවූ සමහර කරුණු කාරනා හේතුවෙන් තාක්‍ෂණික දුබලතා ඇති බවට නීති විශාරදයන් පෙන්වා දී තිබේ. ඒ අනුව කළ යුතුව ඇත්තේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තාක්‍ෂණික දුබලතා ඇත්නම් එකී දෝෂ මගහරවා ගැනීමට නීති සම්පාදනය කරගත යුතු වුවද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් කර ඇත්තේ රටේ ඉදිරි ගමනට සාධනීය ලක්‍ෂණ එකතු කිරීම නොව රට ආපස්සට ගමන් කරවන නිශේධනීය සාධක එකතු කිරීමකි.

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ පූර්ණ බලය පාර්ලිමේන්තුව සතු වුවද 20 වන සංශෝධනයෙන් ජනාධිපති කාර්යාලය හා අගමැති කාර්යාලය විගණනයෙන් ඉවත්කර ඇත. එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 3 සහ 4 තුලින් තහවුරු කර ඇති පරමාධිපති බලය ජනතාව සතු වන්නේය යන්න අහෝසි වේ.

2. 20 වන සංශෝධනය මගින් සංශෝධනය කිරීමට අපේක්ෂා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44, 45, 47 ව්‍යවස්ථා කියවීමට අනුව පර්ලිමේන්තු මන්ත්‍රී වරුන්ගේ ජනවරමට අනුව ස්වාධීන පැවැත්ම බලරහිත කෙරේ.

3. 20 වන සංශෝධනය මගින් සංශෝධනය කිරීමට අපේක්ෂා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාව කියවීමට අනුව රාජ්‍ය සේවය ඍජු දේශපාලන බල අධිකාරියට යටත් කෙරේ.

4. 20 වන සංශෝධනය මගින් සංශෝධනය කිරීමට අපේක්ෂා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 ව්‍යවස්ථාව කියවීමට අනුව මැතිවරණ ක්‍රියාවලිය ස්වාධීන ක්‍රියාකාරිත්වයෙන් අහෝසි කෙරේ.

5. 20 වන සංශෝධනය මගින් සංශෝධනය කිරීමට අපේක්ෂා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 ව්‍යවස්ථාව කියවීමට අනුව අධිකරණ පද්ධතියේ ස්වාධීන පැවැත්ම අභියෝගයට ලක් කෙරේ.

6. 20 වන සංශෝධනය මගින් සංශෝධනය කිරීමට අපේක්ෂා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාව කියවීමට අනුව නීතියේ සාධාණත්වය ඉල්ලා සිටීමට ජනතාවට තිබූ අයිතිය අහෝසි කෙරේ.

7. 20 වන සංශෝධනය මගින් සංශෝධනය කිරීමට අපේක්ෂා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව කියවීමට අනුව හොරකමට, වංචාවට හා දූෂණයට ඉඩකඩ විවර කෙරේ.

මෙම කරුණුවලින් වුවද තහවුරු වන්නේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ අවස්ථාවේ කිසිම ලෙසකින්වත් අවශ්‍ය නොවන බවයි. රටට අවශ්‍යව ඇත්තේ නූතන තත්වයන්ට ගැලපෙන රට ආර්ථික වශයෙන් මෙන්ම දේශපාලනික හා සංස්කෘතිකමය ක්‍ෂේත්‍රයන්ගෙන් ඉහලට ඔසවා තැබිය හැකි සහ රට එක්සත් කළ හැකි අළුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකි. එබැවින් ඒ පිළිබඳව මහජන කතිකාවක් ගොඩනගා රටට උචිත අළුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනයෙහිලා කටයුතු ආරම්භ කරන ලෙසත් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අක්‍රිය සංශෝධනයක් බවට පාර්ලිමේන්තුව මගින් තහවුරු කරන ලෙසටත් ජාත්‍යාලයෙන් යුතුව ඉතා කාරුණිකව අවධාරණය කොට මෙයින් ඉල්ලා සිටිමු.

.................................

පල්ලෙකන්දේ රතනසාර අනුනායක ස්ථවිර
මහා ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාව

.................................

අත්තංගනේ සාසන රතන නායක මහාස්ථවිර
මහා ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය

# II.

# බුද්ධශාසන කාර්ය සාධක මණ්ඩලය ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය

## බුද්ධශාසන කාර්යසාධක මණ්ඩලය

(ආරම්භය ක්‍රි.ව. 1988)

අතිගරු ජනාධිපති
ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා
ජනාධිපති කාර්යාලය
කොළඹ 01

2564/2020.08.25

**20 වන සංශෝධනයට පෙර දූරදර්ශී ව සිතා බලන්න**
**බුද්ධශාසන කාර්යසාධක මණ්ඩලයේ ප්‍රකාශය**

අර්බුදකාරී හා ව්‍යාකූල තත්ත්වයෙන් පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමට පසුගිය ජනාධිපතිවරණයෙහි දීත් පාර්ලිමේන්තු මහ මැතිවරණයෙහි දීත් ජනතාවට ප්‍රතිඥාවක් ලබාදීම පිළිබඳ ව පළමුව අතිගරු ජනාධිපතිතුමා ප්‍රධාන රජයට අපගේ ප්‍රසාදය පිරිනමමු. ජනතාව විශිෂ්ට ජනවරමක් ඔබතුමාට ලබා දුන්නේ ඒ අරමුණ පෙරදැරි ව ය. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අවලංගු කොට ඒ වෙනුවට 20 වන සංශෝධනයක් ගෙන ඒමට රජය අදහස් කරන බවත් රජයේ නිවේදන මගින් දැන් ප්‍රකාශයට පත් වී ඇත. වර්තමාන ව්‍යවස්ථාවෙන් රට තුළ නිර්මාණය වී ඇති ව්‍යාකූල තත්ත්වය නොපමාව නිවැරදි කළ යුතු බව අමුතුවෙන් කිව යුතු නැත. මෙම ව්‍යාකූල තත්ත්වයට හේතුව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පමණක් නො වේ. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති සමානුපාතික ඡන්ද ක්‍රමය මෙන් ම 13 හා 16 වන සංශෝධන ඇතුළු විටින් විට ගෙන එනු ලැබූ නානාවිධ සංශෝධනවලින් ශ්‍රී ලංකාවේ ඒකීය භාවයට, මහජන සාමයට, භෞමික අඛණ්ඩතාවට හා ජාතික ආරක්ෂාවට සිදු ව ඇත්තේ බලවත් තර්ජනයකි. එබැවින් මේ සියල්ල වහා නිවැරදි කළ යුතු ව ඇත.

ඇ.පි.බ

බුද්ධශාසන කාර්ය සාධක මණ්ඩලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
380, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

නොබෝ දිනකින් පළාත් සභා මැතිවරණය පැවැත්වීමෙ අදහසක් ද ඇති බව වාර්තා වේ. දැනට අවුරුදු 03 ක් පුරා පළාත් සභා නොමැති ව රාජ්‍ය පාලනය සිදු විය. පළාත් සභා පවත්වා ගෙන යෑම ශ්‍රී ලංකාවට දැරිය නොහැකි වියදමක් පමණක් නොව, රාජ්‍යයේ පැවැත්මට ද බලවත් තර්ජනයකි. පළාත් සභා ව්‍යුහයක් පවත්වාගෙන ගිය ද එය වහා ප්‍රතිව්‍යුහගත විය යුතු ය. උතුරු පළාත භාර මහඇමති පාලනය කරන පළාත් පොලිසියක් පිහිටුවීමට 13 වන සංශෝධනයේ 09 වන උපලේඛනයේ 01 වන පරිශිෂ්ඨයෙන් විධි විධාන සලසා ඇත. එහි ම 02 වන පරිශිෂ්ඨයට අනුව පළාතක් තුළ පිහිටි ඉඩම් කැබැල්ලක් පුරවැසියකුට හෝ පූජනීය ස්ථානයකට ලබාදීමට පළාත් සභාවේ එකඟතාව ලබා ගත යුතු ව ඇත. ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ස්මාරක හා වාර්තා පිළිබඳ විෂයය ද පළාත් සභා ලැයිස්තුවට ඇතුළත් වී ඇත. 16 වන සංශෝධනය මඟින් උතුරු-නැගෙනහිර දෙපළාත්වල පරිපාලන භාෂාව ලෙස සිංහල භාෂාව නො පිළිගැනේ. උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීමට අවශ්‍ය විධි විධාන ද 13 වන සංශෝධනයෙන් හඳුන්වා දී ඇත.

පළාත් සභාවකට නීතිය හා සාමයට අදාළ පළාත් සභා ලැයිස්තුවේ විෂයයන් සම්බන්ධයෙන් නීති පැනවීමට හැකි අතර, පාර්ලිමේන්තුව දැනට පනවා ඇති නීති අබිබවා මෙම පළාත් සභා නීති ක්‍රියාත්මක වනු ඇත.

පසුගිය දින පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරයේ දී හිටපු මහඇමති සී. වී. විග්නේෂ්වරන් හා ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් යන මන්ත්‍රීවරුන් දෙපළ කළ ජාතිවාදී ප්‍රකාශවලින් පැහැදිලි වන්නේ, නුදුරු අනාගතයේ දී ශ්‍රී ලංකාවේ ඒකීය පැවැත්මට බලවත් තර්ජනයක් අත්‍යාසන්න බව යි. මෙම තත්ත්වය යටතේ පළාත් සභා මැතිවරණයක් පැවැත්වීම දුරු කරගත හැකි අනතුරක් යළි කැඳවාගැනීමකි.

මේ නිසා සියල්ල නිවැරදි කරන අලුත් ව්‍යවස්ථාවක් වහා ගෙන ආ යුතුව ඇත. ඊට අදාළ කාර්යයන් පසුවට කල් තබා ඊට පළමුව 19 වන සංශෝධනය පමණක් නිවැරදි කිරීම ප්‍රමාණවත් නොවන අතර, අනෙකුත් සංශෝධන ද කඩිනමින් කළ යුතු ය. එසේ නො කළහොත් එය රජයට ලැබී ඇති ජනවරමට එදිරිවීමකි. බහුතර ජනතාව තුනෙන් දෙකක විශිෂ්ට ජනවරමක් රජයට ලබා දී ඇත්තේ ශ්‍රී ලංකාවේ ජනතාවට හා ඒකීය භාවයට විරුද්ධ ව විවිධ විජාතික බලවේගවල මැදිහත් වීමෙන් ගෙන එනු ලැබ ඇති භයානක විධිවිධාන වහා නිවැරදි කිරීමට ය. එය සිදු නොකොට පසුවට කල් දැමීම ජනතාවට කරන බලවත් අසාධාරණයකි. එබැවින් 19 වන සංශෝධනය පළමුව සිදු කොට, ඊටත් වඩා වැදගත් සංශෝධනයන් පසුව සිදු කිරීම පිළිබඳ ව ඉදිරිපත් කර ඇති අදහස් රජය ක්‍රියාත්මක නො කළ යුතු බව අපගේ අදහස යි.

ව්‍යවස්ථාවට බලහත්කාරයෙන් ඇතුළත් කර ඇති මෙම විධිවිධාන අවලංගු කිරීමට වහා පියවර ගත යුතුය. එම නිවැරදි කිරීම් සිදු නො කොට පළාත් සභා මැතිවරණය පවත්වනු ලැබුවහොත් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමේ ක්‍රියාවලිය නිසැකව ම ව්‍යර්ථ වනු ඇත. මෙම පළාත් සභා ක්‍රමය හරහා ශ්‍රී ලංකාව පුරා අමාත්‍ය මණ්ඩල 10 ක් ක්‍රියාත්මක වීමත් ඔවුන්ට අවශ්‍ය පහසුකම් හා වරප්‍රසාද සැලසීමත් පළාත් සභා ඡන්දයක් සඳහා අතිවිශාල මුදලක් වියදම් කිරීමත් නිසා සිදු වන ආර්ථික අවපාතය සැබැවින් ම අපට දැරිය නො හැකි වනු ඇත.

අ.පි.බ

ශ්‍රී ලංකාව තුළ දැනටත් හොඳින් ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන හරහා බලය විමධ්‍යගත කිරීමෙන් ඉහත සඳහන් කළ ප්‍රශ්න හා ගැටලු පහසුවෙන් විසඳාගත හැකි වනු ඇත. බහුතරයක් වූ මහජනතාව ශ්‍රී ලංකාවේ සංවර්ධනාත්මක අනාගතයක් පිළිබඳ මහත් බලාපොරොත්තු තබා ඇති අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අගමැතිතුමා වෙත අප කරුණාවෙන් දන්වා සිටින්නේ නව ව්‍යවස්ථාවක් මඟින් වියවුල් ව ගිය රාජ්‍ය ව්‍යුහය සුදුසු පරිදි ප්‍රතිව්‍යුහගත කරන තෙක් පළාත් සභා මැතිවරණ පවත්වා ඒවා පණගැන්වීමට කටයුතු නොකරන ලෙසත් 13 හා 16 වන සංශෝධනවල හඳුන්වා දී ඇති භයානක ප්‍රතිපාදන වහා අවලංගු කිරීමට නොපමා ව අවශ්‍ය පියවර ගන්නා ලෙසත් ය. ජනතාව රජයට ලබා දුන් විශිෂ්ට ජනවරම අර්ථවත් කළ හැක්කේ එලෙසින් බව අපි උදක් ම විශ්වාස කරමු.

මීට - බුද්ධශාසන කාර්යසාධක මණ්ඩලය වෙනුවෙන්

ඉත්තෑපානේ ධම්මාලංකාර මහානායක ස්ථවිර ..........

දිවියාගහ යසස්සි නායක ස්ථවිර (සභාපති) ..........

දොඩම්පහළ චන්දසිරි මහානායක ස්ථවිර ..........

මාතලේ ධම්මකුසල අනුනායක ස්ථවිර ..........

බලංගොඩ සෝභිත නායක ස්ථවිර ..........

තිරිකුණාමලේ ආනන්ද මහානායක ස්ථවිර (සමලේකම්)..........

අකුරටියේ නන්ද නායක ස්ථවිර ..........

කන්දෙගොඩ විමලධම්ම අනුනායක ස්ථවිර ..........

මහාචාර්ය මැදගම නන්දවංස නායක ස්ථවිර ..........

මහාචාර්ය අගලකඩ සිරිසුමන ස්ථවිර (සමලේකම්) ..........

සිරි වජිරාරාමයේ ඤාණසීහ භික්ෂු ..........

ජගත් සුමතිපාල
(සභාපති - සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය) ..........

සුමේධ අමරසිංහ
(සභාපති - ධර්මවිජය පදනම) ..........

කුසුම්බන්දු සමරවික්‍රම
(උප සභාපති - කොළඹ තරුණ බෞද්ධ සංගමය) ..........

එස්. පී. වීරසේකර
(සභාපති - පරමවිඥානාර්ථ බෞද්ධ සමිතිය) ..........

අ.පි.බ

බුද්ධශාසන කාර්ය සාධක මණ්ඩලය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
380, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07

බුද්ධ [illegible] සාධක මණ්ඩලය
සම[illegible] ලංකා බෞද්ධ මහා සම්මේලනය
380, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

ආචාර්ය ජයන්ත වත්තෙවිදානගේ
(උප සභාපති - සාසන සේවක සමිතිය) ..............................

ජීවනී සුගුණදාස
(සභාපතිනි - සමස්ත ලංකා බෞද්ධ කාන්තා සම්මේලනය) ..............................

එම්.කේ.බී. දිසානායක
(සභාපති - රාජ්‍ය සේවා බෞද්ධ සංගමය) ..............................

ආචාර්ය හේමා ගුණතිලක
(සභාපතිනි - බෞද්ධ සහයෝගිතා කේන්ද්‍රය) ..............................

වසන්ත ද සිල්වා
(උපසභාපති - මහාබෝධි සංගමය) ..............................

ආචාර්ය පී.ජී. පුංචිහේවා
(නියෝජිත - ශාන්ති පදනම) ..............................

ජනාධිපති නීතිඥ උදිත ඉගලහේවා
(සභාපති - බෞද්ධ නීතිඥ සංගමය) ..............................

ආචාර්ය ලුම්බිණී ප්‍රියන්ත දේවසිරි
(නියෝජිත - [illegible] පදනම) ..............................

විශේෂඥ වෛද්‍ය අනුලා විජේසුන්දර
(සභාපතිනි - ජයග්‍රහණය ශ්‍රී ලංකා කොළඹ) ..............................

අෂාන් ද සොයිසා
([illegible] - කළුතර බෝධිභාරකාර මණ්ඩලය) ..............................

ජනාධිපති නීතිඥ මනෝහර ද සිල්වා
(ගරු සම්මානිත සාමාජික) ..............................

සුරේන් අභයගුණසේකර
(ගරු සම්මානිත සාමාජික) ..............................

ජනාධිපති නීතිඥ ප්‍රසන්න ලාල් ද අල්විස්
(ගරු සම්මානිත සාමාජික) ..............................

එම්.ඩී.ඩබ්. ආරියවංශ
(ගරු සම්මානිත සාමාජික) ..............................

පානි වැවල
ගරු සම්බන්ධීකාරක ..............................

4

# III.
# හෙල බොදු සවිය ජනාධිපතිවරයා වෙත යොමුකළ ලිපිය

## හෙළ බොදු සවිය

ලිපිනය - ජයසේකරාරාමය, පාර්ලිමේන්තු පාර, රාජගිරිය. ලියාපදිංචි අං.- ශ්‍රී ජපුර/ආය/4/5/18/41
දුර: 0112-076906 077-3071950 / 071-8124505 විද්‍යුත් ලිපිනය: jinawansab@gmail.com

2564/2020.10.18

ගරු ජනාධිපතිතුමා,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

පිංවත් ජනාධිපතිතුමනි,

**20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් මහා සංඝයා වහන්සේගේ අනුශාසනා පිළිබඳවයි.**

දැනට ගැසට් කර ප්‍රකාශයට පත් කර ඇති 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ මස 21, 22 දිනවල පාර්ලිමේන්තු විවාදයට යොමු කිරීමට නියමිත ය. ඒ සම්බන්ධයෙන් මේ රටේ ශාසනික හා සමාජ මෙහෙවරේ විවිධාකාරයෙන් කැපවී සිටින භික්ෂූන් වහන්සේලාගේ අප්‍රසාදය මේවන විටත් පළ වී ඇත.

එමෙන් ම අගරදගුරු මණ්ඩලයේ ද, සිවිල් සංවිධානවල ද විරෝධය පළවී ඇත. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ජන නායකයා වශයෙන් එකී අදහස් උදහස් පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

ඔබතුමා බලයට පැමිණ රුවන්වැලි සෑරදුන් අභියසදීත්, රාජාසන සභාවේදීත්, තමා කෙරෙහි විශ්වාසය තබා රටේ නායකත්වයට පත්කළ මහා සංඝරත්නයට ද සිංහල බෞද්ධ ජනතාවට ද අනුයෝගීව හා අනුගතව ක්‍රියා කරන බවට තබන ලද ප්‍රතිඥාව මෙහිලා සිහිපත් කරනු කැමැත්තෙමු.

එම ප්‍රතිඥාවට ද පටහැනි අයුරින් අත්තනෝමතිකව ක්‍රියා කළහොත් ඒ මගින් ඔබතුමා කෙරෙහි බලවත් ජනතා අප්‍රසාදයක් එල්ලවනු ඇති බව ද නිසැක කරුණකි. එය රටේ සංවර්ධන කාර්යට ද හානිකර ප්‍රතික්‍රියා නිර්මාණය කරනු ඇත.

ඒ නිසා ඔබතුමා කෙරෙහි තබන ලද විශ්වාසය පළුදු නොවන පරිදි පූජනීය මහා සංඝයා වහන්සේගේ අනුශාසනා හා අදහස් පිළිබඳව විශේෂ අවධානයෙන් යුතුව ක්‍රියා කිරීමට අප්‍රමාදීව පියවර ගැනීම ඔබතුමන් ප්‍රධාන රජයෙත්, රටෙත්, ජනතාවගේත්, යහපත පිණිස ම හේතුවන බව කාරුණිකව දන්වා සිටිමු.

මෙයට ශාසනස්ථිතිකාමී,

ඕමල්පේ සෝභිත නාහිමි
හෙළ බොදු සවිය - ප්‍රධාන අනුශාසක

# IV.
# ඇල්ලේ ගුණවංශ හිමියන් ඇතුලු ස්වාමීණ් වහන්සේලා ජනාධිපතිවරයා වෙත යොමුකල ලිපිය

2020-10-15

ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපත් අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා,

ජනාධිපති ලේකම් කාර්යාලය,

කොළඹ.

අතිගරු ජනාධිපතිතුමනි,

**20 වැනි ව්‍යවස්ථා සංශෝධනය**

ශ්‍රී ලංකාවේ ජනතාව ඔබ තුමාගෙන් අපේක්ෂා කරන ලද්දේ බුද්ධ ශාසනය, ජාතික උරුමය, සිංහල ජාතිය, හෙළ සංස්කෘතිය හා දේශිය සම්පත් ඇතුළු සමස්ත රටත්, ජනතා පරමාධිපත්‍යයත් ආරක්ෂා කර ගනිමින් රටත් ජනතාවත් සෞභාග්‍යය වෙත ගෙන යන ගමනට නායකත්වය ලබා දීම යි. එකී අපේක්ෂාව ඇතිව භික්ෂූන් වහන්සේලා පෙරටුකොට ගත් ජාතික සංවිධාන විසින් දේශප්‍රේමී ජනතාව ඔබතුමා වටා එක් සේසත් කරවිය. ඔබතුමාගේත්, ඔබ තුමාගේ නායකත්වය පිළිගන්නා ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණු ආණ්ඩුවේත් ජයග්‍රහණයට වගකිව යුතු සැබෑ බලවේගය වූයේ එකී ජාතික සංවිධාන විසින් ජනගත කර බල ගන්වන ලද, දේශප්‍රේමී ජාතික චින්තනය ය.

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එනු ලබන්නේ ශක්තිමත් ආණ්ඩුවක් බිහි කිරීමේ අරමුණින් බව කියවේ. ප්‍රජාතන්ත්‍රවාදී යාන්ත්‍රණයක් තුල ක්‍රියාත්මක වන ශක්තිමත් රාජ්‍යයක් ස්ථාපිත කිරීමේ ව්‍යවස්ථාවක් ජනතාවගේ සැබෑ බලාපොරොත්තුව යි. එහෙත් 20න් බිහි කරනුයේ අත්තනෝමතික ලෙස විධායකය මෙහෙයවිය හැකි වුත්, ව්‍යවස්ථාදායකය හා අධිකරණය තම අණසකට යටත් කරන්නට තරම් බලයක් සහිත ජනාධිපතිවරයෙකු හා දුබල අමාත්‍ය මණ්ඩලයකි. ජනතාවගේ ආදරය දිනාගත් මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ බලය හා ස්වරත්වය හීන කරවන 20 මගින් අමාත්‍යවරුන්ව හා අමාත්‍ය බලතල තම අභිමතිය අනුව ඕනෑම වෙලාවක වෙනස් කිරීමට ජනාධිපතිට බලය ලැබේ. 30කට සීමා කර තිබූ අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව සම්බන්ධ සීමාව ඉවත් කිරීමේ යටි අරමුණු ද තිබිය හැකි ය. ජනාධිපතිවරයා වෙත ව්‍යවස්ථාවෙන් පවරා දී ඇති වගකීම් රාශියක් ඉවත් කර ඇති අතර ජනාධිපති ධුරය දරන්නා විසින් කරනු ලබන ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවන් අධිකරණය හමුවේ අභියෝග කිරීමේ අයිතිය ද ජනතාවට අහිමි කර තිබේ. සමස්තයක්

1

ලෙස 20න් නීතියේ පාලනයක් නොමැති අස්ථාවර රාජ්‍ය යාන්ත්‍රණයක් බිහි වීමට බොහෝ ඉඩකඩ පවති.

20 සකසා තිබෙන්නේ ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය පසුපස සිටි ජාතික බලවේග හා ජනතා අපේක්ෂාවන් සම්පූර්ණයෙන් ම නොසලකා හරිමිනි. ව්‍යවස්ථා කෙටුම්පතක් සකස් කිරීම සම්බන්ධ අවම දැනුමක් වත් නොමැත්තෙකු ගේ කතෘත්වයක් පෙන්වන මෙම කෙටුම්පත දැනටමත් ජනතාවගේ අප්‍රසාදයට ලක් ව තිබේ. එය දේශපාලන මෙන් ම සමාජමය අර්බුධයක ඇරඹුමකි. ඔබතුමාත්, ආණ්ඩුවත් කෙරෙහි ජනතාව තබා ඇති විශ්වාසය පළුදු කිරීමේ කූට අරමුණින් යුතුව රටත් ජාතියත් පාවා දීමට ක්‍රියා කරන කුමන්ත්‍රණකරුවන් ගේ අදිසි හස්තයක් මෙම ක්‍රියාදාමය පිටුපස තිබේ දැයි ද සැක මතු වේ.

එබැවින් ජනතාවගේ අපේක්ෂාවන් යටපත් වන අයුරින් එම කෙටුම්පතේ ඇතුලත් කර තිබෙන පහත සංශෝධනයන් කෙරෙහි කෙරෙහි අපි ඔබතුමාගේ අවධානයට යොමු කර සිටිමු. එනම්

(අ) **හදිසි පනත් කෙටුම්පත් ගෙන ඒම සඳහා ප්‍රතිපාදන හඳුන්වා දීම**

රටට ජාතියට විනා කරන පනත් කෙටුම්පත් රාශියක් යහ පාලන ආණ්ඩු සමයේ දි ගෙන එනු ලැබූ විට ඒවා පරාජය කරන්නට හැකි වූයේ භික්ෂූන් වහන්සේ ඇතුලු දේශප්‍රේමී පුරවැසියන් විසින් ඒවා ශ්‍රේෂ්ඨාධිකරණයේ දි අභියෝග කළ හෙයිනි. එය ජනතාවට ඇති අයිතියකි. හදිසි පනත් ගෙන එනු ලබන ක්‍රියාවලියේ දි එම අයිතිය ජනතාවට අහිමි වෙයි. එය ප්‍රජාතන්ත්‍ර විරෝධී ය. 1987 දි 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනතා කැමැත්තට එරෙහිව බලහත්කාරයෙන් ගෙන ආ පරිද්දෙන් ම අනාගතයේ දි එම්.සී.සී වැනි රට පාවාදෙන නීති හදිසි පනත් ලෙස පැනවිය හැකි ය. එවැන්නක් සඳහා ඉඩකඩ විවර වීම මෙම ආණ්ඩුවෙන් හෝ ඔබතුමාගෙන් කිසිසේත් ම අපේක්ෂා නො කෙරිනි.

(ආ) **අමාත්‍ය මණ්ඩලය, නියෝජ්‍ය අමාත්‍යවරුන් හා කැබිනට් නොවන ඇමතිවරුන් හා ඔවුන්ගේ ලේකම්වරුන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 7 වන උපලේඛණයේ සඳහන් දේශය තුල වෙනම රාජ්‍යයක් ඇති නොකරන බවට පොරොන්දු වෙමින් ලබා දිය යුතු ප්‍රතිඥාව ව්‍යවස්ථාවේ 53 වගන්තියෙන් ඉවත් කිරීම**

ජාතික ආරක්ෂාවටත්, ඒකීය රාජ්‍යයටත් ඍජු තර්ජනයක් වන මෙම සංශෝධනත් ඒ සමගම පැන නැගුණු ජනතා විරෝධය මැඩලිමට විෂයභාර අමාත්‍යවරයා විසින් ගන්නා ලද උත්සාහයත් අපි දැඩිව හෙලා දකිමු. අවසානයේ දි එය හුදෙක් අතපසු වීමක් යැයි පවසා සිටීම ද තවත් භයානක කරුණකි. ඊට හේතුව වන්නේ මෙම ව්‍යවස්ථා කෙටුම්පත කොතරම් නොසැළකිළිමත් බවකින් යුතුව සකසා තිබෙන්නේ දැයි එමගින් තහවුරු වන හෙයිනි.

(ඇ) **පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස පත් වීම සඳහා පනවා ඇති ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ බාධකය ඉවත් කිරීම**

ද්විත්ව පුරවැසියෝ සැම විටම රටවල් දෙකකට පක්ෂපාති වෙති. යහපාලන ආණ්ඩුව පැවැති කාලයේ දී අප ලැබූ අත්දැකීම වන්නේ ශ්‍රී ලංකාවේ භූමිය හා සම්පත් කොල්ලකෑමේ හා රාජ්‍ය ආරක්ෂාව දුර්වල කිරීමේ ප්‍රයත්න ගණනාවක් ජාත්‍යන්තර බලවතුන් විසින් ක්‍රියාත්මක කිරීම යි. එම උපක්‍රම අතර ඔවුන්ට හිතැති නීති සම්පාදනය කිරීමේ උත්සාහයන් ද කැපී පෙනුනි. බලවත් විදේශ රටවලට පක්ෂපාති වන හා විදේශ රටවල දරු පවුල් පුරවැසිභාවය ලබා රැඳී සිටින තැනැත්තන් අපගේ නීති සම්පාදකයින් කිරීමේ භයානකකම එයයි. ඔවුන් අප රටට හිතවත්ව හා පක්ෂපාතීත්වයෙන් යුතුව කටයුතු කරතැයි සහතික විය නොහැකිය. එබැවින් පාර්ලිමේන්තු මන්ත්‍රීධුරයක් පමණක් නොව රජයේ ඕනෑම උසස් තනතුරක් දැරීම ද්විත්ව පුරවැසියන්ට තහනම් කළ යුතු ය. එසේ තිබිය දී ද්විත්ව පුරවැසියන්ට මන්ත්‍රීධුර දැරීමට ඇති තහනම ඉවත් කිරීම රාජ්‍ය ආරක්ෂාවට ද ජනතා පරමාධිපත්‍ය බලයට ද තර්ජනයකි.

(ඇ) **විගණකාධිපතිවරයාගේ විෂය පථයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය, අගමැති ලේකම් කාර්යාලය හා රජය විසින් සියයට 50ක් කොටස් දරන සමාගම් ඉවත් කිරීම**

ශ්‍රී ලංකා ටෙලිකොම්, ශ්‍රී ලංකන් ගුවන් සමාගම වැනි රජය විසින් කොටස් දරණ සමාගම් සියයකට අධික සංඛ්‍යාවක් පවතී. මේවායින් බොහෝමයක් ම රටේ සම්පත් පරිහරණය කිරීම පිළිබඳව සෘජු ලෙස බලපෑම් කළ හැකි ඒවාය. එම සමාගම් වල ආයෝජනය කර තිබෙන්නේ ජනතාවගේ මුදල් ය. මෙම ආයතන විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයෙන් ඉවත් කිරීමේ සෘජු ප්‍රතිඵලය වන්නේ දූෂණයට රුකුල් දීමකි. එනම් ජනතාවගේ මුදල් අවභාවිතයට පාර කැපීමකි. ජනාධිපතිගේ හා අගමැතිගේ ලේකම් කාර්යාලත් විගණකාධිපතිවරයාගේ පථයෙන් ඉවත් කිරීමේ ප්‍රතිඵලය ද අල්ලස් හෝ දූෂණ විමර්ශණය කිරීම සඳහා වූ කොමිෂම, ජාතික ප්‍රසම්පාදන කොමිෂම, විගණන සේවා කොමිෂම ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීමේ ප්‍රතිඵලය ද වන්නේ දූෂණයට රුකුල් දීමක් වේ. ඔබතුමාගෙන් අප බලාපොරොත්තු වූයේ දූෂණයට ඇති ඉඩකඩ අවහිර කිරීම මිස ඒවාට තව තවත් ඉඩ ලබා දීම නොවේ.

(ඉ) **ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් හා අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්ව පත් කිරීමේ අභිමතානුසාරී බලයක් ජනාධිපති වෙත ලබා දීම.**

මෙවැනි අසීමිත බලතල මගින් අධිකරණයේ ස්වාධීනත්වය බලවත් අනතුරකට ලක් වේ. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සිදුවිය යුත්තේ ජනාධිපතිට ඇති මෙවැනි බලතල පාර්ලිමේන්තුවේ හෝ පාර්ලිමේන්තු සභාවේ අනුමැතියට යටත් කිරීමයි. එවැනි සැබෑ සංවරණ හා තුලන ක්‍රමවේදයන් රාජ්‍ය යාන්ත්‍රණය තුල ක්‍රියාත්මක විය යුතු ය.

(ඊ) **මැතිවරණ කොමිෂන් සභාව විසින් හා නීතිය මගින් පනවන විධිවිධාන උල්ලංඝණය කරන තැනැත්තන්ට එරෙහි ව අධිකරණමය ක්‍රියා මාර්ග ගැනීමට ඇති හැකියාව ඉවත් කිරීම.**

මැතිවරණ කොමිෂන් සභාව විසින් හා නීතිය මගින් පනවන විධිවිධාන වලට පටහැනිව ක්‍රියා කරන තැනැත්තන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට හැකි වගන්තිය ඉවත් කිරීමේ සෘජු ප්‍රතිඵලය වන්නේ මැතිවරණ නීති කඩකරන්නන් හට ඒ සඳහා අවස්ථාව ලබාදීමය. මෙය දූෂිත මැතිවරණ ක්‍රමයකට රුකුල් දෙන සංශෝධනයකි. මෙවැනි සංශෝධන අපි දැඩිව හෙලා දකිමු.

(ළ) **ඇමතිවරුන්ගේ ගණන 30කට සීමා කිරීමේ වගන්ති ඉවත් කිරීම**

අමාත්‍යවරුන් ගේ සංඛ්‍යාව 30කටත් කැබිනට් නොවන අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව 40කටත් සීමා කිරීමේ වගන්තියක් පනවා තිබෙන්නේ වසර ගණනාවක් තිස්සේ ජනතාව විසින් ඒ සඳහා කරනු ලැබූ දැඩි බලකිරීම් වල ප්‍රතිඵලයක් ලෙස වේ. අසීමිත අමාත්‍යවරුන් සංඛාවක් පත් කිරීමට තිබෙන අවකාශය ප්‍රයෝජනයට ගෙන සුලු අන්තවාදී පක්ෂ වලට බහුතර ජනතාවගේ ඡන්දයෙන් පත්කරන ආණ්ඩු සමග කේවල් කිරීම සඳහා අවස්ථාව ලැබේ. මෙහි අනිසි විපාකය වන්නේ බහුතර කැමැත්ත යටපත් කරමින් අන්තවාදී පක්ෂවලට ආණ්ඩුව මෙහෙයවීමේ අයිතිය ලැබීමයි. රිෂාඩ් බදුර්දීන් හිටපු අමාත්‍යතුමා වැනි අන්තවාදීන් මේ වන විට ආණ්ඩුවත් සමග සමීපව කටයුතු කිරීමට පටන්ගෙන තිබෙන්නේ අනාගතයේ දී මෙවැනි සංශෝධන වල වාසිය ලබා ගැනීමේ යටි අරමුණ ඇතිව දැයි සැක පහළ වී තිබේ. එසේ ම අසීමිත අමාත්‍යවරුන් සංඛ්‍යාවක් සිටීම හුදෙක් මුදල් නාස්තියක් පමණක් නොව විධායක යාන්ත්‍රණය අවුල් සහගත තත්වයකට පත් කරන සාධකයක් බව ජනතාව හොඳින් ම දනිති.

මෙම ආණ්ඩුව පත් වීමේ දි ජනතාවට දුන් පොරොන්දුව වූයේ අලුත් ව්‍යවස්ථාවකි. ජනතාවගේ අපේක්ෂාව වූයේ ද එයයි. ව්‍යවස්ථාවට අවිධිමත් ලෙස සංශෝධන කිරීමේ ආදීනව ජනතාව විසින් අත්දැක තිබේ. කුමන ආකාරයේ ව්‍යවස්ථා සංශෝධනයක දි වුව ද දැනට රට මුහුන පා සිටින සැබෑ අර්බුධ වලට විසඳුම් ලබා දීමට පියවර ගත යුතුය. ඒ වා අතර ජාත්‍යන්තර සම්මුතීන් හා ගිවිසුම් අනිවාර්යයෙන් ම පාර්ලිමෙන්තුවේ අනුමැතියට යටත් ව අත්සන් කිරීම සහතික කරන වගන්ති ද, නිශ්චිත ලෙස ජාතික ප්‍රතිපත්ති හා සැළසුම් සකස් කර නීතිගත කිරීම අනිවාර්ය කරන වගන්ති ද, උතුරු හා නැගෙනහිර ඒකාබද්ධ කිරීමට පහසුවන පරිදි හා සමස්ත රටට ම නීති පැනවීම සඳහා පාර්ලිමේන්තුවට බාධා ගෙන එමින් 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දි තිබෙන ප්‍රතිපාදන ඉවත් කෙරෙන වගන්ති ද, දේශිය සම්පත් හා භූමිය විදේශකයින්ට විකිණීම තහනම් කරන වගන්ති ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අභිනවයෙන් ඇතුලත් කල යුතු බව අවධාරණය කර සිටිමු

මේ වන විටත් රට තුල ආන්දෝලනයට ලක් ව තිබෙන 20 වැනි සංශෝධනය ඉදිරිපත් කර තිබෙන ආකාරයෙන් සම්මත කර ගැනීම සම්බන්ධයෙන් නැවත සිතා බැලිය යුතු ව ඇත. එසේ තිබිය දීත් එම සංශෝධනය සම්මත කරන්නට කටයුතු කරන්නේ නම් අවම වශයෙන් මෙහි සඳහන් කර තිබෙන සංශෝධන සිදු කරන මෙන් ඔබ තුමන්ව බලයට පත් කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කල භික්ෂූන්

4

වහන්සේ ජාතික සංවිධාන අතුලු දේශප්‍රේමී ජනතාව නියෝජනය කරමින් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

මේ වගට

| නම | අත්සන |
| --- | --- |
| 01 පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමි | ........................................ |
| 02 පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි | ........................................ |
| 03 පූජ්‍ය බෙන්ගමුවේ නාලක හිමි | ........................................ |
| 04 පූජ්‍ය මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි | ........................................ |
| 05 පූජ්‍ය මල්වානේ චන්ද්‍රරතන හිමි | ........................................ |
| 06 පූජ්‍ය කපුගොල්ලෑවේ ආනන්දකිත්ති හිමි | ........................................ |

විමසීම් :- පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමි 0773 877 898

පිටපත්

01 අතිපූජ්‍ය තෙයි නිකායික මහා නායක ස්වාමින් වහන්සේලා වෙත ගෞරව පෙරදැරිව

02 සෙසු ආගමික නායකතුමන්ලා වෙත

03 ශ්‍රී ලංකා ජනරජයේ අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ ප්‍රධාන අමාත්‍ය මණ්ඩලය වෙත

04 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කතානායක ගරු මහින්ද යාපා අබේවර්ධන ප්‍රධාන පාර්ලිමේන්තු මන්ත්‍රී තුමන්ලා වෙත

## V.
## කතෝලික රදගුරු සම්මේලනය නිකුත් කල නිවේදනය

**CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA**
Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11-2697062 / 2697110
Fax No : 0094-11-2699619
E-mail : EpiscopalSL@gmail.com

### The mind of the Catholic Bishops' Conference in Sri Lanka on 20th Amendment

In the wake of the change of Government following the Presidential and Parliamentary Elections, the Catholic Bishops' Conference in Sri Lanka is constrained to share its grave concern to protect the sacredness of the State that transcends the mutable political and governing bodies. The 1978 Constitution changed primarily the Westminster type Cabinet Democracy to an Executive Presidency. Since then 19th Amendments have been made citing various reasons. However, one cannot deny that the main reasons have been to ensure economic growth, national security, sovereignty and territorial integrity of the island nation. Apparently the proposed 20th Amendment to the Constitution under consideration, does not seem to put forward any other rationale for the move.

Whether it is an amendment or the drafting of a new Constitution the sovereignty of the people should always be safeguarded and protected. In all probability the contents of the 20th Amendment will find its way into the envisioned new Constitution. It is imperative then to closely examine the proposed 20th Amendment before it is voted upon in the Parliament. The Executive Presidency has been the bone of contention since it was created in 1978. All elected Presidents since 1994 vowed to abolish the Executive Presidency with powers vested in it by the 1978 Constitution and transfer power to the democratically elected Parliament, but none had the political will to do so for reasons not unknown to the people. We need to emphasize that concentration of power in an individual without checks and balances does not augur well for a Democratic, Socialist Republic.

A two-thirds majority of the members in the parliament based on political parties does not necessarily manifest the true conscience of the people. Therefore, let the entire membership of the parliament appoint an Independent Constitutional Council comprising a majority of men and women of proven integrity from the society who will take care of drafting a new Constitution which ensures transparent democracy, the rule of law and the equality of all citizens It is our view that rules need not to be changed due to the vagaries and inconsistencies of individual players, but to identify and elect or appoint suitable persons who will abide by the rules to safeguard truth, justice, and the well-being of the country. It is the bounden duty of the democratically elected Parliament to create wholesome governing structures capable of moving this country forward. The drafters must beware to plug the loopholes that lead to multiple interpretations. Greater clarity is needed if the Constitution is to serve the citizenry. Thus the 20th Amendment should not be proceeded with, in its entirety, and instead a new Constitution needs to be the national priority at this moment.

✠ Rt. Rev. Dr. J. Winston S. Fernando, SSS
Bishop of Badulla
President
Catholic Bishops' Conference in Sri Lanka.

✠ Rt. Rev. Dr. J. D. Anthony Jayakody
Auxiliary Bishop of Colombo
Secretary General
Catholic Bishops' Conference in Sri Lanka.

13th October 2020

CATHOLIC BISHOPS' CONFERENCE SRI LANKA

# VI.
# ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
இலங்கை தேசிய கிறிஸ்தவ மன்றம்
National Christian Council of Sri Lanka

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය පිළිබඳව**
**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ප්‍රකාශනය**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය හඳුන්වා දීමට අපේක්ෂා කරනු ලබන ආකාරය පිළිබඳව සහ එම සංශෝධනයෙහි ඇති වැදගත් විධිවිධාන කිහිපයක් පිළිබඳව ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සැලකිල්ල යොමු කොට සිටියි.

**ක්‍රියාවලිය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට රජය තීරණය කර ඇති අතර, පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේ දී එම පනත් කෙටුම්පතෙහි සංශෝධන සිදු කරන බව ද නිවේදනය කර ඇත. එහෙත් කුමන වෙනස්කම් සිදු කරන්නේ දැයි රජය ප්‍රකාශ කර නැත. පනත් කෙටුම්පතක් අධිකරණයේ සමාලෝචනයට භාජනය කරනු ලැබීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඉතා කෙටි කාල සීමාවක් පමණක් ලබා දී ඇත. එහෙත්, පනත් කෙටුම්පතක් බලාත්මක වීමෙන් පසුව අධිකරණයේ සමාලෝචනයට භාජනය කිරීම තහනම් කර ඇති නිසා කාරක සභා අවස්ථාවේදී ගෙන එනු ලබන සංශෝධන සම්මත කර ගැනීමට පෙර ජනතාව විසින් සහ අධිකරණය මගින් පරීක්ෂා කරනු ලැබීමෙන් නිදහස් වේ. එමගින් විනිවිදභාවයෙහි, වගවීමෙහි සහ ව්‍යවස්ථානුකූලභාවයෙහි මූලික අංගයන් උල්ලංඝනය වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන හඳුන්වා දීමට පෙර මහජනතාව දැනුවත් කර මහජනතාවගේ අදහස් විමසන බවට රජයේ අමාත්‍යවරුන් කිහිප දෙනෙකු දුන් පොරොන්දුව කඩ කෙරෙයි.

**හරය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධන පනත් කෙටුම්පත මගින් 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙහි ඇති බොහෝ අංග අහෝසි කිරීමට අපේක්ෂා කෙරේ. 19 වැනි සංශෝධනයෙහි සියලුම අංග දෝෂ සහිත නොවේ. එහි ඇති සාධනීය ලක්ෂණ රඳවා ගත යුතුය.

1980 දශකයේ මැද භාගයේ සිට ම ප්‍රධාන ප්‍රජාතන්ත්‍රවාදී ආයතන නිර්දේශපාලනීකරණය කිරීමෙහි වැදගත්කම පිළිබඳව සිදු කර ඇති නිර්දේශද, විශේෂයෙන් ම තරුණ අසහනය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාව (1990) විසින් සිදු කර ඇති නිර්දේශ සහ පත්කිරීම් සිදු කිරීම සඳහා ජනාධිපතිවරයාට ලැබී තිබෙන පුළුල් බලතල අඩු කිරීම මගින් විධායක ජනාධිපති ධුරය සඳහා වඩා ප්‍රබල සංවරණ සහ තුලන හඳුන්වා දීම සඳහා පුළුල් පරාසයක දේශපාලන බලවේගවල සහ සිවිල් සමාජ කණ්ඩායම්වල නායකත්වයෙන් 1978 වර්ෂයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත වූ දා සිට ම ක්‍රියාත්මක කරන ලද සාමූහික අරගල හා ක්‍රියාකාරකම් ද 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් නොසලකා හැර තිබේ.

20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි ඇති පහත සඳහන් කරුණු නැවත සමාලෝචනය කරන ලෙසට අපි රජයෙන් ඉල්ලා සිටිමු.

1. ව්‍යවස්ථාදායක සභාව වෙනුවට දුර්වල පාර්ලිමේන්තු සභාවක් හඳුන්වාදීම පසුගාමී පියවරකි. ජනාධිපතිවරයා විසින් සිදු කළ යුතු වන්නේ පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ලබා ගැනීම

#368/6, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka.
Telephone: +94 (11) 2671723 Fax: +94 (11) 2671721
E-Mail: info@nccsl.org | Website: www.nccsl.org

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
இலங்கை தேசிய கிறிஸ்தவ மன்றம்
National Christian Council of Sri Lanka

පමණකි. මෙමගින් සැබවින්ම ඉහළ අධිකරණ වලට සහ සියලු ම ස්වාධීන කොමිෂන් සභාවලට පුද්ගලයන් පත්කිරීමේ හුදු අභිමතය ජනාධිපතිවරයාට ලබා දෙයි. එය එම පුද්ගලයින්ගේ ස්වාධීනත්වයට හානි කරනු ඇත. අධිකරණයේ සහ මැතිවරණ සහ මානව හිමිකම් සඳහා වගකිව යුතු කොමිෂන් සභාවල ස්වාධීනත්වයද, නීතියේ ආධිපත්‍යයත් ප්‍රජාතන්ත්‍රවාදී සහ වගකිවයුතු රාජ්‍ය පාලනයක් සඳහා අත්‍යවශ්‍ය වන පූර්වාවශ්‍යතාවන් වේ.

2. දූෂණය, දේශපාලන අනුග්‍රහය සහ බලය, අයුතු ලෙස භාවිතය අවම කිරීම සහතික කරනු සඳහා, 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජාතික විගණන කොමිසම සහ ජාතික ප්‍රසම්පාදන කොමිසම පිහිටුවන ලදී. ජනාධිපතිවරයාගේ කාර්යාලය සහ අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාල සඳහා වෙන් කරනු ලබන අරමුදල් ද අනෙකුත් සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට වෙන් කරනු ලබන අරමුදල් මෙන් විගණනයට යටත් වන ලෙසට එමගින් විධිවිධාන සලසා ඇත. 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙම අංග ඉවත් කිරීම පිළිබඳ කිසිදු සාධාරණීකරණය කිරීමක් නැත.

3. ජනාධිපතිවරයාට අමාත්‍ය ධූර පවරා ගැනීමට සහ පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වා වසරකට පසුව පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට බලය ලැබන විධිවිධාන නැවත හඳුන්වාදීම විධායකය කටයුතු කරන ආකාරය පිළිබඳව පරික්ෂාවෙන් සිටිය යුතු ආයතනය වන ව්‍යවස්ථාදායකයේ බලතල යටපත් කිරීමට ලක් කරයි.

4. අනුක්‍රමිකව පත්වූ රජයන් විසින් දශක ගණනාවක් පුරා අයුතු ලෙස යොදා ගත් විධිවිධානයක් වූ, "හදිසි පනත් කෙටුම්පත්" හඳුන්වා දීමට ව්‍යවස්ථාදායකයට බලය ලැබෙන විධිවිධාන නැවත හඳුන්වාදීම මගින් ව්‍යවස්ථානුකූලභාවය, වගවීම සහ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පිළිබඳ මූලික සම්මතයන් යටපත් කරනු ලබයි.

**සමාප්තිය**

19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි ඇති, ප්‍රධාන ආයතනවල ස්වාධීනත්වය සහ වගකීමෙන් යුතු රාජ්‍ය පාලනය ප්‍රවර්ධනය කෙරෙන අංග ආරක්ෂා කරන ලෙසට අපි රජයෙන් ඉල්ලා සිටිමු. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ප්‍රධාන අරමුණු වලින් එකක් වන්නේ රජයට වඩා ජනතාව ආරක්ෂා කිරීම සහ සවිබල ගැන්වීම වන බැවින්, 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ විවාද කිරීමට පෙර ඒ පිළිබඳ මහජනතාවගේ අදහස් සලකා බැලීමට හැකි වන පරිදි එහි ඇති සියලු ම සංශෝධන මහජනතාවට දැනගැනීමට සලස්වන ලෙසද අපි රජයෙන් ඉල්ලා සිටිමු.

"අපි ප්‍රේමයෙන් සත්‍යය කථා කරමින් ක්‍රිස්තුස් වහන්සේ තුළ හැම අයුරින් ම වර්ධනය වන්නෙමු." **(එපීස 4:15)**

2020 සැප්තැම්බර් 29 වැනි දා

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
இலங்கை தேசிய கிறிஸ்தவ மன்றம்
National Christian Council of Sri Lanka

අත්සන් කරන ලද්දෝ

**සාමාජික සභාවන්**

- ගරු ඩබ්ලිව්. පී. එබනේසර් ජෝසප් දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය සහ මහ නායක ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාව
- අතිගරු කීර්තිසිරි ප්‍රනාන්දු රදගුරුතුමා - ලංකා සභාව, කුරුණෑගල දියෝසිසිය
- අතිගරු ධර්මාචාර්ය ඩැනියල් එස්. තියාගරාජා රදගුරුතුමා දකුණු ඉන්දියානු සභාව - යාපනය දියෝසිසිය
- අතිගරු ඩී. ආර්. කනගසබෙයි - නායක අගරදගුරුතුමන්ගේ කොමිසාරි සහ පාලක රදගුරු ජනරාල් හිමිපානන් - ලංකා සභාව, කොළඹ දියෝසිසිය
- ගරු හේෂාන් ද සිල්වා දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය
- ගරු සමන් පෙරේරා දේවගැතිතුමා - පරිනියාමක/සභාපති, ශ්‍රී ලංකා ප්‍රෙස්බිටේරියන් සභාව
- ගරු ෂර්ලි එස්. ෆේබර් දේවගැතිතුමා - සභාපති, ක්‍රිස්තියානි රෙපරමාදු සභාව
- කර්නල් සුරේශ් පාවර් - ප්‍රාදේශීය භාර මූලිකතුමා, ගැලවීමේ හමුදාව
- ගරු ධර්මාචාර්ය ක්‍රිසේ හැන්ඩි දේවගැතිතුමා - සභාපති, ජනතා දේව සභාව
- ගරු ඇස් ජෝර්ජ් නිරන්ජන් දේවගැතිතුමා - සභාපති (වැඩබලන) ශ්‍රී ලංකා සිව් චතුරශ්‍ර සභාව
- ගරු මැක්ස්වෙල් ඩොස් දේවගැතිතුමා - මහ ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

**සාමාජික සාමයික සංවිධාන**

- තරුණ ක්‍රිස්තියානි සංගමය (YMCA)
- තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය (YWCA)
- ලංකා බයිබල් සමාගම
- ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය පිළිමතලාව
- ශිෂ්‍ය ක්‍රිස්තියානි ව්‍යාපාරය (SCM)
- ලංකා ක්‍රිස්තියානි සාහිත්‍ය සමාගම
- ජීවිතාලෝකය

**සහකාර/අනුරූ සභාවන් සහ සාමයික සංවිධාන**

- ගරු ඩී. නඩරාජා දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකා ලුතරන් සභාව
- ගරු ඩී. දේවනේසන් දේවගැතිතුමා - ඇමරිකන් සිලෝන් මිෂන් සභාව
- යොවුන් තිතු මග
- දේවධර්ම ශාස්ත්‍රාලය කොළඹ

# VII.
# ජාතික සංවිධාන එකමුතුව ජනාධිපතිවරයා වෙත යොමුකල ලිපිය

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා,

ජනාධිපති කාර් යාලය,

කොළඹ.

ජනාධිපතිතුමනි,

**20** වැනි ව්‍යවස්ථා සංශෝධනය සහ ඒ ආශ්‍රිත ගැටළු පිළිබඳව

ඔබතුමා විසින් සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් රටට නව ව්‍යවස්ථාවක් අවශ්‍ය බවට සහ ඒ මගින් රාජ්‍ය තුල පුළුල් ප්‍රතිසංස්කරණ සිදු කළ යුත බවට මහජනයා අතර බලවත් අපේක්ෂාවක් ජනිත කරන ලදි. ඔබතුමාගේ අධිෂ්ඨානය ජනතාව විසින් දෙවරකම ඉතා ඉහළින්ම අනුමත කරන ලද්දේ ඒ නිසාය. ඔබතුමා, එදා එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක මහතා මෙන්, ඉතිහාසය විසින් යුගයේ ප්‍රබල අවශ්‍යතාවයක් සඳහා නිර් මාණය කරන ලද චරිතයක් හෙවත් භූමිකාවකි. ඒ නිසා නව ව්‍යවස්ථාවක් සම්මත කිරීම මගින් ව්‍යවස්ථා විප්ලවයක් සිදු කිරීම සඳහා මීට වඩා මනරම් අවස්ථාවක් ඉතිහාසය විසින් නිර් මාණය කරනු ඇතැයි සිතිය නොහැක.

අප රටේ අද සිටින සියලු විපක්ෂ බලවේග වලට මහජනයා විසින් ඉතා දරුණු ලෙස දඬුවම් ලබා දෙන්නේ ඔවුන් විසින් සිදු කළ මහා ඓතිහාසික පාවාදීම් වලට එරෙහිව අවසන් ප්‍රතිචාරයක් ලෙස යැයි අපි සිතමු. ඒ නිසා ඔබතුමාට ඉතිහාසයේ අන් කවර පාලකයෙකුටත් වඩා සෑම ක්‍රියාවකදීම පරිස්සම් වීමට සිදු වේ. ඔබතුමා විසින් ඉටු කළ යුතු සහ ඉතිහාසය විසින් ඉල්ලා සිටින ජාතික වගකීම් ඉටු කිරීමේදී මානසික බාධක පනවාගත යුතු බවක් ඉන් අදහස් නොවේ. ඔබතුමාට ජනතාව විසින් මහා ජනවරමක් ලබා දෙන විට අප රටේ දීර් ඝ කාලයක් තිස්සේ පරිහානියට ලක්වූ නිලධාරී තන්ත්‍රය වෙනස් කිරීමක් සිදු වූයේ නැත. ඒ සඳහා ජනවරමේ ගුණය සහ එබතුමාගේ ගුණය එක්කළ දීර් ඝ කාලීන ප්‍රතිකාරයක් අවශ්‍ය වනු ඇත. එතෙක් ඔබතුමාට ගමන යාමට සිදුවන්නේ ඔවුන් විසින් දැනුවත්ව සහ නොදැනුවත්ව කපන ලද බොරු වලවල් මහ හරිමිනි. ඒ නිසා අප විසින් අවධාරණය කරනු ලබන්නේ ජනතා අපේක්ෂාවන්ට ඉතා තීරණාත්මක ලෙස බලපාන ජාතික වැදගත්කමක් සහිත තීන්දු පිළිබඳව දෙවරක් සිතා බලන ලෙස පමණි. නව ව්‍යවස්ථාවක අවශ්‍යතාවය ඉතා බලවත් වන්නේ එම තත්වය නිසාය. එසේම නව ව්‍යවස්ථාවක් සම්මත කරන තෙක් ඔබතුමාට කාර්යක්ෂමව සහ ප්‍රතිඵලදායක ලෙස තීන්දු තීරණ ගැනීම සඳහා ඉඩ සලසන ව්‍යවස්ථා සංශෝධනයක අවශ්‍යතාවය අප පිළිගනිමු.

එහිදී ජනතාව විසින් පරාජයට පත් කළ බලවේග විසින් සිදු කළ වැරදි කිසිවක් ඔබ විසින් නොකළයුතු බවට විවාදයක් නැත. ඔබතුමාට ඉතිහාසය විසින් පවරා ඇති භූමිකාව වන්නේ ඔවුන් විසින් සිදු කළ යහපත් දෙයක් ඇත්නම් එය ආරක්ෂා කරන අතර ඔවන් විසින් සිදු නොකළ සහ ඔබ අපේක්ෂා කරන යහපත් දේ සිදු කිරීම යැයි අපි විශ්වාස කරමු. එම අර් ථයෙන් අප ඔබතුමාට පහත සඳහන් කරුණු අවධාරණය කරන්නෙමු. ඊට අමතරව නව ව්‍යවස්ථාවක් හෝ ප්‍රතිපත්තියක් සඳහා මහජන කැමැත්ත ලබා ගැනීමේදී එහි අන්තර් ගතය

තරමටම එම අන්තර් ගතයට ලඟා වීම සඳහා යොදා ගන්නා ක්‍රමවේදයද ඉතා වැදගත් වන බවද සඳහන් කරන්නෙමු.

1. නව ව්‍යවස්ථාවක් සම්මත කිරීමට අදාලව මහජන අදහස් ලබා ගැනීමේ යාන්ත්‍රණයක් සකස්කොට සියලු දේශපාලන පක්ෂ සහ බලවේග වලට දේශපාලන හැංගිමුත්තන් කෙලීමට ඉඩ නොදී ඔවුන්ගේ යෝජනා විවෘතව ඉදිරිපත් කිරීමට බල කෙරෙන ක්‍රමවේදයක් හඳුන්වාදීම.
2. නව ව්‍යවස්ථාව සම්මත කිරීම සඳහා ජනමත විචාරණයක් පවත්වන තෙක් වෙනත් කිසිදු මැතිවරණයක් නොපැවැත්වීම. එහිදී පළාත්සභා මැතිවරණය නව ව්‍යවස්ථාව සම්මත කිරීමෙන් පසුව සිදු කිරීම වැදගත් වන්නේ ඉන් පසුව රටේ ජනතාවට අලුතෙන් සිතන්නට සිදුවීම නිසා මෙන්ම නව ව්‍යවස්ථාවේ නව ප්‍රතිපාදන අනුව එම බල ව්‍යුහයන් වෙනස් වීමට ඉඩ ඇති බැවිනි. ( පසුගිය වසර තුනකට අධික කාලයක් තිස්සේ පළාත්සභා රැස් නොවීම පිළිබඳව උතුරේ හෝ දකුණේ කිසිදු විරෝධයක් පැන නැඟුනේ නැත.)
3. 20 වැනි සංශෝධනයට අදාලව පහත සඳහන් තාක්ෂණික සහ ප්‍රතිපත්තිමය වැරදි නිවරදි කිරීම. ඊට අමතරව කෙටුම්පත පිළිබඳව ලිඛිතව අදහස් දැක්වීමට අමාත්‍ය මණ්ඩලයට ඉඩ ලබා දීමද වැදගත්වේ. එම කොන්දේසි සැපිරීමෙන් පසුව කෙටුම්පත නැවත සංශෝධනය කොට නව කෙටුම්පතක් ලෙස ගැසට් කිරීමද වැදගත්වේ. ඊට හේතුව එම සංශෝධන පසුව කාරකසභා අවස්ථාවේදී ඇතුල් කිරීමට උත්සාහ කළහොත් 19 වැනි සංශෝධනය සම්මත කිරීමේදී සිදුවූ ආකාරයට කෙටුම්පතේ නොමැති අහිතකර සංශෝධන පවා යෝජනා වීමට ඉඩ තිබීමය.

- නව පනත් කෙටුම්පතක් ගැසට් කිරීමෙන් පසුව මහජන සංවාදයට ලක්කිරීම සඳහා ලබාදී තිබූ දින 14 ක කාලය දින 7 ක් දක්වා අඩු කිරීමේ වරද නිවැරදි කිරීම.
- මහජන සංවාදයට ඉඩ අහුරමින් ' හදිසි පනත් ' සම්මත කිරීමට ඉඩ සලසන ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපාදනය නැවත ඉවත් කිරීම.
- 53 වන වගන්තිය සංශෝධනය කිරීමේදී 7 වැනි උපලේඛනය ඉවත්වීම මගින් නිර් මාණය වී ඇති බෙදුම්වාදයට පක්ෂපාති ප්‍රතිපාදනය නිවැරදි කිරීම.
- ද්විත්ව පරවැසියන් විසින් පාර් ලිමේන්තු මන්ත්‍රීධුර දැරීම වැලැක්වීම සඳහා පනවා තිබූ බාධකය මහබැංකු අධිපති, නීතිපති,පොලිස්පති, විගණකාධිපති, හමුදාපතිවරු, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුලත් වන ලෙස නැවත පැනවීම.
- විගණන කොමිසම අහෝසි කිරීමේ වරද සහ යම් රාජ්‍ය ආයතන විගණනයෙන් නිදහස් කිරීමේ වරද නිවැරදි කිරීම.

ඔබතුමාට තෙරුවන් සරණයි

සාහිත්‍යශූරී ගුණදාස අමරසේකර
කැඳවුම්කරු,
ජාතික සංවිධාන එකමුතුව.

# VIII.
# යුතුකම සංවිධානය අගමැතිවරයා වෙත යොමුකල ලිපිය

2020/10/02

ශ්‍රී ලංකා ජනරජයේ අග්‍රාමාත්‍ය
ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත,

**20 වන සංශෝධනයේ නිවැරැදි විය යුතු කරුණු**

විසි වන සංශෝධනයට නීතිපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජිත සංශෝධන තුළ සිදු ව තිබූ තාක්ෂණික වැරැදි නිවැරැදි කිරීමට අමතර ව, වැදගත් සංශෝධන 3ක් නිර්දේශිත ව ඇති බව අපේ අදහස යි. එහි දී 53 වන වගන්තිය යටතේ මෙන් ම 61ඇ වගන්තිය යටතේ ලබාදිය යුතු නිල ප්‍රතිඥාව හෝ දිවුරුම සඳහා හත් වන උපලේඛනයේ ප්‍රතිඥාව ද ඇතුලත් කිරීමට හා ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය හා අග්‍රාමාත්‍යවරයාගේ  ලේකම්වරයාගේ කාර්යාලය විගණකාධිපතිවරයා ගේ විගණනයට යටත් කිරීමට නිර්දේශ ව තිබීම සම්බන්ධයෙන් අප ගේ කෘතඥතාව පළ කරමු.

එ සේ මුත් අප රජයට ලබාදුන් දැවැන්ත ජනවරමට හා තබා ඇති විශ්වාසයට සාධාරණය ඉෂ්ට කිරීමට නම් අවම වශයෙන් පහත යෝජිත නිවැරැදි කිරීම් වත් කාරක සභා අවස්ථාවේ දී සිදු කළ යුතු බව අප සංවිධානයේ අදහස යි.

1) කැබිනට් ඇමැතිවරුන් ගේ සංඛ්‍යාවේ උපරිමය 30ක් ලෙස ද අනිකුත් සියලු ඇමැතිවරුන් ගේ සංඛ්‍යාවේ උපරිමය 40ක් ලෙස ද තිබූ ප්‍රතිපාදනය ඉවත් නොකිරීම.

(මේ ප්‍රතිපාදනය 19 සංශෝධනයට එකතු වූයේ ඇමැති ධුර වරදාන නැතිනම් කප්පම් ලෙස හුවමාරු වූ පිළිකුල් සහගත දේශපාලනයට නැඟුණු ජනතා විරෝධයේ ප්‍රතිඵලයක් ලෙස ය. අද හකීම් හා රිෂාඩ් හිටපු අමාත්‍යවරු කරන ප්‍රකාශ හමුවේ ජනතාව මේ ප්‍රතිපාදනය ඉවත් කිරීමට දරන ප්‍රයත්නය දෙස බලන්නේ පිළිකුලෙනි).

2) පුරවැසියන්ට ශ්‍රේෂ්ඨාධිකරණයට යෑමට ඇති ඉඩ ඇහිරෙන සේ පනතක් ගැසට් පත්‍රයේ පළ කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර තිබිය යුතු කාලය සතියකින් අඩු කිරීමට හා කෙසේවත් ශ්‍රේෂ්ඨාධිකරණයට යා නොහැකි වන ලෙස හදිසි පනත් ගෙන ඒමට ඉඩ විවර කරගැනීම පිණිස සිදු කර ඇති සංශෝධන ඉවත් කරගැනීම.

(පසුගිය රජය ගෙන ආ 19 වන ව්‍යවස්ථා සංශෝධනය, පළාත් සභා පනතට ගෙන ආ සංශෝධන, ඉඩම් පනත ආදි රටට අහිතකර පනත් ගණනාවක් ඒකාබද්ධ විපක්ෂය, පොදුජන පෙරමුණ මෙන් ම විවිධ ජාතික සංවිධාන මඟින් අධිකරණයේ දී අභියෝගයට ලක් කර රටට හානිකර වගන්ති රාශියක් නිවැරැදි කරගෙන ඇත. මේ අයිතිය අනාගතය වෙනුවෙන් ද සුරැකිය යුතු ය).

---

නො. 32, සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 5
දුරකථන: 0716369828 | වෙබ්: www.yuthukama.com | ඊ-මේල් : secretary@yuthukama.com

3) පාර්ලිමේන්තුව විසුරුවා හැරි පසු නව රජය පත්වන තෙක් කැබිනට් මණ්ඩලයට අමතර ව රාජ්‍ය අමාත්‍යවරු හා නියෝජ්‍ය අමාත්‍යවරු ද බලාත්මක වන පරිදි සිදු කර ඇති සංශෝධනය ඉවත් කිරීම.

(මේ ප්‍රතිපාදනය යටතේ විපක්ෂයේ අපේක්ෂකයන්ට පමණක් නොව ආණ්ඩු පක්ෂයේ අමාත්‍යා ධුර නොදරණ අපේක්ෂකයන්ට ද සාධාරණ මැතිවරණයක් නොලැබුණු ඇත).

4) ඉහළ තනතුරු හා කොමිෂන් සභා සඳහා පත්කිරීම් කිරීමේ දී ජනාධිපතිතුමා පාර්ලිමේන්තු සභාවෙන් ලබාගන්නා නිර්දේශ අනුව කටයුතු කළ යුතු බවට (නිර්දේශ කෙරෙන සුදුස්සන් අතුරින් පත්වීම් කළ යුතු බවට) අදාල වගන්ති සංශෝධනය කළ යුතු ය.

(එ සේ නොමැති නම් පාර්ලිමේන්තු සභාවක් පිහිටුවීම නිෂ්ඵල ය).

5) විධායකයට හා ව්‍යවස්ථාදායකයට ලැබෙනුයේ එකිනෙකට ස්වාධීන ජනවරම් දෙකකි. ඒ නිසා අමාත්‍ය මණ්ඩලය පත් කිරීමේ දී (හා ඉවත් කිරීමේ දී) "අවශ්‍ය යයි සලකන අවස්ථාවන්හි දී අගමැතිතුමා ගෙන් විමසා" යන්න "අගමැතිතුමා ගෙන් විමසා" ලෙස සංශෝධනය කළ යුතු ය. එහි දී අවශ්‍ය නිවැරැදි කිරීම් සඳහා මැදිහත්වීමට මැතිවරණයෙන් වසරකට වඩා ගතවී තිබිය දී පාර්ලිමේන්තුව විසුරුවීමේ බලය ජනාධිපතිතුමාට තිබිය යුතු ය.

6) මේ රට පුරවැසියන් නොවන්නන් හා ද්විත්ව පුරවැසියන් විධායකයේ හෝ ව්‍යවස්ථාදායකයේ හෝ තනතුර නොදැරිය යුතු ය. ඒ නිසා අවම වශයෙන් දැනට පවතින ප්‍රතිපාදන එ ලෙස ම තබාගත යුතු ය.

(මහබැංකු හොරකමට එරෙහි අධිකරණ කටයුතු ඉක්මන් කිරීමට ඇති ප්‍රධාන බාධාව අර්ජුන් මහේන්ද්‍රන් මහතාට වෙනත් රටක පුරවැසිකමින් ලැබෙන ආරක්ෂාව බව නිතර ප්‍රකාශ වේ. ද්විත්ව පුරවැසියකුට ද ඒ අන් රටේ ආරක්ෂාව ලැබෙන තාක් තත්ත්වය එක සමාන ය).

7) විගණකාධිපතිවරයා ගේ කාර්ය හා කර්තව්‍ය යටතට (154 වගන්තියට) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන හා ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඇතුලත් විය යුතු ය.

(මේ ප්‍රතිපාදනය වඩාත් අවශ්‍ය වනුයේ මේ ආයතනයන්හි ජනතා අයිතිය ආරක්ෂා කරගැනීම සඳහා ය. පෞද්ගලික විගණන ආයතන මඟින් ජනතා අයිතිය සුරක්ෂිත කිරීම බලාපොරොත්තු විය නොහැකි ය).

නො. 32, සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 5
දුරකථන: 0716369828 | වෙබ්: www.yuthukama.com | ඊ-මේල් : secretary@yuthukama.com

අප විසින් කරුණු දක්වා ඇත්තේ 20 වන සංශෝධනයෙන් සාකච්ඡා කෙරෙන, නිවැරැදි කිරීම අත්‍යාවශ්‍ය වගන්ති පිළිබඳ ව පමණි. ව්‍යවස්ථාවේ 13, 16 සංශෝධන හා මැතිවරණ ක්‍රමයන් සංශෝධනය කිරීම හැකි තාක් ඉක්මනට නව ව්‍යවස්ථාවක් සැකසීම මඟින් ඉටු කරගත යුතු ව ඇත.

ගරු අගමැතිතුමෙනි, අප විසින් මහා සඟරුවනේ හා ජාතික සංවිධානවල අදහස් සැලකිල්ලට ගෙන ඉදිරිපත් කරන ලද ඉහත නිවැරැදි කිරීම් කාරක සභා අවස්ථාවේ දී රජයේ යෝජනා ලෙස 20 වන සංශෝධනයට ඇතුලත් කරන මෙන් උදක් ම ඉල්ලා සිටිමු.

පින්!
මෙයට
අවංක,

ගෙවිඳු කුමාරතුංග
සභාපති

අනුප පස්කුවල්
ජාතික සංවිධායක

පිටපත්:
1. ගරු අධිකරණ ඇමති අලි සබ්රි මැතිතුමා.
2. ශ්‍රී ලංකා පොදුජන නිදහස් සංධානයේ පක්ෂ නායකයන්.

---

නො. 32, සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 5
දුරකථන: 0716369828 | වෙබ්: www.yuthukama.com | ඊ-මේල් : secretary@yuthukama.com

# IX.
# ජාතික නිදහස් පෙරමුණ අගමැතිවරයා වෙත යොමුකල ලිපිය

ජාතික නිදහස් පෙරමුණ
தேசிய சுதந்திர முன்னணி
National Freedom Front

ගරු අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමා,
අගමැති කාර්යාලය,
කොළඹ.

ගරු අගමැතිතුමනි,

**20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට කාරක සභා අවස්ථාවේ දී ඇතුළත් කළ යුතු සංශෝධන පිළිබඳව**

යෝජිත 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට ඇතුළු කොට ඇති යම් ප්‍රතිපාදන පිළිබඳව අප පක්ෂයේ නායකත්වය සහ සෙසු පක්ෂ නායකයන් මෙන්ම පොදු මහජනතාව විසින් ඉදිරිපත් කළ විරෝධතා පිළිබඳව සංවේදී වීම පිළිබඳව පළමුවෙන්ම අප පක්ෂයේ ප්‍රණාමය ඔබතුමාට පිළිගැන්විය යුතුය. ඒ අනුව ඔබතුමා විසින් පත් කරන ලද කමිටුවට අප පක්ෂයේ නායක විමල් වීරවංශ සහෝදරයා විසින් ඉදිරිපත් කරන ලද මූලික විරෝධතා පිළිබඳව යම් එකඟතාවකට පැමිණීමට උත්සාහ කිරීම ද අපගේ ඇගයීමට ලක් වේ.

නමුත් නීතිපතිවරයා විසින් රජයේ යෝජනා ලෙස අධිකරණයට ඉදිරිපත් කරන ලද සහ පාර්ලිමේන්තු විවාදයේ කාරක සභා අවස්ථාවේ දී සංශෝධනය කිරීමට නියමිත බවට සඳහන් කළ යෝජනාවලිය තුළ අප පක්ෂයේ නායකයා විසින් ඉදිරිපත් කළ සංශෝධන කිසිවක් අඩංගු නොවන බව කනගාටුවෙන් සඳහන් කළ යුතුය. අප පක්ෂයේ නායක විමල් වීරවංශ සහෝදරයා විසින් ඔබතුමා වෙත ඉදිරිපත් කළ සහ නීතිපතිවරයාගේ යෝජනා තුළ අඩංගු නොවූ සංශෝධන අතුරින් ප්‍රධාන ත්‍රිත්වයක් ඉතා තීරණාත්මකව වැදගත් වේ. ඒවා පිළිබඳව ප්‍රබල මහජන විරෝධයක් ගොඩනැගී ඇති අතර එම විරෝධයන් නොසලකා කටයුතු කිරීම මගින් අපගේ ආණ්ඩුවේ ජනවරමේ ආධ්‍යාත්මයට සහ ආණ්ඩුවේ ප්‍රතිරූපයට බලවත් අගතියක් සිදුවන බව ඔබතුමා ද පිළිගන්නවා ඇත.

ඉතිහාසයට මෙන්ම ජනවරමට සාධාරණය ඉටු කිරීම සඳහා 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අඩංගු වන අපගේ දැඩි විරෝධයට ලක්ව ඇති සහ නැවත සංශෝධනය කළ යුතු හෙවත් නිවැරදි කළ යුතු ප්‍රතිපාදන ත්‍රිත්වය මෙසේ නැවත අවධාරණය කරමු.

342/1/4 ඊ.ඩබ්. පෙරේරා මාවත, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.
342/1/4 E.W. Perera Mawatha, Kotte Road Pitakotte.
දුරකථන 0112 890670 / ෆැක්ස් 0112 890671
jnpsrilanka1@gmail.com / www.jnpsrilanka.lk

1. සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි කොට ඇති රජයට බහුතර කොටස් හිමි සමාගම් විගණකාධිපතිවරයාගේ විගණනයෙන් නිදහස් කිරීම.


2. මහජනයාගේ දැනගැනීම පිණිස ගැසට් කිරීමෙන් තොරව හදිසි පනත් සම්මත කිරීම.

3. ද්විත්ව පුරවැසි බාධකය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඔබ්බට තානාපතිවරුන් සහ රජයේ ප්‍රධාන උසස් නිලතලවලට ද පැනවීම වෙනුවට එම බාධකය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම.

ඒ අනුව ජාතික නිදහස් පෙරමුණ ලෙස අප ඔබතුමාට ඉතා ගෞරවයෙන් අවධාරණය කරනු ලබන්නේ අප ආණ්ඩුවක් ලෙස එම වැරදි නිවැරදි කළ යුතු බව ය. එය ජනවරම ආරක්ෂා කිරීම සඳහා අප විසින් ගනු ලබන දේශපාලන ස්ථාවරයකි. ආණ්ඩුව සමස්තයක් ලෙස එම දේශපාලන ස්ථාවරය නොසලකා කටයුතු කරන්නේ නම් එහි දේශපාලන වගකීම අප විසින් බාර නොගන්නා බව ඉතා ගෞරවයෙන් සඳහන් කරමි. එහෙත් ආණ්ඩුවට සහ රටට එරෙහිව පවතින සතුරු වටලෑම පිළිබඳව ගැඹුරු අවබෝධයකින් යුතුව 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයට අදාළව ආණ්ඩුව ආරක්ෂා කිරීමේ දේශපාලන ස්ථාවරයක් අප විසින් ගනු ලබන බව පූර්වගාමීව මෙසේ දැනුම් දෙමු.

ඔබතුමාට තෙරුවන් සරණයි!

මෙයට,
විශ්වාසී,



එස්. විජයසිරි,
ප්‍රධාන ලේකම්,
ජාතික නිදහස් පෙරමුණේ දේශපාලන මණ්ඩලය වෙනුවෙන්
2020-10-02

පිටපත් :- සියලු ජනමාධ්‍ය ආයතන

# X.
# පිවිතුරු හෙල උරුමය ජනාධිපතිවරයා වෙත යොමුකල ලිපිය

පිවිතුරු හෙළ උරුමය
Pivithuru Hela Urumaya

2020 ඔක්තෝබර් 19 දින

අතිගරු ජනාධිපතිතුමා
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 1

අතිගරු ජනාධිපතිතුමනි

**විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පක්ෂ ස්ථාවරය**

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ 2020 ඔක්තෝබර් 21 සහ 22 දිනයන්හි පාර්ලිමේන්තුවේ දී විවාද කර ඡන්දය විමසීමට නියමිතය.

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිට ජනතාව විසින් ලබා දෙන විධායක බලයෙන් සැලකිය යුතු කොටසක් අගමැතිට සහ කතානායකගේ සභාපතිත්වයෙන් යුත් ව්‍යවස්ථාදායක සභාවට ලබා දීමෙන් හිස් තුනක පක්ෂියෙකු බඳු රාජ්‍යයක් නිර්මාණය වී ඇත. පසුගිය ආණ්ඩුව අසාර්ථක වීමට බල පෑ ප්‍රධානතම කරුණ වූයේ එයයි. 2020 පාර්ලිමේන්තු මැතිවරණයේ දී 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනස් කළ හැකි ජනවරමක් අප ඉල්ලා සිටියේ එබැවිනි. ඒ අනුව ප්‍රතිපත්තියක් ලෙස අප විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂ නමුත් එහි බරපතල සංශෝධන කිහිපයකට ලක් කළ යුතු බව පක්ෂ ස්ථාවරයයි.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ නිර්ණය මේ වන විට ප්‍රසිද්ධ කිරීමට නියමිතය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන පනත් කෙටුම්පතක් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විමසා බලන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 වන වගන්තියේ සඳහන් ජනමත විචාරණයකට තුඩු දෙන වගන්ති උල්ලංඝණය වෙනවා ද යන සීමිත කරුණ පමණි. එබැවින් 20 වන සංශෝධනයේ අඩංගු කරුණු වල දේශපාලන සහ සමාජ බලපෑම පිළිබඳ සංවාදය තව දුරටත් ඉදිරියට ගෙන යා යුතු බව අපගේ අදහසයි.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අඩංගු කරුණු පිළිබඳ පක්ෂයේ ස්ථාවරය පක්ෂයේ නායක බලශක්ති අමාත්‍ය නීතිඥ උදය ගම්මන්පිල මැතිතුමා විසින් ඇමති මණ්ඩලයේ දී ද ඔබතුමා සමග පෞද්ගලිකව ද විසිවන සංශෝධනය පිළිබඳ අගමැතිතුමා පත් කළ කමිටුවේ සාමාජිකයෙකු ලෙස එහි දී ද දැන් වූ බව පක්ෂයට වාර්තා කර ඇත. නීතිපතිතුමා හරහා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරමින් කමිටු අවස්ථාවේ කරන බවට දක්වා ඇති සංශෝධන වලින් නොවිසඳුණු ජාතික ආරක්ෂාවට මෙන්ම ජනතාවගේ අයිතිවාසිකම් වලට ද බලපාන ප්‍රධාන කරුණු පිළිබඳ පක්ෂයේ මතය අපි මතු දක්වා සිටිමු.

1

අංක 448 කෝට්ටේ පාර පිටකෝට්ටේ
No 448 Kotte Road Pitakotte Sri Lanka
(+94) 11 2877628 (+94) 11 2877626 infopivithuruhelaurumaya@yahoo.com www.pivithuruhelaurumaya.com

**1. හදිසි පනත් සම්මත කිරීම**

ගැසට් මගින් පනත් කෙටුම්පත් ප්‍රසිද්ධ නොකර හදිසි පනත් සම්මත කිරීමට විධිවිධාන යෝජනා කිරීම මහජනතාවට එකී පනත් කෙටුම්පත් පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාව අහිමි කිරීමක් පමණක් නොව එහි අඩංගු ව්‍යවස්ථා විරෝධී විධිවිධාන ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කිරීමට ද අවස්ථාව අහිමි කිරීමකි. ජේ ආර් ජයවර්ධන ජනපතිතුමා 1987 දී දැවැන්ත ජනතා විරෝධයක් මැද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ ද චන්ද්‍රිකා ජනාධිපතිතුමිය විසින් 2000 දී පෙඩරල් ව්‍යවස්ථාව ගෙන ආවේ ද මෙම වගන්තියට මුවා වෙමිනි. ජාතියට තීරණාත්මක පනත් කෙටුම්පත් හදිසි පනත් ලෙස ගෙනැවිත් ජනතාවට ඒ පිළිබඳ අදහස් දැක්වීමට ඇති අවස්ථාව අහිමි කිරීමේ අප්‍රසන්න ඉතිහාසයක් ඇති බව මෙහි දී සිහිපත් කළ යුතුය.

**2. රාජ්‍ය සමාගම් විගණනය කිරීමට විගණකාධිපති සතු බලතල අහෝසි කිරීම**

ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස් සමාගම විසින් අවස්ථා ගණනාවක දී එයාර් බස් මිළ දී ගැනීමේ දී ප්‍රකෝටි ගණනක වංචාවක් සිදු වී ඇති බව පාර්ලිමේන්තු කෝප් කමිටුව ඉදිරියේ හෙළිදරව් වූයේ විගණකාධිපතිගේ විගණනය මගිනි. එබැවින් මහජන මුදල් 50%ට වඩා යොදවා ඇති ඕනෑම ආයතනයක් විගණනය කිරීමේ බලය විගණකාධිපති සතු විය යුතුය. එය කොමිෂන් සභා සම්බන්ධයෙන් ද අදාළය.

**3. ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් සහ ජනාධිපති වීමට අවස්ථාව සැලසීම**

ඕස්ට්‍රේලියාවේ ජනගහනයෙන් 97%ක් සැකසී ඇත්තේ පසුගිය වසර 200 තුල එරටට සංක්‍රමණය වුණු ජනතාවගෙනි. නමුත් එරට පවා ද්විත්ව පුරවැසියන්ට දේශපාලන තනතුරු දැරීමට අවස්ථාවක් ලබා නොදෙයි. ලොව බොහෝ රටවල ද එම නීතිමය සීමාව දැකිය හැක. එකී නීතිය පසුගිය ආණ්ඩුව ගෙන ආවේ රාජපක්ෂ පවුල ඉලක්ක කරගෙන ද්වේශ සහගත චේතනාවෙන් වුවද එය සාධනීය පියවරක් ලෙස අපි දකිමු. යම් ජනාධිපතිවරයෙකුගේ හෝ ඇමතිවරයෙකුගේ පක්ෂපාතිත්වය රටවල් දෙකක් අතර බෙදී ඇත්නම් එකී රට සමග ගනුදෙනු කිරීමේ දී ඔහු ශ්‍රී ලංකාව වෙනුවෙන් අවංකව පෙනී සිටීදැයි යන සාධාරණ සැකයක් ජනතාවට ඇති වනු ඇත.

**4. ඇමතිවරුන් ගණනට ඇති සීමාව ඉවත් කිරීම**

නිදහසින් පසු ක්‍රමයෙන් ඇමතිවරුන් ගණන වැඩි වී අවසානයේ දී ඇමතිවරු ගණන 94 දක්වා ඉහළ නැගුණු බව ඔබතුමා ද දනියි. මේ පිළිබඳ සමාජයේ මතු වුණු දැවැන්ත විරෝධය හේතුවෙන් 19 වන සංශෝධනය මගින් ඇමති මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව 30කට ද සහ ඇමති මණ්ඩල සාමාජිකයින් නොවන ඇමතිවරුන් සහ නියෝජ්‍ය ඇමතිවරුන් ගණන 40කට ද සීමා කරන ලදී. එකී සීමාව ඉවත් කිරීම මගින් මහජන මුදල් නාස්තියක් මෙන්ම තමන්ව ඇමති මණ්ඩලයට පත් කරන මෙන් ඇමති මණ්ඩලයේ නොසිටින මැති ඇමතිවරුන්ගෙන් ඔබතුමාට පීඩනයක් ඇති කිරීම ද සිදුවිය හැක.

ඔබතුමාට ඇමතිවරුන් 30ක් පත් කිරීමට අවස්ථාව තිබිය දී පළමු අවස්ථාවේ දී ඇමති මණ්ඩලය 16කට ද දෙවන අවස්ථාවේ 28කට ද සීමා කිරීමෙන් ජාතියට මහඟු ආදර්ශයක් ලබා දී ඇත. නමුත් මෙකී ව්‍යවස්ථාමය විධිවිධාන ඔබතුමාගේ කාලයෙන් අවසන් නොවේ. ඕස්ට්‍රේලියානු ව්‍යවස්ථාව වසර 119ක් ද ඇමෙරිකානු එක්සත් ජනපද ව්‍යවස්ථාව වසර 231ක් ද තිස්සේ පවතින බව මෙහි ලා සිහිපත් කිරීමට කැමැත්තෙමු.

2

ඉහත කරුණු පිළිබඳ ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර 69 ලක්ෂයේ ජන වරමට ගරු කරනු වස් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වඩාත් ජනතා හිතකාමී කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

මෙයට දේශප්‍රේමීත්වයෙන්

පිවිතුරු හෙළ උරුමය

උපුල් විජේසේකර

ප්‍රධාන ලේකම්

ඩබ්. ඒ. ඩී. උපුල් විජේසේකර
ප්‍රධාන ලේකම්
පිවිතුරු හෙළ උරුමය
අංක 448 කොට්ටේ පාර
පිටකෝට්ටේ

පිටපත්

1. ගරු අගමැතිතුමා
2. ගරු අධිකරණ ඇමතිතුමා
3. සියළුම ජනමාධ්‍ය

3

# XI.
# ලංකා සම සමාජ පක්ෂය ජනාධිපතිවරයා වෙත යොමුකල ලිපිය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ජනාධිපති
අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා.

අතිගරු ජනාධිපතිතුමනි,

රටේ පවතින තත්වය සහ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය.

මේ වන විට ජීවන බර සමාජයේ පහළ තීරුවේ සහ මැද පංතියේ පහළ කොටස්වලට උසුලාගත හැකි සීමාව ඉක්මවා ගොස් ඇති බව ජන සමාජයේ විවිධ කොටස් වලින් අප වෙත වාතර්‍ා කර ඇත.

වක්‍ර බදු අධික වීම නිසා අසීමිත ලෙස භාණ්ඩවල මිල ඉහළ යාම ඊට සමගාමීව අනිවාර්යයෙන් සිදු වේ. සුපිරි ධනවතුන් ආයෝජනය කරන මුදල්වලට යම් බදු සහනයක් දීම යුක්ති සහගත වන නමුත් ආයෝජනය නොකරන සුපිරි ධනවතුන්ගෙන් ආදායම් බදු අය කරගැනීමට හැකිවන පරිදි බදු සංශෝධනයක් කළ යුතු බව අප යෝජනා කර සිටිමු.

ගොවි නිෂ්පාදන අලෙවිය සඳහා සමුපකාර හා අලෙවි සංවධර්න අංශයන් හරහා රජයේ මැදිහත් වීම අපි යෝජනා කර සිටිමු. වී නිශ්පාදනය, එළවලූ පළතුරු ආදියට රජය මැදිහත් වී යම් සාධාරණයක් කළ යුතුව ඇත.
මෙවන් පසුබිමක් තුළ 20 වන සංශෝධනය ගෙන ඒමේ දී සාධනීය ලකෂණයක් ඇත්නම් එයට ජන සමාජයේ ඉහළම පිළිගැනීම ලැබෙනු ඇත. එහෙත් ජනතාවගේ කුකුස හා අවිශ්වාසය රජ යන කරුණු අඩංගු කර තිබීම ගැන කිසිසේත් අප හට එකග විය නොහැක.

වතර්මාන රජයට 2/3 බලයක් ඇති නිසා පාලර්‍ිමේන්තුවේ දී කුමන කරුණක් වුවත් නිතැතින්ම සම්මත කර ගැනීමේ හැකියාවක් ඇත. එසේ තිබිය දී හදිසියේම මෙසේ සංශෝධන ගණනාවක් ගෙන ඒම අප පක්ෂ සාමාජිකයන්ගේ හා ජනතාවගේ සැකයට භාජනයව ඇත. පූණර් ව්‍යවස්ථා සංශෝධනයක් කර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ ඓතිහාසික කාය්‍ර්ය මේ රජය මගින් ඉටුකර ගැනීම අපගේ බලාපොරොත්තුවයි. එහි දී විධායක ජනාධිපති ක්‍රමය යටතේ අවුරුදු 42 අත්දැකීම් ලත් ජනතාව තවදුරටත් මෙම කටුක අත්දැකීම් විදීමට සූදානම් නැත. අප පක්ෂය 1978 සිට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට සැම රජයකින් ම ඉල්ලා ඇතත් මේ වනතුරු එය ඉටු වී නොමැත.

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙල අප පක්ෂය ඉහළින් ම අගය කරන බව දක්වමු. එයට අවශ්‍ය 2/3 බලය දැනටමත් ආණ්ඩුවට ඇත. එවන් පරමබලයක් ලැබී ඇත්තේ වසර 42 කට පසුව ය. එහෙයින් තව තවත් බලතල ජනාධිපති' ධුරයට පැවරීම පිළිබඳව අප බැලිය යුත්තේ අනාගතයේ ඇතිවන ජනාධිපතිවරයෙකු ඒවා හානිකර ලෙස ක්‍රියාවේ යෙදුවහොත් ජනතාවට ගැලවීමක් නැතිවන ලෙස ඇති විය හැකි පීඩාව පිළිබඳ සළකා ය.

යෝජිත සංශෝධනවල සාධනීය කරුණුවලට අප පකෂය ඉහළින් ම සහය පළකරන අතර ද්විතව පුරවැසිභාවය සහිත අයට පාලර්‍ිමේන්තුවට තේරී පත්වීමට අවස්ථාව දීමෙන් ද්‍රවිඩ ඩයස්පෝරාව වැනි රටට හානිකර පුද්ගලයන්ට ව්‍යවස්ථාදායකය තුළ දී ම මෙරට අනාගතයට අහිතකර ක්‍රියාමාගර්යන් ගැනීමට ඉඩසැළසීමේ විධිවිධානවලට එකඟවීමට නොහැකි බව අප පකෂයේ මතය බැවි කාරුණිකව දන්වා සිටිමි.

ස්තුතියි.
මෙයට සහෝදරත්වයෙන්,

මහාචාය්‍ර් තිස්ස විතාරණ,
ප්‍රධාන ලේකම්.

# XII.
# පාර්ලිමේන්තු මන්ත්‍රී විජේදාස රාජපක්ෂ විසින් ජනාධිපතිවරයා වෙත යොමුකල ලිපිය


**ආචාර්ය විජයදාස රාජපක්ෂ**

ජනාධිපති නීතිඥ,
දර්ශනශූරී, කොළඹ විශ්ව විද්‍යාලය
දර්ශනශූරී, කැලණිය විශ්ව විද්‍යාලය
දර්ශනශූරී, (සම්මානිත) කොතලාවල විශ්ව විද්‍යාලය


අතින් / ලියාපදිංචි තැපල්

2020 ඔක්තෝබර් 12

අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා,
ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යෝජිත 20 වන සංශෝධනය</u>

මෙරට පැවති දේශපාලන ව්‍යාකූලතාවය, ජාතික ආරක්ෂාව අහිමි වීමේ අනතුර, විදේශ ආධිපත්‍යයේ ව්‍යාප්තිය සහ රාජ්‍ය අංශවල පැවති දූෂණය යනාදි කරුණු හේතුවෙන් මහත් ලෙස අසහනයට, පීඩාවට හා කම්පනයට පත් ශ්‍රී ලාංකික පුරවැසියන් අතරින් ලක්ෂ හැටනමයක් ජනාධිපතිවරණයේ දී ඔබතුමා වෙත සිය ඡන්දය ලබා දෙමින් ඔබතුමන් ජනාධිපති කරවන ලද්දේ සහ ලක්ෂ හැටඅටක් පුරවැසියන් ඔබතුමන් නියෝජනය කරනු ලබන දේශපාලන බල කඳවුරට පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඡන්දය ලබා දෙන ලද්දේ ඔබතුමන් ඉදිරිපත් කළ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව වෛරක්කාරී දේශපාලනයෙන් මිදී සියලූ ජනතාවට නිදහසේ ජීවත් විය හැකි සෞභාග්‍යමත් සුරක්ෂිත දේශයක් ගොඩනගනු ඇතැයි යන අසීමාන්තික බලාපොරොත්තු පෙරදැරි කරගෙන ය. අද වන විට රට දැරිය නොහැකි ණය බරකින් පීඩාවට පත් වී ඇති අතර බහුතරයක් ජනතාවගේ ආර්ථිකය මුළුමනින් ම බිඳ වැටී අන්ත අසරණ තත්ත්වයට පත්ව ඇත.

කොරෝනා වසංගතය ද ඊට බලපෑ නමුත් ඊටත් වඩා බලපා ඇත්තේ 2005 වසරේ සිට විධිමත් කළමනාකරණයකින් තොර ව අධික පොලී අනුපාත යටතේ ණය ලබා ගනිමින් රාජ්‍ය ණය ප්‍රමාණය මේ වන විට බිලියන 13,000 ඉක්මවා යාමට ඉඩ සලස්වා තිබීමයි. එම හේතුව නිසා ම අපේ රටේ වටිනා සම්පත් කොටස් වශයෙන් චීනය අත්පත් කරගෙන ඇති අතර රටේ වටිනා ම ආර්ථික හා ආරක්ෂක මර්මස්ථාන මේ වන විට අපට අහිමි වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඇමෙරිකාව ඇතුළු බටහිර ආධිපත්‍ය මෙරට ආරක්ෂක හා ආර්ථික මර්මස්ථාන ඩැහැ ගැනීමට කටයුතු කරමින් සිටින අතර එළිපිට නොපෙනුනත් චීනය හා ඇමෙරිකාව අනාගතයේ ඔවුන්ගේ යුධ පිටිය බවට ශ්‍රී ලංකාව පත්කර ගැනීමේ සටන ආරම්භ කර ඇති බව මටත් වඩා හොඳින් ඔබතුමා දන්නා කාරණයක් යැයි මම විශ්වාස කරමි.

2005 වසරේ අප රටේ ජනතාවගේ ඒක පුද්ගල ණය බර රු. 116,000 ක් පමණක් වුවත් මේ වන විට එය රු. 620,000/- දක්වා වැඩි වී ඇත. එහෙත් ඒ සා විශාල ණය කන්දරාවක් ලබාගන්නත් ඊට සාපේක්ෂ ව රට තුළ සංවර්ධනයක් සිදු වී නොමැත.


අංක. 17, විජයබා මාවත, නාවල පාර, නුගේගොඩ
දුරකථන : 011 2 852841 ෆැක්ස් : 011 2 827208 ඊමේල් : rajapakshew@gmail.com

මෙවන් වූ මොහොතක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුද නිර්මාණය කරගනිමින් දේශපාලනික ව කුලල් කා ගැනීම ඉතාමත් ම අමනෝඥ ක්‍රියාවක් වන අතර එමගින් රටේ ජාතික ආරක්ෂාව සහ ආර්ථිකය යන දෙක ම විනාශ වීම අපට වළක්වාගත නොහැක. අනෙක් අතට විසිවන සංශෝධනයෙන් ඉදිරිපත් කර ඇති බොහෝමයක් කරුණු වලට මහජන විරෝධය උත්සන්න වෙමින් පවතින බවත්, ඔබතුමා සහ මෙම ආණ්ඩුව පත් කිරීමට ඡන්දය දුන් ජනතාවට මෙන් ම පොදුවේ රටේ ජනතාව ද අපේක්ෂා භංගත්වයට පත්වී ඇති බවත් සඳහන් කළ යුතු ව ඇත.

මෙම තත්ත්වය පිළිබඳ ව සාකච්ඡා කිරීම පිණිස ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු සහ මන්ත්‍රීවරු සියලු දෙනා ඔක්තෝබර් මස 09 වන දින අරලියගහ මන්දිරය වෙත කැඳවූවත් ඒ පිළිබඳ සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවක් නොමැති බවත්, එය අනිවාර්ය ලෙස සම්මත කළ යුතු බවත් ප්‍රකාශ කරමින් කිසිවකුටත් අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාවක් ඔබතුමා ලබා නොදුන් නිසා මෙලෙසින් ලිඛිත ව කරුණු ඉදිරිපත් කිරීමට සිදු වූ බව ද සැලකර සිටිමි.

එම රැස්වීම ආරම්භයේ මහාචාර්ය ජී.ඇල්. පීරිස් මහතා ඉදිරිපත් කළ පහත සඳහන් කරුණු දෙක ම නිවැරදි නොවන ව්‍යාජ කරුණු බව දන්වා සිටිමි. ඒවා නම්;

1. **දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හේතුවෙන් පොලිස්පතිවරයා ඉවත් කිරීමට ජනාධිපතිවරයාට බලයක් නොතිබීම යන කාරණය.**

   පොලිස්පතිවරයා සහ නීතිපතිවරයා ඉවත් කිරීමේ ක්‍රමවේදය 2002 අංක 05 දරන පනතින් පාලනය වන්නක් මිස එය 19 වන සංශෝධනයට කිසිසේත් සම්බන්ධයක් නොමැත.

2. **කැබිනට් මණ්ඩලය තුළ ආර්ථික කටයුතු පිළිබඳ අනු කමිටුවක් ඇතිකොට එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා එහි සභාපතිත්වය දැරීම යන කාරණය.**

   එය ද දහනවවන සංශෝධනයට කිසිදු සම්බන්ධයෙක් නොමැත. සෑම අමාත්‍ය මණ්ඩලක් තුළ ම කැබිනට් අනුකාරක සභා පැවතීම සාමාන්‍ය දෙයකි.

දැනට ඉදිරිපත්කර ඇති විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අනර්ථකාරී අංශයන් කිහිපයක් සැකෙවින් පහත සඳහන් පරිදි දක්වා සිටිමි.

1. **ජනාධිපතිවරයා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පැවරී ඇති පහත සඳහන් වගකීම් සහ යුතුකම් ඉටුකිරීම් වලින් ඉවත් වීම.**

   අ) ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කර ආරක්ෂා කරන බවට වගබලාගත යුතු ය.

   ආ) ජාතික ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කළ යුතු ය.

   ඇ) නිදහස් මැතිවරණ පැවැත්වීමට අවශ්‍ය සහාය ලබා දිය යුතු ය.

   ඇ) ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු ය.

ඉ) මූලික අයිතිවාසිකම් නඩුවකින් ජනාධිපතිවරයාගේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අභියෝගයට ලක් කිරීමට පුරවැසියන්ට ඇති අයිතිය තහවුරු කළ යුතු ය.

මහජන ඡන්දයෙන් තේරීපත්වනු ලබන ජනාධිපතිවරයාට පැවරී ඇති මෙම වගකීම් වලින් ඔහු ව මුදා හැරීමට නීති සැකසීමේ අවශ්‍යතාව කුමක් ද යන්න පැහැදිලි කළ යුතු ව ඇත. එම වගකීම් ඉවුකිරීම ප්‍රතික්ෂේප කිරීම සමාජය තුල ඔබ ගොඩනගා ඇති ප්‍රතිරූපයට හානි කරන්නකි.

වසර 29 ක් සිරගත ව සිට සිය රටට සහ ජාතියට නිදහස දිනා දුන් ලොව පහළ වූ අග්‍රගණ්‍ය රාජ්‍ය නායකයකු වූ දකුණු අප්‍රිකාවේ ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා මැතිඳුන් විසින් මැතිවරණ කොට්ඨාස නිර්ණය සම්බන්ධයෙන් කරන ලද නියෝගයක් එරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය විසින් අවලංගු කරමින් නියෝගයක් කරන ලද්දේ එවැනි බලයක් ජනාධිපතිට නොමැති බව තීන්දු කරමිනි. එදින ම රාත්‍රී ජනතාව අමතමින් එතුමා ප්‍රකාශ කලේ එතුමා අධිකරණ තීන්දුවට ගරු කරන බවත්, එතුමාගේ රටේ ජනාධිපති ද නීතියේ ආධිපත්‍යයට යටත් වන බව එම නඩු තීන්දුවෙන් සනාථ වන බවත් ප්‍රකාශ කරමිනි. රාජ්‍ය නායකයකු ශ්‍රේෂ්ඨත්වයට පත් වන්නේ හිතුවක්කාර තීරණ ගැනීම තුළින් නොව පාලිතයා මෙන් ම පාලකයා ද නීතියේ ආධිපත්‍යයට යටත් ය යන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික හරය පිළිගෙන කටයුතු කිරීමට තරම් නිහතමානී, නිරහංකාරත්වයට පත්වන තරමට ය.

පාස්කු ඉරිදා සිදු වූ මහා ජන සංහාරයේ මහමොළකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමක් පවා සිදු නොකරමින් පොලිසිය විසින් ම ඔවුන් මුදා හැර ඇති හෙයින් මෙරට නීතියේ ආධිපත්‍යය ගිලිහී ඇති බව මහජනයා තේරුම්ගෙන ඇත.

**2. රටකට අත්‍යවශ්‍ය පහත සඳහන් කොමිෂන් සභා අහෝසි කිරීම.**

අ) විගණන සේවා කොමිෂන් සභාව

ආ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

මෙය රටේ ජාතික ආර්ථිකයට ඉතාමත් ව්‍යසනකාරී ලෙස බලපාන කරුණකි. 2007 වසරේ මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ, එමෙන් ම මුළු පාර්ලිමේන්තුව ම අනුමත කළ කෝප් වාර්තාවේ සඳහන් කරුණු අනුව රජයට කෝටි තිස්දහසකට වඩා වැඩි වංචා දූෂණ සිදුකළ තැනැත්තකු ඔබ මේ වනවිටත් ඉන්දිය මහ කොමසාරිස්වරයා ලෙස පත්කොට යවා ඇත. එම කෝප් වාර්තාවේ සඳහන් ඔහුගේ වංචා හා දූෂණ චෝදනා වල සත්‍යතාව ශ්‍රේෂ්ඨාධිකරණය ද පිළිගනිමින් එවකට අමාත්‍යවරයකු වූ මිලින්ද මොරගොඩ සිදු කළ එම වංචනික ක්‍රියාකලාපය හේතුවෙන් රජයට අහිමි වී තිබූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවත්, ඇපලෝ රෝහලත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු අක්කර 8 ½ කුත්, සියලු පුද්ගලික බැංකු වල තිබූ 5% ක කොටස් ප්‍රමාණයත් නැවත රජයට ලබා ගැනීමට නියෝග කෙරුණි. එවකට ඔහුගේ අමාත්‍යංශ ලේකම්වරයා ලෙස සිටි පී.බී. ජයසුන්දර මහතාට ජනතාවට ද්‍රෝහී වීමේ චෝදනාව මත රුපියල් ලක්ෂ 05 ක වන්දි මුදලක් භාණ්ඩාගාරයට ගෙවන ලෙසට නියෝග කොට ඔහු ව මුදල් අමාත්‍යංශයේ ලේකම් තනතුරින් නෙරපා හරින ලද බව ඔබතුමාට අමතක වී ඇත්දැයි යන්න ප්‍රශ්න කිරීමට ජනතාවට සිදු වී ඇත.

Page 3 of 9

**3. කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව 30 නොඉක්මවිය යුතු බව සහ රාජ්‍ය සහ නියෝජ්‍ය අමාත්‍යවරු සංඛ්‍යාව 40 නොඉක්මවිය යුතු ය යන සීමාවන් ඉවත් කිරීම.**

මෙය මෙරට ජනතාව දශක ගණනාවක් තිස්සේ සටන් කොට ලබාගත් අයිතියක් බව අමතක නොකළ යුතු අතර මෙම සීමා ඉවත් කිරීමට ඔබතුමාගේ රජයට ඇති අවශ්‍යතාව කුමක් ද යන්න ජනතාවට කිසිසේත් අවබෝධ කරගත නොහැකි කරුණකි.

**4. පාර්ලිමේන්තුව රැස් වූ දින සිට වසරක් ඇතුළත විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට බලය පැවරීම.**

විධායකය සම්බන්ධ ව ජනතා පරමාධිපත්‍ය ජනාධිපති වෙත පවරා දී ඇත්තේ වුව ද ව්‍යවස්ථාදායකය පිළිබඳ ජනතා පරමාධිපත්‍ය සතු වන්නේ උත්තරීතර පාර්ලිමේන්තුවට බවත්, ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සහ මූල්‍ය පාලන බලය සම්බන්ධ තනි හා අනන්‍ය ආධිපත්‍ය හිමි වන්නේ පාර්ලිමේන්තුවට පමණක් බව සිහිපත් කර දෙමි. වසර 05 ක් සඳහා ජනතාව පත්කරගනු ලබන මහජන නියෝජිතයින්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව වසරක් ගතවන තැන විසුරුවීමට ජනාධිපතිට බලය ලැබෙන්නේ නම් එය තුලනය සහ සංවරණය අතර ඇති බලවත් පරස්පරතාවයකි. ජනාධිපතිවරයා ව්‍යවස්ථාව උල්ලංඝනය කළහොත් ඔහුට එරෙහි ව දෝෂාභියෝගයක් ගෙනෙමින් එය ඔප්පු කර 2/3 බලයකින් සම්මත කිරීම දීර්ඝ ක්‍රියාවලියක් වන නමුත් කිසිදු හේතුවක් නොදක්වා හා ක්‍රමවේදයක් අනුගමනය නොකොට පාර්ලිමේන්තුව විසුරුවා හරින්නේ නම් එය ඒකාධිපති බලයකි.

මීට පෙර 2004 පෙබරවාරි මස 07 වන දින චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය අවුරුදු 2 කට පසු පාර්ලිමේන්තුව විසුරුවා හැර එක්සත් ජනතා සන්ධානය නිර්මාණය කර 2004 අප්‍රේල් 02 වන දින මහ මැතිවරණයක් පවත්වන්නට යෙදුනේ රනිල්-ප්‍රභාකරන්ගේ සාම ගිවිසුම නිසා මේ රට දෙකඩ වීමේ අවදානමෙන් බේරා ගැනීමට ය. එහෙත් ශ්‍රී.ල.නි.ප./ජ.වි.පෙ. එකතුව එ.ජ.නි. සංධානයට ලබා ගැනීමට හැකි වුයේ මන්ත්‍රීධුර 105 ක් පමණි. එවකට පැවති යුද සමයේ හදිසි නීතියවත් සම්මත කර ගැනීමට අවශ්‍ය සාමාන්‍ය බහුතරය අපහට නොතිබූ අතර වෙනත් පක්ෂ වලින් මන්ත්‍රීවරු එකතු කරගෙන මා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 11 කට සාර්ථක ව පෙනී සිට ආණ්ඩුවේ මන්ත්‍රීන් සංඛ්‍යාව 105 සිට 123 දක්වා වැඩිකර දුන් නිසා මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා වන විට ඔහුට යුද්ධය මෙහෙයවීමට අවශ්‍ය බහුතරය මා විසින් නිර්මාණය කර දුන් බව ඔබතුමා විසින් නොදන්නා කරුණක් යැයි මම සිතමි. එම ගැටලුකාරී තත්ත්වයන් අනාගතයේ ඇතිවීම වළක්වා ගැනීමට නම් සිදු කළ යුත්තේ ස්ථාවර ආණ්ඩු නිර්මාණය කළ හැකි ලෙස පවතින මැතිවරණ ක්‍රමයේ ප්‍රශස්ත වෙනසක් සිදු කිරීමයි.

**5. හදිසි අවස්ථා පනත් ඉදිරිපත් කිරීම පිණිස නැවත ප්‍රතිපාදන හඳුන්වා දීම.**

රටක නීතියක් පැනවීමේ දී වගවිභාගයකින් තොර ව හදිසියේ සිදු කිරීම ඉතා අනර්ථකාරී ක්‍රියාවකි. රටක පැනනගින හදිසි තත්ත්වයන් පාලනය කිරීමට මහජන ආරක්ෂක පනත

මගින් රෙගුලාසි සෑදීමේ ප්‍රමාණවත් බලයක් ජනාධිපතිවරයා සතු වේ. අනෙක් අතට හදිසි පනත් පැනවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් අප පාර්ලිමේන්තුව නීති පැනවූ අවස්ථා දෙකකි.

අ) 1987 පළාත් සභා ඇතිකරමින් පනවන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය.

එය මෙරට ජනතාවගේ අවශ්‍යතාවක් නොවූ අතර විදේශීය බලපෑම් මත සිදුකරන ලද්දකි.

ආ) 1988 දෙසැම්බර් මස 17 වන දින සම්මත කරන්නට යෙදුනු 15 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය.

ආර්. ප්‍රේමදාස අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් වූ ජනාධිපතිවරණයට දින දෙකකට පෙර එම සංශෝධන සිදු කරන ලද්දේ මුස්ලිම් ජනතාවගේ ඡන්දය ලබා ගැනීම සඳහා අෂ්රොෆ් මැතිතුමාට දෙන ලද දේශපාලන කප්පමක් වශයෙනි. මැතිවරණ දිස්ත්‍රික්කයකින් ලබාගත යුතු 12.5% ක අවම ඡන්ද ප්‍රතිශතය 5% කට අඩු කළ අතර එතැන් පටන් මෙරට බිහි වූ සුළු පක්ෂ මෙරට පැවති ප්‍රධාන පක්ෂ මෙහෙයවන දූරස්ථ පාලකය බවට පත් විය.

උදා : 1994 වසරේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය ජනාධිපතිවරණයේ දී 62% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්ත ද එතුමියට පාර්ලිමේන්තුවේ ආසන 113 ක් ලබාගත නොහැකි විය.

ඉහත කී හදිසි පනත් දෙක මේ රට විනාශ මුඛයට ඇද දැමූ අනර්ථකාරී පනත් දෙකක් වන අතර එවකට සිටි ජනාධිපතිවරුන් ඒකාධිපතියන් ලෙස කටයුතු කිරීම නිසා මෙම ඛේදජනක ඉරණමට රට මුහුණ දී ඇත.

**6. ද්විත්ව පුරවැසියකුට මන්ත්‍රීවරයකු සහ ජනාධිපතිවරයකු වීමට සුදුසුකම් ඇති බවට නීතිය වෙනස් කිරීම.**

ද්විත්ව පුරවැසියන්ට කිසිදු රටක රාජ්‍ය තන්ත්‍රයේ ඉහළ තනතුරු වලට පත් වීමට සහ රාජ්‍ය තන්ත්‍රයට සහභාගී වීමට අයිතිය ලබා නොදේ. ද්විත්ව පුරවැසිභාවය දරන තැනැත්තා රටවල් දෙකක නීති මගින් බැඳී සිටින නිසා ඔහුට ස්වාධීන ව කටයුතු කළ නොහැකි අතර එම රටවල් දෙක අතර ප්‍රතිවිරුද්ධ අයිතිවාසිකම් (conflict of interest) ඇති වූ අවස්ථාවක දී එම තැනැත්තා පුරවැසිභාවය දරමින් සිටින අනෙක් රටට ඔහුට පක්ෂපාතී වීමට සිදු වුවහොත් ඔහු ශ්‍රී ලංකාවට එරෙහි ව ද්‍රෝහියකු ලෙස කටයුතු කිරීමෙන් වැළකී සිටිය නොහැක. ඔස්ට්‍රේලියාවේ උප අගමැති බර්නාබි ජොයිස් (Barnaby Joyce) නවසීලන්තයේ ද ද්විත්ව පුරවැසිභාවය ලබාගෙන ඇති බව 2017 අගෝස්තු මස හෙළිදරව් වූ වහා ම ඔහු උප අගමැති ධුරයෙන් හා මන්ත්‍රී ධුරයෙන් නෙරපා දමන ලදී. ශ්‍රී ලංකාවේ ද කිසිවකුත් එවැනි ද්විත්ව පුරවැසියකුගේ අවශ්‍යතාව ඉල්ලා නොමැති අතර ශ්‍රී ලංකා මහ බැංකුව මංකොල්ල කෑ අර්ජුන් මහේන්ද්‍රන් වැන්නන් තවදුරටත් රටට අවශ්‍ය නොවන බව ද දන්වා සිටිමි.

**7. ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයෙන් ඉවත් කිරීම.**

පත්වන ජනාධිපතිවරයකු හෝ අග්‍රාමාත්‍යවරයකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කර ආරක්ෂා කරන බවට දිවුරුම් දීම සිදු කළ යුතු අතර එවැන්නෙකුට මහජන මුදල් වංචා කිරීමට ද අයිතියක් නැත. ඔවුන් මහජන මුදල් වංචා නොකරන බවට විශ්වාසයක් ඇත්නම් මෙවැනි මුක්තියක් ලබා දීමේ අරමුණ කුමක් ද?

ජනාධිපති අරමුදල ද ජනාධිපති කාර්යාලය යටතේ පවතින අතර රජයේ මුදල් වලින් ඉතා විශාල මුදල් ප්‍රමාණයක් එම ගිණුම මතින් ගනුදෙනු කරන බව ද අමතක නොකළ යුතු ය.

**8. සමාගමක ප්‍රාග්ධනයෙන් 50% කට වඩා වැඩි මුදලක් රජය හෝ රාජ්‍ය ආයතනයක් මගින් ආයෝජනය කර ඇත්නම් එය විගණකාධිපතිගේ අධීක්ෂණයට ලක් විය යුතු බවට ඇති ව්‍යවස්ථා ප්‍රතිපාදනය අහෝසි කිරීම.**

මෙවැනි ආයතන 120 ක ලැයිස්තුවක් මේ වන විට හෙළිදරව් වී ඇති අතර විශාල වශයෙන් මහජන මුදල් යොදවා ඇති ශ්‍රී ලංකන් ගුවන් සමාගම, ශ්‍රී ලංකා ටෙලිකොම් ඇතුළු විශාල ආයෝජනයන් ඇති ආයතන මීට ඇතුළත් ය. එම ආයතන වල පාලකයන් ලෙස පත් කරනු ලබන තැනැත්තන්ට සොරකම් කිරීමේ චේතනාවක් නැත්නම් හෝ සොරකම් නොකරයි නම් විගණනයෙන් ඉවත් කිරීමේ හේතුව කුමක් ද?

ඕනෑ ම අමාත්‍යාංශයක් යටතේ ඇති ආයතන වල මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අවසාන වගකිව යුතු නිලධාරියා වන්නේ එම අමාත්‍යාංශයේ ලේකම්වරයා වන අතර එම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල විගණනයක් නොවන්නේ නම් ලේකම්වරයා එම ආයතන සම්බන්ධ වගකීම භාරගන්නේ කෙසේද?

**9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIX (අ) පරිච්ඡේදය අවලංගු කිරීම මගින් දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුති සහ දූෂණ වැළැක්වීමට වෙනත් යම් ජාත්‍යන්තර සම්මුති ක්‍රියාත්මක කිරීම පිණිස අල්ලස් හෝ දූෂණ විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල අහෝසි කිරීම.**

ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාව දූෂණ පවතින රටක් බවට පිළිගැනීමට ලක්වීමට මෙය හේතු කාරණා වන බව නිසැක ය. එමෙන් ම අල්ලස් හෝ දූෂණ වැඩි කිරීම සඳහා මිස අඩු කිරීම පිණිස මෙවැනි ප්‍රතිපාදන ඉවහල් නොවනු ඇත.

**10. ශ්‍රී ලංකාව දෙකඩ නොකරන බවට දක්වන උපලේඛනයේ ඇති දිවුරුම ඉවත් කිරීම.**

මෙය අත්වැරදීමකින් සිදු වී ඇති බව මේ වන විට අධිකරණ අමාත්‍යවරයා පිළිගෙන ඇත.

ඉහත කරුණු අනුව මෙරට ඉතා අසීරු තත්ත්වයකට මුහුණ දී ඇති මෙම වකවානුවේ දේශපාලන විරසකභාවයන් වර්ධනය කරමින් මේ රට අරාජික දේශයක් බවට පත් නොකොට සියලු පක්ෂ වල සහයෝගය ලබා ගනිමින් මෙරට විදේශ රටවල විවිධ වූ ආක්‍රමණයන්ගෙන් බේරා ගනිමින් මෙරට ආර්ථිකය ගොඩනැගීමට පියවර ගන්නා මෙන් ඉතාමත් සද්භාවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිමි.

මේ වන විට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත්කර ඇතත් එය කිසිසේත් ම ඔබතුමාත් සහ රටේ ජනතාවත් අපේක්ෂා කරනු ලබන පරමාර්ථ ඉටුකරගත හැකි එකක් නොවන බව සඳහන් කර සිටින අතර මෙරට ජනතාව 225 දෙනෙකු සිය නියෝජිතයන් ලෙස තෝරාපත්කර ගනු ලබන්නේ පාර්ලිමේන්තුවේ නීති සම්පාදනය සහ මූල්‍ය පාලනයට මිස අන් කිසිවක් සඳහා නොවන බව තේරුම්ගත යුතු ව ඇත. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැකසීම සඳහා අධිකරණ අමාත්‍යවරයාට නොහැකියාවක් ඇත්තේ නම් එය සිදුකළ යුත්තේ පාර්ලිමේන්තුවේ තේරීම්කාරක සභාවක් මගින් වන අතර ඒ සඳහා විශේෂඥයින්ගේ උපදෙස් ලබා ගැනීමට කිසිදු බාධාවක් නොමැත.

'දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා රටේ ආරක්ෂාව පිරිහුනේය' යන්නට වඩා එවකට බලයේ සිටි නායකයින්ගේ නොහැකියාව, අපරිනතභාවය සහ අවස්ථාවාදී කුහක පිළිවෙත ඊට බලපෑ බව අප තේරුම්ගත යුතු ය. ජනාධිපති හා අගමැති අතර විරසකයට බලපෑ ප්‍රධාන හේතුව වූයේ ඇමතිවරු පත් කිරීමේ බලය අගමැති සතු වීමත් සහ විෂයයන් තීරණය කිරීමේ බලය ජනාධිපතිවරයා සතු වීමත් නිසා ය. වෛරක්කාර දේශපාලන පක්ෂ දෙකක නායකයින් අතර එය එසේ වුවත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉතා ඉක්මනට සම්මත කරනු ලබන බවට ප්‍රතිඥා දෙන ඔබතුමා සහ ඔබතුමාගේ වැඩිමහල් සොයුරු අග්‍රාමාත්‍යතුමා සමඟ එවැනි ගැටුමක් ඇතිවන බව ඔබතුමා පවසන්නේ නම් ඔබතුමා රටට දෙන පණිවිඩය ඔබතුමන්ට සහ රජයට කොතරම් හානිකර ද යන්න ඔබතුමන් විසින් ම අවබෝධ කරගත යුතු කරුණක් ලෙස සලකමි.

එකී කරුණු අනුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අවශ්‍යතාවය බහුතර ජනතාවගේ මතය වන අතර එහි දී ප්‍රමුඛත්වය ලබා දිය යුතු කරුණු කිහිපයක් කෙරෙහි ඔබතුමාගේ අවධානය මෙමගින් යොමු කරමි. (සලකා බැලීම සඳහා)

1. මැතිවරණ පැවැත්වීම සම්බන්ධයෙන් වර්තමානයේ පවතින බරපතළ විකෘතිය නිවැරදි කර ගැනීම. පාර්ලිමේන්තු මැතිවරණ, පළාත් සභා මැතිවරණ සහ පළාත් පාලන මැතිවරණ පවත්වන්නේ ක්‍රමවේද තුනකට ය. ජනතාවට වගකියන මන්ත්‍රීවරයකු පත්කර ගැනීමේ හැකියාව ඇති එක් ප්‍රමිතයක් යටතේ මැතිවරණ පැවැත්වීම සඳහා සහ ස්ථාවර ආණ්ඩු පිහිටුවා ගැනීමට හැකිවන පරිදි නීති සංශෝධනය වීම අත්‍යවශ්‍ය කාරණයකි.

2. මෙරට පිහිටුවන ලද පළාත් සභා ඉතාමත් අකාර්යක්ෂම සහ අසාර්ථක ක්‍රියාවලියක් බවත්, එමගින් රටට කිසිදු ප්‍රතිලාභයක් අත්නොවන බවත්, එය විශාල වශයෙන් මහජන මුදල් නාස්ති කරන ක්‍රියාවලියක් බවත් මෙරට අතිබහුතරයකගේ මතය බව සනාථ වී ඇත. එක ම විෂය මධ්‍යම ආණ්ඩුවට සහ පළාත් සභා වලට ලබා දීම මගින් අධ්‍යාපන, සෞඛ්‍ය, මහාමාර්ග, වාරිමාර්ග හා පරිසරය යනාදී කරුණු සම්බන්ධ බරපතළ පිරිහීමක්

සහ කඩාවැටීමක් සිදු වී ඇත. ඒ සඳහා ආදේශ කරගත හැකි විකල්ප යෝජනා සැලකිල්ලට භාජනය කිරීම සුදුසු යැයි යෝජනා කරමි. ඒවා නම්;

අ) පළාත් පාලන ආයතන වල බලතල වැඩිකොට තරුණ සහ කාන්තා නියෝජනය වැඩිකර එම ආයතන ශක්තිමත් කරලීමේ ක්‍රියාවලිය තුළින් වේගවත් සංවර්ධනයක් ඇතිකරලීම. උදාහරණ ලෙස ජපාන රාජ්‍ය පාලන ක්‍රමය පෙන්වා දිය හැක.

ආ) පළාත් සභා ක්‍රමය ජනවාර්ගික ගැටළුවක් හේතුවෙන් ඇති කරන ලද්දක් නිසාවෙන් ඊට විකල්ප ලෙස සෙනට් මණ්ඩලයක් ඇති කිරීම වඩාත් උචිත බව පැවසිය හැක.

පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරා ගැනීමට බලපාන ප්‍රධාන කාරණය ජනප්‍රියභාවයයි. අපේක්ෂකයන්ගේ උගත්කම, පරිනතභාවය, විෂය ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වයට පත්ව සිටීම යන කරුණු වලට එතරම් වැදගත්කමක් දෙන බවක් පෙනෙන්නට නැත. පාර්ලිමේන්තුව විසින් සකසනු ලබන නීති වඩාත් නිවැරදිදැයි සාකච්ඡා කර අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට උගතුන් සහ වියතුන්ගෙන් සමන්විත සෙනෙට් මණ්ඩලයක් පවත්වා ගෙන යාම මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව ආදී ප්‍රබල රාජ්‍යයන් සිදුකරමින් පවතී. පළාත් 9 නියෝජනය වන පරිදි උගතුන් හා බුද්ධිමතුන් සෙනෙට් මණ්ඩල සාමාජිකයන් වීම තුළින් ජනප්‍රිය දේශපාලන සංස්කෘතිය වෙනුවට උගතුන් සහ වියතුන් සහභාගී කරගන්නා වූ ප්‍රශස්ත දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කරගත හැකි වනු ඇත.

මේ අතරින් වඩාත් සුදුසු කුමක් ද යන්න පිළිබඳ පක්ෂ අතර සහ මහජනයා අතර සංවාදයක් ඇතිකර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය කිරීමේ අවශ්‍යතාව ජාතික අවශ්‍යතාවක් බව මහජන නියෝජිතයින් ලෙස අප තේරුම්ගෙන සිටී.

රාජ්‍ය නායකයින්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආරක්ෂාව තහවුරු කරගත හැකි යැයි යන මිත්‍යාවෙන් අප මිදිය යුතු ය. 1978 ජේ.ආර්. ජයවර්ධන මහතා විධායක ජනාධිපතිකම සහ මැතිවරණ ක්‍රමය හඳුන්වා දුන්නේ එක්සත් ජාතික පක්ෂයෙන් පිට ජනාධිපතිවරයකු සහ ආණ්ඩුවක් අනාගතයේ කෙදිනක හෝ බිහි නොවන බවට සහතිකයක් ලබා දෙමිනි. නමුත් මේ වන විට අවුරුදු 26 ක කාලයක් තුළ එක්සත් ජාතික පක්ෂ ජනාධිපතිවරයකු හෝ තනි ආණ්ඩුවක් පත්කර ගැනීමට නොහැකි වී ඇත. එම පක්ෂය මහපොළොවෙන් ද අන්තර්ධාන වී ඇත. ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා 18 වන සංශෝධනය සම්මත කරගනු ලැබුවේ ද වඩාත් බලගතු පාලකයකු ලෙස දීර්ඝ කාලයක් බලය දරා සිටීමට ය. අවසානයේ සිදු වූයේ ජනතාව ලබා දුන් හය වසරක බලය සිව් වසරකින් අවසන් කර ගැනීමට ය.

ජනාධිපතිතුමාගේ සිට ප්‍රාදේශීය සභා මන්ත්‍රීන් දක්වා සියලු මහජන නියෝජිතයින් මේ රටේ අයිතිකරුවන් නොව රටේ භාරකරුවන් පමණි. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ විසින් දේශනා කරන ලද එම ප්‍රකාශය මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශයට ඇතුළත් කිරීමට කටයුතු කරන ලද්දේ ද මා විසිනි. එම නිසා මහජනයා සහ දේශපාලකයා අතර බැඳීම හෝ විරසක වීම තීරණය වන්නේ පාලකයින්ගේ තිබෙන අවංකභාවය සහ විශ්වසනීයභාවය පදනම් කරගෙන මිස ව්‍යවස්ථා බලය තුළින් ඒකාධිපතියන් බවට පත්වීම මගින් නොවේ.

සහශ්‍ර දෙකකට වැඩි කාලයක් මේ රටේ මුරදේවතාවුන් බවට පත්ව සිටින අතිගෞරවනීය මහානායක හිමිපාණන් වහන්සේලා ප්‍රමුඛ මහා සංඝරත්නයේ ද, අති උතුම්

කාදිනල් හිමිපාණන් වහන්සේ ඇතුළු සියලු ආගමික නායකයින්ගේ ද අවවාද සහ අනුශාසනා ලබා ගනිමින් රටට ගැලපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා නොපමාව කටයුතු කරන ලෙස දේශහිතෛෂී මහජන නියෝජිතයකු ලෙස මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි.

ස්තුතියි
මෙයට

ආචාර්ය විජයදාස රාජපක්ෂ
ජනාධිපති නීතිඥ

**පිටපත් :**

1. සියලුම අතිගෞරවණීය මහානායක හිමිපාණන් වහන්සේලා ඇතුළු නායක හිමිපාණන් වහන්සේලා
2. අති උතුම් කාදිනල් හිමිපාණන් වහන්සේ
3. හින්දු හා මුස්ලිම් ආගමික නායකතුමන්ලා
4. ගරු අග්‍රාමාත්‍යතුමා
5. ගරු සභානායකතුමා
6. ගරු විපක්ෂනායකතුමා
7. සියලු දේශපාලන පක්ෂ නායකයින්

# XIII.
# පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමණාත් සී දොලවත්ත විසින් ජනාධිපතිවරයා වෙත යොමුකල ලිපිය

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
**PARLIAMENT**

නිතිඥ ප්‍රේමනාත් C. දොළවත්ත,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
නො. 50,
ඉහළ බෝමිරිය පාර,
කඩුවෙල.
2020.10.19

ගරු ජනාධිපතිතුමනි / ගරු අග්‍රාමාත්‍යතුමනි,

## 20 වන ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳවයි

විසිවැනි ව්‍යවස්ථා සංශෝධනය පිලිබඳ වර්තමානයේ පවතින කථිකාවතේ ආරම්භකයෙකු වශයෙන් ප්‍රසිද්ධියේ මා දැක්වූ අදහස් පිලිබඳව ගරු අග්‍රාමාත්‍යතුමා සහ ගරු ජනාධිපතිතුමා මේ වනවිටත් අවධානය යොමු කර තිබීම පිලිබඳව නිහතමානීව සතුටු වෙමි.

ජනතා නියෝජිතයකු ලෙස 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයට අදාලව මා ඉදිරිපත් කළ අදහස්වලට ගරු කරමින් අවශ්‍ය සංශෝධන සඳහා අවධානය යොමු කිරීම රටේ ජනතා අභිලාෂය ඉටු කිරීමක් බව මම පෞද්ගලිකව විශ්වාස කරමි.

විශේෂයෙන් 53 වන ව්‍යවස්ථාවේ 7 වන උපලේඛනයේ රටේ ඒකීයභාවයට විරුද්ධව කටයුතු නොකරන්නේය යන දිවුරුම හා ජනාධිපති කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය විගණනයෙන් ඉවත් නොකිරීමට ගෙන ඇති තීන්දුව ඒ අතර කැපී පෙනෙයි.

19 වන ව්‍යවස්ථා සංශෝධනයේ අඩුපාඩු නිවැරැදි කෙරෙන නව සංශෝධනයකට අපේ රටේ ජනතාව තුනෙන් දෙකක ජනවරමක් දුන් බව සැබෑය. නමුත් එම ජනවරම 2015 දී අප පරාජය වූ 18 වන ව්‍යවස්ථා සංශෝධනයට නැවත යාමට දුන් ජනවරමක් නොවන බව වටහා ගත යුතුය.

ඒ නිසා 20 වන ව්‍යවස්ථා සංශෝධනය තුළ ඇති අගතිදායි සංශෝධන සම්බන්ධයෙන් සලකා බලන මෙන් මේ අවස්ථාවේදීත් මම ඉතාම ගෞරයෙන් ඉල්ලා සිටිමි.

1. අමාත්‍යධූර සංඛ්‍යාව වැඩි කිරීම
2. විගණනය සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන ඉවත් කිරීම
3. හදිසි පනත් කෙටුම්පත් ගෙන ඒම

යන කාරණා සම්බන්ධයෙන් නැවත සලකා බලන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ කතිකාව ගැනද මෙහිදී අවධානය යොමු කරමි. ද්විත්ව පුරවැසියෙකු හා ශ්‍රී ලංකාවේ සාමන්‍ය පුරවැසියෙකු අතර ඇති ප්‍රධානතම වෙනසක් ඇත. ද්විත්ව පුරවැසියෙකු යනු ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ඉල්ලුම් කර ලබා ගත් පුද්ගලයෙකි. ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය ලැබූ සෑම

1

පුරවැසියෙකුටම, වෙනත් රටක පුරවැසිභාවය හිමිය. ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ඕනෑකමින්ම ඉල්ලුම් කර ලබා ගන්නේ ඔවුන් හදවතින්ම ශ්‍රී ලංකාවට ඇති ආදරය නිසාවෙන් බව මාගේ විශ්වාසයයි.

ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසි භාවය ලැබූවන් මෙරට දෙවන පන්තියේ පුරවැසියන් බවට මින් පෙර කිසිවිටෙකත් පත් වුයේ නැත. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙනඒමේදී දේශපාලනිකව එක් පුද්ගලයකු පමණක් ඉලක්ක කරගනිමින් ඉදිරිපත් කළ බව හැඟෙන 91 වන ද්විත්ව පුරවැසිභාවය පිලිබඳ වගන්තිය මම තරයේ හෙළා දකිමි.

විසි වැනි ව්‍යවස්ථා සංශෝධනයේ ඇතැම් කරුණු අරබයා ඇතිවූ මූලික විරෝධතා සම්බන්ධයෙන් මා ගෙන ගිය සටනේ ප්‍රතිඵලයක් ලෙස ගරු අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 9 දෙනෙකුගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කිරීමත්, එකී යෝජනා ගැන අවධානය යොමු කිරීමත් සතුටට කරුණකි.

අප ලැබූ මැතිවරණ ජයග්‍රහණය යතාර්ථයක් කිරීමට විශාල වශයෙන් දායකත්වය දැක්වූ භික්ෂූන් වහන්සේලා වන රාමඤ්ඤ නිකායේ ස්වාමීන්වහන්සේලා මෙන්ම පූජ්‍ය ඇල්ලේ ගුණවංශ නාහිමි, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි සහ අගරදගුරු මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් සහ ආචාර්ය ගුණදාස අමරසේකර, ජාතික සංවිධාන එකමුතුවේ ලේකම් වෛද්‍ය වසන්ත බණ්ඩාර වැනි ජාතික බලවේග මෙම විසිවැනි ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව දක්වන අදහස් පිළිබදව අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.


රටට බලපාන ඕනෑම ගැටලුවකදී සියලු ජාතින්, පාර්ශවයන් එක් කොට, පැහැදිලි ඉදිරි ගමනක් වෙනුවෙන් ජනතාව පෙළ ගැස්සීමට ඔබතුමන්ලා නායකත්වය දෙන බව රට වැසි සියලු දෙනාගේ විශ්වාසයයි. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදීව ගෙන එන 20 වන ව්‍යවස්ථා සංශෝධනයේ වෙනස්කම් අප ලැබූ පරාජයක් නොවන බව පැහැදිලිය. මෙය හුදෙක්ම ජනතාවාදී ජයග්‍රහණය තව දීර්ඝ කාලයක් පවත්වා ගැනීම සඳහා කරන්නා වූ ඉල්ලීමකි.

විසි වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙනඒමේදී බෙදුම්වාදී චෝදනාලත් රිෂාඩ් බදියුදීන් වැනි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අප කඳවුරට ලබා ගැනීම මම කිසිසේත් අනුමත නොකරමි.

මාතෘ භූමිය සුරක්ෂිත කරමින් හෙට දින මුළු රටම බලා සිටින සංවර්ධන ඉලක්කයට පා තැබීමට ඔබතුමන්ලාගේ නායකත්වය මත ජනතාව තැබූ විශ්වාසය මේ දක්වා එලෙසින්ම පවතියි. වෙනසක් යැයි කියමින් ආපස්සට ගිය රටට සැබෑ අරුණලු ගෙන ඒමේ හැකියාව අප රජයට ඇති බව ජනතාවගේ පරම විශ්වාසයයි. ඒ වෙනුවෙන් මා මේ ඉදිරිපත් කරන සංශෝධන සම්බන්ධයෙන් හා අදහස් සම්බන්ධයෙන් අවධානය යොමු කරන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ස්තුතියි,

මෙයට විශ්වාසී



ප්‍රේම්නාත් සී. දොළවත්ත,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

2

# XIV.
# ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ විශේෂඥ කමිටුවේ වාර්ථාව

**OBSERVATIONS OF THE COMMITTEE APPOINTED BY THE BAR ASSOCIATION OF SRI LANKA TO STUDY AND SUBMIT VIEWS ON THE PROPOSED 20TH AMENDMENT TO THE CONSTITUTION AS WELL AS FURTHER AMENDMENTS REQUIRED TO THE CONSTITUTION TO FACILITATE ADDRESSNG LAWS DELAYS AND OTHER RELATED MATTERS AFFECTING THE ADMINISTRATION OF JUSTICE.**

## 1. Introduction

1.1 The Bar Association of Sri Lanka ("BASL") by letter dated 9 September 2020 under the hand of its President and of its Secretary addressed to Mr. Nihal Jayamanne PC informed him that a Special Committee of 15 persons of the BASL had been appointed by the Management Committee of the BASL to study the draft of the 20th Amendment of the Constitution and submit views on the same on an urgent basis to be tabled before the Executive Committee of the BASL and the Bar Council in order to be forwarded to the relevant authorities.

1.2 The letter indicated that Mr. Nihal Jayamanne, PC was invited to chair the Committee and that the other members of the Committee were Mr. Ikram Mohamed, PC, Mr. M.M. Zuhair, PC, Mr. L.M.K.Arulanandam, PC, Mr. Prasantha Lal De Alwis, PC, Mr. Nihal Jayawardene, PC, Mr. Nalin Ladduwahetty, PC, Mr. Maithri Wickremesinghe, PC, Mr. Uditha Egalahewa, PC, Mr. Anura Meddegoda, PC, Mr. Mohan Weerakoon, PC, Mr. S.T. Jayanaga, PC, Mr. Priyal Wijayaweera, PC, Mr. Maurapada Gunawansha, PC, Mr. Ravi Algama and Mr. Shantha Jayawardena (Convenor).

1.3 The Committee was requested to submit its observations by 18 September 2020. The members of the Committee were informed of their appointment by the Convener of the Committee on 11 September 2020 and copies of the letter dated 9 September 2020 were received by the members of the Committee on 14 September 2020.

1.4 Mr. Nihal Jayamanne, PC declined the invitation to chair the Committee and also to participate in the Committee. Mr. Ikram Mohamed, PC, Mr. Anura Meddegoda PC and Mr. Ravi Algama also declined to be in the Committee. Mr. Jagath Wickramanayaka PC was subsequently appointed to the Committee by the BASL.

1.5 The Committee unanimously elected at its first meeting held on 14 September 2020, Mr. L.M.K. Arulanandam PC as the Chairman of the Committee.

1.6 The Committee met on 14 September 2020 and 17 September 2020. The members present at each meeting of the Committee are set out in the Annexure 2, to these observations.

1.7 The Committee was constrained by the short time limit within which its views were required to be submitted and requests that it be excused for any shortcomings in the

observations. The committee also decided that members of the committee may submit their views in writing in order to consider the same, in formulating the views of the committee. Accordingly, Mr. S.T. Jayanaga, PC, Mr. M.M. Zuhair, PC, Mr. L.M.K.Arulanandam, PC and Mr. Maithri Wickremesinghe, PC submitted their views in writing.

1.8 The Committee proceeded on the basis that the "draft of the 20th Amendment to the Constitution" on which its observations were requested by letter dated 9 September 2020 was the "Twentieth Amendment to the Constitution a Bill to amend the Constitution of the Democratic Socialist Republic of Sri Lanka" published in the Gazette of the Democratic Socialist Republic of Sri Lanka Part II of August 28, 2020 Supplement issued on 02.09.2020 (the "Bill").

1.9 The Committee noted that the BASL has been formed *inter alia* to extend co-operation and support towards the maintenance of the honour and independence of the Judiciary of Sri Lanka, consider matters of national importance relating to the Rule of Law and Administration of Justice and if need be to make representations thereon to the Government and/or any other relevant authority and taking any further steps in respect thereof including filing of actions or intervening in actions in Courts of Justice.

1.10 The Committee in preparing its observations on the Bill was mindful of the obligations of BASL in terms of its Constitution and in particular to act in support of maintaining the independence of judiciary of Sri Lanka and to support the rule of law and the administration of justice. The Committee proceeded on the basis that it is fundamental to the Rule of Law that the legislature, the executive and the judiciary are coequal branches of Government and that no one branch of Government is superior to the other. The Committee was of the view that the provisions of the Bill that strengthen the Rule of Law and the Administration of Justice should be supported by the BASL and conversely any provisions that weaken the Rule of Law or the Administration of Justice should be opposed by the BASL.

1.11 In respect of few provisions of the Bill there were dissenting views expressed by some members of the committee. Such dissenting views are incorporated in Annexure 1.

## 2. Clause 2 of the Bill

The amendment sought to be introduced by clause 2 clarifies that the ability of a President to call for an election before the expiry of his first term of office is related to the second term. It is an amendment that can be supported.

3. **Clause 3 of the Bill – Duties of the President**

3.1 Clause 3 of the Bill repeals Article 33 of the Constitution. Article 33(1) sought to be repealed by clause 2 imposed inter alia a duty on the President to ensure the Constitution is respected and upheld. It is the view of the Committee that the Rule of Law necessarily requires the President, conferred with wide ranging powers under the Constitution should have the duty to uphold the Constitution. The Committee is of the view that repealing such a provision is detrimental to the Rule of Law. Article 33(1) also imposed three other duties which are equally necessary for a country governed by the Rule of Law.

3.2 Clause 3 of the Bill introduced a new Article 33 which retained the provisions of Article 33(2) of the Constitution without the reference to the duties imposed on the President. The Committee is of the view that deleting the word 'duties' is not conducive to the Rule of Law.

3.3 The Committee is of the view that clause 3 of the Bill should be deleted.

4. **Clause 4 of the Bill – The President's Responsibility to Parliament**

4.1 Clause 4 of the Bill proposes to repeal Article 33A of the Constitution which made the President responsible to the Parliament. We observe that however Article 42 proposed in the Bill under Clause 4 makes the President responsible to Parliament for the due exercise, performance and discharge of his powers, duties and functions.

4.2 In the circumstances The Committee is of the view that there is nothing obnoxious in the amendment proposed by Clause 4 subject to our comments relating to Clause 5 of the Bill below.

5. **Clause 5 of the Bill – Immunity of the President**

5.1 Clause 5 of the Bill deletes Article 35 of the Constitution and introduces in its place a new Article 35. The Committee is of the view that no person should be above the law. The President in particular being the repository of substantial powers under the Constitution should be held accountable for the exercise of those powers in accordance with the Constitution. No person is above the law and to grant absolute immunity from suit is contrary to all known principles of the Rule of Law. If the public do not have access to remedy a grievance against the unlawful exercise of powers by all powerful President the only remedy will be to take arms against the State.

5.2 Moreover, Article 4(d) of the Constitution specifically provides that the sovereignty of the people shall be enjoyed by the people inter alia by the fundamental rights which are by the Constitution declared and recognized shall be respected, secured and advanced by all organs of the Government. Needless to say the President is not exempted from the obligations to respect, secure and advance fundamental rights. Depriving the citizens of a remedy when the President violates fundamental rights is inimical to the Rule of Law. Nevertheless, we are mindful that certain powers of the President should not be justiciable and a suitable exception should be carved out.

5.3 The Committee is of the view that clause 5 of the Bill should be substituted with the following.

> *"Article 35 of the Constitution is hereby amended by deleting the second proviso to Article 35(1) and substituting the following in place thereof.*
>
> > *'Provided further that the Supreme Court shall have no jurisdiction to pronounce upon the exercise the power of the President under Articles 33(2)(a), 33(2)(b), 33(2)(d), 33(2)(e) and 33(2)(g).' "*

**6. Clause 6 of the Bill – Parliamentary Council**

6.1 Clause 6 repeals Chapter VII A of the Constitution relating to the Constitutional Council and introduces a new Chapter VII A consisting of Article 41A, providing for a Parliamentary Council.

**(A) Composition of the Parliamentary Council**

6.2 The Committee is of the view that the composition of the Parliamentary Council proposed by clause 6 of the Bill is more conducive to the Rule of Law than the composition of the Constitutional Council contained in Article 41A of the Constitution. The inclusion in the Constitutional Council of persons who are not elected by the people is contrary to the sovereignty of the people and not conducive to the Rule of Law. The committee noted that non-elected members of the present Constitutional Council is not answerable to an organ of the State[1].

**(B) Appointments to the Public Service Commission, the National Police Commission, the Human Rights Commission, the Commission to Investigate Allegations of Bribery or Corruption and the appointment of the Parliamentary Commissioner for Administration (Ombudsman).**

6.3 The Committee is of the view that the Public Service Commission, the National Police Commission, the Human Rights Commission, the Commission to Investigate Allegations of Bribery or Corruption and the appointment of the Parliamentary Commissioner for Administration (Ombudsman) are part of the executive and the method of appointment proposed by clause 6 of the Bill cannot be objected to.

**(C) Appointments to the Superior Courts and the Judicial Service Commission**

6.4 The separation of powers on which the Constitution is based and the coequal arms of Government necessarily requires that no one arm of Government should have control over the composition of another arm of Government. Article 4 of the Constitution provides that the judicial power of the people shall be exercised by Parliament through Courts, Tribunals and Institutions created and established or recognized by the Constitution, or created and established by law. In these circumstances, it is imperative that the executive should not have control over the appointment of Judges or the Judicial Service Commission. Indeed, if there is one arm of Government that should have control it is Parliament and not the President.

6.5 The Committee is of the view that as regards the appointment of Judges of the Supreme Court and the Court of Appeal the President should not have absolute control over the appointments. The Committee is of the view that the appointment should be made by the President nominating an individual to the Parliamentary Council and the appointment being made by the President subject to the approval of the Parliamentary Council. This ensures that the legislature and the executive provides the necessary checks and balances relating to the appointment to the judiciary and the Judicial Service Commission.

**(D) Appointments to the Elections Commission**

6.6 Needless to say the sovereignty of the people which is inalienable includes the power of franchise. The franchise is exercisable by the people at the election of the President and of the Members of Parliament and at a referendum.

6.7 The Elections Commission is fundamental in ensuring that the inalienable sovereignty of the people is not affected in any way. The Elections Commission is responsible for the conduct of the election of the President. It is inimical to the Rule of Law that the

President should have control over the appointment of members of the Elections Commission which conducts its own election.

6.8 The Committee is of the view that the appointment to the Elections Commission should be made by the President nominating the names of individuals to the Parliamentary Council and the appointment being made by the President subject to the approval of the Parliamentary Council. This ensures that the legislature and the executive provides the necessary checks and balances relating to the appointment to the Elections Commission.

**(E) The Appointment of Members of The Finance Commission and the appointment of the Auditor General**

6.9 The control of public finance by Parliament is fundamental to representative democracy. This is also enshrined in Article 148. The Finance Commission and the Auditor-General are necessary and essential to ensure Parliamentary control of finance. The Government inter alia allocates funds on the recommendation of the Finance Commission. The Auditor-General ensures that the funds are utilised according to law. To grant the President control over these appointments would diminish Parliamentary control over finance. It is inimical to the Rule of Law that the President should have control over the appointment of members of the Finance Commission and the Auditor-General.

6.10 The Committee is of the view that the appointment to the Finance Commission and the appointment of the Auditor General should be made by the President nominating the names of individuals to the Parliamentary Council and the appointment being made by the President subject to the approval of the Parliamentary Council. This ensures that the legislature and the executive provides the necessary checks and balances relating to these appointments.

**(F) The Appointment of the Secretary-General of Parliament**

6.11 The Secretary-General of Parliament is the head of the Parliamentary staff. He performs critical functions in support of the legislature. The control of appointment of the Secretary-General by the President is inimical to the Rule of Law. The Committee is of the view that the appointment of the Secretary- General of Parliament should be made by the President nominating the name of individual to the Parliamentary Council and the appointment being made by the President subject to the approval of the Parliamentary Council. This ensures that the legislature and the executive provides the

necessary checks and balances relating to this appointment an important appointment in Parliament through which the legislature operates.

### (G) The Appointment of the Attorney-General

6.12 The Attorney General is conferred wide ranging powers under the Constitution. It is necessary for the Rule of Law that one organ of Government should not have control over the office of the Attorney-General through the appointment of the Attorney General. It is our view that the appointment of the Attorney-General should be made by the President nominating the name of individual to the Parliamentary Council and the appointment being made by the President subject to the approval of the Parliamentary Council. This ensures that the legislature and the executive provides the necessary checks and balances relating to the appointment of the Attorney General.

### (H) Proposed Article 41A(10) in Clause 6 of the Bill – Removal of members of commissions and persons holding high office

6.13 The Committee is of the view that proposed Article 41A(10) in Clause 6 of the Bill should be amended to read as follows.

> "No person appointed to be the Chairman or member of a Commission referred to in Schedule I of this Article or any of the persons appointed to the offices referred to in Part I and Part II of Schedule II of this Article shall be removed, otherwise than in the manner provided for in the Constitution or in any law enacted for such purpose. Where no such provision is made, such person may be removed by the President for *cause stated*."

## 7. Clause 7 of the Bill – The Excecutive

7.1 Clause 7 of the Bill repeals the entirety of Chapter VIII of the Constitution consisting of Articles 42 to 53 of the Constitution and substitutes new proposed Articles 42 to 53.

7.2 <u>Proposed Articles 44(1), 45(1) and 46(1)</u>

Proposed Articles 44(1), 45(1) and 46(1) make a fundamental change relating to the appointment of Members of the Cabinet. While Articles 43(2), 44(1) and 45(1) required the President to appoint Members of the Cabinet, Ministers not in the Cabinet and Deputy Ministers on the advice of the Prime Minister proposed Articles 44(1),

45(1) and 46(1) remove the requirement to act on advice and introduce a requirement of consultation with the Prime Minister where considers such consultation to be necessary. It also enables the President to assign to himself any subject or function and remain in charge of subject or function not assigned to a Minister.

7.3 The executive power of the people is exercised by the President elected by the people. Each organ of Government exercises coequal power. The President as the repository of executive power should be able to exercise executive power as a Minister of the Cabinet and similarly should not be required to act on the advice of the Prime Minister who enjoys that position as a Member of the legislature in selecting which of the members of Parliament should form part of the Executive and members of the Cabinet, non-Cabinet Ministers and Deputy Ministers.

7.4 The Committee is of the view that the amendment introduced by proposed Articles 41(1), 42(2) and 43(2) is not a matter that can be objected to, by the BASL, in view of the imbalance of power of the President and the Prime Minister under the existing provisions. We also note that as the President is elected by the people at presidential election, there is justification for the President being conferred with executive powers.

**8. Clause 8 of the Bill**

8.1. Amendment proposed to the Article 54(2) of the Constitution.

The Committee is of the view that the removal of a member of the Public Service Commission by the President should be for cause and accordingly the amendment proposed to Article 54(2) should be amended to read as follows.

> "by the substitution, in paragraph (4) of that Article, for the words 'by the President with the approval of the Parliamentary Council or is convicted', of the words 'by the President for cause stated or is convicted' ",

**9. Clause 11 of the Bill – Decisions of the Public Service Commission**

9.1 According to the existing provisions, a public servant aggrieved by a decision of the Public Service Commission may appeal to the Administrative Appeals Tribunal created under Article 59 of the Constitution or by way of a Fundamental Rights Application under Article 126 of the Constitution.

9.2 The Bill does not repeal Article 59 of the Constitution which creates the Administrative Appeals Tribunal. However the proposed amendment in Clause 11, by amending Article 61A of the Constitution, confers finality to decisions of the Public Service Commission subject only to the Jurisdiction of the Supreme Court under Article 126 of the Constitution.

9.3. Thus the proposed amendment creates an anomalous situation as the Administrative Appeals Tribunal is in existence without Jurisdiction/ power to hear appeals against the decisions of the Public Service Commission. Thus Administrative Appeals Tribunal will be there without any function being assigned to. We are also of the view that if the only forum allowed for the public servants to challenge the decisions of the Public Service Commission is the Supreme Court, then the Supreme Court would be inundated with Fundamental Rights Applications filed by public servants regarding disciplinary matters, transfers and promotions adding to the laws delays in the Supreme Court.

9.4 Therefore The Committee is of the view that the existing Article 61A should not be amended and the proposed amendment to Article 61A cannot be supported.

**10. Clause 12 of the Bill**

For the reasons set out in 7 above, The Committee is of the view that proposed Article 61E should be amended to read as follows.

"The President shall appoint -

(a) the Heads of the Army, the Navy and the Air Force; and

(b) *subject to the approval of the Parliamentary Council* the Attorney-General."

**11. <u>Clause 13 of the Bill</u>**

For the reasons set out in 7 above, The Committee is of the view that proposed Articles 65(1) and 65(6) should be amended to read as follows.

> "1. There shall be Secretary-General of Parliament who shall be appointed by the President subject to the approval of the Constitutional Council and who shall hold the office during good behaviour."

> "6. Whenever the Secretary-General is unable to discharge the function of his office, the Speaker may appoint a person to act in place of the Secretary-General."

**12. <u>Clause 14 of the Bill – Dissolution of Parliament</u>**

12.1 The legislative power of the people is exercised by Parliament. The Parliament is elected for a period of 5 years by the people. The legislature, the executive and the judiciary are co-equal organs of Government. The President as the Head of the executive being granted the unfettered power to dissolve Parliament at his whim albeit after one year but before the term of office of Parliament has expired is contrary to the Rule of Law and the separation of powers. It is contrary to the sovereignty of the people.

12.2 We propose that the President's power to dissolve Parliament during the period specified in Article 62(2) should be limited to the following circumstances.

(a) Parliament by resolution requests the President to dissolve Parliament.

(b) The rejection by Parliament of the Appropriation Bill on two consecutive occasions.

(c) The rejection of the statement of Government policy on two consecutive occasions.

(d) Parliament passes a motion of no confidence in the Government.

12.3 We propose that the President shall be required to dissolve Parliament in the case of (b) above.[2]

**13. Clause 15 of the Bill – Judicial Review of Bills**

13.1 Amendment proposed to Article 78(1)

Our Constitution does not contain judicial review of legislation. It is imperative for the Rule of Law that the judiciary should be given sufficient time and assistance to determine whether a Bill is inconsistent with the Constitution and the required majority for its enactment including the need for a referendum. The proposed Article 78(1) reduces the period available for such scrutiny from 14 days to 7 days. We believe that the amendment is not conducive to the Rule of Law.

13.2 The new proposed Article 78(3)

The proposed Article 78(3) is salutary and should be supported.

13.3 We also propose that Article 80(3) be amended by the addition of the following words to the end of that sub-article.

> "save and except on the ground that it is contrary to Article 78(3) and such amendment if included in the Bill would have required such Bill to be passed by two-thirds of the whole number of Members (including those not present) or such majority and approved by the People at a Referendum."

14. **Clause 17 of the Bill**

14.1 **Amendment proposed by Clause17 (1)**

We believe that independence required for the Rule of Law must ensure that all members of the Commission set out in the schedules to Article 41A should not be qualified to be elected as a Member of Parliament.

14.2 **<u>Amendment proposed by Clause17(4) – Taking away of the Dual-Citizenship Disqualification</u>**

Article 91(d)(1)(xiii) of the Constitution debars a citizen who is also citizen of any other country from being qualified to be elected as a Member of Parliament . The Committee is of the view that the sovereignty of the people would be gravely affected by the legislature including persons whose loyalty is not solely to Sri Lanka being elected as Members of Parliament. Indeed, a person who has acquired citizenship of another country almost always has sworn an oath of allegiance to that other country. The repeal of Article 91(d)(1)(xiii) of the Constitution would grant the right to the thousands if not hundreds of thousands of diaspora members of every community who have obtained citizenship in other countries in addition to the citizenship of Sri Lanka to contest an election to enter Parliament and influence the policies of the Government while being a citizen of a foreign country who has sworn allegiance to that country. So for example in Australia they would have sworn and oath in the following manner.

> "From this time forward,
> <u>I pledge my loyalty to Australia and its people</u>,
> whose democratic beliefs I share,
> whose rights and liberties I respect,
> and whose laws I will uphold and obey." (emphasis added)

14.3 Those diaspora members who are citizens of Norway would have taken the following oath.

> "As a citizen of Norway I pledge loyalty to my country Norway and the Norwegian society, and I support democracy and human rights and will respect the laws of the country." (emphasis added)

14.4 Those diaspora members who are citizens of the United Kingdom would have taken the following oath.

> "I will give my loyalty to the United Kingdom and respect its rights and freedoms. I will uphold its democratic values. I will observe its laws faithfully and fulfil my duties and obligations as a British citizen." (emphasis added)

14.5 Those diaspora members who are citizens of Switzerland would have taken the following oath.

"I swear or I solemnly promise: to be loyal to the Republic and the canton of Geneva as to the Swiss Confederation; to scrupulously observe the constitution and the laws; to respect the traditions, to justify my adhesion to the community of Geneva by my actions and behaviour; and to contribute with all my power to keeping it free and prosperous."

14.6 Those diaspora members who are citizens of the United States of America would have taken the following oath.

"I hereby declare, on oath, that I absolutely and entirely renounce and abjure all allegiance and fidelity to any foreign prince, potentate, state, or sovereignty of whom or which I have heretofore been a subject or citizen; that I will support and defend the Constitution and laws of the United States of America against all enemies, foreign and domestic; that I will bear true faith and allegiance to the same; that I will bear arms on behalf of the United States when required by the law; that I will perform non-combatant service in the Armed Forces of the United States when required by the law; that I will perform work of national importance under civilian direction when required by the law; and that I take this obligation freely without any mental reservation or purpose of evasion; so help me God."

14.7 To permit a person who is also a citizen of another country to be elected to Parliament is not only a surrender of sovereignty but is contrary to national interest and indeed a threat to security of the nation.

14.8 We are firmly of the view that Article 91(1)(d)(xiii) should not be repealed.

15. **Clause 19 of the Bill**

15.1 For the reasons set out in 7 above, The Committee is of the view that the proposed Article 103(1) should be amended as follows.

"There shall be an Election Commission (in this Chapter referred to as the "Commission") consisting of three members appointed by the President subject to the approval of the Parliamentary Council from amongst persons who have distinguished themselves in any profession or in the fields of administration or education. The President on the recommendation of the Parliamentary Council shall appoint one member as its Chairman."

15.2 For the reasons set out in 7 above, The Committee is of the view that the proposed Article 103(7) should not be amended.

16. **Clause 20 of the Bill**

16.1 In order to ensure that there is no ambiguity as to the scope of Article 104B The Committee is of the view that proposed Article 104B(4a) should be amended by the inclusion of the following words at the end of that Article.

"unless such guideline is required for the purposes set out in Article 104B(a).

16.2 The Committee is of the view that the media should be regulated by the normal law and should not be controlled during an election. An exception can be legitimately carved out for State media which is funded by the State and should act fairly at all times. For this reason, The Committee is of the view that Article 104B(5)(b) should not be repealed.

17. **Clause 22 of the Bill**

The Committee is of the view that Article 104GG is necessary for the sovereignty of the people and to ensure a free and fair election. The Committee is of the view that Article 104GG should be retained.

18. **Clause 23 of the Bill**

The Committee is of the view that for the reasons set out in 7 above, proposed Article 107(1) in clause 23 of the Bill should be amended to read as follows.

> "The Chief Justice, the President of the Court of Appeal and every other Judge of the Supreme Court and the Court of Appeal shall be appointed by the President by Warrant under his hand subject to approval of the Parliamentary Council."

19. **Clause 24 of the Bill**

While acting appointments as Chief Justice and President of the Court of Appeal under proposed Article 109(1) would be limited to sitting Judges of the Supreme Court and Court of Appeal respectively the proposed Article 109(2) empowers the appointment of an Acting Judge to the Supreme Court or the Court of Appeal. The Committee is of the view that for the reasons set out in 7 above, proposed Article 109(2) in clause 24 of the Bill should be amended to read as follows.

> "If any Judge of the Supreme Court or of the Court of Appeal is temporarily unable to exercise, perform and discharge the powers, duties and functions of his office, by reason of illness, absence from Sri Lanka or any other cause, the President may, subject to the approval of the Parliamentary Council, appoint another Judge to act as a Judge of the Supreme Court or Court of Appeal, during such period."

20. **Clause 25 of the Bill**

For the reasons set out in Clause 7 above and to ensure the independence of the judiciary The Committee is of the view that proposed Article 111D(1) be amended to read as follows.

> "There shall be a Judicial Service Commission (in this Chapter referred to as the 'Commission') consisting of the Chief Justice and the two most senior Judges of the Supreme Court appointed by the President. Provided that where the Chief Justice and the two most senior Judges of the Supreme Court are Judges who have not had any judicial experience serving as a Judge of a Court of First Instance, the Commission shall consist of the Chief Justice, the senior most Judge of the Supreme Court and the next most senior Judge of such Court, who has had experience as a Judge of a Court of First Instance."

21. **Clause 26 of the Bill**

For the reasons set out in Clause 7 above and to ensure the independence of the judiciary The Committee is of the view that proposed Article 111E(6) be amended to read as follows.

> "The President may for cause stated and subject to approval of the Parliamentary Council remove from office any member of the Commission."

22. **Clause 27 of the Bill – Urgent Bills**

The Committee is of the view that the proposed Article 122 is inimical to the Rule of Law administration of justice and the sovereignty of the people. Particularly in circumstances where judicial review of legislation is not available it would lead the way to tyranny.[3]

23. **Clause 31 of the Bill**

23.1 The control of public finance by Parliament is fundamental to representative democracy. This is also enshrined in Article 148. The Auditor-General is necessary and essential to ensure Parliamentary control of finance. The Auditor-General ensures that the funds are utilised according to law. To grant the President control over his appointment would diminish Parliamentary control over finance. It is inimical to the Rule of Law that the President should have control over the appointment of the Auditor-General. The Committee is of the view that the appointment of the Auditor General should be made by the President nominating a name of an individual to the Parliamentary Council and appointment being made by the President subject to the approval of the Parliamentary Council. This ensures that the legislature and the executive provides the necessary checks and balances relating to these appointments. It also ensures that the executive that spends the money allocated by Parliament is not in sole control of the auditing of such activity.

23.2 For these reasons The Committee is of the view that proposed Article 153(1) and proposed Article 153(4) be amended as follows.

> "(1) There shall be an Auditor-General who shall be a qualified Auditor, and subject to the approval of the Parliamentary Council, be appointed by the President and shall hold office during good behaviour."

> "(4) Whenever the Auditor-General is unable to discharge functions of his office, the President may, subject to the approval of the Constitutional Council, appoint a person to act in the place of the Auditor-General."

24. **Clause 32 to Clause 39 of the Bill**

For the reasons set out in 23 above, The Committee is of the view that the abolition of the Audit Service Commission is contrary to national interest the Rule of Law and the sovereignty of the people. The Committee is of the view that Article 153A to 153H of the Constitution should not be repealed.

25. **Clause 40 of the Bill**

25.1 Proposed Articles 154(1), (2), (3)

For the reasons set out in 23 above, The Committee is of the view that proposed Articles 154(1) should be amended to read as follows.[4]

> "The Auditor-General shall audit all departments of the Government, the Office of the Secretary to the President, the Office of the Secretary to the Prime Minister, the Offices of the Cabinet of Ministers, the Judicial Services Commission, the Public Service Commission, the Provincial Public Service Commissions, the Parliamentary Council, the Commissions referred to in the Schedule to Article 41B, the Parliamentary Commissioner for Administration, the Secretary-General of Parliament, local authorities, public corporations, business and other undertakings vested in the Government under any written law and any company registered or deemed to be registered under the Companies Act, No. 7 of 2007 in which the Government or a public corporation or local authority holds fifty per centum or more of the shares of that company including the accounts thereof if such company which is not listed on any Stock Exchange recognized by the Securities and Exchange Commission of Sri Lanka."

25.2 In view of the amendment to proposed Article 154(1) The Committee is of the view that no amendment should be made to Article 154(2) and (3).

25.3 Repeal of Article 154(9)

Article 154(9) required the Auditor General to be a member of the Institute of Chartered Accountants of Sri Lanka, or of any other Institute established by law, possesses a certificate to practise as an Accountant issued by the Council of such Institute. Needless to say, removing this requirement is contrary to the Rule of Law and the sovereignty of the people.

25.4 The Committee is of the view that Article 154(9) should not be repealed.

26. **Clause 41 of the Bill**

For the reasons set out in 7 above, The Committee is of the view that proposed Article 154R(1)(c) should be amended as follows.

> "three other members appointed by the President subject to the approval of the Parliamentary Council, to represent the three major communities, each of whom shall be a person who has distinguished himself or held high office, in the field of finance, law, administration, business or learning."

27. **Clause 42 of the Bill**

The Committee is of the view that proposed Article 155A(4) set out in Clause 42(2) be amended by the inclusion of the words "for cause stated" between the words "by the President" and ", or is convicted".

28. **Clause 45 of the Bill**

The amendment proposed to Article 155F intends to decriminalise any interference or influencing of a police officer to whom the National Police Commission has delegated its powers. The Committee is of the view that the proposed amendment is inimical to the Rule of Law.

29. **Clause 54 of the Bill**

Clause 54 of the Bill repeals the provision relating to the constitutional status of the Commission to Investigate Allegations of Bribery or Corruption. The Committee is of the view that the repeal of these provisions is inimical to the Rule of Law.

## Annexure 1 – Dissenting Views

1. **Clause 6 of the Bill - Parliamentary Council – Composition**

   Mr. L.M.K.Arulanandam, PC is of the view that the provisions in Clause 6 of the Bill, in particular proposed Article 41A (i) of the Bill is prejudicial to the interests of the minority communities and it can deprive the minority communities a fair representation in Parliamentary Council.

2. **Clause 14 of the Bill – Dissolution of the Parliament**

   Mr. Nihal Jayawardena PC, Mr. Uditha Egalahewa PC and Mr. Mohan Weerakoon PC are of the view that Clause 14 of the Bill is in accordance with the accepted constitutional norms and that the President should have the discretion to dissolve Parliament as provided for in proposed Article 70 (Clause 14 of the Bill).

3. **Clause 27 of the Bill – Urgent Bills**

   Mr. Nihal Jayawardena PC, Mr. Uditha Egalahewa PC and Mr. Mohan Weerakoon PC are of the view that Clause 27 of the Bill should be supported as there can be a necessity for an urgent Bill and there should be provision in the Constitution for urgent Bills and the safeguard of review by the Supreme Court upon the referral of an urgent Bill by the President is adequate.

4. **Clause 40 of the Bill - Auditor General's Power to audit State owned companies**

   Mr. Nihal Jayawardena PC, Mr. Uditha Egalahewa PC and Mr. Mohan Weerakoon PC are of the view that Clause 40 of the Bill should be supported as there is a separate regime under the Companies Act to audit companies incorporated under the Companies Act, and the fact that the Government owns shares in a company is not a justification to allow the Auditor General to audit such companies. They are of the view that, audit by the Auditor General is a hindrance to the business operations of such companies in which the Government hold shares.

**Annexure 2 – Attendance**

Members of the Committee Present at the Meeting on 14 September 2020

1. Mr. L.M.K.Arulanandam, PC
2. Mr. Nihal Jayawardene, PC
3. Mr. Maithri Wickremesinghe, PC
4. Mr. Uditha Egalahewa, PC
5. Mr. S.T. Jayanaga, PC
6. Mr. Priyal Wijayaweera, PC
7. Mr. Maurapada Gunawansha, PC
8. Mr. Shantha Jayawardena (Convenor)

---

Members of the Committee Present at the Meeting on 17 September 2020

1. Mr. L.M.K.Arulanandam, PC
2. Mr. Prasantha Lal De Alwis, PC
3. Mr. Nihal Jayawardene, PC
4. Mr. Maithri Wickremesinghe, PC
5. Mr. Mohan Weerakoon, PC
6. Mr. Priyal Wijayaweera, PC
7. Mr. Jagath Wickramanayake, PC
8. Mr. Shantha Jayawardena (Convenor).

---

21st September 2020

# XV.
# වෘත්තීය සමිති එකකුව විසින් ජනාධිපතිවරයා වෙත යොමුකල ලිපිය

2020.10.19

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා
අතිගරු ජනාධිපතිතුමා
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 01

**20 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒම .**

ශ්‍රී ලංකාවේ ජනතාව ඔබතුමාගෙන් අපේක්ෂා කරන ලද්දේ බුද්ධ ශාසනය, ජාතික උරුමය, සිංහල ජාතිය හෙළ සංස්කෘතිය හා දේශීය සම්පත් ඇතුළු සමස්ත රටත්, ජනාතාපරමාධිපත්‍යයත් ආරක්ෂා කර ගනිමින් රටත් ජනතාවත් සෞභාග්‍ය වෙත ගෙන යන ගමනට නායකත්වය ලබා දීමයි. එකී අපේක්ෂාව ඇතිව භික්ෂූන් වහන්සේලා පෙරටු කර ගත් ජාතික සංවිධාන විසින් දේශප්‍රේමී ජනතාව ඔබතුමා වටා එක් රැස් කරවිය. ඔබතුමාගේත් ඔබතුමාගේ නායකත්වය පිළිගන්නා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු ආණ්ඩුවේත් ජයග්‍රහණයට වගකිව යුතු සැබෑ බලවේගය වූයේ එකී ජාතික සංවිධාන විසින් ජනගත කර බලගන්වන ලද දේශප්‍රේමී ජාතික චින්තනයයි.

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එනු ලබන්නේ ශක්තිමත් ආණ්ඩුවක් බිහි කිරීමේ අරමුණින් බව කියවේ. ප්‍රජාතන්ත්‍රවාදී යාන්ත්‍රණයක් තුල ක්‍රියාත්මක වන ශක්තිමත් රාජ්‍යයක් ස්ථාපිත කිරීමේ ව්‍යවස්ථාවක් ජනතාවගේ සැබෑ බලාපොරොත්තුවයි. එහෙත් 20න් බිහි කරනුයේ අත්තනෝමතික ලෙස විධායකය මෙහෙයවිය හැකි වූත්, ව්‍යවස්ථාධායකය හා අධිකරණය තම අණසකට යටත් කරන්නට තරම් බලයක් සහිත ජනාධිපතිවරයෙකු හා දුබල අමාත්‍ය මණ්ඩලයකි. ජනතාවගේ ආදරය දිනාගත් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ බලය හා ස්ථාවරත්වය හීන කරවන 20 මගින් අමාත්‍යවරුන්ව හා අමාත්‍ය බලතල තම අභිමතය අනුව ඕනෑම වෙලාවක වෙනස් කිරීමට ජනාධිපතිට බලය ලැබේ. 30කට සීමා කර තිබූ අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව සම්බන්ධ සීමාව බවත් කිරීමේ යටි අරමුණුද තිබිය හැකිය. ජනාධිපති වරයා වෙත ව්‍යවස්ථාවෙන් පවරා දී ඇති වගකීම් රාශියක් ඉවත් කර ඇති අතර ජනාධිපති ධුරය දරන්නා විසින් කරනු ලබන ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවන් අධිකරණය හමුවේ අභියෝග කිරීමේ අයිතියද ජනතාවට අහිමි කර තිබේ. සමස්තයක් ලෙස 20න් නීතියේ පාලනයක් නොමැති අස්ථාවර රාජ්‍ය යාන්ත්‍රණයක් බිහි වීමට බොහෝ ඉඩකඩ පවතී.

20 සකසා තිබෙන්නේ ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය පසුපස සිටි ජාතික බලවේග හා ජනතා අපේක්ෂාවන් සම්පූර්ණයෙන්ම නොසලකා හරිමිනි. ව්‍යවස්ථා කෙටුම්පතක් සකස් කිරීම සම්බන්ධ අවම දැනුමක්වත් නොමැත්තෙකුගේ කතෘත්වයක් පෙන්වන මෙම කෙටුම්පත දැනටමත් ජනතාවගේ අප්‍රසාදයට ලක්ව තිබේ. එය දේශපාලන මෙන්ම සමාජමය අර්බුධක ඇරඹුමකි. ඔබතුමාත්, ආණ්ඩුවත් කෙරෙහි ජනතාව තබා ඇති විශ්වාසය පළුදු කිරීමේ කුඨ

අරමුණින් යුතුව රටත් ජාතියත් පාවා දීමට ක්‍රියාකරන කුමන්ත්‍රණ කරුවන්ගේ අදිසි හස්තයක් මෙම ක්‍රියාදාමය පිටුපස තිබේ දැයි සැක මතුවේ.

එබැවින් ජනතාවගේ අපේක්ෂාවන් යටපත් වන අයුරින් එම කෙටුම්පතේ ඇතුලත් කර තිබෙන පහත සංශෝධනයන් කොරතී අපි ඔබතුමාගේ අවධානය යොමු කර සිටිමු. එනම්,

1. හදිසි පනත් ගෙන ඒම සඳහා ප්‍රතිපාදන හඳුන්වා දීම

රටට ජාතියට විනා කරන පනත් කෙටුම්පත් රාශියක් යහපාලන ආණ්ඩු සමයේදී ගෙන එනු ලැබූ විට ඒවා පරාජය කරන්නට හැකි වූයේ භික්ෂූන් වහන්සේ ඇතුළු දේශප්‍රේමී පුරවැසියන් විසින් ඒවා ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝග කළ හෙයිනි. එව ජනතාවට ඇති අයිතියකි. හදිසි පනත් ගෙන එනු ලබන ක්‍රියාවලියේදී එම අයිතිය ජනතාවට අහිමි වෙයි. ඒ අනුව අනාගතයේදී MCC වැනි රටපාවා දෙන නීති මෙන්ම මෙරට පෞද්ගලික අංශයේ කම්කරුවන්ට බලපාන ඒකීය කම්කරු නීතිය ද හදිසි පනත් ලෙස පැනවිය හැකිය. එය ප්‍රජාතන්ත්‍ර විරෝධීය. එවැන්නක් සඳහා ඉඩකඩ විවර වීම මෙම ආණ්ඩුවෙන් හෝ ඔබතුමාගෙන් කිසිසේත්ම අපේක්ෂා නොකෙරිනි.

2. අමාත්‍ය මණ්ඩලය, නියෝජ්‍ය අමාත්‍යවරුන් හා කැබිනට් නොවන ඇමතිවරුන් හා ඔවුන්ගේ ලේකම්වරුන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 7වන උපලේඛණයේ සඳහන් දේශය තුල වෙනම රාජ්‍යයක් ඇති නොකරන බවට පොරොන්දු වෙමින් ලබා දිය යුතු ප්‍රතිඥාව ව්‍යවස්ථාවේ 53 වගන්තියෙන් ඉවත් කිරීම

ජාතික ආරක්ෂාවටත්, ඒකීය රාජ්‍යයටත් සෘජු තර්ජනයක් වන මෙම සංශෝධනත් ඒ සමඟම පැන නැඟුනු ජනතා විරෝධය මැඩලීමට විෂයභාර අමාත්‍යවරයා විසින් ගන්නා ලද උත්සහයත් අපි දැඩිව හෙලා දකිමු. අවසානයේදී එය හුදෙක් අතපසු වීමක් යැයි පවසා සිටීමද තවත් භයානක කරුණකි. ඊට හේතුව වන්නේ මෙම ව්‍යවස්ථා කෙටුම්පත කොතරම් නොසැළකිළිමත් බවකින් යුතුව සකසා තිබෙන්නේදැයි එමඟින් තහවුරු වන හෙයිනි.

3. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස පත් වීම සඳහා පනවා ඇති ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ බාධකය ඉවත් කිරීම

ද්විත්ව පුරවැසියෝ සැම විටම රටවල් දෙකකට පක්ෂපාතී වෙති. යහපාලන ආණ්ඩුව පැවති කාලයේදී අප ලැබූ අත්දැකීම් වන්නේ ශ්‍රී ලංකාවේ භූමිය හා සම්පත් කොල්ලකෑමේ හා රාජ්‍ය ආරක්ෂාව දුර්වල කිරීමේ ප්‍රයත්න ගණනාවක් ජාත්‍යන්තර බලවතුන් විසින් ක්‍රියාත්මක කිරීමයි. එම උපක්‍රම අතර ඔවුන්ට හිතැති නීති සම්පාදනය කිරීමේ උත්සහයන්ද කැපී පෙනුනි. බලවත් විදේශ රටවලට පක්ෂපාතී වන හා විදේශ රටවල දරු පවුල් පුරවැසිභාවය ලබා රැඳී සිටින තැනැත්තන් අපගේ නීති සම්පාදකයන් කිරීමේ භයානකකම එයයි. ඔවුන් අප රටට හිතවත්ව හා පක්ෂපාතීත්වයෙන් යුතුව කටයුතු කරතැයි සහතික විය නොහැකිය. එබැවින් පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයක් පමණක් නොව රජයේ ඕනෑම උසස් තනතුරක් දැරීම ද්විත්ව පුරවැසියන්ට තහනම් කළ යුතුය. එසේ තිබියදී ද්විත්ව පුරවැසියන්ට මන්ත්‍රීධූර දැරීමට ඇති තහනම ඉවත් කිරීම රාජ්‍ය ආරක්ෂාවටද ජනතා පරමාධිපත්‍ය බලයටද තර්ජනයකි.

**4.** විගණකාධිපතිවරයාගේ විෂය පථයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය, අගමැති ලේකම් කාර්යාලය හා රජය විසින් සියයට **50**ක් කොටස් දරන සමාගම් ඉවත් කිරීම

ශ්‍රී ලංකා ටෙලිකොම්, ශ්‍රී ලංකන් ගුවන් සමාගම වැනි රජය විසින් කොටස් දරණ සමාගම් සියයකට අධික සංඛ්‍යාවක් පවතී. මේවායින් බොහෝමයක්ම රටේ සම්පත් පරිහරණය කිරීම පිළිබඳව සෘජු ලෙස බලපෑම් කළ හැකි ඒවාය. එම සමාගම් වල ආයෝජනය කර තිබෙන්නේ ජනතාවගේ මුදල්ය. මෙම ආයතන විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයෙන් ඉවත් කිරීමේ සෘජු ප්‍රතිඵලය වන්නේ දූෂණයට රුකුල් දීමකි. එනම් ජනතාවගේ මුදල් අවභාවිතයට පාර කැපීමකි. ජනාධිපතිගේ හා අගමැතිගේ ලේකම් කාර්යාලයත් විගණකාධිපතිවරයාගේ විෂය පථයෙන් ඉවත් කිරීමේ ප්‍රතිඵලයද අල්ලස් හෝ දූෂණ විමර්ෂණය කිරීම සඳහා වූ කොමිෂම, ජාතික ප්‍රසම්පාදන කොමිෂම, විගණන සේවා කොමිෂම ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීමේ ප්‍රතිඵලයද වන්නේ දූෂණයට රුකුල් දීමකි. ඔබතුමාගෙන් අප බලාපොරොත්තු වූයේ දූෂණයට ඇති ඉඩකඩ අවහිර කිරීම මිස ඒවාට තව තවත් ඉඩ ලබා දීම නොවේ.

**5.** ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් හා අධිකරණ සේවා කොමිෂන් සභාවේ සමාජිකයින්ව පත් කිරීමේ අභිමතානුකාරී බලයක් ජනාධිපති වෙත ලබා දීම.

මෙවැනි අසීමිත බලතල මඟින් අධිකරණයේ ස්වාධීනත්වය බලවත් අනතුරකට ලක්වේ. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සිදුවිය යුත්තේ ජනාධිපතිට ඇති මෙවැනි බලතල පාර්ලිමේන්තුවේ හෝ පාර්ලිමේන්තු සභාවේ අනුමැතියට යටත් කිරීමයි. එවැනි සැබෑ සංවරණ හා තුලන ක්‍රමවේදයන් රාජ්‍ය යාන්ත්‍රණය තුල ක්‍රියාත්මක විය යුතුය.

**6.** මැතිවරණ කොමිෂන් සභාව විසින් හා නීතිය මඟින් පනවන විධිවිධාන උල්ලංඝණය කරන තැනැත්තන්ට එරෙහිව අධිකරණමය ක්‍රියා මාර්ග ගැනීමට ඇති හැකියාව ඉවත් කිරීම.

මැතිවරණ කොමිෂන් සභාව විසින් හා නීතිය මඟින් පනවන විධිවිධාන වලට පටහැනිව ක්‍රියා කරන තැනැත්තන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට හැකි වගන්තිය ඉවත් කිරීමේ සෘජු ප්‍රතිඵලය වන්නේ මැතිවරණ නීති කඩකරන්නන් හට ඒ සඳහා අවස්ථාව ලබා දීමය. මෙය දූෂිත මැතිවරණ ක්‍රමයකට රුකුල් දෙන සංශෝධනයකි. මෙවැනි සංශෝධන අපි දැඩිව හෙලා දකිමු.

**7.** ඇමතිවරුන්ගේ ගණන **30**කට සීමා කිරීමේ වගන්ති ඉවත් කිරීම

අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව 30කටත් කැබිනට් නොවන අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව 40කටත් සීමා කිරීමේ වගන්තියක් පනවා තිබෙන්නේ වසර ගණනාවක් තිස්සේ ජනතාව විසින් ඒ සඳහා කරනු ලැබූ දැඩි බලකිරීම් වල ප්‍රතිඵලයක් ලෙස වේ. අසීමිත අමාත්‍යවරුන් සංඛ්‍යාවක් පත් කිරීමට තිබෙන අවකාශය ප්‍රයෝජනයට ගෙන සුළු අන්තවාදී පක්ෂ වලට බහුතර ජනතාවගේ ඡන්දයෙන් පත්කරන ආණ්ඩු සමඟ කේවල් කිරීම සඳහා අවස්ථාව ලැබේ. මෙහි අනිසි විපාකය වන්නේ බහුතර කැමැත්ත යටපත් කරමින් අන්තවාදී පක්ෂවලට ආණ්ඩුව මෙහෙයවීමේ අයිතිය ලැබීමයි. රිෂාඩ් බදුර්දීන් හිටපු අමාත්‍යතුමා වැනි අන්තවාදීන් මේ වන විට ආණ්ඩුවත් සමඟ සම්පව කටයුතු කිරීමට පටන්ගෙන තිබෙන්නේ අනාගතයේදී මෙවැනි සංශෝධන වල වාසිය ලබා ගැනීමේ යටි

අරමුණු ඇතිව දැයි සැක පහළ වී තිබේ. එසේම අසීමිත අමාත්‍යවරුන් සංඛ්‍යාවක් සිටීම හුදෙක් මුදල් නාස්තියක් පමණක් නොව විධායක යාන්ත්‍රණය අවුල් සහගත තත්වයකට පත් කරන සාධකයක් බව ජනතාව හොඳින්ම දනිති.

මෙම ආණ්ඩුව පත්වීමේදී ජනතාවට දුන් පොරොන්දුව වූයේ අලුත් ව්‍යවස්ථාවකි. ජනතාවගේ අපේක්ෂාව වූයේද එයයි. ව්‍යවස්ථාවට අවිධිමත් ලෙස සංශෝධන කිරීමේ ආදීනව ජනතාව විසින් අත්සැක තිබේ. කුමන ආකාරයේ ව්‍යවස්ථා සංශෝධනයකදී වුවද දැනට රට මුහුණ පා සිටින සැබෑ අර්බුධ වලට විසඳුම් ලබා දීමට පියවර ගත යුතුය. ඒවා අතර ජාත්‍යන්තර සම්මුතීන් හා ගිවිසුම් අනිවාර්යයයෙන්ම පාර්ලිමේන්තුවේ අනුමැතියට යටත්ව අත්සන් කිරීම සහතික කරන වගන්තිද, නිශ්චිත ලෙස ජාතික ප්‍රතිපත්ති හා සැළසුම් සකස් කර නීතිගත කිරීම අනිවාර්ය කරන දේශීය සම්පත් හා භූමිය විදේශිකයන්ට විකිණීම තහනම් කරන වගන්තිද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අභිනවයෙන් ඇතුලත් කල යුතු බව අවධාරණය කර සිටිමු.

මෙ වන විටත් රට තුල ආන්දෝනලයට ලක්ව තිබෙන 20 වැනි සංශෝධනය ඉදිරිපත් කර තිබෙන ආකාරයෙන් සම්මත කර ගැනීම සම්බන්ධයෙන් නැවත සිතා බැලිය යුතුව ඇත. එසේ තිබියදීත් එම සංශෝධනය සම්මත කරන්නට කටයුතු කරන්නේ නම් අවම වශයෙන් මෙහි සඳහන් කර තිබෙන සංශෝධන සිදු කරන නේ ඔබතුමන්ව බලයට පත් කිරීම සඳහා කටයුතු කල භික්ෂූන් හා රටවැසියන් වශයෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමු.

| අනු අංකය | නම | සංවිධානය | අත්සන |
|---|---|---|---|
| | ප්‍රනාන්දු [illegible] | [illegible] | [illegible] |
| | [illegible] | [illegible] | [illegible] |
| | [illegible] | [illegible] | [illegible] |
| | [illegible] | [illegible] | [illegible] |
| | [illegible] | CMU | [illegible] |
| | [illegible] | MSOU | [illegible] |
| | [illegible] | Health TU's | [illegible] |
| | [illegible] | SLPTSU | [illegible] |
| | [illegible] | NPTWU | [illegible] |
| | [illegible] | [illegible] | [illegible] |
| | J. G. S. [illegible] | [illegible] | [illegible] |

# XVI.
# නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මාර්ගගත පෙත්සම

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
FMM Sri Lanka Free Media Movement

2020. 10. 21

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ

ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඇතුලු

මන්ත්‍රීවරුන් සියලු දෙනා වෙත,

**මහජන පෙත්සම**

**20 වැනි ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත -**

**නීතිගත කිරීමට පෙර එහි වගන්ති බරපතල ලෙස සලකා බලා සමාලෝචනය කරන්න.**

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට මාධ්‍ය නිදහසට සහ භාෂණයේ නිදහසට බලවත් තර්ජනයක් එල්ලකරන, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය සඳහා වන පනත් කෙටුම්පත , ඔක්තෝබර් 21දා පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමටත් , දින දෙකක කෙටි විවාදයකින් පසුව ඔක්තෝබර් 22 දා ඡන්දය විමසීමටත් නියමිතව ඇත.

මාධ්‍ය නිදහස සහ යහ පාලනය සහතික කිරීම සඳහා ජනාධිපති සහ ආණ්ඩුව කෙරෙහි පනවා ඇති සංවරණ සහ තුලන ඇතුළුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති නිදහසට මෙම පනත මගින් ඇතිවිය හැකි තර්ජන පිළිබඳව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය දැඩි කනස්සල්ලට පත්වෙයි.

19 වැනි සංශෝධනය මගින් ඇතිකරන ලද ප්‍රජාතන්ත්‍රවාදී අංග සහ ව්‍යුහයන් ඉවත්කරන 20 වැනි සංශෝධන පනත් කෙටුම්පත මගින් ජනාධිපතිවරයා ඔහුගේ ධුරයෙන් ඉවත්වීමෙන් පසු ද බලපාන පරිදි නීතියේ සීමාවට හසු නොවන ලෙස ජනාධිපති මුක්තිය වැඩි කරයි. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ( වසරකට පසුව ), ඇමතිවරුන් පත් කිරීමට සහ අගමැති ඉවත් කිරීමට මෙන් ම සියලු කොමිසන් සභා , විනිශ්චයකාරවරුන් , නීතිපති සහ විගණකාධිපති පත් කිරීමටත් එයින් ඔහුට බලය ලබාදෙයි. ජනතාව නොතකා හරිමින් පැය 24 කින් පනත් සම්මත කළ හැකි වන පරිදි හදිසි පනත් ගෙනෙ ඒමේ නීතිය එමගින් නැවත හඳුන්වා දෙනු ලබයි.

20 වැනි සංශෝධන පනත යටතේ භාෂණයේ නිදහසට සහ මාධ්‍ය නිදහසට බරපතළ අභියෝගයක් විය හැකි ප්‍රධාන කාරණයක් වන්නේ , තව දුරටත් ස්වාධීන ආයතන නොවිය හැකි ස්වාධීන කොමිසන් සභාවල ඉරණමයි. ව්‍යවස්ථා සභාව විසින් සමාජිකයෙන් පත් කරනු ලැබූ ස්වාධීන කොමිසන් සභා මගින් ස්වාධීන රාජ්‍ය සේවයක්, පොලිස් සේවයක්, අධිකරණයක්, මහජන මුදල් අධීක්ෂණයක්, නිදහස් සහ සාධාරණ මැතිවරණ , තොරතුරු දැනගැනීමේ අයිතිය සහ දූෂණ විමර්ශනය සහතික කරනු ලැබීය. 20 වැනි සංශෝධනය මගින් ව්‍යවස්ථා සභාව අහෝසි කොට , සිවිල් සමාජයේ නියෝජනයක් නැති සහ තීරණ ගැනීමේ බලයක් නැති පාර්ලිමේන්තු සභාවකට එම බලය පැවරීමෙන් කොමිසන් සභා සාමාජිකයෙන් පත්කිරීමේ සහ ඉවත්කිරීමේ අභිමතානුසාරී බලයක් ජනාධිපතිට ලබාදෙන්නේ කොමිසන් සභාවල ස්වාධීනත්වය අවදානමට ලක් කරමිනි.

20 වැනි සංශෝධනය මගින් එහි රාමුවට බරපතල බලපෑම් සිදුවිය හැකි තොරතුරු දැනගැනීමේ අයිතියට විශේෂ අවධානය යොමුවිය යුතුය. ව්‍යවස්ථා සභාව විසින් කොමිසම පත්කළ යුතු බව තොරතුරු දැනගැනීමේ පනතේ සඳහන් වුව ද , යෝජිත සංශෝධනය මගින් එය වෙනස් කර ඇත්තේ නිර්දේශ ලබාදීමට බලයක් නැති සහ එමගින් බලය සහ බලක්ෂේත්‍රය සීමා කොට ඇති පාර්ලිමේන්තු සභාවකට වන බැවින් තොරතුරු දැනගැනීමේ අයිතියේ ක්‍රියාකාරීත්වය අවදානමට ලක්කරයි.

මෙම සන්දර්භය තුළ අනාගතයේ නිදහස් සහ සාධාරණ මැතිවරණ සඳහා මැතිවරණ කොමිසමේ ස්වාධිනත්වය , සහ විරුද්ධ මතවලට සහ මහජන මතයට ඉඩකඩ තිබේ ද යන්න මෙන්ම සමතුලිත සහ පක්ෂග්‍රාහී නොවන වාර්තාකරණයක් සහතික කෙරෙන මාධ්‍ය නිදහසක් සම්බන්ධයෙන් ද අවධානය යොමු විය යුතුය.

සීමාසහිත අධීක්ෂණ බලයකින් යුතු පාර්ලිමේන්තු සභාවක් යටතේ ස්වාධීන කොමිසන් සභාවලට දේශපාලන වශයෙන් පත්වීම් කරනු ලැබීමට වැඩි ඉඩක් පවතින අතර එමගින් ප්‍රජාතන්ත්‍රවාදය තුළ භාවිත කළ මාධ්‍ය සහ අනෙක් නිදහසට බඳා සිදුවිය හැකිය. පොලිස්පතිවරයා, අගවිනිසුරු ඇතුළු විනිශ්චයකාරවරුන් , රටේ ඉහළ තනතුරු සඳහා නිලධාරීන් පත්කිරීම ආදිය දේශපාලන කැළැල් සහිත වූ විට භාෂණයේ නිදහස සහ මාධ්‍ය නිදහස ඇතුළු මානව හිමිකම් උල්ලන්ඝණය වීම නොවැලක්විය හැකිය.

20 වැනි සංශෝධනයේ බොහෝ වගන්ති මහජනයාට තිබූ ප්‍රජාතන්ත්‍රවාදී අයිතින්ට සහ මාධ්‍ය විසින් භාවිත කරන ලද නිදහසට අනතුරුදායකය. මෙම සංශෝධන පනත නීතිගත කිරීමට පෙර එහි වගන්ති බරපතළ ලෙස නැවත සලකා බලමින් සමාලෝචනය කරන ලෙස අගමැති තුමාගෙන් සහ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉල්ලා සිටියි.

නම් ලැයිස්තුව පහත දැක්වේ

# XVII.
# මාධ්‍ය සංවිධාන එකමුතුවේ ඒකාබද්ධ නිවේදනය

## 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් මාධ්‍ය කර්මාන්තය නියෝජනය කරන සංවිධානවල අවධානය

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඇතැම් වගන්ති සම්බන්ධයෙන් මාධ්‍ය කර්මාන්තය නියෝජනය කරන සංවිධාන ලෙස අපි දැඩි කනස්සල්ල පළ කරමු. අපගේ මතය අනුව, මෙය ශ්‍රී ලංකාවේ කතා කිරීමේ, ප්‍රකාශනයේ සහ තොරතුරු වල නිදහසට අහිතකර ලෙස බලපානු ඇත.

14 ඒ ව්‍යවස්ථාවේ, තොරතුරු දැනගැනීමේ ව්‍යවස්ථාමය අයිතිය (RTI) අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිගනිමින්,ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ තන්ත්‍රයේ හරය තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත බව අවධාරණය කිරීම අවශ්‍ය වේ. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත මගින් ස්ථාපිත කළ ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවීම සහ එම අයිතිය ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක කළ හැකි ක්‍රියා පටිපාටි රාජ්‍ය අධිකාරීන් තුළ ක්‍රියාත්මක කිරීම මෙන්ම ජනමාධ්‍යවේදීන් සහ පුරවැසියන් 2017 සිට තොරතුරු දැන ගැනීමේ පනත උද්යෝගයෙන් භාවිතා කර ඇති අතර, ඒ ඔස්සේ ශ්‍රී ලංකාව හොඳම භාවිතයේ ගෝලීය ආදර්ශයක් බවට පත් කර තිබේ. ඒ නිසා රටේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා රජය සියලු පියවර ගනු ඇතැයි අපගේ විශ්වාසයයි.

කෙසේ වෙතත්, 104 බී (5) (ආ) වගන්තිය අවලංගු කර ආදේශ කිරීම සඳහා 20 (3) (ආ) වගන්තියේ 20 වන ව්‍යවස්ථා සංශෝධනයේ කෙටුම්පත සම්බන්ධයෙන් මාධ්‍ය ආයතන සහ සංවිධාන ලෙස අප කනස්සල්ලට පත්වී ඇත. ඒ,ඕනෑම රාජ්‍ය මාධ්‍ය ආයතනයක් මෙන්, පුද්ගලික පුවත්පතක හෝ විකාශන හෝ විකාශන ක්‍රියාකරුගේ 'හිමිකරු හෝ ප්‍රකාශකයා', මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතු යන්නයි. මෙම විධිවිධානය මීට පෙර අදාළ වූයේ රාජ්‍ය මාධ්‍ය ආයතනවලට පමණි.

මැතිවරණ සමයේ එවැනි මාර්ගෝපදේශයන්ට අනුකූල වීම සැමවිටම පෞද්ගලික මාධ්‍යයේ මෙන්ම රාජ්‍ය මාධ්‍යයේ ද යුතුකමක් විය යුතු අතර, රාජ්‍ය මාධ්‍යයට අනුකූලවම පෞද්ගලික මාධ්‍ය සඳහා ව්‍යවස්ථානුකූලව අනිවාර්ය යුතුකමක් පැනවීම පිළිගත් මූලධර්මය උල්ලංඝනය කරයි. රාජ්‍ය අරමුදලට බදු ගෙවන්නන්ගේ දායකත්වයෙන් මුදල් යෙදවීම ඉහළ රැකවරණයක් සඳහා පුද්ගලික මාධ්‍ය ආයතන බැඳී සිටී.ඕනෑම අවස්ථාවක, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිතර මතක් කර දෙන පරිදි, රාජ්‍ය මාධ්‍යයන්ට ඇති සීමිත සංඛ්‍යාතයන් නිසා විකාශකයන් සම්බන්ධයෙන් වන රාජකාරිය මුද්‍රිත මාධ්‍යයට සාපේක්ෂව වෙනස් ප්‍රමිතියකි.

කෙසේ වෙතත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මතක් කර දෙන පරිදි ලබා ගත හැකි සීමිත සංඛ්‍යාතයන් නිසා, රාජ්‍ය අරමුදලට සහ පෞද්ගලික විකාශකයින්ට බදු ගෙවන්නන්ගේ මුදල් දායක වීමෙන් අරමුදල් සපයනු ලබන රාජ්‍ය මාධ්‍ය මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද එම මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළයුතු බව අපගේ පිළිගැනීම වේ.

ජනමාධ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ සිව්වන ස්ථම්භය වන අතර රටේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය තුළ මුරපල්ලාගේ කාර්යභාරයක් ඉටු කරන බැවින්, විශේෂයෙන් මැතිවරණ කාලවලදී විවේචනාත්මක වාර්තාකරණය සහ විවරණය වඩාත් අවශ්‍ය වන බැවින්, 104 ආ (5) ආ ව්‍යවස්ථාවේ මුල් හඳුන්වාදීම වඩාත් සුදුසු බවඅපගේ අදහස වේ.

තවද, 20 වන ව්‍යවස්ථා සංශෝධනයේ 27 වන වගන්තිය මඟින් 122 (1) (ඇ) ව්‍යවස්ථාවට සංශෝධනයක් යෝජනා කරන, රටේ ජාතික අවශ්‍යතාවය වෙනුවෙන් ගෙන එන, පැය 24 ක් හෝ පැය 72 ක් තුළ සම්මත කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කළහොත්, මෙම කෙටි කාල සීමාව හේතුවෙන් පනත් කෙටුම්පතක් මහජනයාට ලබා දිය යුතු කාලය අඩු වනු ඇත. එහි ප්‍රතිපලයක් ලෙස පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමට පෙර පනත් කෙටුම්පතේ අන්තර්ගතය පුරවැසියන් නොදැන සිටිය හැකි තත්වයන්ට එය හේතු වනු ඇති ඇති බැවින් අපි බියට පත්වෙමු.

එපමණක් නොව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඉවත් කර සිවිල් සමාජ නියෝජනයක් නොමැති පාර්ලිමේන්තු කවුන්සිලයක් ආදේශ කිරීම සඳහා වන 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ යෝජනාව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසම ඇතුළු ස්වාධීන කොමිෂන් සභා පත් කිරීමේ සැබෑ ස්වභාවයට පටහැනි බව අපගේ අදහසයි.

ඉහත කරුණු වලට අමතරව, ජනාධිපතිවරයාගේ ලේකම්ගේ කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම් කාර්යාලය සහ රජය විසින් කොටස් වලින් 50% කට වඩා කොටස් හිමිකම් දරණ සමාගම් විගණනයෙන් ඉවත් කර තිබීම පිළිබඳවද අපි සැලකිලිමත් වෙමු.මෙය පාලන ක්‍රියාවලියේ විනිවිදභාවයට සහ වගවීමටබලපාන අතර ඒ පිළිබඳ වාර්තා කිරීමට මාධ්‍යයට ඇති හැකියාව වළක්වයි.

මෙවැනි මූලික වෙනස්කම් මගින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රගතිශීලී ආයතන කෙරෙහි සෘණාත්මක ලෙස බලපෑම් කිරීමේ හැකියාව ඇති බව අපි දනිමු. එබැවින් පුරවැසියන්ගේ ව්‍යවස්ථාමය සාරධර්ම හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යෝජිත 20 ව්‍යවස්ථා සංශෝධනයේ ඉහත වගන්ති නැවත සලකා බලන ලෙස අපි ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
ශ්‍රී ලංකා පුවත්පත් හිමිකරුවන්ගේ සංගමය
ශ්‍රී ලංකා කර්තෘ සංසදය
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය
මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය
ශ්‍රී ලංකා මුස්ලිම් මාධ්‍ය සංසදය
දෙමළ මාධ්‍ය සන්ධානය
දකුණු ආසියානු නිදහස් මාධ්‍ය සංගමය - ශ්‍රී ලංකා පාර්ශ්වය

# XVIII.
# සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරයේ මාධ්‍ය නිවේදනය

සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය
நியாயமான சமூகத்திற்கான தேசிய இயக்கம்
NATIONAL MOVEMENT FOR SOCIAL JUSTICE



349/1/1 , පුඩිසිටි ගොඩනැගිල්ල, පළමු මහල, කෝට්ටේ පාර, රාජගිරිය. 071 8124191 | 011 2865200
nmsjsrilanka@gmail.com sadharana samajayak

2020.10.21

<u>ජනමතයට නිගරු කරමින් ද්විත්ව පුරවැසියන්ට</u>
<u>රටේ පාලනය භාරදීමේ උත්සාහය පරාජය කරමු</u>

වෙනත් රටක පුරවැසිභාවය හිමි පුද්ගලයන්ටද ශ්‍රී ලංකාවේ පාලනයට එක්වීමට හැකිවන ආකාරයට රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට රජය දරණ උත්සාහය පිලිබඳව සාධාරණ සමාජයක් සඳහා වන ව්‍යාපාරය බලවත් විරෝධය පල කරන්නෙමු.

රටේ ඉදිරි ආරක්ෂාව හා යහපැවැත්ම පිළිබද අපේක්ෂාවන් ඇති කිසිවෙකුට හෝ එවැනි යෝජනාවකට කිසිසේත්ම එකඟවිය නොහැක. මෙය හැඳින්විය හැක්කේ තෝරාගත් එක් පුද්ගලයෙක් හෝ පුද්ගලයන් කිහිපදෙනෙකුගේ අවශ්‍යතාවයක් වෙනුවෙන් රටේ උත්තරීතර නීතිය වෙනස් කිරීමට ගන්නා ලැජ්ජා සහගත උත්සාහයක් ලෙසටය. එය මිලියන 21 පමණ වූ මේ රටේ ජනතාවගේ ආත්ම අභිමානයට සිදු කරන බලවත් නිග්‍රහයක් මෙන්ම බුද්ධියට කරුණු ලබන අපහාසයක්ද වන්නේය.

අප මේ බව අවධාරණය කරන්නේ ද්විත්ව පුරවැසිභාවය පිළිබද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඇතුළත් වගන්තිය කිසිදු ලෙසකින් හෝ වෙනස් නොවන බවට අධිකරණ අමාත්‍යවරයා ප්‍රසිද්ධියේම සිදුකර ඇති ප්‍රකාශය සැලකිල්ට ගනිමිනි.

20 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතට අනුවද ඒ පිළිබදව රජයේ ස්ථාවරය සේ සැලකිය හැකි අධිකරණ අමාත්‍යවරයාගේ ප්‍රකාශය අනුවද වෙනත් රටක පුරවැසියන්ට ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනයට එක්වීමට අවස්ථාවක් නිර්මාණය කිරීම වනාහි තම දේශය වෙනුවෙන් සිය ජීවිත පූජා කරන ලද දේශමාමක වීරෝදාර ලාංකීය විරුවන්ට කරන්නාවූ බරපතලම නිග්‍රහයකි. අතිගෞරවණීය වාරියපොල ශ්‍රී සුමංගල මාහිමිපාණන් වහන්සේ වැනි මේ රටේ දැහිතකාමී මාහාසංඝරත්නයට සිදුකරන්නාවූ බලවත් අවමානයකි.

මේ රටේ සුජාත සැබෑ පුරවැසියන්ට පමණක් හිමිවිය යුතුවූ විශේෂ වූ වරප්‍රසාදයක් විදේශීය රටක පුරවැසිභාවය හිමි පුද්ගලයන් වෙත ලබාදීමේ ඇති අමනෝඥ තීරණයේ ඇති බිහිසුණු බව තේරුම් ගැනීම සඳහා අප රටේ පුරවැසියෙක් වෙනත් රටක පුරවැසිභාවය ලබාගැනීම සඳහා දෙනු ලබන දිවුරුමේ ඇති බරපතලකම අවබෝධ කරගත යුතුය. උදාහණයක් ලෙස ගන්නේ නම් එවැන්නෙක් ඇමෙරිකා එක්සත් ජනපදයේ පුරවැසිභාවය ලබාගැනීමේදී දෙවියන් වහන්සේගේ නාමය පෙරදැරිව කරුණු ලබන දිවුරුම මෙසේය.


**"මා මින් පෙර වැසියෙකු හෝ පුරවැසියෙකු ලෙස ජීවත් වූ කිසිදු විදේශීය කුමාරයෙකුට, රාජ්‍යත්වයකට, රාජ්‍යයකට හෝ ස්වාධිපත්‍යයකට මා දැක්වූ සියලු පක්ෂපාතීත්වය සහ අනුරාගය පූර්ණ ලෙස අත්හැරීමට සහ ප්‍රතික්ෂේප කිරීමටත් ඇමෙරිකා එක්සත් ජනපදයේ සියලු දේශීය සහ විදේශීය සතුරන්ට එරෙහිව ඇමෙරිකාවේ ව්‍යවස්ථාව සහ නීතිය සුරැකීමටත් ඊට අනුකූලවීටත් නීතියෙන් අවශ්‍ය වූ විට එක්සත් ජනපදය වෙනුවෙන් අවි දැරීමටත් ඇමෙරිකාවේ සන්නද්ධ හමුදාවන්ට සේවය ලබාදීමටත් ජාතික වශයෙන් වැදගත් කාර්යයන් හි යෙදීමටත් මා මෙසේ නිදහස්ව, කිසිදු මානුෂික සංරෝධනයකින් හෝ මග හැරීමේ චේතනාවකින් තොරව දිවුරා පොරොන්දු වන බැවින්, දෙවියනි මාහට උදව් කරනු මැනව"**

එමගින් පැහැදිලිවම පෙනී යන්නේ ඇමෙරිකාවේ පුරවැසිභාවයද හිමි ද්විත්ව පුරවැසියෙකු යම් හෙයකින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනයට සම්බන්ධ වුවහොත් ඔහුට ඇමෙරිකාවේ අවශ්‍යතාවයන්ට අනුව ශ්‍රී ලංකාවට එරෙහිව අවි එසවීමට පවා සිදුවන බවය. එවැනි අවස්ථාවකදී එවැනි පුද්ගලයෙකුට එසේ ක්‍රියාකාරීවීමට හැකිවන ආකාරයට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අවස්ථාවද ලබාදෙමින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන යෝජනාව කෙටුම්පත් කර ඇති බවද අවධාරණයෙන් සඳහන් කළ යුතුය. ඒ අප රටේ බලාත්මක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වගන්තිය මගින් ඇතිකර ඇති විශේෂ බැඳීමක්ද ඉවත් කිරීමට කටයුතු කිරීම මගිනි. එනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවටද ආරක්ෂා කරන බවටද රටේ රාජ්‍ය නායකයා තවදුරටත් බැඳී නොසිටින ආකාරයට 20 වන සංශෝධන කෙටුම්පතෙහි 5 (3) වගන්තියට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන වගන්තිය ඉවත් කිරීම මගිනි.

**ඒ අනුව ආණ්ඩුවේ මෙම උත්සාහය අපගේ මාතෘභූමිය විදේශයන් වෙත පාවාදීම සඳහා ඉතා සැලසුම්ගතව හා සූක්ෂම ලෙස සිදුකරන පාපකාරී කුමන්ත්‍රණයක් ලෙසටද සැලකිය හැකිය.**

අතිශයෙන් භයානක වූ මෙම තත්වය පිළිබදව ජාතියේ මුර දේවතාවන් වන අතිගෞරවණීය මහා සංඝරත්නයේද  අනෙකුත් පූජක ප්‍රසාදීන් වහන්සේලාගේද ජාතිමාමක සියලු පුරවැසියන්ගේද අවධානය යොමු වේවායි ප්‍රාර්ථනා කරමු.

එමෙන්ම 20 වන සංශෝධනය සම්මත කරගන්නේ නම් අවම වශයෙන් රටට අතිශයින්ම අහිතකර වගන්ති හෝ ඉවත් කරගනිමින් එම කාර්යය සිදුකරන ලෙස අප සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත අවධාරණයෙන් යුතුව ඉල්ලා සිටින අතර මේ මොහොතේ අප ආණ්ඩුවෙන් ඉතා බලවත් ලෙස ඉල්ලා සිටින්නේ 20 වන සංශෝධනය ඉවත් කරගනිමින් ජනතාවට පොරොන්දු වූ පරිදි රටට ගැලපෙන හා රටේ ස්වාධීනත්වය ආරක්ෂා වන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමට අවශ්‍ය කටයුතු සලසන ලෙසය.



කරු ජයසූරිය
සභාපති,
සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය

# XIX.
# ජාත්‍යන්තර නීතිඥ සංවිධාන ඒකාබද්ධ නිවේදනය

## Statement on The 20th Amendment to the Constitution of Sri Lanka

We, the undersigned organisations, are deeply concerned about the impact the Sri Lanka 20th Constitutional Amendment Bill (the 'Amendment Bill') issued on 2 September 2020 would have on the independence and impartiality of the judiciary, if adopted. Of particular concern are the amendments proposed relating to the Judiciary and to the Judicial Services Commission.

The adherence to the Commonwealth (Latimer House) Principles on the Accountability of and Relationship between the Three Arms of government (The Principles) and to the Commonwealth Charter was specifically affirmed by the Government of Sri Lanka.

Principle IV,
*'An independent, impartial, honest and competent judiciary is integral to upholding the rule of law, engendering public confidence and dispensing justice....*
*.....Judicial appointments to all levels must be made on merit on the basis of clearly defined criteria and by a publicly declared process".*

The appointment process, whether or not involving an appropriately constituted and representative judicial services commission, should be designed to guarantee the quality and the independence of those selected for appointment at all levels. The Model Law on Judicial Services Commissions endorsed by Commonwealth Law Ministers at their Meeting in Nassau, Bahamas in October 2017, commends the creation of an independent judicial services commission composed of judges, representatives of the legal profession and lay members representing civil society through an independent appointments process. The current proposed Parliamentary Council (Article 41a), composed of members of parliament or nominees thereof in no way conforms to the spirit of an independent body,

Furthermore, the provisions of Article 107, 109 and 111 of the 20th Amendment to the Constitution gives the President of Sri Lanka powers to make any senior judicial appointments without specific approval or advice from the Parliamentary Council. Under the proposed Amendment the President is only required to obtain the "observations" of the Parliamentary Council. This is contrary to the Commonwealth (Latimer House) Principles as well as the UN Basic Principles on the Independence of the Judiciary and to the spirit of the separation of powers and the Commonwealth Charter.

The present Constitution provides for a national consensus on appointments by requiring approval of the Constitutional Council. The Constitutional Council is chaired by the Speaker and includes the Prime Minister and the Leader of the Opposition, One Member of Parliament representing the President while minor parties in Parliament nominate one other. The Council also has three eminent persons who are not involved in politics and who are nominated jointly by the Prime Minister and the Leader of the Opposition after consulting leaders of the other political parties represented in Parliament. In nominating these three persons and another two Members of Parliament, the Prime Minister and Leader of the Opposition must ensure that the Constitutional Council reflects the pluralistic character of Sri Lankan society, including professional and social diversity. The present Constitution also provides for any removal of members of the Judicial Appointments Commission to be approved by the Constitutional Council. The proposed 20th Amendment aims to abolish these provisions and would, in effect relegate the Judiciary to a position inferior to that of the Executive and Legislature in Sri Lanka. This is contrary to the rule of law and the basic tenets of the principles of separation of powers.

We therefore call upon the Executive and Legislature of Sri Lanka to ensure that the proposed constitutional changes are consistent with the Commonwealth fundamental values and international standards relating on the independence of the judiciary and the separation of powers.

**22 September 2020**
**Commonwealth Magistrates' and Judges' Association (CMJA)**
**Commonwealth Lawyers Association (CLA)**
**Commonwealth Legal Education Association (CLEA)**
**Commonwealth Journalists Association (CJA)**
**Rechters voor Rechters (Judges for Judges)**

**පැෆ්රල් සංවිධානය**

**නො.16, බයර්ඩ් පෙදෙස, පාමංකඩ පාර, කොළඹ 06, ශ්‍රී ලංකාව.**

(+94)112558570/1 (+94)112558572 paffrel@sltnet.lk www.paffrel.lk


9 786245 621002